(ஆ) மேற்படி தேவைகளைப் பூர்த்திசெய்வதன்மூலம் கல்வி யில் தர ரீதியான மற்றும் அளவு ரீதியான அபிவிருத்தி ஏற்படுமென்பதை அவர் ஏற்றுக்கொள்வாரா?

[ගරු බුද්ධික පතිරණ මහතා]

(இ) (i) மேற்படி தேவைகளைப் பூர்த்திசெய்வதற்குத் தேவையான நிதியை சம்பந்தப்பட்ட பாடசாலை களுக்குப் பெற்றுக்கொடுக்க அவர் நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கு எடுக்கும் காலம் யாதென் பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the schools with needs for buildings ;

(ii) the number of buildings needed by such schools ;

(iii) the number of schools without sanitary facilities ; and

(iv) the names and addresses of such schools;

out of the government schools administered by the Mulatiyana Divisional Education Office coming under the purview of the Mulatiyana Zonal Education Office of the Matara District?

(b) Will he admit that a qualitative and quantitative development of education will take place through the fulfilment of above needs?

(c) Will he state-

(i) whether action will be taken to allocate financial provisions required for the fulfilment of above needs ; and

(ii) if so, the period of time to be taken for this purpose?

(d) If not, why ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா )
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඇමුණුමෙහි (I) යටතේ දක්වා ඇත.

(ii) ගොඩනැඟිලි 4යි. ඇමුණුමෙහි (II) යටතේ දක්වා ඇත.

(iii) 20යි. ඇමුණුමෙහි (III) යටතේ දක්වා ඇත.

(iv) ඇමුණුමෙහි (IV) යටතේ දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) ඔව්.

(ඇ) (i) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ සනීපාරක්ෂක පහසුකම් සම්පූර්ණ කරලීම සඳහා එම පාසල් නාමාවලිය මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇති අතර එය ඉදිරියේදී ක්‍රියාත්මක වීමට නියමිතය.

2012 වර්ෂය සඳහා සැලසුම් කිරීමේදී මුලටියන කොට්ඨාසයේ පාසල්වල ගොඩනැඟිලි අවශ්‍යතා සඳහා ව්‍යාපෘති සැලසුම් සකස් කර ඉදිරිපත් කර ඇත.

(ii) සනීපාරක්ෂක පහසුකම් මෙම වර්ෂය තුළදී ද, ගොඩනැඟිලි අවශ්‍යතා ලබන වර්ෂයේදී ද ඉදි කිරීමට නියමිතය.

(ඈ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

මුලටියන කොට්ඨාසය

(I)
1. මාර/දේවාලේගම ක.වි.
2. මාර/කැටියපේ ම.වි.
3. මාර/මාකඳුර ම.ම.වි.
4. මාර/දෙයියන්දර ම.ම.වි.

(II) 60 x 20 ගොඩනැඟිලි 04 යි.

(III)
1. මාර/බමුණුගම ම.වි.
2. මාර/බැරගම ක.වි.
3. මාර/බෙරලි අතුර ක.වි.
4. මාර/දෙයියන්දර ම.ම.වි.
5. මාර/දෙයියන්දර ක.වි.
6. මාර/දෙනගම විපුලසාර ම.ම.වි.
7. මාර/දේවාලේගම ක.වි.
8. මාර/දිද්දෙනිපොත ම.වි.
9. මාර/කොරඹුරුවාන ම.වි.
10. මාර/මාකඳුර ම.ම.වි.
11. මාර/මාකඳුර ක.වි.
12. මාර/මාරමණ්ඩිය ක.වි.
13. මාර/මීපාවිට ක.වි.
14. මාර/පල්ලාවෙල ම.වි.
15. මාර/පාත්‍රාමුල්ල ක.වි.
16. පිටවල්ගමුව ක.වි.
17. මාර/රදාවෙල ක.වි.
18. මාර/රන්සෑගොඩ උතුර ක.වි.
19. මාර/රන්සෑගොඩ දකුණ ක.වි.
20. මාර/ගොම්බද්දල විජයබා ක.වි.

(IV)
01. මාර/බමුණුගම ම.වි. - හොරපාවිට
02. මාර/බැරගම ක.වි. - මාකඳුර
03. මාර/බෙරලි අතුර ක.වි. -රන්සෑගොඩ
04. මාර/දෙයියන්දර ම.ම.වි. - දෙයියන්දර
05. මාර/දෙයියන්දර ක.වි. - දෙයියන්දර
06. මාර/දෙනගම විපුලසාර ම.ම.වි. - දෙනගම
07. මාර/දේවාලේගම ක.වි. - රදාවෙල
08. මාර/දිද්දෙනිපොත ම.වි. - මුලටියන හන්දිය
09. මාර/කොරඹුරුවාන ම.වි. - රන්සෑගොඩ
10. මාර/මාකඳුර ම.ම.වි. - මාකඳුර
11. මාර/මාකඳුර ක.වි. - මාකඳුර

12. මාර/මාරමණ්ඩිය ක.වි. - නෙරලම්පිටිය
13. මාර/මීපාවිට ක.වි. - රන්සෑගොඩ
14. මාර/පල්ලාවෙල ම.වි. - රඳාවෙල
15. මාර/පාත්‍රාමුල්ල ක.වි. - රන්සෑගොඩ
16. මාර/පිටවල්ගමුව ක.වි. - දෙනගමුව
17. මාර/රඳාවෙල ක.වි. - රඳාවෙල
18. මාර/රන්සෑගොඩ උතුර ක.වි. - රන්සෑගොඩ
19. මාර/රන්සෑගොඩ දකුණ ක.වි. - රන්සෑගොඩ
20. මාර/ගොම්බද්දල විජයබාහු ක.වි. - ගොන්බද්දල

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතුරු ප්‍රශ්නය අහන්නට කලින් මට පොඩි පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඒ සඳහා අවස්ථාව දෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මා අසන ලද ප්‍රශ්නයේ (අ) (ii) කොටසට පිළිතුරු වශයෙන් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහන් කළේ ගොඩනැඟිලි 3යි කියා ද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

එම ප්‍රශ්නයේ(අ) (ii) කොටසට උත්තරය - ගොඩනැඟිලි 04යි. (අ) (iii) පාසල් 20යි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. පාසල්වලට සනීපාරක්ෂක පහසුකම් -වැසිකිළි කැසිකිළි පහසුකම්- සැලසීමේදී ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා කිව්වා, මුලටියන අධ්‍යාපන කලාපයේ පමණක් පාසල් 20කට ආසන්න ප්‍රමාණයකට ඒ පහසුකම් නැහැ කියා. මුලටියන අධ්‍යාපන කලාපයේ වැසිකිළි කැසිකිළි පහසුකම් නැති ඒ පාසල් 20ටම 2012 වර්ෂයේදී ඒ පහසුකම් ලැබෙනවා ද ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පාසල් 20ටම වැසිකිළි සහ කැසිකිළි නොමැතිකම ම නොවෙයි, දැනට තිබෙන ඒවා ක්‍රියාත්මක වන්නේ නැති වීම හෝ අබලන් වීමයි සිදුව තිබෙන්නේ. පාසල් 20ටම ඒ පහසුකම් සපයන්නට පුළුවන්කම තිබෙනවා. මොක ද? ඒක කෙරෙන්නේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන්. ඔබතුමා වෙනම ප්‍රශ්නයක් ඇහැව්වොත් එම අමාත්‍යාංශයෙන් ඒකට උත්තරයක් දේවි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමනි, පාසල්වලට පානීය ජලය සහ වැසිකිළි කැසිකිළිවලට ජලය ලබා ගැනීමේත් ප්‍රශ්නයක් තිබෙනවා. බොහෝ තැන්වලට ජලය නැහැ නොවෙයි තිබෙන ජල පද්ධති සහ ළිං අපවිත්‍ර වීම සහ අබලන් වීමයි සිදු වී තිබෙන්නේ. මේ සම්බන්ධයෙනුත් ක්‍රියා මාර්ග ගන්න 2012 වර්ෂයේදී සැලසුමක් තිබෙනවා ද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට කලිනුත් රජය මඟින් මතු පිට ජලය නොමැති බොහෝ පාසල්වලට සෝලා යන්ත්‍ර මඟින් -සූර්යතාප බලය යොදා ගෙන- ජලය සපයා දී තිබුණා. මොන මොන පාසල් සඳහාද ජල ප්‍රශ්නය තිබෙන්නේ කියලා මම ගරු මන්ත්‍රීතුමාගෙන් පෞද්ගලිකව දැන ගන්න කැමැතියි. එහෙම දැනුම් දුන්නොත් අපට ඒක ඉෂ්ට කරන්න පුළුවන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මම ඔබතුමාට මුලටියන කලාප අධ්‍යාපන බල ප්‍රදේශයේ, මුලටියන කොට්ඨාසයට අදාළව ලේඛනයක් ලබා දෙන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ තුන්වෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ කොට්ඨාසය තුළ බෙල්පාමුල්ල කනිෂ්ඨ විද්‍යාලය, ගල්වැටුම කනිෂ්ඨ විද්‍යාලය, මඩුවෙල කනිෂ්ඨ විද්‍යාලය සහ කුඩාපාන කනිෂ්ඨ විද්‍යාලය මේ වන විට වැසී ගොස් තිබෙනවා. මෙවැනි පාසල්වල විශාල සම්පත් ප්‍රමාණයක් තිබෙනවා. ගොඩනැඟිලි, පුස්තකාල, ඩෙස්ක්-පුටු සහ වෙනත් ලී බඩු උපකරණ තිබෙනවා. මේ සම්පත් කළමනාකරණය කරන්න අධ්‍යාපන අමාත්‍යාංශය බලාපොරොත්තු වන්නේ කුමන ආකාරයකටද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවා කළමනාකරණය සහ පරිපාලනය කරන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නොවෙයි. ව්‍යුහාත්මකව ඒ කටයුතු කෙරෙන්නේ පළාත් සභාව මඟිනුයි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ඇත්ත. පළාත් සභාව මඟින් කෙරෙන්නේ නැහැ. ඒකයි ගරු නියෝජ්‍ය ඇමතිතුමා මම අහන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ඩෙස්ක්-පුටු අවශ්‍ය පාසල් මොනවාද කියා ඔබතුමාට දැනුම් දෙන්න පුළුවන් නම් ඒවාට මේ උපකරණ ලබා දෙන්න පුළුවන්. ඒ වාගේම වෙනත් කටයුතු සඳහා පාවිච්චි කිරීමට අනෙකුත් ගොඩනැඟිලි සහ දේපළ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත පවරා දීමේ හැකියාව තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මම සඳහන් කළ පාසල් හතරට අදාළව ඒවා අවශ්‍යයි. බොහොම ස්තුතියි.

## සේවක භාරකාර අරමුදල : විස්තර
## ஊழியர் நம்பிக்கை நிதியம்: விபரம்
## EMPLOYEES TRUST FUND : DETAILS

1000/'10

2\. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) සේවක භාරකාර අරමුදලේ (ETF) මේ වන විට තැන්පත් කර ඇති මුදල;

(ii) එහි සාමාජිකත්වය ලබා ඇති සේවක සංඛ්‍යාව;

(iii) සාමාජිකයින්ගේ මුදල් වෙනුවෙන් ලබා දෙන වාර්ෂික පොලී අනුපාතය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම මුදල් සාමාජිකයන්ට නැවත ලබා දීමේ වර්ෂ 5 කාල සීමාව දීර්ඝ කර තිබේද;

(ii) නොඑසේ නම්, එවැනි කාලය දීර්ඝ කිරීමක් සඳහා සැලැස්මක් සකසා තිබේද;

(iii) ඉහත (ආ) (i) හෝ (ii) සිදු කර ඇත්නම්, එයට හේතු වූ කරුණු කවරේද;

(iv) ඒ සඳහා කම්කරු උපදේශන සභාවේ අනුමතිය ලබා ගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) කෙටි කාලීන අවශ්‍යතා සපුරා ගැනීම වෙනුවෙන් සේවක භාරකාර අරමුදලේ මුදල් භාවිතා කරන සේවකයින් මුහුණ දෙන ගැටලු සඳහා ලබා දෙන විසඳුම කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஊழியர் நம்பிக்கை நிதியத்தில் (E.T.F.) இதுவரை வைப்புச் செய்துள்ள பணம் எவ்வளவென் பதையும்;

(ii) இதில் அங்கத்துவம் பெற்றுள்ள ஊழியர்களின் எண்ணிக்கையையும்;

(iii) அங்கத்தவர்களின் பணத்திற்காக வழங்கப்படு கின்ற வருடாந்த வட்டி வீதம் எவ்வளவென் பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இப்பணத்தை அங்கத்தவர்களுக்கு மீளச் செலுத் தும் 5 வருட கால எல்லையானது அதை விட நீண்ட காலத்திற்கு நீடிக்கப்பட்டுள்ளதா,

(ii) இன்றேல், அத்தகைய கால நீடிப்புக்கான திட்ட மொன்று தயாரிக்கப்பட்டுள்ளதா,

(iii) மேற்படி (i) அல்லது (ii) மேற்கொள்ளப்பட்டி ருப்பின், அதற்கு ஏதுவான காரணங்கள் யாவை,

(iv) இதன்பொருட்டு தொழில் ஆலோசனை மன்றத் தின் அனுமதி பெறப்பட்டுள்ளதா

என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) குறுகியகாலத் தேவைகளை ஈடேற்றிக் கொள்வதற் காக ஊழியர் நம்பிக்கை நிதியத்தின் பணத்தைப் பாவிக்கின்ற ஊழியர்கள் எதிர்நோக்கும் சிக்கல் களுக்காக வழங்கப்படும் தீர்வு யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he inform this House -

(i) the amount of money deposited by now in the Employees Trust Fund ( ETF);

(ii) the number of employees who have obtained its membership; and

(iii) the annual interest rate paid for the money of the members ?

(b) Will he state -

(i) whether the period of five years for refunding the money for depositors has been extended;

(ii) if not, whether a plan has been made for such an extension of time;

(iii) if either the above (b) (i) or (ii) has been done, the reasons for the same; and

(iv) whether the approval of the Labour Advisory Council has been obtained for this purpose ?

(c) Will he inform this House of the solutions offered to the problems of employees who utilize the money in the Employees Trust Fund for the fulfilment of short-term requirements ?

(d) If not, why ?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2011.08.31 දිනට අරමුදලේ ආයෝජන වටිනාකම රුපියල් බිලියන 132කි.

(ii) මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව ලක්ෂ 95කි. එහි සක්‍රිය සහ අක්‍රිය සියලු කාණ්ඩ ඇතුළත්.

(iii) 2011 වර්ෂය සඳහා සියයට 8.5ක පොලී අනුපාතයක් ගෙවන ලදී.

(ආ) (i) නැත.

(ii) වසර 05ක කාල සීමාව වසර 10 දක්වා දීර්ඝ කිරීම පිණිස 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතට සංශෝධනයක් ගෙන ඒමේ යෝජනාව අධ්‍යයනය කරමින් පවතී.

(iii) සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ මූලික අරමුණ වනුයේ සේවයේ යෙදී සිටියදී සාමාජිකයන්ට ප්‍රතිලාභ ලබා දීමයි. අරමුදල දැනට

හඳුන්වා දී ඇති ප්‍රතිලාභ ලබා ගැනීමට අඛණ්ඩ සාමාජිකත්වයක් තිබිය යුතුය.

වර්ෂ පහකට වරක් ප්‍රතිලාභ ලබා ගන්නේ නම් සාමාජිකයාට ලබා ගත හැකි වන්නේ සුළු මුදලකි. එහෙත් වසර 10කට වරක් ප්‍රතිලාභ ලබා ගැනීමේ දී පොලියද සමඟ වැඩි මුදලක් ඔවුනට ලබා ගැනීමට අවස්ථාව ලැබෙන බැවින්, ඔවුන්ගේ දීර්ඝ කාලීන අවශ්‍යතා සඳහා කිසියම් ඵලදායී ආයෝජන කටයුත්තක් සඳහා එම මුදල් යෙදවීමට අවස්ථාව සැලසේ.

(iv) නැත.

අදාළ යෝජනාව 2011.11.01 වැනි දා -මේ මාසයේ පළමුවන දා- පැවැති කම්කරු උපදේශක කාරක සභාවට ඉදිරිපත් කරන ලදී.

එහිදී මෙම යෝජනා තවදුරටත් අධ්‍යයනය කර නිරීක්ෂණ ඉදිරිපත් කිරීම සඳහා කම්කරු අමාත්‍යතුමා විසින් වෘත්තිය සමිති නිලධාරින් සහ අදාළ නිලධාරින්ගෙන් සමන්විත කමිටුවක් පත් කර තිබෙනවා. ඒ නිසා මෙම යෝජනාව තවදුරටත් සාකච්ඡා මට්ටමෙන් පවතිනවා.

(ඇ) සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලේ සාමාජිකයන්ට තම රාජකාරි ජීවිතය තුළ බුක්ති විඳිය හැකි ප්‍රතිලාභ දහයක් මණ්ඩලයෙන් ප්‍රදානය කෙරෙනවා. ඒවා මෙසේයි. සෞඛ්‍ය ප්‍රතිලාභ වශයෙන් ස්වයංක්‍රීය ජීවන රක්ෂණ ප්‍රතිලාභ, නිත්‍ය දුබලතා රක්ෂණ වන්දි යෝජනා ක්‍රමය, හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර ලබා දීමේ යෝජනා ක්‍රමය, වකුගඩු බද්ධ කිරීමේ සැත්කම් සඳහා මූල්‍යාධාර ලබා දීමේ යෝජනා ක්‍රමය, අක්ෂි කාච පැළඳීම සඳහා මූල්‍යාධාර ලබා දීමේ යෝජනා ක්‍රමය, ශ්‍රම සුව රැකවරණ රෝහල්ගත වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කිරීමේ යෝජනා ක්‍රමය.

අධ්‍යාපන ප්‍රතිලාභ වශයෙන් පහ වසර ශිෂ්‍යත්වය සමත් වූ දරුවන් 5000ක් වෙනුවෙන් රුපියල් 15,000 බැගින් ශිෂ්‍යත්ව පිරිනැමීමේ යෝජනා ක්‍රමය, සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලේ සක්‍රීය සාමාජිකයන්ගේ උසස් පෙළ විභාගය සමත් දූ දරුවන් 10,000ක් සඳහා ඔවුන්ගේ උසස් අධ්‍යාපන කටයුතු වෙනුවෙන් රුපියල් 12,000ක මූල්‍යාධාර ලබා දීමේ යෝජනා ක්‍රමය, නිත්‍ය දුබලතා හේතුවෙන් සේවය අවසන් කොට ඇති ඊටීඑෆ් සාමාජිකයන්ගේ දූ දරුවන් වෙනුවෙන් රුපියල් 15,000 බැගින් පහ වසර ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.

ඊට අමතරව සහන පොලියට 'වියන' නිවාස ණය යෝජනා ක්‍රමයකුත් ක්‍රියාත්මක වෙනවා.

(ඈ) පැන නොනඟී.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය ඇසීමට පෙර ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මා අහන්න කැමැතියි, මේ රුපියල් බිලියන 132යි කියලා කියපු මුදල දැනට අරමුදලේ තිබෙන මුදල ද, එහෙම නැත්නම් එහාට, මෙහාට ආයෝජනය කරපු ඒවා හැර ඉතිරිව තිබෙන මුදලද කියා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

දැනට තිබෙන වටිනාකම තමයි -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒ කියන්නේ තැන් තැන්වල ආයෝජනය කරන්නට පෙර තිබුණු මුදල නේද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ආයෝජනත් සමඟ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

නැහැ. සම්පූර්ණ මුදල නොවෙයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පළමුවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ රුපියල් බිලියන 132ට අමතරව ඔබතුමන්ලා මේ අරමුදල පාවිච්චි කරලා වෙනත් ස්ථානවල යම් කිසි ආයෝජනයන් කර තිබෙනවාද, එහෙම නම් ඒ ප්‍රමාණය කොපමණද කියලා කරුණාකරලා මට කියන්න පුළුවන්ද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ඒ ටික කියන්න පුළුවන්. මේ පිළිබඳව පිටු 45කින් යුතු සම්පූර්ණ වාර්තාවක් මාර්තු මාසයේ 22වැනි දා අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් ඉදිරිපත් කරලා තිබෙනවා. පිටු 45කින් යුතු එම වාර්තාවේ සමස්ත ආයෝජන සංඛ්‍යාව සහ සෑම සමාගමක් පිළිබඳව විස්තර සඳහන් කරලා තිබෙනවා. එහි සභාගත කළ පිටපතක් පාර්ලිමේන්තු පුස්තකාලයේ තිබෙනවා. ඒ නිසා ඔබතුමාට එය ලබා ගන්නට පුළුවන්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඇත්ත වශයෙන්ම මේ සේවක භාරකාර අරමුදලේ බොහොම පැහැදිලිව සඳහන් වනවා, විශේෂයෙන් ආයෝජනයක් කරනකොට මහා භාණ්ඩාගාරයේ තිබෙන සුරැකුම්පත්වල සහ වෙනත් භාණ්ඩාගාර බිල්පත්වල පමණක් ආයෝජනය කරන්නට පුළුවන් කියලා. ඊට අමතරව වෙනත් කිසිම තැනක ආයෝජනය කරන්නට නීතිමය වශයෙන් ප්‍රතිපාදනයක් ඔබතුමන්ලාට දීලා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම දීලා නැතිව තිබෙද්දී විශේෂයෙන්ම කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කිරීම තුළ, ඒ වාගේම විවිධ කුඩා කොම්පැනිවල ආයෝජනය කිරීම තුළ මේ වන විට විශාල පාඩු සහිතව දැවැන්ත අර්බුද ගණනාවක් ඇති වෙලා තිබෙනවා. දවස ගණනේ විශාල පාඩුවක් ලබනවා. ඒ නිසා නීතියට පිටින් ගිහිල්ලා මේවා ආයෝජනය කරන්න තීන්දුව ගත්තේ කවුද, පාර්ලිමේන්තුවේ සම්මත වූ පනතකින් ඒකට අනුමැතියක් දීලා තිබෙනවාද, එහෙම නැත්නම් මේ පාඩුවට වග කියන්නේ කවුද කියලා මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳව නීතියට පිටින් ගමන් කරලා නැහැ. මෙම පනත සම්මත වීමත් සමඟ 1980 සිට ක්‍රියාත්මක වුණු මෙම යෝජනා තුළ රජයේ සුරැකුම්පත්වල සියයට 90ක් ආයෝජනය කරලා තිබෙනවා. ඒ කියන්නේ රුපියල් බිලියන 132ක්. කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය උපරිමය සියයට 6කට සීමා කරලා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, බිලියන කොච්චරද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

රුපියල් බිලියන හතයි. උපරිමය සියයට 6යි. ඒ වාගේම සියයට 90ක් සුරැකුම්පත්-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම කිව්වේ වෙනත් ඒවායේ ආයෝජනය කරන්න පුළුවන් කියා නීතිමය වශයෙන් ප්‍රතිපාදන නැහැ කියන එකයි.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ඒ ගැන මේ පනතේ නීතිමය වශයෙන්ඉතා පැහැදිලිව තිබෙනවා. ඒ අනුව ක්‍රියා කරලා අවසරය ලබා ගෙන තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

තුන්වැනි අතුරු ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳව උත්තරය මම පසු ගිය මාර්තු මාසයේත් දුන්නා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අවුරුදු පහක කාල සීමාව අවුරුදු දහයක් දක්වා දීර්ඝ කරන්න කටයුතු කරන එක ගැන මම කියන්න කැමැතියි, අවුරුදු පහකින් සේවකයන්ට ගන්න තිබෙන අයිතිවාසිකම අවුරුදු දහයක් දක්වා දීර්ඝ කිරීමෙන් සේවකයන්ට වාසියක් වන්නේ නැහැයි කියන එක. මම හිතන විධියට ඔබතුමන්ලා මේ මුදල් වෙනත් යම් කාරණයකට තබා ගැනීම තමයි අවසාන වශයෙන් සිද්ධ වන්නේ. ඒ නිසා ප්‍රශ්නයක් විධියට නොවෙයි, මේ සම්බන්ධයෙන් සලකා බලා සේවකයන්ට අවුරුදු පහක් ඇතුළත මේ මුදල ලබා ගන්න අවස්ථාව ලබා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්න කැමැතියි.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

මම හිතන්නේ මේ කාරණය -අවුරුදු පහක කාල සීමාව- ගැන ගැටලුවක් නැහැ කියලායි. අවුරුදු දහයක කාරණය පිළිබඳව මම කිව්වා. එය කම්කරු උපදේශක කාරක සභාව වෙත ඉදිරිපත් කරලා, දැනටමත් සියලුම වෘත්තීය සමිතිත් සමඟ සාකච්ඡා කර තිබෙනවා. පළමුවැනි දාට නියමිතව තිබූ එම සාකච්ඡාව කල් ගියා. ඔවුන්ගේ නිර්දේශ ලබා ගෙන ඒ අනුව කටයුතු කරනවා මිසක් රජය වෙන ක්‍රියා මාර්ගයකට යාමට අදහස් කරන්නේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මේ වාගේ හදිසියේ ගෙනැල්ලා පනත් කෙටුම්පත් සම්මත කරන්න එපා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ඔබතුමාගේ වෘත්තීය සමිතියත් එතැන ඉන්නවා.

## ආනයනික කෘෂි රසායන පරීක්ෂාව : ක්‍රියා මාර්ග
## இறக்குமதியாகும் விவசாய இரசாயனப் பொருட்களின் பரிசோதனை: நடவடிக்கை
## TESTING OF IMPORTED AGRO CHEMICALS : MEASURES TAKEN

1619/'11

4. **ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) 2011 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවට ආසනික් අඩංගු කෘෂි රසායන ගෙන්වීම නතර කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) පසු ගිය දා දේශීය වෙළඳ පොළෙහි ආසනික් අඩංගු කෘෂි රසායන තිබෙන බවට පළවූ වාර්තා පිළිබඳව අමාත්‍යාංශය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

(ii) කෘෂි රසායන ලංකාවට ගෙන ඒමේදී පරීක්ෂාවට භාජනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2011ஆம் ஆண்டிலிருந்து இலங்கைக்கு ஆசனிக் அடங்கிய விவசாய இரசாயனப் பொருட்களை இறக்குமதி செய்தல் நிறுத்தப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) உள்நாட்டுச் சந்தையில் ஆசனிக் அடங்கிய விவசாய இரசாயனப் பொருட்கள் இருப்பதாக அண்மையில் வெளிவந்த அறிக்கைகள் தொடர்பாக அமைச்சினால் மேற்கொள்ளப்பட்ட நடவடிக்கைகள் யாவை என்பதையும்:

(ii) விவசாய இரசாயனப் பொருட்கள் இலங்கைக்கு இறக்குமதி செய்யப்படும்போது அவற்றைப் பரிசோதிக்கும் செயல்முறை யாதென்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Is he aware that the importation of agro chemicals that contain arsenic has been stopped in Sri Lanka since 2011?

(b) Will he inform this House of -

(i) the measures taken by the Ministry regarding the recently published reports which indicated that agro chemicals containing arsenic are available in the local market; and

(ii) the procedure adopted to test agro chemicals when they are imported to Sri Lanka?

(c) If not, why ?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**

(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)

(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) මෙහි සඳහන් 2011 වසර, 2001 ලෙස නිවැරදි විය යුතුයි. ආසනික් සක්‍රිය කාරකයක් වශයෙන් අඩංගු වන කෘෂි රසායන ලංකාවට ගෙන්වීම 2001 ජුනි මස 29වන දින අංක 1190/24 දරන රජයේ ගැසට් පත්‍රයට අනුව එම දින සිට ක්‍රියාත්මක වන පරිදි තහනම් කර ඇත.

සංයෝග කළ නිෂ්පාදනයක අඩංගු පළිබෝධ නාශක ගුණාංග ගෙන දෙන ද්‍රව්‍ය සක්‍රිය කාරකයක් ලෙස හැඳින්වේ.

(ආ) (i) දේශීය වෙළෙඳ පොළේ පළිබෝධ නාශක විශ්ලේෂණය කිරීමේදී ආසනික් ඇති බවට වාර්තා වූ පළිබෝධ නාශක සංයෝජන පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් දේශීය වෙළෙඳ පොළෙහි විකිණීම තාවකාලිකව අත්හිටවූ අතර, අදාළ උපදෙස් ලබා ගැනීම සඳහා පළිබෝධ නාශක තාක්ෂණ හා උපදේශන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

කමිටුවේ උපදෙස් අනුව රඳවාගෙන ඇති පළිබෝධ නාශක ප්‍රමාණයන් භාවිතා කිරීම නිසා මනුෂ්‍යයාට හෝ පරිසරයට බලපෑමක් වීමට ඇති හැකියාව ඉතාමත් අඩු බැවින් එම පළිබෝධ නාශක භාවිතය සඳහා මුද හරින ලදී. එහෙත් නොකඩවා ආසනික් මෙන් වෙනත් අන්තරායකාරී මූලද්‍රව්‍ය පළිබෝධ නාශක සමඟ ලංකාවට ඒම වැළැක්වීම සඳහා එවන් රසායන ද්‍රව්‍ය දහයක් (ආසනික්, කැඩ්මියම්, කෝබෝල්ට්, ක්‍රෝමියම්, රසදිය, නිකල්, ඊයම්, ටින්, තැලියම් හා සයනයිඩ්) පිළිබඳව ප්‍රමාණාත්මක විශ්ලේෂණ වාර්තාවක් පළිබෝධ නාශක ආනයනයට පෙර පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයා වෙත ලබා ගැනීමට කටයුතු කර ඇත.

ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ -FAO- මෙන්ම ලෝක සෞඛ්‍ය සංවිධානයේ -WHO- නියමිත මහ පෙන්වීම් සලකා බලා මනුෂ්‍යයාට හෝ පරිසරයට හානිකර මට්ටමකින් මෙම මූලද්‍රව්‍ය දහය කුමන හෝ ආකාරයකින් අඩංගු නොවන පළිබෝධ නාශක පමණක් ගෙන්වීමට මින් අවසර දෙනු ලැබේ. මෙය දැනටමත් ක්‍රියාත්මක කර ඇත. මීට අමතරව ගෙන්වනු ලබන පළිබෝධ නාශකවල ඉහත කී රසායන ද්‍රව්‍ය අඩංගු වේ දැයි පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් විසින් අහඹු ලෙස පරීක්ෂාවට ලක් කරනු ලැබේ.

(ii) යම් තැනැත්තකුට කෘෂි රසායන ද්‍රව්‍යයක් ගෙන ඒමට අවශ්‍ය වන්නේ නම් පළමුව එවන් කෘෂි රසායන ද්‍රව්‍යයක් ගෙන ඒමට අවශ්‍යතාවක් ඇති බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ අංශයෙන් හෝ අදාළ බෝග පර්යේෂණ ආයතනයකින් (උදා :- තේ,පොල්,රබර් හා උක් වැනි) නිර්දේශයක් පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතුයි.

එම නිර්දේශන මත ගෙන ඒමට ඉල්ලුම් කර ඇති කෘෂි නාශකය මෙරටට ආනයනය කිරීමට අවසර දිය හැකි කෘෂි නාශකයක්ද යන්න පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණය කරනු ලැබේ. (ලෝක සෞඛ්‍ය සංවිධානයේ අන්තරාකාරීත්වය අනුව කර ඇති වර්ගීකරණයේ III හෝ ඊට වඩා වැඩි පන්තියට එම පළිබෝධ නාශක අයත් විය යුතු අතර පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් තහනම් කර ඇති රසායනිකයන් සක්‍රිය ද්‍රව්‍යය ලෙස නොතිබිය යුතුයි.)

ලංකාවේ පවතින නීතිය යටතේ ලියා පදිංචි කළ හැකි පළිබෝධ නාශකයක් ලෙස තීරණය වුවහොත් ලංකාවේදී එම පළිබෝධ නාශකයේ ජෛව ක්‍රියාකාරිත්වය පරීක්ෂා කර බැලීම සඳහා අවශ්‍ය වන නියැදියක් පමණක් ගෙන ඒමට අවසර දෙනු ලැබේ.

ලංකාවට ගෙන ආ පළිබෝධ නාශක නියැදිය භාවිත කර එහි ක්‍රියාකාරිත්වය සහතික කරන ලද පර්යේෂණ වාර්තාවක් ඉන් පසු බෝග පර්යේෂණ ආයතනයන්හි පර්යේෂකයන් විසින් පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයා වෙත ලබා දෙනු ලැබේ. මේ පර්යේෂණ සඳහා අවම වශයෙන් වර්ෂයක කාලයක් ගත වේ. එම වාර්තා අනුව පළිබෝධ නාශක ලංකාවේදී කාර්යක්ෂමව භාවිතා කළ හැකි බැව් පෙනී ගියහොත් පළිබෝධ නාශකය ලියා පදිංචිය සඳහා අදාළ අයදුම්පත් පර්යේෂණ වාර්තාවක් සමඟින් ඉදිරිපත් කළ යුතුයි. ලියාපදිංචි කිරීමේ අයදුම්පත සමඟ පළිබෝධ නාශක පිළිබඳ විස්තර ඇතුළත්ව පහත සඳහන් වාර්තා ස්වාධීන සහතිකලත් -accredited- රසායනාගාරයක් වෙතින් පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දිය යුතුයි.

i. සක්‍රිය ද්‍රව්‍යයේ භෞතික හා රසායනික ගුණ

ii. සක්‍රිය ද්‍රව්‍යයේ විසභාවය, මනුෂ්‍යයාට හා පරිසරයට විය හැකි බලපෑම.

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

iii. පළිබෝධ නාශකයේ සක්‍රිය ද්‍රව්‍ය සහ අඩංගු අනෙකුත් සියලුම සංඝටක පිළිබඳව ප්‍රමාණාත්මක සහ ගුණාත්මක විස්තරයක්.

iv. එම සියලුම සංඝටකයන්ගේ ආරක්ෂාකාරී භාවිත පිළිබඳ වාර්තාවක් - Material Safety Data Sheet.

v. සක්‍රිය ද්‍රව්‍ය ඇතුළු එක් එක් සංඝටක හඳුනා ගැනීම සඳහා විශ්ලේෂණ ක්‍රමවේදයන්

vi. පළිබෝධ නාශකයේ ආයු කාලය (Shelf Life) වාර්තාවක් (ඒ සඳහා කළ පර්යේෂණවල ප්‍රතිඵල සමඟින්)

vii. පළිබෝධ නාශකයේ අවශේෂ (Residues) පරීක්ෂා කිරීමේ ක්‍රමවේදය සහ අදාළ දත්ත.

viii. විෂ වීමකදී දිය යුතු ප්‍රතිකාර පිළිබඳ විස්තර

ix. විෂභාවය පිළිබඳ අදාළ පර්යේෂණ වාර්තා

x. අනෙකුත් අවශ්‍ය වාර්තා

මෙම වාර්තා සියල්ල සලකා බලා පළිබෝධ නාශක ලංකාවේ භාවිතයට සුදුසු දැයි තීරණය කරනු ලැබුවහොත් එය ලංකාවේ ලියා පදිංචිය සඳහා වර්ෂ 03ක කාලයකට අවසර දෙනු ලැබේ. (මෙම කාල සීමාව නැවත දීර්ඝ කළ හැක.) පළිබෝධ නාශක වෙළඳ පොළට නිකුත් කළ පසු එහි ගුණාත්මකභාවය පවත්වා ගෙන යන්නේදැයි පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් මඟින් වරින් වර ක්ෂේත්‍රයේ නියැදි ගෙන රසායනාගාරයේ පරීක්ෂා කර බලනු ලැබේ.

(ඈ) පැන නොනඟී.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙකයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පසු ගිය දා විශාල ලෙස ආන්දෝලනයට තුඩු දුන්නා මේ ආසනික් ප්‍රශ්නය. එහිදී සමාගම් කිහිපයකට අයත් පළිබෝධ නාශක වර්ග 9ක් ලංකාව ඇතුළේ පරිහරණය කිරීම තාවකාලිකව අත් හිටුවීමට තීරණයක් ගනු ලැබුවා. ගරු ඇමතිතුමනි, මා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, තාවකාලිකව අත් හිටුවීමට ලබා දුන් ඒ තීරණය වෙනස් කළාද, වෙනස් කළා නම් ඒ වෙනස් කිරීම සඳහා පාදක කර ගත්තේ කවර කරුණුද කියා.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළිබෝධ නාශක 9ක් නොවෙයි 28ක් පිළිබඳව පැමිණිලි ආවා. ඒ අතරින් තුනක් ගැන තමයි දිගටම පරීක්ෂණ කළේ. ඒ වර්ග තුන නතර කළා. ඊට පස්සේ පළිබෝධ නාශක තාක්ෂණ හා උපදේශන කමිටුව -අදාළ පරීක්ෂණ කරලා නිකුත් කරපු වාර්තා අනුව- උපදෙස් දුන්නා පරිසරයට හා මනුෂ්‍යයන්ට හානිකර ප්‍රමාණයට මේ කියන විෂ ද්‍රව්‍ය නැහැ කියලා. ඒ නිසා දැන් ඒවා නිදහස් කරලා තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මගේ දෙවන අතුරු ප්‍රශ්නය ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ආසනික් සක්‍රිය මූලද්‍රව්‍යයක් ලෙස කිසි සේත්ම අඩංගු නොවිය යුතුයි කියලා තමයි 2001 ගැසට් නිවේදනය නිකුත් කළේ. ඒක තමයි රජයේ තීරණය. එසේ තිබියදී යම් යම් සුළු ප්‍රමාණ වශයෙන් අඩංගුව තිබෙනවා කියන පදනම මත ඒවා නිදහස් කරන්නේ කොහොමද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නම් ඒ ගැසට් නිවේදනය වෙනස් කළ යුතු වනවා. ගරු ඇමතිතුමනි, සක්‍රිය මූල ද්‍රව්‍යයක් ලෙස ආසනික් අඩංගු පළිබෝධ නාශක නිකුත් කිරීම නීතියෙන් වළක්වා තිබියදී, මේවා ශරීරවලට බලපාන්නේ නැහැයි කියලා ඔබතුමාගේ කමිටුවක් තීරණය කරන්නේ කොහොමද?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සක්‍රිය තත්ත්වයේ ඒවා විතරයි මේ ගැසට් නිවේදනයෙන් වළක්වා තිබෙන්නේ. සක්‍රිය නොවන කියන්නේ මෙහෙමයි. අපි මේ භාවිත කරන ඕනෑම ආහාරයක යම් කිසි ඉතා සුළු ප්‍රමාණයක් ආසනික් තිබෙන්න පුළුවන්. ඒවා සක්‍රිය නැහැ. ඒක තමයි ඒ ගොල්ලෝ මේ පර්යේෂණයෙන් බලන්නේ. ඒක සක්‍රිය නොවනවා කියලා ඒ විද්වත් මණ්ඩලයට තේරුම් ගියොත් ඒකට අවසර දෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

තුන්වන අතුරු ප්‍රශ්නය මෙකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආසනික් වකුගඩු රෝගයකට සම්බන්ධයි, ඒ වාගේම ලක්ෂ සංඛ්‍යාත ප්‍රමාණයකට වකුගඩු රෝගය වැළඳී තිබෙනවා කියන ඒ ආකාරයේ සාකච්ඡාවක් තමයි රට තුළ සිද්ධ වුණේ. එම නිසා රජයක් හැටියට ඒ තත්ත්වය ඉතාම වග කීමෙන් වෙනස් කළ යුතුව තිබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්වාධීන පුද්ගලයන් විසින් ලංකාවේ පළිබෝධ නාශක ගෙන ගොස් මැලේසියාවේ ක්වාලාලම්පූර් නගරයේ ලෝකයේ පිළිගන්නා ලද පර්යේෂණාගාරයකදී පරීක්ෂාවට භාජන කරනු ලැබුවා. ඒ පරීක්ෂාවට භාජන කරන ලද ඒවා සම්බන්ධ වාර්තා මා සතුව තිබෙනවා. ඒ පරීක්ෂණ වාර්තාවලට අනුව නම්, ඒ ආසනික් ප්‍රමාණය ඔබතුමා කියන පරිදි සැලකිල්ලට ලක් නොකළ යුතු ප්‍රමාණයක් නොවේ. ඒ පරීක්ෂණ වාර්තා අනුව නම්, එම ආසනික් ප්‍රමාණය සක්‍රිය ද්‍රව්‍යයක් ලෙස එම පළිබෝධ නාශකවල තිබෙන බව තමයි වාර්තා වී තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ රටක කරන ලද පරීක්ෂණ වාර්තාවල එවැනි සඳහනක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, එවැනි සඳහනක් තිබියදී, ඔබතුමාගේ අමාත්‍යාංශයේ යම් කාර්ය මණ්ඩලයක් විසින් ඊට පටහැනි තීරණයක් දෙනු ලබන්නේ කෙසේද?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ප්‍රශ්න දෙකක් ඇසුවා, වකුගඩු රෝගය සහ ආසනික් අතර ඇති සම්බන්ධය පිළිබඳව. මේ සම්බන්ධයෙන් නිශ්චිත තීරණයක් කිසිම විද්වතකු තවම ලබා දී නැහැ.

වකුගඩු රෝගය පිළිබඳව පැමිණිලි ලැබී තිබෙන්නේ, අනුරාධපුර දිස්ත්‍රික්කය ඇතුළු උතුරු මැද පළාතෙන්. නමුත් කෘෂි රසායනික භාවිතය හම්බන්තොට දිස්ත්‍රික්කය, මොනරාගල දිස්ත්‍රික්කය ඇතුළු සෑම දිස්ත්‍රික්කවලම පවතිනවා. නුවරඑළිය දිස්ත්‍රික්කයේ කෘෂි රසායනික භාවිතය අතිවිශාල වශයෙන් පවතිනවා. නමුත් ඒ දිස්ත්‍රික්කවලින් මේ රෝගය පිළිබඳ

වාර්තාවක් මේ වන තුරු අපට ලැබී නැහැ. එම නිසා මේ තර්කය පිළිබඳව විශාල පරස්පරයක්, ගැටුමක් තිබෙනවා. ඒක එක කාරණයක්. එම නිසා ඒ ගැන නිශ්චිත තීරණයක් දෙන්න කිසිම කෙනකුට තවම පුළුවන් වෙලා නැහැ. ඒ නිසා ඒ ගැන කථා කිරීමෙන් ඵලක් නැහැ.

ඊ ළඟට අනෙක් කාරණය වශයෙන් එතුමා කියනවා, මැලේසියාවේ විද්‍යාගාරයක කළ පරීක්ෂණයක් ගැන. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ පනත අනුව අපට නිශ්චිතව නියම කරලා තිබෙනවා, "මේ රජයේ මෙන්න මේ ආයතනවලින් පරීක්ෂා කරලා බලන්න" කියලා. එම ආයතනවලින් පරීක්ෂා කිරීම විතරයි අපි කරන්නේ. ඊට එහාට යන්න අපට අවශ්‍යතාවකුත් නැහැ. මොකද, අපේ රටේ ඉන්න විද්‍යාඥයින්ට මේ වාගේ සුළු පරීක්ෂණයක් කරලා නිශ්චිත තීරණයක් දීමේ හැකියාව ඉහටත් උඩින් තිබෙනවා කියන එකයි මම විශ්වාස කරන්නේ. ඒ වාගේම රජය පිළිගෙන තිබෙන්නේ එම ආයතනවලින් කරන්න කියලායි. එම ආයතනවලින් පරීක්ෂණ කළා, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ රසායනාගාරයෙන් පරීක්ෂණ කළා, රජයේ ප්‍රධාන රසායනාගාරයේ පරීක්ෂණ කළා, විශ්වවිද්‍යාල රසායනාගාරයේත් පරීක්ෂණ කළා, ඒ වාගේම කැලණිය විශ්වවිද්‍යාලයේදී සියලු දෙනාම ඉදිරියේ පරීක්ෂණයක් කළා. ඒ සියලුම වාර්තා පදනම් කරගෙන තමයි පළිබෝධ නාශක කමිටුව මඟින් අද මෙම තීරණය දීලා තිබෙන්නේ. එච්චරයි මට කියන්න තිබෙන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

## පිටරට තුළ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූප ගොඩනැඟීම : ප්‍රචාරක ආයතන
## வெளிநாடுகளில் இலங்கையின் பிரதிமையை மேம்படுத்தல் : விளம்பர நிறுவனங்கள்
## PROMOTING OF SRI LANKA'S IMAGE ABROAD : ADVERTISING FIRMS

1014/'10

5. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2)

(අ) (i) විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ශ්‍රී ලංකාව ලෝකය තුළ ප්‍රචාරණය කිරීම සඳහා යම් මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබේද;

(ii) එම මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) ඒ අනුව, එම වැඩසටහන සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ ප්‍රචාරණ ආයතන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ආයතන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ආයතන අතරින් "බෙල්පොටින්ජර්" නම් බ්‍රිතාන්‍ය සමාගමක් එම වැඩසටහන ප්‍රචාරණය සඳහා ඇතුළත්කරගෙන තිබේද;

(ii) ඔවුන්ගෙන් ලබා ගත් සේවාවන් කවරේද;

(iii) එම ආයතනය සඳහා ගෙවන ලද මුළු මුදල හා එක් එක් කාර්යය සඳහා ගෙවන ලද මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டு அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வெளிநாட்டு அலுவல்கள் அமைச்சின் ஊடாக இலங்கையின் புகழுருவை உலகில் பிரசாரம் செய்வதற்காக குறிப்பிட்ட ஒரு தொகைப் பணம் ஒதுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அப்பணத்தொகை எவ்வளவு என்பதையும்;

(iii) இதன் பிரகாரம் மேற்படி நிகழ்ச்சித்திட்டத்திற் காக கேள்விப்பத்திரங்களை முன்வைத்த பிரசார நிறுவனங்களின் எண்ணிக்கை எத்தனையென்ப தையும்;

(iv) அந்த நிறுவனங்கள் யாவையென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி நிறுவனங்களில் "பெல்பொடெஞ்சர்" எனும் பிரித்தானிய கம்பனியொன்று மேற்படி நிகழ்ச்சித்திட்டத்தின் பிரசாரத்திற்காக சேர்த்துக் கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அவர்களிடமிருந்து பெறப்பட்டுள்ள சேவைகள் யாவையென்பதையும்;

(iii) மேற்படி நிறுவனத்திற்குச் செலுத்தப்பட்ட மொத் தப் பணத்தொகையும் ஒவ்வொரு பணிக்காக செலுத்தப்பட்ட பணத்தொகைகளும் தனித்தனி யாக எவ்வளவென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of External Affairs :

(a) Will he state -

(i) whether a certain amount of money has been allocated for promoting Sri Lanka's image in the world through the Ministry of External Affairs ;

(ii) the amount of money so allocated ;

(iii) the number of advertising firms that submitted tenders for that programme, accordingly ; and

(iv) the names of those firms?

(b) Will he inform this House -

(i) whether the services of a British firm named 'Bell Pottinger' out of the firms referred to in (a) (iv) above, have been obtained for the above mentioned programme;

(ii) of the types of the services obtained from that firm ; and

(iii) separately of the total amount of money paid to that firm and the amount of money paid for each task?

(c) If not, why ?

**ගරු නියෝමාල් පෙරේරා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நியோமால் பெரேரா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Neomal Perera - Deputy Minister of External Affairs)

Hon. Deputy Speaker, on behalf of the Minister of External Affairs I answer Question No. 5.

(a) (i) The Ministry of External Affairs does not have a specific vote or financial provisions to undertake image-building activities abroad. However, on requests made by individual missions, the Ministry allocates funds on a case by case basis on their merits and justifications for image-building purposes. Funds for such promotional events have been allocated out of the annual budgetary provisions given to the Ministry. Besides such allocations, the Ministry encourages specialized Sri Lankan agencies such as the Sri Lanka Tourism Promotion Bureau - SLTPB -, Export Development Board - EDB -, Sri Lanka Tea Board - SLTB - , Board of Investment - BOI -, National Gem and Jewellery Authority, business chambers and the corporate sector to assist missions abroad in the form of funding, expertise and material with regard to promoting Sri Lanka's image and commercial interests abroad.

(ii) The total budgetary provisions allocated in the manner outlined in (a) (i) by the Ministry of External Affairs to the Sri Lanka Missions abroad for image-building activities carried out in their respective countries of accreditation for the period 1st January to 15th October, 2011 is Rs. 9,701,720.

(iii) Given the manner in which the funds have been allocated to Sri Lankan Missions abroad as referred to in (a) (i) above, the question of engaging advertising firms for promotional programmes does not arise.

(iv) Not applicable.

(b) (i) Does not arise.

(ii ) Does not arise.

(iii ) Does not arise.

(c ) Does not arise.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Are there any Supplementary Questions?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,මෙම වැඩසටහන් සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ ප්‍රචාරණ ආයතන සංඛ්‍යාව කොපමණද කියලා අහපුවාම, "does not arise" කියලා කියනවා. ටෙන්ඩර් අරගෙන තිබෙනවා නම් එම ආයතන කොච්චර සංඛ්‍යාවක් තිබෙනවාද, එම ආයතන මොනවාද කියලා කිව්වොත් හොඳයි කියන එකයි මම කියන්නේ. ඒ රුපියල් මිලියන 9 නිකම්ම පාවිච්චි කරලා නැහැ නේ. ඒ පිළිබඳව කියන්න කියලායි මම කියන්නේ.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

This has not come under tender procedure. Rupees nine million has been spent by 24 Missions for advertising and promotional events on a case by case basis. There was no basic requirement to spend that Rs. 9 million.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

Is there no procedure followed when you call for tenders?

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

We have not called for tenders.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

You can find anyone and give it?

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

When our Missions and institutions abroad ask funds for advertising, we allocate it on a case by case basis.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

You spend Rs. 9 million out of people's money and there is no procedure at all.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

Hon. Deputy Speaker, this Rs. 9 million has been spent by 24 Missions for the whole year. It was not for any specific job.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Supplementary Question No. 2.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒ ආයතන සංඛ්‍යාව කොපමණද, එම ආයතන මොනවාද කියලා කියන්නවත් ගරු නියෝජ්‍ය ඇමතිතුමාට බැරිද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුපියල් ලක්ෂ 90ක් වියදම් කරන කොට අඩුම තරමින් එම මුදල වියදම් කරන්නේ කොහොමද කියලා ක්‍රමවේදයක් තිබෙන්නට ඕනෑ. මොකද, මේවා ලංකාවේ ජනතාවගේ මුදල්. එක එක්කෙනාට ඕනෑ විධියට තෝරා ගෙන වැඩ කරන්න බැහැ. ඒ කරපු දේවල් ටික මොනවාද කියලා කරුණාකර කියන්න කියන එක තමයි මම කියන්නේ.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

Sir, we have spent this money on a miscellaneous account and not on a special project. We have spent Rs. 9 million for promotional activities of 24 Missions.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

Can you give me a list of the things that you have done with this Rs. 9 million?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

දෙවැනි අතුරු ප්‍රශ්නයද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒ මුදලින් කළේ මොකක්ද කියලා අපට කියන්න කියලායි මම කියන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ Rs. 9 million වලින් කරපු දේවල් මොනවාද කියලා අපට තොරතුරු දෙන්න කියලා කියන්න. රුපියල් ලක්ෂ 90ක් කියන්නේ කජු ඇට, කොස් ඇට නොවෙයි නේ.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

You have not asked for individual expenditure sheets.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

දැන් ඒ ප්‍රශ්නයට උත්තරයක් දෙන්නේ නැද්ද?

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

ඔබතුමා මේ ප්‍රශ්නයෙන් එහෙම එකක් අහලා නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මා මේ ප්‍රශ්නයෙන් බොහොම පැහැදිලිව අහලා තිබෙනවා,"එම මුදල් ප්‍රමාණය කොපමණද; ඒ අනුව, එම වැඩසටහන සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ ප්‍රචාරණ ආයතන සංඛ්‍යාව කොපමණද?" කියලා. මොකක් හෝ ආයතනයක් විසින් කොච්චර වියදම් කළාද, මොකක්ද කළේ කියන එක අපට කියන්න කියලායි කියන්නේ.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

We have not called for tenders for advertising. Hon. Deputy Speaker, on the individual requirement of any Mission, monies are allocated subject to approval from the Ministry.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

You have not called for tenders and the missions have unsolicited proposals. That is what you are doing. We know that.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මම අහනවා. යම් කිසි විධියකට විදේශ තානාපති කාර්යාල මඟින්- ලංකාවේ විදේශ අමාත්‍යාංශය ගැන නොවෙයි මම කියන්නේ- ලංකාව ගැන ප්‍රචාරණය කිරීම සඳහා මීට අමතරව මුදල් යොදා ගෙන තිබෙනවාද කියලා ඔබතුමාට කියන්න පුළුවන්ද?

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මේ වෙන් කිරීමට අමතරව කර ගෙන නැහැ?

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්න අංක 6. සුනිල් හඳුන්නෙත්ති මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තුන්වැනි අතුරු ප්‍රශ්නය අහනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

තුන්වැනි අතුරු ප්‍රශ්නය ඇහුවා. කමක් නැහැ, අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Deputy Minister, could you please tell us whether "Bell Pottinger" is still servicing the Government of Sri Lanka?

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

As far as the Ministry is concerned, we do not have any dealings with such a company.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Are you seriously saying that you did not meet with Tim Ryan?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්න අංක 6. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

Our Ministry has not awarded any tenders or signed any contracts.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

But, the Hon. Minister answered in Parliament that Rs. 120 million was spent in UK in this regard. How can your policy -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්න අංක 7. ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අනේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔබතුමා මේකත් censor කරනවා නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

No, the Hon. Deputy Minister gave the Answer. I am not censoring. I have allowed you to ask about four or five Supplementary Questions.

## දයාවතී හෙට්ටිආරච්චි මහත්මියගෙන් අත් පත් කර ගත් ඉඩම : වන්දි මුදල

## திருமதி தயாவதி ஹெட்டியாரச்சியிடமிருந்து சுவீகரிக்கப்பட்ட காணி: நட்டஈடு

## LAND ACQUIRED FROM MRS. DAYAWATHIE HETTIARACHCHI : COMPENSATION

1278/'11

7. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය -(1) :

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෝපගොඩ "සුරම්‍යා" හි පදිංචි දයාවතී හෙට්ටිආරච්චි මහත්මියට අයත් මාරඹ, පෙද්දපිටිය උතුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි, වලකන්දවත්ත නැමති තේ වගා ඉඩමේ පර්චස් හතරක පමණ ප්‍රමාණයක මීට වර්ෂ 10කට පෙර වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ජල විද්‍යා අංශය මඟින් නිල්වලා ගඟේ ජල මිනුම් කටයුතු සඳහා යැයි පවසමින් කුලුනක් ඉදිකර ඇති බවත්;

(ii) මේ දක්වා එම කුලුනින් කිසිදු ප්‍රයෝජනයක් ගෙන නොමැති බවත්;

(iii) කුලුන ඉදිකිරීම සඳහා අත්පත්කර ගත් ඉඩම වෙනුවෙන් මේ දක්වා ඉඩම හිමිකාරියට වන්දි මුදලක් හෝ බදු මුදලක් ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ජල මිනුම් කුලුනෙහි කටයුතු අතර මග නවතා දැමීමට හේතු කවරේද;

(ii) අත් පත් කර ගත් ඉඩම වෙනුවෙන් දයාවතී මහත්මියට වන්දි මුදලක් ගෙවීමට හෝ ඉදිකිරීම් කටයුතු සිදු නොකරන්නේ නම්, ඉඩම නැවත ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) වන්දි මුදලක් ලබා දෙන්නේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தின் அக்குரஸ்ஸ பிரதேச செயலாளர் பிரிவில் போபகொட "சுரம்யா" இல்லத்தில் வதியும் திருமதி தயாவதி ஹெட்டியா ரச்சிக்குச் சொந்தமான மாரம்ப பெத்தபிட்டிய - வடக்கு கிராம உத்தியோகத்தர் பிரிவிலுள்ள வலகந்தவத்த எனும் தேயிலைப் பயிர்செய்கைக் காணியில் பத்து வருடங்களுக்கு முன்னர் சுமார் நான்கு பர்சஸ் அளவிலான காணித்துண் டொன்றில் நீர்ப்பாசனத் திணைக்களத்தின் நீரியல் பிரிவினால் நில்வலா கங்கையின் நீர் அளவைப் பணிகளுக்கெனக் கூறி ஒரு கோபுரம் அமைக்கப்பட்டுள்ளதென்பதையும்;

(ii) இற்றைவரை மேற்படி கோபுரத்திலிருந்து எவ்வித பயனும் பெற்றுக்கொள்ளப்படவில்லை என்பதையும்;

(iii) இக்கோபுரத்தை அமைப்பதற்காகச் சுவீகரிக்கப் பட்ட காணிக்கு எவ்வித நட்டஈடோ அல்லது குத்தகைப் பணமோ இதுவரை உரிமையாள ருக்கு வழங்கப்படவில்லை என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) நீர் அளவைக் கோபுரத்தின் நடவடிக்கைகளை இடைநடுவே நிறுத்தியமைக்கான காரணம் யாதென்பதையும்;

(ii) சுவீகரிக்கப்பட்ட காணிக்காக திருமதி தயாவதிக்கு நட்டஈட்டினைச் செலுத்துவதற்கு அல்லது நிர்மாணப் பணிகள் இடம்பெறாத பட்சத்தில் இக்காணியை மீளப்பெற்றுக் கொடுப் பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iii) நட்டஈடு வழங்கப்படுமாயின் அத்தொகை யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources Management:

(a) Is he aware that -

(i) a tower has been erected by the Hydrology Division of the Department of Irrigation purportedly, for water gauging activities of the Nilwala river on a four-perch area of the tea land known as Walakandawatta, in the Maramba Peddapitiya North Grama Niladhari Division belonging to Mrs. Dayawathie Hettiarachchi of "Suramya", Bopagoda in the Akuressa Divisional Secretary's Division in the Matara District, 10 years ago;

(ii) this tower has not been used for any purpose so far; and

(iii) no compensation or lease rental has been paid to the owner of this land for acquiring the land to erect the tower ?

(b) Will he inform this House-

(i) the reasons that led to the suspension of the activities of this water gauge tower;

(ii) whether action will be taken to pay compensation to Mrs. Dayawathie for the land that has been acquired or give the land back to her if the construction work is not carried out; and

(iii) if compensation is paid, what amount is it?

(c) If not, why?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) දනිමි.

(ii) දනිමි.

(iii) දනිමි.

ශ්‍රී ලංකාවේ සියලුම ගංගාවල දිනපතා ජල මිනුම් ගැනීම වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් කරනු ලබයි. මෙසේ ලබා ගන්නා ජල මිනුම් දිවයිනේ ජල සම්පත් කළමනාකරණ කටයුතු සඳහා අත්‍යවශ්‍ය දත්තයක් වේ. ප්‍රශ්නයට අදාළ මෙහි සඳහන් ස්ථානය නිල්වලා ගඟේ ජල මිනුම් ගැනීම සඳහා ජල විද්‍යාත්මක වශයෙන් වඩාත්ම යෝග්‍ය ස්ථානයක් විය. ඒ අනුව 1930 වසරේ සිට 2010 නොවැම්බර් 30 දින දක්වාම මෙම ස්ථානයේදී නිල්වලා ගඟේ ජලයේ මිනුම් ලබා ගෙන ඇත.

2004 වසරේ එවකට පැවති රජය විසින් පිහිටුවනු ලැබූ ජල කළමනාකරණ කවුන්සිලය යටතේ ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘතියක් අනුව මෙහි ජල මිනුම් ගැනීම වඩාත් විධිමත්ව සිදු කිරීම සඳහා නවීන උපකරණ සවි කිරීම පිණිස ගඟ දෙපස කුළුනු දෙකක් ඉදි කරන ලදී.

කුළුනු ඉදි කරන ලද්දේ ගඟ දෙපැත්තේ වූ පෞද්ගලික ඉඩම් තුළිනි. පැවති සාමාන්‍ය ක්‍රමවේදය අනුව ප්‍රාදේශීය ලේකම්ගේ තක්සේරු වටිනාකම අනුව එක් පසෙකට වර්ග මීටර් 63ක් (පර්චස් 2.5ක්) සඳහා බදු මුදල් ගෙවීමට තීරණය වූ අතර, දෙපසම ඉඩම් අයිතිකරුවන්ගේ එකඟතාව මත කුළුනු ඉදි කරන ලදී. එසේම ඉවත් කිරීමට සිදු වූ සියලුම ගස් හා වගාවන් සඳහා රජයේ තක්සේරු මුදල ගෙවා ඇත. පසුව පැවති රජය වෙනස් වීම හේතුවෙන් ජල කළමනාකරණ කවුන්සිලය අහෝසි වීමෙන් ව්‍යාපෘතිය නතර විය.

එහෙත්, මෙහි කටයුතු පවත්වාගෙන යාමේ අවශ්‍යතාවක් පවතී.

(ආ) (i) ඉදිකිරීම් අවසන් වීමෙන් අනතුරුව බදු මුදල් ගෙවීමේදී වම් ඉවුරේ ඉඩම් අයිතිකරු බදු මුදලින් සෑහීමට පත් වූ නමුත්, ගැටලුව ඉදිරිපත් කරනු ලබන දකුණු ඉවුරේ ඉඩම් අයිතිකරු වන දයාවතී හෙට්ටිආරච්චි මහත්මිය බදු මුදල ප්‍රමාණවත් නොමැති බව පවසමින් විරෝධය පළ කරන ලදී. ඒ අනුව මෙම ඉඩම් කොටස රජයට පවරා ගැනීමට කටයුතු කොට 38 (අ) වගන්තිය යටතේ භුක්තිය භාර ගෙන ඇත. එබැවින් දැනට ඉතිරි වී ඇත්තේ රජයේ තක්සේරු වටිනාකම ගෙවීම සඳහා කටයුතු කිරීමයි. ඒ සඳහා අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා දැනුම් දී ඇත.

ඉඩම් අයිතිකරු විසින් දිගින් දිගට ජල මිනුම් ගැනීමට බාධා ඇති කිරීම හා අසල්වාසීන් නොමඟ යවමින් ආරවුල් ඇති කිරීම හේතුවෙන් මෙම ස්ථානයේ අනාරක්ෂිත තත්ත්වයක් උදා වී ඇත. එබැවින් ජල මිනුම් ගැනීම 2010 නොවැම්බර් මස සිට වෙනත් ස්ථානයකට තාවකාලිකව ගෙන ගොස් ඇත.

(ii) ජල විද්‍යාත්මක වශයෙන් මෙම ස්ථානයේ පවතින වැදගත්කම හේතුවෙන් ඉදිරියේදී ස්වයංක්‍රීය ජල මිනුම් ස්ථානයක් ලෙස හෝ පවත්වාගෙන යෑමේ අවශ්‍යතාවක් පවතී. එබැවින් අත් පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කොට ඉඩම විධිමත්ව පවරා ගත යුතුව ඇත.

(iii) රජයේ තක්සේරු වටිනාකම ගෙවීමට කටයුතු කරමි.

(ඇ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ස්තුතිය පුද කරන්න කැමැතියි, ගරු අමාත්‍යතුමා මේ ප්‍රශ්නයට බොහොම අංග සම්පූර්ණ පිළිතුරක් ලබා දීම පිළිබඳව.

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙසේයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අමාත්‍යතුමාගේ දීර්ඝ විස්තර කිරීම තුළ සඳහන් වුණා, නිල්වලා ගඟ ඉතා වැදගත් ස්ථානයක් කියා. ඒක ඇත්ත. නිල්වලා ගඟ පටන් ගන්නා ස්ථානයේ උස මීටර් 1050යි. මේ ස්ථානයේ උස මුහුදු මට්ටමේ ඉඳලා මීටර් 12යි. කිලෝ මීටර් 36ක් ඇතුළත ගඟ එක්වරම මීටර් 1038ක් පහළට වැටෙනවා. මේ ස්ථානයේ වටිනාකමේ තත්ත්වය ගරු අමාත්‍යතුමා සහ අමාත්‍යාංශය අවබෝධ කර ගෙන ඉන්නවා නම්, 2004 ඉඳන් අවුරුදු 7ක් ගතවෙලා තිබෙන මොහොතක මේ අයට සාධාරණ වන්දි මුදලක් දීලා මේ ස්ථානය නිරවුල් කර ගැනීමට ඇයි අමාත්‍යාංශය කඩිනම් පියවරක් ගන්නේ නැත්තේ?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කී පරිදි වම් ඉවුරේ අයට දෙන ලද වන්දි මුදලින් වම් ඉවුරේ එක්කෙනා සෑහීමට පත් වුණා. නමුත් දකුණු ඉවුරේ ඉන්න හෙට්ටිආරච්චි මහත්මිය එයින් සෑහීමට පත් වන්නේ නැතුව අපට කරදර කරන්න පටන් ගත්තා. ඒ නිසා අපි නීත්‍යානුකූලව ඒ ඉඩම පවරා ගැනීමේ කටයුතු කර තිබෙනවා. රජයේ නීතිරීති අනුව අපට ගෙවන්න පුළුවන් වන්නේ ප්‍රධාන තක්සේරුකරු තක්සේරු කරන වන්දි මුදල් ප්‍රමාණය පමණයි. ප්‍රධාන තක්සේරුකරුට අවශ්‍ය කරුණු ඉදිරිපත් කළාම ඒ අනුව අපි වන්දි මුදල ගෙවනවා. ඒ වන්දි මුදලින් සෑහීමකට පත් වෙන්නේ නැත්නම් ඔබතුමාගේ ඒ ආදරණීය හෙට්ටිආරච්චි මහත්මියට පුළුවන් වන්දි තක්සේරු මණ්ඩලයට කෙළින්ම අභියාචනයක් ඉදිරිපත් කරන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි. මට ඇමතිතුමා කියන විධියට තේරෙන්නේ, දැන් මේ වන්දියේ විෂමතාවක් පිළිබඳ කරුණක් පැන නැඟිලා තිබෙන නිසා ඇමතිතුමන්ලාට කරදර කරන නිසා මේක ප්‍රමාද වනවාය කියන කාරණයයි. අපි දන්නවා සාමාන්‍යයෙන් පාරවල්වලට අත් පත් කර ගැනීම්, වෙනත් පොදු කටයුතුවලට අත් පත් කර ගැනීම්වලදී ඇමතිතුමාට කරදර කළා කියලා වැඩ නවත් වන්නේ නැහැ, වැඩේ කරනවා කියලා. ඇමතිතුමාට සහ අමාත්‍යාංශයට කරදර කළත් මේ වැඩේ කොහොම හරි ඇමතිතුමා කරයි. වැඩේ ඉක්මන් කරලා පොඩි වන්දියක් දුන්නොත් කරදරය ඉක්මනට නතර වෙයි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
අපි වන්දි තක්සේරු කිරීමට දැන් ප්‍රාදේශීය ලේකම්තුමාට ඉදිරිපත් කරලා තිබෙනවා. ඔබතුමා ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට ගිහිල්ලා ප්‍රාදේශීය ලේකම්තුමාව ටිකක් උනන්දු කළොත් හොඳයි. අපිත් ඒ කටයුත්ත කරන්නම්. එතකොට එතුමියට ඉක්මනින් වන්දිය ලබා දෙන්න අපිට පුළුවන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මේකයි. [බාධා කිරීම්]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
හොයන්න අවස්ථාවක් ලැබුණේ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නයත් දයාවති සම්බන්ධවද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඔව්, ඔව්. [බාධා කිරීමක්]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඔබතුමාත් එක්ක එකතු වෙලා research එකක් කරන්න වෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමා පිළිගන්නවා ඇති එක පැත්තක වන්දිත් ගෙවලා තිබෙද්දී, දැන් කුලුනු දෙකේම වැඩ අත හැරලා දාලා, මේ වන කොට කාර්යාලයත් වසා දමලා එතැන හිටපු සේවකයොත් වෙනත් ස්ථානවලට මාරු කරලා තිබෙන බව. දැන් ඒ සේවකයෝ යළි මෙතැනට ගෙනැල්ලා, ඒක ස්ථාපිත කරලා, අර වන්දි දීපු පැත්තෙන්වත් මේ වැඩේ පටන් අරගෙන, මේ කටයුත්තට මුල පුරන්න බැරිද? මොකද, මම මේ ළඟදී ගියා. ඒකයි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු මන්ත්‍රීතුමනි, දැන් නවීන තාක්ෂණය තිබෙනවා. නවීන තාක්ෂණයට අනුව සමහර ස්ථානවල ස්වයංක්‍රීයව ජල මැනුම කරන්න පුළුවන්. මගේ ඉන්ජිනේරු නිලධාරින්ගෙන් මට උපදෙස් ලැබිලා තිබෙන්නේ එතැන ස්වයංක්‍රීය ජල මිනුම් මධ්‍යස්ථානයක් බවට පත් කිරීම තමයි වඩාත් යෝග්‍ය කියලා. නමුත් ඉඩම් පවරා ගැනීම අවශ්‍ය වෙනවා. අපි ඉඩම් පවරා ගෙන ඉඩමට වන්දි ගෙවනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
දයාවතී හෙට්ටිආරච්චි මහත්මියට ඔබතුමාව හමුවන්න අමාත්‍යාංශයට එන්න කිව්වොත් මේ ප්‍රශ්නය කථා කරලා විසඳන්න පුළුවන්ද?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
නැහැ, නැහැ. ඔබතුමා හමු වුණාම ඇති.

## මහ බැංකුව සතු රත්‍රන් ප්‍රමාණය : විස්තර
### மத்திய வங்கிக்குச் சொந்தமான தங்கம் : விபரம்
### GOLD IN POSSESSION OF CENTRAL BANK : DETAILS

1620/'11

8. **ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) වර්ෂ 2010 ජූනි මාසය වන විට මහ බැංකුව සතුව තිබූ රත්‍රන් ප්‍රමාණය කොපමණද;

(ii) වර්ෂ 2010 ජූනි සිට 2011 ජූනි දක්වා මිලදී ගත් හා අලෙවි කළ රත්‍රන් තොග ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් අවස්ථාවේදී රත්‍රන් මිලදී ගත් ආකාරය කවරේද;

(iv) එක් එක් අවස්ථාවේදී අළෙවි කරන ලද රත්‍රන් ප්‍රමාණයන්හි මිල ගණන් කවරේද;

(v) රත්‍රන් අළෙවි කිරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010ஆம் ஆண்டு ஜூன் மாதமளவில் மத்திய வங்கிக்கு சொந்தமாயிருந்த தங்கத்தின் அளவு எவ்வளவு;

(ii) 2010ஆம் ஆண்டு ஜூன் முதல் 2011ஆம் ஆண்டு ஜூன் வரை கொள்வனவு செய்யப்பட்ட மற்றும் விற்பனை செய்யப்பட்ட தங்கத்தின் அளவு வெவ்வேறாக எவ்வளவு;

(iii) தங்கம் கொள்வனவு செய்யப்பட்ட ஒவ்வொரு சந்தர்ப்பத்திலும் அவை கொள்வனவு செய்யப் பட்ட விதம் யாது;

(iv) ஒவ்வொரு சந்தர்ப்பத்திலும் விற்பனை செய்யப் பட்ட தங்கத்தின் விலைகள் யாது;

(v) தங்க விற்பனையின் பொருட்டு பின்பற்றப்பட்ட நடைமுறை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he inform this House-

(i) the amount of gold that was in possession of the Central Bank as at June 2010;

(ii) separately of the amount of gold stocks purchased and sold from June 2010 up to June 2011;

(iii) the manner in which gold was purchased, on each of the occasions it was purchased;

(iv) the prices at which gold was sold at each occasion; and

(v) the procedure followed in selling the gold?

(b) If not, why ?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) වර්ෂ 2010 ජූනි මස අවසානයේදී සන්තකයේ තිබූ රත්‍රන් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 17.34 යි. (ට්‍රෝයි අවුන්ස 557,480 යි.)

(ට්‍රෝයි අවුන්ස 1= ග්‍රෑම් 31.1034768 )

(ii) වර්ෂ 2010 ජූනි සිට 2011 ජූනි 30 දක්වා මිලදී ගෙන විකුණනු ලැබූ රත්‍රන් තොග ප්‍රමාණය :

| **මිලදී ගනු ලැබූ තොග** මෙට්‍රික්ටොන් | **විකුණනු ලැබූ තොග** මෙට්‍රික් ටොන් |
|---|---|
| 51.01 | 52.39 |
| (ට්‍රෝයි අවුන්ස 1,640,102.65) | (ට්‍රෝයි අවුන්ස 1,684,333.25) |

(iii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ස්වකීය සංචිත කළමනාකරණ මෙහෙයුම්වල කොටසක් වශයෙන් ජාත්‍යන්තර වෙළෙඳ පොළ තුළ රත්‍රන් මිලට ගෙන අලෙවි කරනවා. හොඳම ජාත්‍යන්තර පරිචයන් පිළිපදිමින් හා තරගකාරී මිල ගණන් ලබා ගැනීමෙන් පසු ඒ හා සමාන පිළිගත් ජාත්‍යන්තර ප්‍රතිපාර්ශ්වයන් සමඟ මෙම රත්‍රන් වෙළෙඳ ගනුදෙනු තථ්‍ය කාල පදනම මත සිදු කරනු ලබනවා. ඒ අනුව ජාත්‍යන්තර වෙළඳ පොළ තුළ රත්‍රන්වල වෙළෙඳ පොළ මිල ගණන් වාසිදායක වන විට දී එවැනි බලයලත් ප්‍රතිපාර්ශ්වයන් හරහා රත්‍රන් මිලදී ගෙන තිබෙනවා.

(iv) සංචිත කළමනාකරණ කටයුතුවල කොටසක් වශයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2010 ජූනි 1 සිට 2011 ජූනි 30 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ට්‍රෝයි අවුන්ස එකක් ඇමෙරිකානු ඩොලර් 1,168 සිට ඇමෙරිකානු ඩොලර් 1,555 දක්වා පරාසයක් තුළ මිලකට රත්‍රන් අලෙවි කර ඇති අතර එමගින් ඇමෙරිකානු ඩොලර් මිලියන 195.75 ක ලාභයක් උපයා තිබෙනවා.

(v) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලාභ ඉපයීම උදෙසා, ලෝක වෙළෙඳ පොළේ මිල සංචලනයන් සැලකිල්ලට ගෙන හොඳම ජාත්‍යන්තර පරිචයන් පිළිපදිමින්, ස්වකීය පිළිගත් ප්‍රතිපාර්ශ්වයන් හරහා රත්‍රන් අලෙවි කරනු ලබනවා.

(ආ) පැන නොනඟී.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියූ පරිදි මේ වර්ෂයට අදාළව රත්‍රන් මෙට්‍රික් ටොන් 51ක් මිලදී ගෙන තිබෙනවා, 52.3ක් විකුණා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙට්‍රික් ටොන් 52.3ක් කියන්නේ මූල්‍යමය වශයෙන් ගත්තොත් විශාල අගයක්. ඒ විකිණීම සඳහා ඔබතුමා අනුගමනය කරන්නේ වෙළඳ පොළේ සිදු වන උච්චාවචනයන් සැලකිල්ලට ලක් කරමින් ඔබතුමන්ලාගේ විශ්වාසවන්ත ගැනුම්කරුවන්ට ලබා දීමයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක තමයි අපේ රටේ සිදු වෙලා තිබෙන විශාලතම ගනුදෙනුව. ඒ ගනුදෙනුව කිරීමේදී විශ්වාසවන්ත පුද්ගලයන් සහ වෙළඳ පොළේ උච්චාවචනයක් පමණක් නොවෙයි සැලකිල්ලට ලක් කළ යුතු වන්නේ. එය විකිණීම සඳහා ඔබතුමන්ලා අනුගමනය කළ යුතුයි මීට වඩා විනිවිද භාවයෙන් යුතු ක්‍රමවේදයක්. නමුත් කිසිදු ටෙන්ඩර් කැඳවීමකින් තොරව තමයි මෙය විකුණා දමා තිබෙන්නේ. ටෙන්ඩර් කැඳවීමකින් තොරව එසේ විකුණා දැමීමට අදහස් කළේ කුමක් නිසාද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
*(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)*
(The Hon. Gitanjana Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පටිපාටිය අනුගමනය කරන්නේ 1970 සිටයි. 1996 සිට තොග මිලදී ගැනීම සහ වෙළඳ පොළේ මැදිහත් වීම අනුගමනය කිරීම එලෙසම ගමන් කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මෙය අද ඊයේ දෙයක් නොවෙයි. ඔබ එය පිළිගන්නවා ඇති. මුදල් මණ්ඩලයේ අනුමැතියට යටත්ව තමයි මේ සියලු දේ කෙරෙන්නේ කියන එක අපි මතක් කරලා දෙන්නට ඕනෑ. ඔබගේ දැන ගැනීම සඳහා සෑම මාසයකම ලබා ගත් සහ විකුණුම් මිල ගණන් සියල්ල සඳහන් ලියවිලි මම **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද ලියවිලි:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணங்கள் :*
*Documents tabled:*

Gold Trading Operations at Central Bank of Sri Lanka

As per the current Reserves Management Guideline of Central Bank of Sri Lanka (CBSL), it is allowed to maintain 3 to 20 percentages of the Foreign Reserves in gold. As in other foreign reserves assets CBSL is actively engaged in gold trading to make profits depending on the world market prices. Selection of authorized institutions (counterparty) to trade in gold is done based on the financial soundness, past track records and credit ratings of those institutions to see whether counterparties are in a position to perform their financial obligations. The criteria to select counterparties, has been set out in the counterparty selection guideline, which is a Foreign Reserves Management Committee and Monetary Board approved document.

Central Bank is involved in gold transactions since late 1970s and commenced trading activities in gold in early 1990s. Gold is traded in the international markets, similar to other currencies such as Euro, Sterling Pound transactions. Therefore, dealings staff assigned for gold trading, buy and sell gold depending on market prices with strict adherence to the Reserves Management Guidelines.

**The total quantity of gold held by CBSL in troy ounces with values**

| Year ending | Gold Quantity (Troy Ounces) | Gold Value (USDMn) | Gross Official Reserves (USD Mn) | Gold as a % of Gross Official Reserves |
|---|---|---|---|---|
| 2011 Oct | 304,936 | 523.34 | 6,982.6 | 7% |
| 2010 | 345,359 | 486.52 | 6,610.2 | 7% |
| 2009 | 678,050 | 741.48 | 5,097.0 | 15% |
| 2008 | 105,902 | 92.06 | 1,753.4 | 5% |
| 2007 | 152,580 | 128.59 | 3,062.5 | 4% |

Confiscated Gold

Over the years, CBSL purchased confiscated gold from Sri Lanka Customs after having it analyzed by the Government Analyst. All such confiscated gold (mostly in the form of jewelry, coins, bars, etc.) as well as items such as bars and coins that were remaining from the retail sale outlets after their closure were sent for refining in three batches as given in the table below. Each batch was refined into London Good Delivery bars of 0.999 fineness (i.e. investment gold), and was added to the CBSL's investment gold as stated below. After the deregulation of gold imports in 1999, Sri Lanka Customs does not sell confiscated gold to the Central Bank.

| Batch | Description | Date sent for refining | Refiner | Quantity sent for refining (troy ounce) | Quantity of refined gold received (troy ounces) | Comments |
|---|---|---|---|---|---|---|
| 01 | Gold purchased from Sri Lanka Customs | 06/08/2003 | Johnson Matthey UK | 26,178.63 | 26,025.67 | Added to CBSL's gold reserves |
| 02 | Gold and jewelry items acquired under emergency regulation between 1990 and 1992 | 15/11/2004 | UBS Zurich | 1,944.99 | 1,567.84 | Refining charges were set of against gold. An amount of Rs. 73.6 mn, being the rupee value of refined gold received by CBSL, was transferred to the DST's account in Dec 2004. |
| 03 | Gold imported for gold shops of CBSL | 04/12/2007 | Johnson Matthey Canada | 3,512.92 | 3,226.42 | Refined gold was added to the CBSL's reserves and US$ 180,784 was received from the refiner for some silver items and coins, which could not be refined. The USD amount was also added to the CBSL's foreign reserves. |

| | Month | Gold Purchase | | Gold Sale | | No of Transactions |
|---|---|---|---|---|---|---|
| | | Qtyin Troy Ounces | Avg.Price in USD | Qty in Troy Ounces | Avg.Price in USD | (both buying & selling) |
| 2011 | Jan | 372,189.92 | 1,362.32 | 124,000.00 | 1,368.99 | 74 |
| | Feb | 36,499.97 | 1,343.94 | 212,085.13 | 1,371.26 | 36 |
| | Mar | 42,500.00 | 1,415.50 | 85,522.57 | 1,425.40 | 35 |
| | Apr | 106,504.45 | 1,479.55 | 21,746.11 | 1,465.93 | 16 |
| | May | 189,016.03 | 1,499.28 | 165,397.90 | 1,512.00 | 64 |
| | Jun | 68,500.00 | 1,514.90 | 38,500.00 | 1,536.81 | 30 |
| | Jul | 41,500.00 | 1,498.26 | 295,865.60 | 1,565.27 | 47 |
| | Aug | 14,000.00 | 1,721.57 | 104,091.07 | 1,726.60 | 15 |
| | Sep | 222,074.33 | 1,707.04 | 18,000.00 | 1,713.31 | 40 |
| | Oct | 18,000.00 | 1,635.75 | 86,000.00 | 1,682.13 | 28 |
| | | **1,110,784.70** | **1,535.09** | **1,027,208.38** | **1,555.41** | **385** |

Price movement and Reserves level of Gold is depicted in attached graphs.




**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේවා කාටද ලබා දුන්නේ කියන එකත් සඳහන් වෙලා තිබෙනවාද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
නැහැ. ඒ table එක තිබෙනවා. ඕක වෙනම ප්‍රශ්නයකින් අහන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. 2010 ජූනි මාසය ආරම්භ වන විට මෙට්‍රික් ටොන් 17.34ක් තිබිලා තිබෙනවා. මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, එල්ටීටීඊ සංවිධානය සතුව තිබී මහ බැංකුව වෙත ලබා ගන්නවා යැයි කියා දිගින් දිගටම ප්‍රකාශ කරන ලද -මට මතකයි එක විටකදී රූපවාහිනී නාලිකාවල විශාල ප්‍රමාණයක් පෙන්වූවා- රත්‍රන් ප්‍රමාණයත් මීට ඇතුළත්ද, ඒ ප්‍රමාණය කොපමණද කියා. ඒ කියන්නේ 2010 ජූනි මාසය වන විට මහ බැංකුව සතුව තිබුණු මෙට්‍රික් ටොන් 17.34 තුළ එල්ටීටීඊ සංවිධානයෙන් අත් පත් කර ගන්නා ලද රත්‍රන් කොපමණ ප්‍රමාණයක් තිබුණාද කියා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ සඳහා වෙනම ප්‍රශ්නයක් යොමු කරන්නය කියා මා කියනවා. මහ බැංකුව සතු රත්‍රන් පිළිබඳවයි මේ ප්‍රශ්නයෙන් උත්තර දුන්නේ. මීට පෙර රේගුව විසින් අත් පත් කර ගත් රත්‍රන් ප්‍රමාණයන් අරගෙන ඒවා ශුද්ධ කරලා නැවත මේ සංචිතයට එකතු කර තිබෙනවා. ත්‍රස්තවාදී ක්‍රියාදාමයන් තුළ 1989-90 කාල පරිච්ඡේදයේදී ලබා ගත් රත්‍රන් ප්‍රමාණයනුත් එලෙසම ශුද්ධ කරලා මහ බැංකුව වෙත නැවත ලබා ගැනීමට කටයුතු කර තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ප්‍රමාණය කොපමණද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ප්‍රමාණය සඳහන් ලියවිල්ල මම සභාගත කරන්නම්, ඔබතුමාගේ දැන ගැනීම සඳහා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය මුදල් ඇමතිතුමනි, ඔබතුමා දුන් පිළිතුර අනුව මම මේ අවස්ථාවේදී අහන්නේ මුදල් අමාත්‍යාංශයට ආයෝජන මණ්ඩලය පවරා ගෙන ඒ තුළින්, සභාපතිවරයා පත් කරන්න ඇමතිතුමාට තිබෙන අවස්ථාව ජනාධිපතිතුමා වෙත ලබා ගන්න කටයුතු කරන්න යනවාද කියායි. කවදා ඉඳන්ද ඒක කරන්නේ කියන එක ගැන අපව දැනුවත් කරන්න පුළුවන්ද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා හැමදාම එක්කෝ කිලිනොච්චියේ යන එකට මැදවච්චියේ යනවාය කියා පටලවා ගන්නවා; එහෙම නැත්නම් අලිමංකඩ යන එකට පාමංකඩ යනවාය කියා පටලවා ගන්නවා. අද මහ බැංකුව ගැන අහලා ආයෝජන මණ්ඩලය ගැන අහනවා. මෙය අදාළ නැත. ස්තුතියි.

## 2011 වර්ෂය සඳහා නිවාස ව්‍යාපෘති : වෙන් කළ මුදල
### 2011ஆம் ஆண்டுக்கான வீடமைப்புத் திட்டங்கள்: பண ஒதுக்கீடு
### HOUSING PROJECTS FOR 2011: MONEY ALLOCATED

1015/'10

9. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) 2011 වර්ෂය සඳහා ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය යටතේ නිවාස ඉදිකිරීම් සඳහා වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

[ගරු දයාසිරි ජයසේකර මහතා]

(ii) එම මුදලින් ග්‍රාමීය නිවාස, රජයේ නිවාස හා මහල් නිවාස ඉදි කිරීම සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණයන්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත නිවාස ව්‍යාපෘති සඳහා විවිධ රටවල්වලින් ණය හෝ ආධාර ලබා දී තිබේද;

(ii) එසේ නම්, ණය හෝ ආධාර ලබා දුන් රටවල් සහ එක් එක් රටෙන් ලබා දුන් මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிர்மாணத்துறை, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2011ஆம் ஆண்டுக்காக நிர்மாணத்துறை, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சின்கீழ் வீடுகளை நிர்மாணிப்பதற்காக ஒதுக்கப்பட்டுள்ள மொத்தப் பணத்தொகை எவ்வளவு என்பதையும்;

(ii) இந்தப் பணத்தொகையில் கிராமிய வீடுகள், அரசாங்க வீடுகள், மாடிவீடுகள் என்பவற்றை நிர்மாணிப்பதற்காக ஒதுக்கப்பட்டுள்ள பணத் தொகை வெவ்வேறாக எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்கூறிய வீடமைப்புத் திட்டங்களுக்குப் பலதரப்பட்ட நாடுகளிலிருந்து கடன் அல்லது நிதி உதவிகள் கிடைத்துள்ளதா என்பதையும்;

(ii) அவ்வாறெனின் கடன் அல்லது நிதி உதவிகளை வழங்கிய நாடுகள் மற்றும் வழங்கப்பட்ட பணத் தொகை வெவ்வேறாக எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Construction, Engineering Services, Housing and Common Amenities:

(a) Will he state-

(i) the total amount of money allocated to construct houses in the year 2011 under the Ministry; and

(ii) separately, of the amounts allocated to construct rural houses, government houses and flats out of the above amount?

(b) Will he state-

(i) whether aid or loans have been provided by various countries for the above housing projects; and

(ii) if so, the countries that provided aid or loans and the amounts provided by each country separately?

(c) If not, why?

**ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) භාණ්ඩාගාරය රුපියල් මිලියන 1,710කි.

වෙනත් මූල්‍ය ප්‍රතිපාදන රුපියල් මිලියන 8,611කි. ඒ අනුව දෙකෙහිම එකතුව රුපියල් මිලියන 10,321කි.

(ii) ග්‍රාමීය හා අර්ධ නාගරික නිවාස රුපියල් මිලියන 816.72

මහල් නිවාස ඉදි කිරීම රුපියල් මිලියන 578.98

නිවාස ආශ්‍රිත කටයුතු සඳහා රුපියල් මිලියන 314.30

(ආ) (i) නැත.

(ii) අදාළ නැත.

(ඇ) අදාළ නැත.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ 2011 වර්ෂය සඳහා ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය යටතේ නිවාස ඉදි කිරීම සඳහා වෙන් කර ඇති මුදල එතුමා කිව්වා, රුපියල් මිලියන 10,321ක් කියලා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 1,710යි, වෙනත් මූල්‍ය ප්‍රතිපාදන රුපියල් මිලියන 8,611යි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඔව්, ඒක තමයි මා කියන්නේ. ඔක්කොම එකතු කළාම රුපියල් මිලියන 10,321යි. එතකොට ඒකෙන් ග්‍රාමීය නිවාසවලට රුපියල් මිලියන 816යි, මහල් නිවාස සඳහා රුපියල් මිලියන 578යි එකතු කළාම රුපියල් මිලියන 10,321න් ඉතිරි ටික කොහේටද යන්නේ කියන එකයි මම අහන්නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු මන්ත්‍රීතුමනි, පැරණි මහල් නිවාස නවීකරණය සඳහාත් රුපියල් මිලියන එක්දහස් ගණනක මුදලක් අප වෙන් කරලා තිබෙනවා. ඒ අනුව මාළිගාවත්ත සොයිසා ෆ්ලැට්ස් ඇතුළු සර්පන්ටයින් මහල් නිවාස යෝජනා ක්‍රමය වැනි නිවාස යෝජනා ක්‍රම නවීකරණය කෙරෙනවා. ඒ වාගේම සාමාන්‍යයෙන් නිවාස අධිකාරිය යටතේ තිබෙන මහල් නිවාස යෝජනා ක්‍රමවල පොදු කටයුතු පවත්වා ගෙන යාම සඳහාත් මුදල් ප්‍රතිපාදන වෙන් වෙලා තිබෙනවා. මේ සියල්ලෙහිම එකතුව තමයි ඔය ඉදිරිපත් කළේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය නිකුත් කළ පොතේ- [බාධා කිරීමක්] ඔව්. එහි එතුමන්ලා පැහැදිලිව -ඔබතුමාට මේක ලැබුණාද, ඔබතුමා මේ සම්බන්ධව දන්නවාද කියලා මා දන්නේ නැහැ- නිවාස ඉදි කිරීම සම්බන්ධව සඳහන් කර තිබෙනවා, දිවයින පුරා වාර්ෂිකව නිවාස ඒකක ලක්ෂයක් බැගින් 2020 දක්වා ඉදි කරන්නට අවශ්‍ය කටයුතු ටික ලෑස්ති කරනවාය කියලා. ඒ විතරක් නොවෙයි. කොළඹ පැල්පත් නිවාස ඉදි කිරීමට අවශ්‍ය රුපියල් බිලියන 10ක අරමුදල්, ණයකර නිකුත් කිරීම මඟින් නාගරික සංවර්ධන අධිකාරියට ලබා ගෙන තිබෙනවාය කියලාත් සඳහන් කර තිබෙනවා. ඒ අනුව කොලොන්නාව, සාලමුල්ල, දෙමටගොඩ ප්‍රදේශවල පැල්පත්වාසීන්ට නිවාස ඒකක 2,100ක් හදන්න කටයුතු කරනවාය කියලාත් මේ පොතේ සඳහන් කරලා තිබෙනවා. ඉතින් මා අහන්න කැමැතියි, ඒ නිවාස හදන එක ඔබතුමාට අයිති වැඩ පිළිවෙළක් නොවෙයිද කියලා. මොකද මේ අනුව ගත්තාම මේ 816යි, 578යි එකතු කළාම ඉතාම කුඩා ප්‍රමාණයක්. මේ පොතේ සඳහන් නිවාස ලක්ෂයත් එක්ක ගත්තාම ලංකාවේ මේ අවුරුද්දට කොච්චර නිවාස සංඛ්‍යාවක් ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ හදන්නට බලාපොරොත්තු වනවාද කියලා බලන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ඔබතුමා ඒ ගැන සොයා බලන්න උනන්දු වීම ගැන මා සතුටු වනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඔබතුමාට වන අසාධාරණය අපි දකින නිසා-

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ඇත්ත වශයෙන්ම.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඇමතිතුමා උත්තර දෙන්න. දැන් වෙලාව පස්වරු 2.10යි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

නැහැ, මම මේ කිව්වේ -

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

නැහැ, ඔබතුමා කියපු එක මට පැහැදිලියි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

නිවාස ලක්ෂයක් හදනවා කිව්වාට එතුමාට හදන්න දෙන්නේ නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

මම උත්තර දෙන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

නිවාස ඇමතිතුමා අසරණයි. ඒකයි මම කියන්නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

නැහැ, කිසි අසරණකමක් නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

දැන් වෙලාව පස්වරු 2.15යි. ගරු මන්ත්‍රීතුමාගේ සහ ගරු ඇමතිතුමාගේ සහයෝගය ඉල්ලනවා-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒ නිසාම ආණ්ඩුවට වැඩි බලයක් දෙන්න හොඳ නැහැයි කියලා එතුමා කියනවා. එතුමා කියන එක හොඳයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු ඇමතිතුමනි, දෙවන අතුරු ප්‍රශ්නයට පිළිතුර දෙන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මම කියන එක ඊයේ පත්‍රයේ තිබුණා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

නැහැ, නැහැ, නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඔව්, ඔව්. ඊයේ "ලංකාදීප" පත්‍රයේ තිබුණා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා අහපු ප්‍රශ්නයට පිළිතුර මෙසේයි. කොළඹ අග නාගරික ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පදිංචිකරුවන් විධිමත් මහල් නිවාස පද්ධතියකට ගෙන ඒමේ ව්‍යාපෘතිය නාගරික සංවර්ධන අධිකාරියෙන් ආරම්භ කර තිබෙනවා. ඒක අපි මේ අමාත්‍යාංශය භාර ගන්නා අවස්ථාවේදීම ගත්ත තීරණයක්. ඒ අනුව ඒක සිදු වනවා. ඒ

[ගරු විමල් වීරවංශ මහතා]

වාගේම අපේ අමාත්‍යාංශය මඟින් පමණක් නොවෙයි, මේ නිවාස වැඩසටහන් ක්‍රියාත්මක වන්නේ. ධීවර අමාත්‍යාංශයෙන් ධීවර ජනතාවගේ නිවාස වැඩසටහනක් කෙරෙනවා. බොහෝ වැඩසටහන්වලට අපේ අමාත්‍යාංශය තාක්ෂණික දායකත්වය දෙනවා. ඒ කටයුතු කිරීමේ දී අවශ්‍ය සහයෝගය දෙනවා. ඒ වාගේම සමෘද්ධිය හරහා යම්කිසි සාමාන්‍ය නිවාස වැඩ පිළිවෙළක් යනවා. නිවාස කියන විෂය අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන එක ඇත්ත. නමුත් අපට මේ විෂයය එක තැනකට විතරක් පටු කරන්න බැහැ. ඒක විවිධ අමාත්‍යාංශ, ආයතන තම තමන්ගේ මට්ටමින් කර ගෙන යනවා. අපි කරන්නේ මේකේ ප්‍රධාන වැඩ කොටස ඉටු කරන එකයි. සාමාන්‍යයෙන් ඒක එහෙම තමයි වෙන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය. [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තුන්වැනි අතුරු ප්‍රශ්නය ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා අහනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමාගෙන් මම තුන්වැනි අතුරු ප්‍රශ්නය හැටියට මෙසේ අහන්න කැමැතියි. මම උපදේශක කාරක සභාවේදීත් මේ ප්‍රශ්නය මතු කළා. ඒ තමයි ආහාර මුද්දරලාභීන්ගෙන් කපා දැමූ නිවාස ණය, වසර ගණනාවකට පස්සේ නැවත වරක් එකතු කිරීමේ ක්‍රියාවලිය අදටත් ක්‍රියාත්මක වනවා. ඒක සත්‍ය කාරණාවක්. ඔබතුමා ඒ ගැන ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද කියලා මම අහන්න කැමැතියි. මොකද, විශේෂයෙන්ම මම කියන්න කැමැතියි, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට පත් කර තිබෙන නිලධාරිතුමන්ලාගේ අද වගකීම වෙලා තිබෙන්නේ නිවාස සංගණනය කරන එක, ගෙවල් හදලා දෙන එක නොවෙයි. අර අවුරුදු ගණනාවකට ඉස්සර වෙලා කපා හැරපු ණය මුදල් එකතු කරනවා, එහෙම නැත්නම් ඒ අයට නඩු දමනවා කියලා බල කිරීම් කරනවා. මම නැවත වරක් ඔබතුමාගේ අවධානය යොමු කරවනවා මේ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්න කියලා. මේ පාර්ලිමේන්තුවේ බහුතර මන්ත්‍රීවරුන් ඉන්න ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශවල මෙය බොහොම බැරෑරුම් ප්‍රශ්නයක්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ඔය ප්‍රශ්නය අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේදීත් මතු කළා. ඒ අවස්ථාවේ ඔබතුමාට පැහැදිලි කළා එක් අවස්ථාවකදී පමණක් ආහාර මුද්දරලාභීන්ගේ තිබුණු නිවාස ණය කපා හැරලා සෙවන අරමුදලින් ඒ මුදල පියවා තිබුණු බව. සෙවණ අරමුදලෙනුත් කරන්නේ නිවාස ආධාර දෙන එක. හැබැයි සෙවණ අරමුදලේ සල්ලි පාවිච්චි කරලා ඒ හිඟය පියවලා ආහාර මුද්දර ලාභීන්ගේ නිවාස ණය කපා දමලා තිබුණා. අපි දැන් නැවත අය කිරීම් කරන්නේ ඒ කපා දමාපු අයගේ ණය නොවෙයි. නමුත් නිසි පරිදි ණය නොගෙවන ලද විශාල පිරිසක් රටේ ඉන්නවා. ඒ අයගෙන් ඒ ණය අය කර ගත්තොත් තමයි වැඩි නිවාස ප්‍රමාණයක් ඉදි කර දෙන්න හැකියාව නිවාස අධිකාරියට ලැබෙන්නේ. මම ඒ නිසා පිළිගන්නේ නැහැ, ආහාර මුද්දර ලාභීන්ගේ කපා දමාපු ණය නැවත අය කරනවාය කියන එක. කිසියම් හෝ තැනක මොනවා හෝ විශේෂ හේතුවක් නිසා ඒ වාගේ වැරැද්දක් වෙලා තිබෙනවා නම් නිශ්චිතව ඔබතුමා මට ඒක පෙන්නුවොත් ඒක නිවැරදි කරන්න පුළුවන්. නැතිව පොදු වශයෙන් එහෙම වෙන්නේ නැහැ.

## එස්.ටී.කේ. ජයවීර මහතාගේ නිවසට සිදු වූ හානිය : වන්දි
## திரு. எஸ்.ரி.கே. ஜயவீரவின் சேதமடைந்த வீடு : நட்டஈடு
## DAMAGED HOUSE OF MR. S.T.K. JAYAWEERA : COMPENSATION

1280/'11

11. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, "දර්ශන" කප්පරතොට ලිපිනයෙහි පදිංචි එස්. ටී. කේ. ජයවීර මහතාගේ නිවසට සහ ගෘහ භාණ්ඩවලට 2004.12.26 දින ඇති වූ සුනාමිය නිසාවෙන් හානි සිදු වී ඇති බවත්;

(ii) එම හානිය වෙනුවෙන් වන්දි මුදලක් හෝ නව නිවසක් ලබා දෙන මෙන් ඒ මහතා විසින් වර්ෂ හයකට ආසන්න කාලයක් තිස්සේ අදාළ අංශ වෙත ඉල්ලීම් කළද මේ දක්වා එය ඉටු නොවීමෙන් ඔහු දැඩි ලෙස අසරණ වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) හානියට පත් ඔහුගේ නිවස ප්‍රතිසංස්කරණය කර ගැනීම සඳහා වන්දි මුදලක් හෝ වෙනත් ස්ථානයකින් නව නිවසක් ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගත වන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

அனர்த்த முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தின் வெலிகம பிரதேச செயலாளர் ஆளுகைப் பிரதேசத்தில் "தர்சன" கப்பரதொட்ட எனும் முகவரியில் வதியும் திரு. எஸ்.ரி.கே. ஜயவீரவின் வீட்டுக்கும், வீட்டுத் தளபாடங்களுக்கும் 2004.12.26 ஆம் திகதி ஏற்பட்ட சுனாமியின் காரணமாகச் சேதம் ஏற்பட்டது என்பதையும்;

(ii) இச்சேதத்திற்காக நட்டஈட்டுத் தொகையினையோ புதிய வீடொன்றையோ பெற்றுத் தருமாறு இவர் சுமார் ஆறு வருடங்களாக சம்பந்தப்பட்ட பிரிவுகளிடம் கோரிக்கை விடுத்தாலும் இதுவரையிலும் அது நிறைவேற்றப்படவில்லை என்பதால் இவர் கடும் நிர்க்கதி நிலைக்கு உள்ளாகியுள்ளார் என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) சேதத்திற்கு உள்ளான இவரது வீட்டை மறுசீரமைப்பதற்காக நட்டஈட்டுத் தொகையினை அல்லது வேறொரு இடத்தில் புதிய வீடொன்றை பெற்றுக் கொடுப்பதற்கு நடவடிக்கை எடுப்பரா என்பதையும்;

(ii) ஆமெனில், இதற்கு எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Disaster Management:

(a) Is he aware that-

(i) the house and furniture belonging to Mr. S.T.K. Jayaweera residing at "Darshana", Kapparathota in the Weligama Divisional Secretary's Division of Matara District have been damaged due to the tsunami that occurred on 26.12.2004;

(ii) he has been rendered utterly helpless as his requests for compensation or a new house to compensate for the damage have not been met even though he has referred those requests to the relevant authorities for a period of nearly six years?

(b) Will he inform this House-

(i) whether measures will be taken to provide him with compensation to repair his damaged house or a new house from another location; and

(ii) if so, the time frame required to do that?

(c) If not, why?

**ගරු මහින්ද අමරවීර මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Disaster Management)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මෙම නිවස සුනාමියෙන් හානි වූවක් නොවේ.

(ii) අදාළ නොවේ.

(ආ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

අතුරු ප්‍රශ්න. ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න ඉතාම කෙටියෙන් අහලා සහයෝගය ලබා දෙන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත් මට සාධාරණ වෙලාවක් ලබා දෙන්න. මම එහෙම කරන්නේ නැහැනේ. ඔබතුමා දන්නවානේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක තමයි මේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කරන සූදුව. දැන් ඒ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිවරයා මේ කියන පුද්ගලයාගේ නිවස සුනාමියට හසු වුණු බවට ලිඛිතවම දුන්නු වාර්තා දෙකක් තිබෙනවා. මා ගරු ඇමතිතුමාට මේ ලිපි එවන්නම්. ඒ වාගේම එවකට හිටපු ප්‍රාදේශීය ලේකම් ඒ.ඩබ්ලිව්. සරත් මහත්මයා සහතික කර තිබෙනවා, මේ නිවස සුනාමියට හසු වුණාය කියලා. සුනාමිය සිදු වූ 2004 දෙසැම්බර් 26වැනි දා ඉඳලා දැනට අවුරුදු හතක් ගත වෙලා තිබෙනවා. දැන් ප්‍රාදේශීය ලේකම්වරයා වරින්වර කියනවා, මේ නිවස සුනාමියට හසු වුණේ නැහැයි කියලා. මේ ලියුම් ටික මා ඇමතිතුමාට එවන්නම්. ඔබතුමාට මේ ලියුම් ටික බැලුවොත් පෙනේවි, මීට කලින් හිටපු ප්‍රාදේශීය ලේකම්වරයාත්, ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිවරයාත් අවස්ථා කිහිපයකදීම මේ පුද්ගලයාගේ නිවස සුනාමියට හසු වුණාය කියලා කියා තිබෙන බව. මෙතැනදී ලොකු අසාධාරණයක් මේ පුද්ගලයාට සිදුවෙලා තිබෙනවා. මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ කරුණාකර, මේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දෙන වාර්තා මත පමණක්ම පදනම් වෙලා උත්තරයක් දෙන්නේ නැතිව, ඔබතුමාත් සුනාමි ව්‍යසනය සිදු වූ ප්‍රදේශයකට අදාළ දිස්ත්‍රික්කයක් නියෝජනය කරන නිසා මේ ගැන සානුකම්පිතව බලා මැදිහත් වීමක් කරන්නය කියලායි.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට යම් ගෙවීමක් කරන්න හෝ අඩු ගණනේ ඒ පිළිබඳව සාකච්ඡාවක් හෝ කරන්න සිද්ධ වන්නේ දිසාපති, ප්‍රාදේශීය ලේකම් දෙන වාර්තාත් එක්කයි. මොකද, මෙම අමාත්‍යාංශයේ සම්පූර්ණ කටයුතු අපි සිදු කරන්නේ දිසාපතිවරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ. ඉතින් දිසාපතිවරයා ප්‍රාදේශීය ලේකම් සමඟ තොරතුරු විමසීමෙන් අනතුරුව, පැහැදිලිවම මට වාර්තා කරලා තිබෙනවා, මෙම නිවසට සුනාමියෙන් හානි වී නොමැති බවත්, පැරණි වීම නිසා ස්වාභාවික හේතු මත විනාශ වී ඇති බවත්. ඉතින් එහෙම වාර්තාවක් එව්වාට පස්සේ අපට මේ පිළිබඳව තවදුරටත් කටයුතු කරන්න හැකියාවක් නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

දෙවන අතුරු ප්‍රශ්නය.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ඉන්න ප්‍රාදේශීය ලේකම්වරයා එහෙම කියනවා. හැබැයි මේ සිද්ධියෙන් පස්සේ එවකට හිටපු ප්‍රාදේශීය ලේකම්වරයා -ගරු ඇමතිතුමනි, මම ඔය පැත්තට එවාපු ලියුම්වල එය සඳහන් වනවා.- ලියාපු ලියුමට ග්‍රාම නිලධාරිවරයාත් නිර්දේශයක් කරලා තිබෙනවා. ඔය ඉංග්‍රීසි ලියුමේ රෝස පාටින් highlight කරලා තිබෙන ටික බලලා ඒ එක්කම ලිපියේ අනෙක් පැත්ත බලන්න. ගරු ඇමතිතුමනි, ඒ ප්‍රාදේශීය ලේකම්වරයාත්, ග්‍රාම නිලධාරිවරයාත් පිළිගන්නවා මේ ප්‍රදේශය සුනාමියට හසු වුණාය කියලා. එතකොට බලන්න, මේ නිලධාරින් මාරුවීම නිසා සුනාමිය සිදුවෙලා අවුරුදු හතක් ගිහිල්ලාත් මේ පුද්ගලයාට සුනාමි ව්‍යසනයට අදාළ සහනය ලැබෙන්නේ නැතිව වාගේම, "මේ පුද්ගලයා සුනාමියට හසු වුණු ප්‍රදේශයට කිසි සේත්ම සම්බන්ධ නැහැ, මේ නිවස අබලන් වුණු නිසා මෙසේ වුණා" ය කියලායි දැන් කියන්නේ. ඔය ලිපියේම නිර්දේශ කරලා තිබෙනවා, සුනාමියට හසු වුණු ප්‍රදේශයේයි මේ නිවස තිබෙන්නේ කියලා. මේක ලොකු අසාධාරණයක්. මේකෙන් වෙන්නේ මේ මනුෂ්‍යයින් අන්තිමට සමාජයට වෛරක්කාරයෝ පිරිසක් බවට පත් වීමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා මා ඔබතුමාට කියනවා මේ ගැන විශේෂ පරීක්ෂණ මණ්ඩලයක් යවලා හරි මැදිහත් වෙන්නය කියලා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මට එවාපු 2007.07.27 දිනැති ලියුමේම සඳහන් වෙලා තිබෙනවා, "... පදිංචි ජයවීර යන අයගේ නිවස සුනාමි උවදුරට ලක්ව ඇති මීටර 100 - 60 සීමාව තුළ පිහිටා ඇත. මේ අය සුනාමි ව්‍යසනයෙන් වන්දි, ආධාර මුදල් ලබා නොගත් අතර, දීර්ඝ කාලයක් සුනාමියෙන් පසු නිවස අබලන් තත්ත්වයේ පැවතීම නිසා හානි වී ඇත." කියලා. එහෙමයි මේකෙත් තිබෙන්නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
නැහැ, නැහැ. පළමුවැනි ලියුම බලන්න. 2005 ලියුම. පළමුවැනි පිටුව.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඒකෙත් නැහැ. ඒකෙත් සටහන් කරලා

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
එහි තිබෙනවා ගරු ඇමතිතුමනි. එහි highlight marker එකකින් රෝස පාටින් ලකුණු කරලා තිබෙන කොටස බලන්න.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඒක තමයි. එහි කියලා නැහැ. ප්‍රාදේශීය ලේකම් සහ දිසාපතිවරයාගේ වාර්තා නැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
තිබෙනවා. පළමුවැනි ලියුමේ පිටුපස තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එළියට ගියාම තමයි මේ ගැන පෙන්වන්න වෙන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමන්ලා දෙදෙනා එළියේදී ඔය සම්බන්ධයෙන් සාකච්ඡා කර ගන්න. දැන් වෙලාව පස් වරු 2.20යි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමාට මැදිහත් වෙලා මේ ගැන සොයා බලන්න කියන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා මැදිහත් වෙලා සාකච්ඡා කරන්න. ගරු මන්ත්‍රීතුමා ගිහින් ගරු ඇමතිතුමා හමු වෙන්න.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මම ඒ පිළිබඳව ඔබතුමාත් එක්ක සාකච්ඡා කරන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
එම ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්න අවසන්.

ප්‍රශ්න අංක 12-1621/'11-(1), ගරු අනුර දිසානායක මහතා. ගරු සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப் பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන වටය. ප්‍රශ්න අංක 3, ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා. ප්‍රශ්නය අහනවාද? [බාධා කිරීමක්] Order, please!

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අස්වර් මන්ත්‍රීතුමා නිසා කථා කරන්න බැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

## 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා වැය කළ මුදල : විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය

## 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிச் செலவினம்: தொலைத்தொடர்புகள், தகவல் தொழில்நுட்பவியல் அமைச்சு

MONEY SPENT ON DEYATA KIRULA EXHIBITION 2011: MINISTRY OF TELECOMMUNICATION AND INFORMATION TECHNOLOGY

1225/'11

3. **ගරු අනුර දිසානායක මහතා - (ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවට)**
(மாண்புமிகு அநுர திஸாநாயக்க - கௌரவ சுனில் ஹந்துன்னெத்தி சார்பாக)
(The Hon. Anura Dissanayake on behalf of the Hon. Sunil Handunnetti)
විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මඟින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්යය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම් ඒ මන්ද?

தொலைத்தொடர்புகள், தகவல் தொழிநுட்பவியல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிக்காக தொலைத் தொடர்புகள், தகவல் தொழில்நுட்பவியல் அமைச்சு செலவிட்டுள்ள மொத்தப் பணத்தொகை எவ்வளவு என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) அமைச்சின் ஒவ்வொரு நிறுவனம் மற்றும் திணைக்களத்தினால் மேற்படி கண்காட்சிக்காக மேற்கொள்ளப்பட்ட செலவு தனித்தனியே எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி திணைக்களங்கள் மற்றும் நிறுவனங்க ளினால் ஆற்றப்பட்ட பணிகள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு பணிக்காகவும் செலவிடப் பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்

அவர் தனித்தனியாக குறிப்பிடுவாரா?

(இ) கடந்த வரவு செலவுத் திட்டத்தில் மேற்படி செலவினத் துக்காக அமைச்சின் எந்த செலவுத் தலைப்பின் கீழ் நிதி ஒதுக்கப்பட்டிருந்தது என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Telecommunication and Information Technology:

(a) Will he state the total amount of money spent by the Ministry of Telecommunication and Information Technology on the "Deyata Kirula" exhibition in 2011?

(b) Will he state-

(i) separately, the expenditure borne by each institution and department of the Ministry on that exhibition;

(ii) the functions carried out by those institutions and departments; and

(iii) separately, the amount of money spent on each of those functions?

(c) Will he state the Head of Expenditure of the Ministry, out of which funds were allocated from the last Budget for the above-mentioned expenses?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) රු. දසලක්ෂ 252.1යි.

i. සංවර්ධන වැඩසටහන සඳහා - රු. දසලක්ෂ 250.4

ii. ප්‍රදර්ශනය සඳහා - රු. දසලක්ෂ 1.7

(ආ) (i) (අ) ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය - රු. දසලක්ෂ 8.8

i. සංවර්ධන වැඩසටහන සඳහා - රු. දසලක්ෂ 7.8

ii. ප්‍රදර්ශනය සඳහා - රු. දසලක්ෂ 1

(ආ) ශ්‍රී ලංකා ටෙලිකොම් (PLC) සමාගම - රු. දසලක්ෂ 243.3

i. සංවර්ධන වැඩසටහන සඳහා - රු. දසලක්ෂ 242.6

ii. ප්‍රදර්ශනය සඳහා - රු. දසලක්ෂ 0.7

(ii) (අ) ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA)

| | ඉටු කරන ලද කාර්යය | පිරිවැය |
|---|---|---|
| 1. | මොනරාගල දිස්ත්‍රික්කයේ සියලුම ජනතාවගේ උප්පැන්න, විවාහ සහ මරණ සහතික පිටපත් පරිගණකගත කොට ක්ෂණිකව නිකුත් කිරීමට කටයුතු යෙදීම. | රු. දසලක්ෂ 5කි. |
| 2. | දිස්ත්‍රික්යේ පිහිටි නැණසල ග්‍රාමීය තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානවල අඩු පාඩු සකස් කිරීම හා නැණසල ක්‍රියාකරුවන් දැනුවත් කිරීම. | රු. දසලක්ෂ 0.5කි. |
| 3. | මොනරාගල දිස්ත්‍රික්කයේ අඩු පහසුකම් සහිත පාසල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පරිහරණය සඳහා පරිගණක යන්ත්‍ර පරිත්‍යාග කිරීම. | රු. දසලක්ෂ 2කි. |
| 4. | මානව සම්පත් කළමනාකරණ පිරිවැය. | රු. දසලක්ෂ 0.3කි. |

(ආ) ශ්‍රී ලංකා ටෙලිකොම් (PLC) සමාගම

| | ඉටු කරන ලද කාර්යය | පිරිවැය |
|---|---|---|
| 1. | මොනරාගල නගර සීමාව තුළ පිහිටුවා ඇති දුරකථන කුලුනු හා රැහැන් නැවත ස්ථානගත කිරීම. | රු. දසලක්ෂ 7.4කි. |
| 2. | මොනරාගල දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධනයට සමගාමීව ශ්‍රී ලංකා ටෙලිකොම් ජාල පද්ධතිය නැවත ප්‍රතිස්ථාපනය කිරීම. | රු. දසලක්ෂ 8.1කි. |
| 3. | දැයට කිරුළ ප්‍රදර්ශන භූමියේ දුරකථන රැහැන් පද්ධතිය සකස් කිරීම. | රු. දසලක්ෂ 0.4කි. |
| 4. | වැල්ලවාය ප්‍රදේශයේ නව සම්බන්ධතා සඳහා නව බෙදා හැරීමේ මධ්‍යස්ථාන 15ක් පිහිටුවීම හා වැල්ලවාය-මොනරාගල මාර්ගයේ කිලෝමීටර 05ක රැහැන් නැවත සකස් කිරීම. | රු. දසලක්ෂ 5.4කි. |

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

| | | |
|---|---|---|
| 5. | මොනරාගල-පොතුවිල් මාර්ගයේ කිලෝමීටර 07ක රැහැන් ජාලය සැකසීම හා ප්‍රතිසංස්කරණය කිරීම, නව බෙදුම් පොළවල් 10ක් පිහිටුවීම. | රු. දසලක්ෂ 3.6කි. |
| 6. | මොනරාගල-බිබිල මාර්ගයේ කිලෝමීටර 07ක රැහැන් ජාලය නැවත සකස් කිරීම හා බෙදා හැරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම. | රු. දසලක්ෂ 1.1කි. |
| 7. | මොනරාගල අනෙකුත් මාර්ගවල රැහැන් ජාලය නැවත සකස් කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම, නව සම්බන්ධතා සඳහා නව බෙදා හැරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම. | රු. දසලක්ෂ 2.5කි. |
| 8. | මොනරාගල හා වැල්ලවාය මාර්ගයේ කිලෝමීටර 07ක රැහැන් ජාලය නැවත සකස් කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම. | රු. දසලක්ෂ 8.1කි. |
| 9. | දැයට කිරුළ භූමියේ නව බෙදා හැරීමේ මධ්‍යස්ථාන 20ක් පිහිටුවීම. | රු. දසලක්ෂ 2.2කි. |
| 10. | මොනරාගල නගරයේ නව ටෙලිෂොප් ආයතනයක් පිහිටුවීම. | රු. දසලක්ෂ 3.0කි. |
| 11. | 13 MSANN හා ද්විතීක රැහැන් එළීම. | රු. දසලක්ෂ 194.8කි. |
| 12. | මධ්‍යම සංස්කෘතික අරමුදල සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ අනුග්‍රාහක දායකත්වය | රු. දසලක්ෂ 6.0කි. |

(ඇ) මෙම අමාත්‍යාංශය යටතේ ප්‍රදර්ශනයට සම්බන්ධ වූ ආයතන දෙකම රාජ්‍ය සමාගම්ය. රාජ්‍ය සමාගම් මඟින් දරනු ලබන වියදම් අය වැය ලේඛනයේ අමාත්‍යාංශ වැය ශීර්ෂවලට ඇතුළත් නොවේ.

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිතායතනය හා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම යන ආයතනවල ව්‍යාපෘති සඳහා වෙන්ව ඇති මුදලින් දැයට කිරුළ සංවර්ධන වැඩසටහනට ආයෝජනය කර ඇති අතර එම ආයතන දෙකේ මාධ්‍ය හා ප්‍රචාරක කටයුතු සඳහා වෙන්ව ඇති මුදල් ප්‍රදර්ශනයේ වියපැහැදම් සඳහා ලබා ගෙන ඇත.

(ඈ) පැන නොනඟී.

## 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා වැය කළ මුදල : ක්‍රීඩා අමාත්‍යාංශය

### 2011 `தேசத்துக்கு மகுடம்" கண்காட்சிச் செலவினம்: விளையாட்டுத்துறை அமைச்சு

### MONEY SPENT ON DEYATA KIRULA EXHIBITION 2011: MINISTRY OF SPORTS

1227/’11

**6. ගරු අනුර දිසානායක මහතා (ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවට)**

(மாண்புமிகு அநுர திஸாநாயக்க - கௌரவ சுனில் ஹந்துன்னெத்தி சார்பாக)

(The Hon. Anura Dissanayake on behalf of the Hon. Sunil Handunnetti)

ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ක්‍රීඩා අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මඟින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්යය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම් ඒ මන්ද?

விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2011 `தேசத்துக்கு மகுடம்" கண்காட்சிக்காக விளையாட்டுத்துறை அமைச்சு செலவிட்டுள்ள மொத்தப் பணத்தொகை எவ்வளவு என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) அமைச்சின் ஒவ்வொரு நிறுவனம் மற்றும் திணைக்களத்தினால் மேற்படி கண்காட்சிக்காக மேற்கொள்ளப்பட்ட செலவு தனித்தனியே எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி திணைக்களங்கள் மற்றும் நிறுவனங்களினால் ஆற்றப்பட்ட பணிகள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு பணிக்காகவும் செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்

அவர் தனித்தனியாக குறிப்பிடுவாரா?

(இ) கடந்த வரவு செலவுத் திட்டத்தில் மேற்படி செலவினத்துக்காக அமைச்சின் எந்த செலவுத் தலைப்பின் கீழ் நிதி ஒதுக்கப்பட்டிருந்தது என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Sports:

(a) Will he state the total amount of money spent by the Ministry of Sports on the "Deyata Kirula" exhibition in 2011?

(b) Will he state-

(i) separately, the expenditure borne by each institution and department of the Ministry on that exhibition;

(ii) the functions carried out by those institutions and departments; and

(iii) separately, the amount of money spent on each of those functions?

(c) Will he state the Head of Expenditure of the Ministry, out of which funds were allocated from the last Budget for the above-mentioned expenses?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) මුළු මුදල රු.4,575,787.96

(ආ) (i)

| | | |
|---|---|---|
| ක්‍රීඩා අමාත්‍යාංශය | රු. | 2,020,618.55 |
| ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | රු. | 1,685,252.50 |
| ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය | රු. | 443,211.19 |
| ක්‍රීඩා වෛද්‍ය ආයතනය | රු. | 426,705.72 |
| සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය | රු. | 00.00 |

(ii) එක් එක් ආයතනය විසින් ඉටු කරන ලද කාර්යයන්

<u>ක්‍රීඩා අමාත්‍යාංශය</u>

| *අංකය* | *කරන ලද කාර්යයන්* |
|---|---|
| 01. | ප්‍රදර්ශන වැඩ කටයුතු සැලසුම් කිරීම |
| 02. | අනෙකුත් ආයතන සම්බන්ධීකරණය කිරීම |
| 03. | ප්‍රදර්ශන කුටි නිර්මාණය කිරීම |

<u>ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය</u>

| *අංකය* | *කරන ලද කාර්යයන්* |
|---|---|
| 01. | සැලසිනේ ආයතනය මඟින් ක්‍රීඩා පුහුණුව පිළිබඳ වාර්තා වැඩසටහන් 03ක් නිෂ්පාදනය කර ප්‍රදර්ශනය කිරීම. |
| 02. | ප්‍රදර්ශනය සඳහා ඩිජිටල් පුවරු සැකසීම. |
| 03. | ප්‍රදර්ශනය සඳහා අත් පත්‍රිකා මුද්‍රණය කිරීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. |

<u>ක්‍රීඩා වෛද්‍ය ආයතනය</u>

| *අංකය* | *කරන ලද කාර්යයන්* |
|---|---|
| 01. | ප්‍රදර්ශනය සඳහා අත් පත්‍රිකා මුද්‍රණය කිරීම. |
| 02. | ක්‍රීඩා වෛද්‍ය විෂයට අදාළ මිනිත්තු 10 වාර්තා වැඩසටහනක් නිර්මාණය කිරීම. |
| 03. | ජෛව්‍ය යාන්ත්‍රණ මූලික මූලධර්ම පිළිබඳ වැඩසටහන ඉදිරිපත් කිරීම. |
| 04. | ප්‍රර්ශන කුටි සැදීම. |

<u>සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය</u>

| *අංකය* | *කරන ලද කාර්යයන්* |
|---|---|
| 01. | අධිකාරියේ පවතින ක්‍රීඩා මණ්ඩප, ගොඩනැඟිලි හා ක්‍රීඩාංගණයන්හි ඡායාරූප ප්‍රදර්ශනය කිරීම. |
| 02. | විද්‍යුත් කාලසනක පද්ධතිය සහ එහි විශේෂත්වය පිළිබඳව - ඡායාරූප හා භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම. |
| 03. | විද්‍යුත් මිනුම් මාපක - පිටියේ ඉසව් මැනීම සඳහා නව තාක්ෂණය යටතේ මිනුම් ක්‍රියාත්මක කරන ආකාරය විදහා දැක්වීම. |
| 04. | කෘත්‍රිම ක්‍රීඩාංගණයේ පසු බිම පිළිබඳ දැනුවත් කිරීම - ක්‍රීඩාංගණය ඉදි කිරීම සඳහා යොදා ගන්නා අමු ද්‍රව්‍ය ප්‍රදර්ශනය කිරීම. |
| 05. | එළිමහන් ක්‍රීඩාංගණ යටතේ ඇති ක්‍රීඩා භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම. |
| 06. | ආයතනයේ පවතින පහසුකම්, නවීන උපකරණ හා ක්‍රීඩා තරග නීති රීතීන් පිළිබඳ වාර්තාමය වැඩසටහන් පුළුල් තිරයේ ප්‍රදර්ශනය කිරීම. |

<u>ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව</u>

| *අංකය* | *කරන ලද කාර්යය* |
|---|---|
| 01. | හැඳුනුම්පත් නිකුත් කිරීම් කටයුතු. |
| 02. | ප්‍රදර්ශන කුටි අධීක්ෂණය. |
| 03. | සංවිධාන කටයුතු හා ප්‍රදර්ශන භූමියේ වොලිබෝල් හා දැල් පන්දු ක්‍රීඩා පිටි සැකසීම. |
| 04. | දැයට කිරුළ ජාතික කබඩි ක්‍රීඩා දැල් පන්දු, වොලි බෝල් හා පාපැදි තරගාවලියක් සංවිධානය කර පැවැත්වීම හා ජයග්‍රාහකයින්ට ත්‍යාග පිරිනැමීම. |
| 05. | ක්‍රීඩා භාණ්ඩ බෙදා දීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. |

(iii) එක් එක් ආයතනය මඟින් ඉටු කරන ලද කාර්යයන් සඳහා දරන ලද වියදම්.

ක්‍රීඩා අමාත්‍යාංශය - කුටි නිර්මාණය සඳහා - රු. 2,020,618.55

<u>ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය</u>

| *අංකය* | *කරන ලද කාර්යයන්* | | *වියදම* |
|---|---|---|---|
| 01. | සැලසිනේ ආයතනයට වාර්තා වැඩසටහන් 03ක් සඳහා ගෙවා ඇති මුදල | රු. | 349,391.75 |
| 02. | ප්‍රදර්ශනය සඳහා භාණ්ඩ ගෙන යාම සහ ගෙන ඒම | රු. | 49,000.00 |
| 03. | ප්‍රදර්ශනය සඳහා ඩිජිටල් පුවරු සැකසීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා වූ වියදම්. | රු. | 14,965.44 |
| 04. | ප්‍රදර්ශනය සඳහා අත් පත්‍රිකා මුද්‍රණය | රු. | 29,854.00 |
| | එකතුව | රු. | 443,211.19 |

<u>ක්‍රීඩා වෛද්‍ය ආයතනය</u>

| *අංකය* | *කරන ලද කාර්යයන්* | | *වියදම* |
|---|---|---|---|
| 01. | අත් පත්‍රිකා මුද්‍රණය කිරීම | රු. | 52,045.72 |
| 02. | මිනිත්තු 10ක වාර්තා වැඩසටහනක් නිර්මාණය කිරීම සඳහා | රු. | 216,660.00 |
| 03. | ජෛව යාන්ත්‍රණ මූලික මූලධර්ම පිළිබඳ වැඩසටහන | රු. | 116,200.00 |
| 04. | දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා කුටි සැකසීම හා අනෙකුත් වියදම් සඳහා අත්තිකාරම් | රු. | 41,800.00 |
| | එකතුව | රු. | 426,705.72 |

<u>සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය</u>

| *අංකය* | *කරන ලද කාර්යය* | | *වියදම* |
|---|---|---|---|
| 01. | 2011 වසරේදී වියදමක් නොකළ අතර 2010 වසරේදී සකසන ලද ප්‍රදර්ශන භාණ්ඩ 2011 වසරේදී ද ප්‍රදර්ශනය කෙරිණි. | රු. | 00.00 |

<u>ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව</u>

| *අංකය* | *කරන ලද කාර්යය* | | *වියදම* |
|---|---|---|---|
| 01. | හැඳුනුම්පත් කමිටු වියදම් | රු. | 101,963.00 |
| 02. | ප්‍රදර්ශන කුටි වියදම් | රු. | 85,464.00 |
| 03. | ප්‍රදර්ශන කුටි අධීක්ෂණ කටයුතු | රු. | 100,174.00 |
| 04. | මුදල් කමිටු වියදම් | රු. | 5,390.00 |

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

| | | | |
|---|---|---|---|
| 05. | සංවිධාන කටයුතු හා ප්‍රදර්ශන භූමියේ වොලි බෝල් හා දැල් පන්දු ක්‍රීඩා පිටි සැකසීම සඳහා වූ වියදම් | රු. | 48,460.00 |
| 06. | දැයට කිරුළ ජාතික කබඩි, දැල් පන්දු, වොලි බෝල් හා පාපැදි තරගාවලිය පැවැත්වීම හා ත්‍යාග බෙදා දීම සඳහා වූ වියදම් | රු. | 671,646.50 |
| 07. | ක්‍රීඩා භාණ්ඩ බෙදා හැරීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා වූ වියදම් | රු. | 672,155.00 |
| | මුළු එකතුව | රු. | 1,685,252.50 |

(ඇ) ක්‍රීඩා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය - 136
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය - 219

(ඈ) පැන නොනඟී.

## 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා වැය කළ මුදල : ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය

2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிச் செலவினம்: கமநல சேவைகள், வனசீவராசிகள் அமைச்சு

MONEY SPENT ON DEYATA KIRULA EXHIBITION 2011: MINISTRY OF AGRARIAN SERVICES AND WILDLIFE

1230/'11

10. **ගරු අනුර දිසානායක මහතා (ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවට)**
(மாண்புமிகு அநுர திஸாநாயக்க - கௌரவ சுனில் ஹந்துன்னெத்தி சார்பாக)
(The Hon. Anura Dissanayake on behalf of the Hon. Sunil Handunnetti)

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මඟින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්යය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම් ඒ මන්ද?

கமநல சேவைகள், வனசீவராசிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிக்காக கமநல சேவைகள், வனசீவராசிகள் அமைச்சு செலவிட்டுள்ள மொத்தப் பணத்தொகை எவ்வளவு என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) அமைச்சின் ஒவ்வொரு நிறுவனம் மற்றும் திணைக்களத்தினால் மேற்படி கண்காட்சிக்காக மேற்கொள்ளப்பட்ட செலவு தனித்தனியே எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி திணைக்களங்கள் மற்றும் நிறுவனங்க ளினால் ஆற்றப்பட்ட பணிகள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு பணிக்காகவும் செலவிடப் பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்

அவர் தனித்தனியாக குறிப்பிடுவாரா?

(இ) கடந்த வரவு செலவுத் திட்டத்தில் மேற்படி செலவினத் துக்காக அமைச்சின் எந்த செலவுத் தலைப்பின் கீழ் நிதி ஒதுக்கப்பட்டிருந்தது என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Agrarian Services and Wildlife:

(a) Will he state the total amount of money spent by the Ministry of Agrarian Services and Wildlife on the "Deyata Kirula" exhibition in 2011?

(b) Will he state-

(i) separately, the expenditure borne by each institution and department of the Ministry on that exhibition;

(ii) the functions carried out by those institutions and departments; and

(iii) separately, the amount of money spent on each of those functions?

(c) Will he state the Head of Expenditure of the Ministry, out of which funds were allocated from the last Budget for the above-mentioned expenses?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) රු. 500,000 (පන්ලක්ෂයයි)

(ආ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව - රු. 3,304,981.69 (තිස්තුන්ලක්ෂ හාරදහස් නවසිය අසූඑකයි ශත හැටනවයයි)

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව - රු. 18,817,551.82 (දහ අට මිලියන අටසිය දහහත්දහස් පන්සිය පනස්එකයි ශත අසූදෙකයි)

ශ්‍රී/ස ලංකා පොහොර සමාගම - රු. 200,751.00 (දෙලක්ෂ හත්සිය පනස්එකයි)

සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම - රු. 109,321.59 (එක්ලක්ෂ නවදහස් තුන්සිය විසිඑකයි ශත පනස්නවයයි)

සී/ස ජනතා පොහොර ව්‍යවසාය - රු. 666,771.00 (හයලක්ෂ හැටහයදහස් හත්සිය හැත්තෑඑකයි.)

(ii)

| ආයතනය | කරන ලද කාර්යයන් | දැරූ වියදම - රු. |
|---|---|---|
| ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය | අමාත්‍යාංශ ප්‍රදර්ශන කුටිය හා ප්‍රදර්ශන භූමියේ පිවිසුම් දොරටුව නිර්මාණය. | 500,000 (පන්ලක්ෂයයි) |
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 01. යාල ජාතික උද්‍යානයේ තල්ගස්මංකඩ සංචාරක නිවාසය හා බංගලා භාරකරු නිල නිවස අලුත්වැඩියා කිරීම. | 893,860.00 (අටලක්ෂ අනූතුන්දහස් අටසිය හැටයි) |
| | 02. පරණ බූතව සංචාරක නිවස අලුත්වැඩියා කිරීම. | 587,865.14 (පන්ලක්ෂ අසූහත්දහස් අටසිය හැටපහයි ශත දාහතරයි) |
| | 03. යාල ජාතික උද්‍යානයේ ගල්ගේ නව පිවිසුම විවෘත කිරීම හා නාම පුවරු සකස් කිරීම. | 608,261.03 (හයලක්ෂ අටදහස් දෙසිය හැටඑකයි ශත තුනයි) |
| | 04. ලුණුගම්වෙහෙර සංචාරක නිවස අලුත්වැඩියා කිරීම. | 396,093.90 (තුන්ලක්ෂ අනූහයදහස් අනූතුනයි ශත අනූවයි) |
| | 05. කතරගම නව සංචාරක නිවාසයක් ඉදි කිරීම. | 262,099.46 (දෙලක්ෂ හැට දෙදහස් අනූනවයයි ශත හතළිස්හයයි) |
| | 06. ප්‍රදර්ශන භූමිය හා අවට ප්‍රදේශවලට වන අලින්ගෙන් වන හානිය වැළැක්වීම සඳහා කාර්ය මණ්ඩලය යොදවා විශේෂිත ආරක්ෂක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම. | 502,090.16 (පන්ලක්ෂ දෙදහස් අනූවයි ශත දහසයයි) |
| | 07. ප්‍රදර්ශන කුටියේ තැබීම සඳහා මිය ගිය සත්ත්ව නිදර්ශක සැකසීම හා අනෙකුත් ප්‍රදර්ශන භාණ්ඩ අලුත්වැඩියාව | 54,712.00 (පනස්හතරදහස් හත්සිය දොළහයි) |
| | **එකතුව** | 3,304,981.69 (තිස්තුන් ලක්ෂ හාරදහස් නවසිය අසූඑකයි ශත හැටනවයයි) |
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 01. අක්කර 162ක පුරන් කුඹුරු නැවත වගා කිරීම | 4,546,702.00 (හතළිස් පන්ලක්ෂ හතළිස්හයදහස් හත්සිය දෙකයි) |
| | 02. පුද්ගලික ආදර්ශ ගෙවතු 15,980ක් ස්ථාපිත කිරීම | 3,871,033.50 (තිස්අට ලක්ෂ හැත්තෑඑක්දහස් තිස්තුනයි ශත පනහයි) |
| | 03. ගොවිජන සේවා මධ්‍යස්ථාන 18ක භූමිය කෘෂි ආදර්ශන සහිත සශ්‍රීක භූමියක් බවට පත් කිරීම. | 283,900.00 (දෙලක්ෂ අසූතුන්දහස් නවසියයයි) |
| | 04. ප්‍රදර්ශන කුටිය, අළෙවි කුටිය, වී බිස්ස, ගස උඩ පැල, ගොවි ගෙදර නිර්මාණ කටයුතු සිදු කිරීම | 450,000.00 (හාරලක්ෂ පනස්දහසයි) |
| | 05. අදාළ කාර්යයන්වල නිරත වූ සියලුම නිලධාරීන් සඳහා දරන ලද වියදම | 131,440.00 (එක්ලක්ෂ තිස්එක්දහස් හාරසිය හතළිහයි) |
| | 06. කමත සජීවී රංගන වැඩසටහන | 150,000.00 (එක්ලක්ෂ පනස්දහසයි) |
| | 07. අත් පත්‍රිකා මුද්‍රණය | 32,000.00 (තිස්දෙදහසයි) |
| | 08. සුළු වාරි කර්මාන්ත 13 පුනරුත්ථාපනය | 9,036,270.32 (අනූලක්ෂ තිස්හයදහස් දෙසිය හැත්තෑවයි ශත තිස්දෙකයි) |
| | 09. ගොවිජන සේවා මධ්‍යස්ථාන 16ක ආදර්ශ කාබනික පොහොර ඒකක ස්ථාපනය කිරීම. | 316,206.00 (තුන්ලක්ෂ දහසයදහස් දෙසිය හයයි) |
| | **එකතුව** | 18,817,551.82 (දහඅට මිලියන අටසිය දහහත්දහස් පන්සිය පනස්එකයි ශත අසූදෙකයි) |
| සී/ස ලංකා පොහොර සමාගම | 01. බිබිල අධ්‍යාපන කොට්ඨාසයට අයත් ප්‍රධාන පාසල් 18ක දරු දැරියන්හට ගෙවතු වගාව හා ඵලදායී පොහොර භාවිතය පිළිබඳ දැනුවත් කිරීම සහ පොහොර ආදර්ශන ලබා දීම. | 130,000.00 (එක්ලක්ෂ තිස්දහසයි) |
| | 02. ප්‍රදර්ශන කුටිය සැකසීම. | 70,751.00 (හැත්තෑදහස් හත්සිය පනස්එකයි) |
| | **එකතුව** | 200,751.00 (දෙලක්ෂ හත්සිය පනස්එකයි) |
| සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 01. ගෙවතු වගාව පිළිබඳ මොනරාගල දිස්ත්‍රික්කයේ පාසල් සිසුන් දැනුවත් කිරීම. | 109,321.59 (එක්ලක්ෂ නවදහස් තුන්සිය විසිඑකයි ශත පනස්නවයයි) |
| සී/ස ජනතා පොහොර ව්‍යවසාය | 01. තනමල්විල මධ්‍ය මහා විද්‍යාලයේ තෝරා ගත් ළමුන් 50 දෙනෙකුට කාබනික පොහොර නොමිලේ බෙදා දීම. | 25,000.00 (විසිපන්දහසයි) |
| | 02. ප්‍රදර්ශන භාණ්ඩ පිළියෙල කිරීම. | 269,391.00 (දෙලක්ෂ හැටනවදහස් තුන්සිය අනූඑකයි) |
| | 03. කාබනික පොහොර යොදා කරන ලද ආදර්ශන වගාව ප්‍රදර්ශනය කිරීම. | 197,601.00 (එක්ලක්ෂ අනූහත්දහස් හයසිය එකයි) |
| | 04. කාබනික පොහොර භාවිතයේ වැදගත්කම ප්‍රදර්ශනය කිරීම සඳහා කෙටි චිත්‍රපටයක් ප්‍රදර්ශනය කිරීම හා කාබනික පොහොර අදාළ අමු ද්‍රව්‍ය යොදා නිෂ්පාදනය කර පෙන්වීම. | 174,779.00 (එක්ලක්ෂ හැත්තෑහතරදහස් හත්සිය හැත්තෑනවයයි) |
| | **එකතුව** | 666,771.00 (හයලක්ෂ හැටහයදහස් හත්සිය හැත්තෑඑකයි) |

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

(iii) ඉහත (ii) හි දී පිළිතුරු ලබා දී ඇත.

(ඈ) 2011 වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ප්‍රතිපාදන සැලසී නොමැති අතර අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතන මඟින් අමාත්‍යාංශ ප්‍රදර්ශන භූමියේ පිවිසුම් දොරටුව සහ ප්‍රදර්ශන කුටිය නිර්මාණය සඳහා මුදල් ලබා ගෙන ඇත.

(ඇ) අදාළ නොවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය. ගරු ජෝන් අමරතුංග මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රීති ප්‍රශ්නයක්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මොකක්ද රීති ප්‍රශ්නය?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, the House would like to know whether there is an acting Leader of the Opposition appointed by the Hon. Leader of the Opposition.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, that is not a point of Order.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I want to know because according to the Constitution, there is no -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I want to know that because it is reported in the newspapers -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
The Hon. John Amaratunga has been duly appointed. [බාධා කිරීමක්] විපක්ෂ නායකතුමා විසින් නිසි පරිදි -ලිඛිතව- දැනුවත් කිරීමක් කරනු ලැබ තිබෙනවා. [බාධා කිරීමක්] ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා කථා කරන්න. [බාධා කිරීමක්] එතුමා පිළිබඳව ලිඛිතව දැනුම් දීලා තිබෙනවා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### තෙල් මිල ඉහළ දැමීම නිසා මහජනතාව විඳින පීඩා
### எரிபொருள் விலையதிகரிப்பினால் மக்கள் எதிர்நோக்கும் கஷ்டங்கள்
### HARDSHIPS FACED BY PUBLIC DUE TO FUEL PRICE HIKE

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ ගරු ඛනිජ තෙල් කර්මාන්ත ඇමතිතුමාගෙන් අසනු ලබන ප්‍රශ්නය මෙසේය.

පසු ගිය සතියේ ඉතිහාසයේ කිසිම දිනක නොවූ පරිදි ඛනිජ තෙල් මිල විශාල වැඩි මුදල් ප්‍රමාණයකින් මේ රජය විසින් වැඩි කරනු ලැබුවා. ඒ අනුව පෙට්‍රල් රුපියල් 12කින්ද, ඩීසල් රුපියල් 8කින්ද, භූමිතෙල් රුපියල් 10කින්ද වැඩි කරනු ලැබුවා. මේ අනුව පෙට්‍රල් ලීටරයක වර්තමාන මිල රුපියල් 137ක්ද, ඩීසල් ලීටරයක වර්තමාන මිල රුපියල් 84ක්ද, භූමිතෙල් ලීටරයක වර්තමාන මිල රුපියල් 71ක් ද පරිදි වේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පසු ගිය කාලය පුරාම දූෂණ අක්‍රමිකතා හේතුවෙන් පාඩු ලබන ආයතනයක් බවට පත්වී තිබේ. විශේෂයෙන්ම ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පසු ගිය කාලය තුළ ඛනිජ තෙල් මිලදී ගැනීම සඳහා විදේශ බැංකු සමඟ අත්සන් කරනු ලැබූ හෙජින් ගිවිසුම නිසා ලැබූ පාඩුව අතිමහත්ය. මේ සඳහා වන ගෙවීම් ඉදිරි කාලයේදී ඛනිජ තෙල් සංස්ථාවට ගෙවීමට සිදු වුවහොත් එයින් වන මූල්‍ය පාඩුව මකා ගැනීම සඳහා නැවත වරක් තෙල් මිල වැඩි කිරීම විනා වෙනත් විකල්පයක් නොමැති බව පෙනේ. එමෙන්ම මීට මාස කිහිපයකට ප්‍රථම ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ආනයනය කරන ලද බාල පෙට්‍රල් තොගය නිසා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලැබූ පාඩුව අතිමහත්ය. එම පෙට්‍රල් යොදා ධාවනය කළ වාහන සඳහා වන්දි ගෙවීම ආරම්භ කර ඇතත් එය නවතා ඇත්තේ සංස්ථාව සතුව ප්‍රමාණවත් මුදල් නොමැති නිසා බව දැනුම් දෙන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තෙල් නළවල කාන්දුවීම් සහ තෙල් නළවලින් සොරකම් කිරීම නිසා සිදු වන පාඩුව අතිමහත්ය. ඒ සියල්ල විසඳා ගැනීමට සංස්ථාවට නොහැකි වී ඇත්තේ එහි අකාර්යක්ෂම හා දුර්වල පරිපාලනය හේතුවෙනි. ඒ නිසා මේ රටේ අහිංසක ජනතාවගේ හිස මතට වැය බරක් ලෙසින් පතිත වීම නිරන්තරයෙන් සිදු වේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රජය බලයට පත් වූයේ ලෝක වෙළඳ පොළට අවශ්‍ය ආකාරයට නොහැසිරෙන බවට මේ රටේ ජනතාවට පොරොන්දු දීමෙනි.

ඒ වාගේම ලෝක බැංකුවේත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේත් ජලග් ගලවා දමා අරාබිකරයේ තම මිත්‍ර රටවලින් අඩු මුදලට ඛනිජ තෙල් මේ රටට ගෙන්වා පහසු මිලට මේ රටේ ජනතාවට ලබා දෙන බවට විමල් වීරවංශ මන්ත්‍රීතුමා කිව්වා. [බාධා කිරීමක්] තමුන්නාන්සේ ඒක කිව්වා නේ. එහෙත් ඇත්ත වශයෙන්ම සිදු වී ඇත්තේ කුමක්ද? අද වන විට ලෝක වෙළෙඳ පොළේ තෙල් බැරලයක මිල ඩොලර් 80ක පමණ මුදලකට පහත වැටී ඇත. ඒ අනුව පෙට්‍රල් ලීටරයක් නිෂ්පාදනය කිරීම සඳහා වැය වන උපරිම මිල වන්නේ රුපියල් 85ක පමණ ප්‍රමාණයකි. නමුත් පෙට්‍රල් ලීටරයක් විකුණන මිල රුපියල් 137ක් වේ. සංස්ථාවේ අලාභ පියවා ගැනීම සහ සංස්ථාවේ අකාර්යක්ෂමතාව නිසා මේ රටේ ජනතාවට පෙට්‍රල් ලීටරයක් වෙනුවෙන් රුපියල් 52කට අධික මුදලක් විවිධ බදු ලෙස අමතරව ගෙවීමට සිදු වී තිබේ. මෙය කොතරම් අසාධාරණ ගෙවීමක්ද යන්න ඔබතුමාට ද වැටහෙනවා ඇත.

විශේෂයෙන්ම මෙලෙස තෙල් මිල වැඩි කිරීම නිසා මේ රටේ සෑම ක්ෂේත්‍රයකම මිල ගණන් වැඩි වීමට පටන් ගෙන ඇත. මේ වන විටත් බස් ගාස්තු වැඩි කරන ලෙස ඉල්ලීම් ලැබෙමින් පවතින අතර, මේවා වැඩි වූ වහාම දුම්රිය සහ අනෙකුත් සේවාවල ගාස්තු ද වැඩි වනවා ඇත. එමෙන්ම මේ රටේ පාරිභෝගිකයන්ට අත්‍යවශ්‍ය වන සියලු භාණ්ඩ හා සේවාවන්ගේ මිල තෙල් මිල හා බැඳී පවතින හෙයින් එළවලු, මාළු, සහල්, පරිප්පු, පාන් පිටි ඇතුළු සියලු ආහාර ද්‍රව්‍යයන්ගේ මිල තෙල් මිල හා සාපේක්ෂව වැඩි කිරීමට දැනටමත් පටන් ගෙන ඇත. මේ සියලු වැය බර මේ රටේ ජනතාවට විඳීමට සිදු වී ඇත්තේ ඛනිජ තෙල් සංස්ථාවේ ඇති අකාර්යක්ෂමතාව සහ දූෂණ හේතුවෙනි.

එබැවින් ජනතාවට උසුලාගත නොහැකි වන ආකාරයට වැඩි කර ඇති මෙම තෙල් මිල වහාම පහත හෙළන ලෙසටත්, එළැඹෙන අය වැය ජනතාවට බර නොදෙන අය වැයක් බවට පෙන්වන ලෙසටත් ඉල්ලා සිටිමි. අය වැය ඉදිරිපත් කිරීමට ප්‍රථමයෙන් මෙවැනි අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවාවන්ගේ මිල වැඩි වීම තුළින් මේ රටේ ජනතාවගේ දුක් ගිනි තව තවත් වැඩි වන අතර, ජීවන වියදම අහස උසට නැඟීම තුළින් මේ රටේ ජනතාව අන්ත අසරණ දුක්ඛිත තත්ත්වයකට පත් වේ. එබැවින් ඛනිජ තෙල් සංස්ථාවේ නාස්තිකාර වියදම් වහාම නවතා දමා, කාර්යක්ෂම පරිපාලනයක් ඇති කර, තෙල් මිල වහාම පහත හෙළා, මේ රටේ ජනතාවට පොරොන්දු වූ පරිදි තම යුතුකම් සහ වගකීම් ඉෂ්ට කරන ලෙසට මේ රජයට බල කර සිටිමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තිබෙන ලැයිස්තුව මොකක්ද කියලා පෙන්වන්න තමුන්නාන්සේගෙන් විනාඩියක් ඉල්ලා ගන්න මා කැමැතියි. මේ තිබෙන්නේ අත්‍යවශ්‍ය බඩු භාණ්ඩ හා සේවාවන්ගේ මිල වැඩි වීම. මෙය, තෙල් මිල වැඩි වීමේ ප්‍රතිඵලයක්. ත්‍රී වීලර් ගාස්තු වැඩි වීම, එළවලු මිල වැඩි වීම, පාන් ඇතුළු සියලුම බේකරි නිෂ්පාදනවල මිල වැඩි වීම, ලොන්ඩරි ගාස්තු වැඩි වීම, පෞද්ගලික බස් සේවා ගමන් ගාස්තු වැඩි වීම, ගෑස් මිල වැඩි වීම, පොදු වාහන ගාස්තු වැඩි වීම, පාසල් ළමුන්ගේ ප්‍රවාහන ගාස්තු වැඩි වීම, උද්ධමනය වැඩි වීම, පාරිභෝගික භාණ්ඩ සියල්ලේම මිල වැඩි වීම, විදුලිය ගාස්තු වැඩි වීම සිදු වනවා. ඒ වාගේම ආදාහනාගාර ගාස්තුවද වැඩි වනවාය කියන එක මා මතක් කරන්න කැමැතියි. ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අමාත්‍යතුමා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. A. D. Susil Premajayantha - Minister of Petroleum Industries)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැඩ බලන විපක්ෂ නායකතුමා විසින් අද ස්ථාවර නියෝග 23 (2) යටතේ අසනු ලබන ප්‍රශ්නය ඉදිරිපත් කරනු ලැබුවා. එතුමා විසින් ඔබතුමා වෙත යොමු කර මා වෙත එවා තිබෙන පිටපත එතුමා කරන ලද ප්‍රකාශය හා නිශ්චිත වශයෙන්ම සමගාමී නොවුවත්, මා ඒ ගැන වැඩි අවධානයක් යොමු කරන්නේ නැහැ. මොකද, එතුමා මෙම ප්‍රකාශය කියවා ගෙන යද්දී යම් යම් වචන එහාට මෙහාට වීමක් සිදු වුණා. මා ඒ ගැන තකන්නේ නැහැ. නමුත් ඒකේ හරය අරගෙන, ඒ හරයට පිළිතුරු දෙන්න මා බලාපොරොත්තු වනවා. මේ ප්‍රකාශයේ නැති කොටසකුත් එතුමා අවසාන වශයෙන් කියෙව්වා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ මෙම ප්‍රශ්නයේ හරය හැටියට දක්වන කරුණු තුනක් තිබෙනවා. එක, පසු ගිය වකවානුවේදී ඇති කර ගනු ලැබූ හෙජින් ගිවිසුම නිසා ඇති වූ පාඩුව පියවා ගැනීම සඳහා මෙවැනි වැඩි වීම් කරනු ලබන බවට කරන චෝදනාව. දෙක, පසු ගිය දා ගෙන්වන ලද පෙට්‍රල් තොගයකින් සිදු වූ අලාභය නිසා එය සමනය කර ගැනීමට තෙල් මිල වැඩි කරනවාය කියන එක. තුන, තෙල් නළ කාන්දු වීම නිසා එයින් වන්නා වූ පාඩුව අවම කර ගැනීමට තෙල් මිල වැඩි කරනවාය කියන කාරණය.

මේ කරුණු තුනම වර්තමානයේ තෙල් මිල වැඩි වීමට කිසිදු සම්බන්ධතාවක් නැහැ කියන කාරණය මම ඉතා පැහැදිලිව කියනවා.

පළමුවන කාරණය මෙයයි. Hedging ගිවිසුම සම්බන්ධයෙන් Standard Chartered බැංකුව මඟින් ලන්ඩනයේ වාණිජ මහාධිකරණයට ඉදිරිපත් කර තිබූ නඩුවේ තීන්දුව දීමෙන් පස්සේ, ඇමරිකානු ඩොලර් මිලියන 166ක තැන්පතුවක් කරන්නේ නැතුව අභියාචනා කරන්න අවස්ථාව සලසා දී තිබෙනවා. දැන් ඒක අභියාචනා අවස්ථාවේ තිබෙන නිසා තවම ඒ පිළිබඳ අවසන් තීන්දුවකට එළැඹිලා නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගෙවන්න වුණොත් ඒකත් ප්‍රශ්නයක් නේ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
It is a hypothetical question.

දෙවන කාරණය මෙයයි. ඇමෙරිකානු ඩොලර් මිලියන 196ක් අය කර ගැනීම සඳහා සිටි බැංකුව මඟින් සිංගප්පූරුවේ බේරුම්කරණ මණ්ඩලයට ඉදිරිපත් කර තිබූ පැමිණිල්ල බේරුම්කරණයේදී සංස්ථාවට වාසි සහගත තීන්දුවක් දීලා තිබෙනවා. ඒ නිසා ඇමෙරිකානු ඩොලර් මිලියන 196ක් සිටි බැංකුවට ගෙවීමට අවශ්‍ය වන්නේ නැහැ.

තුන්වන කාරණය මෙයයි. ඩොයිෂ් බැන්ක් එකේ ඇමෙරිකානු ඩොලර් මිලියන 60ක වගකීම සම්බන්ධයෙන් සිංගප්පූරුවේ බේරුම්කරණ මණ්ඩලය විසින් බේරුම්කරණ අවස්ථාවේ විමසීමක් කළා. ඒ පිළිබඳව තවම තීන්දුව දීලා නැහැ. ඒ නිසා මේ වන තෙක් මෙම කරුණු තුනෙන්ම කිසිදු පාඩුවක් හෝ ඒ පිළිබඳව තිබෙන්නා වූ වගකීමේ සම්පූර්ණ ප්‍රමාණය කොපමණද කියන එක තීන්දු වෙලා නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

මම කිව්වේ, ඒවා තීන්දු වුණොත් ආයෙත් සැරයක් මිල වැඩි කරන්න වෙනවා කියන එකයි.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

It is a hypothetical question. I just want to emphasize that this matter has no relevancy to the Hedging Agreement. [බාධා කිරීමක්] නැහැ, නැහැ. මේ තෙල් මිල වැඩි කිරීම ඒකට සම්බන්ධයක් නැහැ. ඔබතුමා පොඩ්ඩක් අහගෙන ඉන්න කෝ මම කියන දේ. ඔබතුමා දන්නවා නේ. [බාධා කිරීමක්] රවි කරුණානායක මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ තෙල් මිල වැඩි කිරීමට ඒක අදාළ නැහැ. ඔබතුමා ඒක දන්නවා. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒ කියන්නේ, දෙවැනි වතාවටත් මිල වැඩි කරනවා කියන එකද?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

නැහැ, නැහැ. මේ අවස්ථාවේ තෙල් මිල වැඩි කිරීම සම්බන්ධයෙන් ඔය කියන කාරණය අදාළ නැහැ කියන එකයි මම කිව්වේ. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊ ළඟ කාරණය මෙයයි. ආන්දෝලනයට තුඩු දුන් පෙට්‍රල් තොගයෙන් ඉතිරි කොටස කමිටුවේ නිර්දේශයක් අනුව ටෙන්ඩර් කැඳවලා විකුණා දැමීමෙන් අපට ඒ පාඩුව පියවා ගන්න පුළුවන්. ඊට අදාළ වන්දි ගෙවීම සම්බන්ධයෙන් බැලුවොත්, මේ වන විට 380 දෙනෙකු සඳහා වන්දි ගෙවීම් කටයුතු කර ගෙන යනු ලබනවා. ඉදිරි සති දෙක තුන තුළදී එම ගෙවීම් කටයුතු අවසන් කිරීමට කටයුතු කර ගෙන යනවා.

ඊ ළඟට තෙල් නළ කාන්දුව බැලුවොත්, අවුරුදු 40ක් පැරණි තෙල් නළවලින් තමයි ඒ කාන්දුව සිදු වන්නේ කියලා පෙනෙනවා. ඒ පිළිබඳව ශක්‍යතා වාර්තාවක් සකස් කරලා තිබෙනවා. සැලැස්මක් ඇති කරලා තිබෙනවා. ඒ අනුව, අපි නොබෝ දිනකින් ටෙන්ඩර් කැඳවලා නව තෙල් නළ එළීම සඳහා පියවර ගනු ලබනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමා මතු කරපු කරුණු තුන තෙල් මිල වැඩි කිරීම සමඟ සහසම්බන්ධතාවක් නැහැයි කියන කාරණය මා ඉතා පැහැදිලිව කියනවා.

ඊ ළඟට ඔබතුමාගේ ප්‍රකාශයේ මෙන්න මේ ආකාරයට සඳහන් කරලා තිබෙනවා. "ඇත්ත වශයෙන්ම සිදුව ඇත්තේ කුමක්ද? අද වන විට ලෝක වෙළෙඳ පොළේ තෙල් බැරලයක මිල ඇමරිකානු ඩොලර් 80කට පමණ මුදලකට පහත වැටී ඇත." ඔබතුමා අද "Daily Financial Times" පුවත් පත අරගෙන බැලුවොත්, ඒ වාගේම අද තිබෙන ඕනෑම ඉංග්‍රීසි පුවත් පතක් බැලුවොත්, ඊයේ වන විට ලෝක වෙළෙඳ පොළේ තිබූ තෙල් මිල ගණන් ඒවායේ තිබෙනවාය කියා පෙනෙනවා. අපි ආනයනය කරන බොර තෙල් බැරලයක මිල ඇමෙරිකානු ඩොලර් 86 - 88 අතර තමයි තිබෙන්නේ. Brent crude oil ඇමෙරිකානු ඩොලර් 110-112යි අතර. පිරිපහදු කරපු තෙල් බැරල් එකක් ඇමෙරිකානු ඩොලර් 121, 123, 125යි කියන මිල මට්ටම් තුනේ තිබෙන්නේ. ඒක නිසා ඇමෙරිකානු ඩොලර් 80ක් කියන කාරණය පිළිගන්න බැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

තෙල් බැරලය ඇමෙරිකානු ඩොලර් 40ට බැස්ස කාලයේ මිල අඩු කළාද?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ඔබතුමාගේ ප්‍රකාශයේ ඒක නැහැ නේ. ඒක තිබුණා නම් මට උත්තර දෙන්න තිබුණා. මතක තියා ගන්න, ඔබතුමා වැඩ බලන විපක්ෂ නායක හැටියට තමයි මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ. නිකම් නොවෙයි. ඒක නිසා හරියටම ඔබතුමා අහලා තිබෙන එකටමයි මම උත්තර දෙන්නේ. මොකද, ඔබතුමාට ගරු කරන්න එපායැ. [බාධා කිරීමක්] වැඩ බලන විපක්ෂ නායකතුමා හැටියටයි ඔබතුමාට මේ උත්තර දෙන්නේ. බොර තෙල් බැරලයක් ඇමෙරිකානු ඩොලර් 80ක් කියන කාරණය සත්‍යයෙන් තොරයි කියන එක වැඩ බලන විපක්ෂ නායකතුමා හැටියට ඔබතුමා පිළිගන්න ඕනෑ. අද පුවත් පත් බැලුවත් ඒක පෙනෙන්න තිබෙනවා. [බාධා කිරීමක්] මම කියන්නේ දැන් ඔබතුමා කියලා තිබෙන දේ වැරැදියි, අසත්‍යයි කියන එකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම කෙටියෙන් පැහැදිලි කරනවා නම් ජනවාරි මාසය වන විට බොර තෙල් බැරලයක මිල ඇමෙරිකානු ඩොලර් 76-80 අතර තිබුණා.

අද Iranian light sweet crude oil එක ඩොලර් 88ක් දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. Brent crude oil එක 110ට, 112ට ගිහිල්ලා තිබෙනවා. ඒක අපි පාවිච්චි කරන්නේ නැහැ. ඊ ළඟට පිරිපහදු කරපු තෙල් බැරල් එකක් ජනවාරි මාසයේ තිබුණේ ඩොලර් 101යි, 102යි, 105යි කියන මිල පරාසය තුළයි. දැන් එය 121, 123, 125 දක්වා වැඩි වෙලා තිබෙනවා. වැඩිම මිලක් තිබෙන්නේ භූමිතෙල් බැරල් එකකටයි. පසු ගිය පෙබරවාරි මාසයේ ඉඳලා මේ මිල වැඩි වීම එසේ සිදු වුවත් රජය විසින් ඊට සමගාමීව තෙල් මිල වැඩි කළේ නැහැ. උදාහරණයක් වශයෙන් කියනවා නම් පසු ගිය සතියේ තෙල් මිල වැඩි කිරීමෙන් පසුවත් සාමාන්‍ය ඩීසල් ලීටරයකින් සංස්ථාවට රුපියල් 18ක පාඩුවක් සිදු වනවා. එක ඩීසල් ලීටරයකින් සංස්ථාවට රුපියල් 18ක් පාඩු වනවා. ඒ මේ මිල වැඩි කිරීමෙන් පස්සෙයි. භූමිතෙල් ලීටරයකින් සිදු වන පාඩුව රුපියල් 31ක්. විදුලිබල උත්පාදනය සඳහා යොදා ගන්නා දැවි තෙල්වලින් රුපියල් 45ක පාඩුවක් සිදු වෙනවා. සල්ෆ ප්‍රතිශතය අඩු ලීටරයක් සඳහා රුපියල් 47ක් පාඩු වනවා. කර්මාන්තශාලා සඳහා දැවි තෙල් විකුණන එකෙන් රුපියල් 35ක් පාඩු වනවා. සාමාන්‍යයෙන් දෛනික පරිභෝජනය පෙට්‍රල් ලීටර මිලියන 1.9ක් වනවා. නැත්නම් ටොන් දෙදාහකට ආසන්න ප්‍රමාණයක් වනවා. ඩීසල් ටොන් පන්දාහක් එහෙම නැත්නම් ලීටර් මිලියන 5.1ක් වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතකොට අපට ගණනය කර ගත හැකියි, දිනකට සංස්ථාවට සිදු වන පාඩුව කොච්චරද කියලා. ඩීසල් ලීටරයකින් රුපියල් 18ක පාඩුවක් වන කොට දවසකට නිකුත් වෙන මිලියන 5.1 එක 18න් වැඩි කළාම දවසකට ඩීසල්වලින් විතරක් සිදු වන පාඩුව අපට ගණනය කර ගන්න පුළුවන්. භූමිතෙල් ලීටරයකින් රුපියල් 31ක් පාඩු වෙන කොට දිනකට නිකුත් වන ලීටර් සංඛ්‍යාවෙන් අපට සිදු වන පාඩුව බලා ගන්න පුළුවන්. ඉතින් මේ ආකාරයේ පාඩුවක් සිදු වුණාම අවසාන වශයෙන් ඒ පාඩුව යන්නේ මහා භාණ්ඩාගාරයටයි. මහා භාණ්ඩාගාරයට මේ පාඩුව ගියාට පස්සේ, වෙනත් අංශයන් මඟින් ආදායම් වැඩි කර ගෙන ඒ මුදල සම්පාදනය කර ගන්න වෙනවා. මේ තත්ත්වයත් අපි සැලකිල්ලට ගත්තා. මේ තෙල් මිල අඩුවෙයි කියලා අපි හිතුවා. පුරෝකථනයක් කළා. මැදපෙරදිග තෙල් නිෂ්පාදනය කරන රටවල ඇති වෙලා තිබෙන්නා වූ දේශපාලන හා අනෙකුත් අවිනිශ්චිතතාව හේතුවෙන් තෙල් මිල ඉහළ යාම ප්‍රධාන

ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. උදාහරණයක් වශයෙන් ලිබියාවෙන් තෙල් නිෂ්පාදනය වනවා. ලිබියාව නිෂ්පාදනය කරන තෙල් ඉතාලිය සහ යුරෝපීය රටවල් ගණනාවකට ලබා දුන්නා. නමුත් පසු ගිය කාලයේ ඇති වුණු අවිනිශ්චිත තත්ත්වය තුළ ඒ තෙල් නිෂ්පාදනය සිදු වුණේ නැහැ. තවමත් සිදු වෙලා නැහැ. එය නිවැරදි වෙන්න තව කොපමණ කාලයක් යයිද කියන එක කියන්නත් බැහැ. ඒ වාගේම ඉරාකයේ ඇති වෙලා තිබෙන තත්ත්වය. දැන් අලුත්ම තත්ත්වය තමයි ඉරානයට අත් වෙමින් යන තත්ත්වය. ඒ නිසා මේ සියලු තත්ත්වයන් තුළ තෙල් මිල ඉහළ යාමේ ප්‍රවණතාවක් තිබුණත් අපි පසු ගිය මාස හය තුළදීම තෙල් මිල වැඩි කළේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊ ළඟ කාරණය තමයි පසු ගිය කාලය තුළ නිසි ලෙස වැසි නොලැබීම නිසා ජල විදුලියෙන් විදුලිය නිෂ්පාදනය කිරීම වෙනුවට සියයට 75ක, 80ක ප්‍රමාණයක් තාප විදුලිය නිෂ්පාදනය කරන්න සිදු වීම. තාප විදුලිය නිෂ්පාදනය කිරීමේදී සාමාන්‍යයෙන් ප්‍රවාහන කටයුතු සඳහා නිකුත් කරනු ලබන්නා වූ ඩීසල් තොගයට වඩා තව සියයට 30ක, 40ක ප්‍රමාණයකින් ඩීසල් ආනයනය කරන්න සංස්ථාවට සිදු වුණා. ආනයනය කළා විතරක් නොවෙයි, ඒවා විදුලිබල මණ්ඩලයට සහ විදුලිය නිෂ්පාදනය කරන ආයතනවලට ලබා දුන්නෙත් මේ කියන ලීටරයකට සිදු වූ පාඩුවත් එක්කයි. ඒ නිසා සංස්ථාවේ සිදු වන පාඩුව තවත් ප්‍රමාණයකින් වැඩි වුණා. මෑත කාලීනව ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල අඩු වෙයි කියලා අපට හිතන්න අමාරුයි. මොකද ඉස්සරහට එන්නේ සීත සෘතුවයි. සීත සෘතුවේදී තෙල් පරිභෝජනය වැඩියි. විශේෂයෙන්ම බටහිර සහ සීත කලාපවල රටවල තෙල් පරිභෝජනය වැඩියි. ඒ තත්ත්වයත්, ඉදිරියේදී ඇතිවිය හැකි අවිනිශ්චිත තත්ත්වයනුත් සලකා බලලායි අපි මේ ආකාරයෙන් තෙල් මිල වැඩි කරන්න කටයුතු කර තිබෙන්නේ.

අනික් කාරණය මේකයි. පෙට්‍රල් භාවිතය වැඩි වෙමින් පවතිනවා. වාහන ආනයනය කිරීම වැඩි වෙලා තිබෙනවා. ඊට සමගාමීව පෙට්‍රල් නිකුත් කිරීම වැඩි වෙලා තිබෙනවා. ඉතින් මේ තෙල් මිල මේ ආකාරයෙන් වැඩි වීමට ඒ කරුණු සියල්ලමත් හේතු වෙලා තිබෙනවා.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
පෙට්‍රල් ලීටරයකින් ලාභ ලැබෙනවා නේද? ඒ ලාභය අනෙක් ඒවාට දාන්න පුළුවන් නේ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
බැහැ නේ. ගරු මන්ත්‍රීතුමනි, දවසකට නිකුත් වන්නේ පෙට්‍රල් ලීටර මිලියන 1.9යි. අපි කියමු, මිලියන 2ක් කියලා. මිලියන දෙකෙන් රුපියල් 13 ගණනේ නැත්නම් 12 ගණනේ එන ප්‍රමාණය වැඩි කරලා ගත්තාම ඒ ප්‍රමාණය මදියි, මිලියන 5ක්, 18 ගණනේ වෙන පාඩුවට.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
රුපියල් 60ක් අපි ලාභ ලබනවා නේ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
නැහැ. රුපියල් 60ක් ලාභ ලබන්නේ නැහැ. ඔබතුමාගේ ගණනය කිරීම වැරදියි. තෙල් බැරල් එකක් ඩොලර් 80ට දමා ගණන් හැදුවේ. නමුත් ඩොලර් 121ට දමා ගණන් හදන්න ඕනෑ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇමතිතුමනි, මිල වැඩි කර තිබෙන ප්‍රමාණය බැලුවාම පෙට්‍රල්, ඩීසල්, ඇතුළු ඛනිජ තෙල් ඔක්කොම දැන් ලාභ ලබනවා නේද?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙම නම් ලාභ ලබන්න කොච්චර වැඩි කරන්න ඕනෑද?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඒක තමයි මා කිව්වේ. දැනට ඩීසල් ලීටරයකින් රුපියල් 18ක්, භූමිතෙල් ලීටරයකින් රුපියල් 31ක් පාඩු ලබනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කොච්චර වැඩි කරන්න ඕනෑද ලාභ ලබන්න?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මේක තමයි ගණන.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වැඩි කරන්නේ කවදාද?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
දැනට වැඩි කරන්න බලාපොරොත්තුවක් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පාඩු ලබනවා නම් මේ ආණ්ඩුව හැම එකම සහනාධාර ක්‍රමයට නේ ගෙන යන්නේ? ඇයි, මේකත් ඇද ගෙන යන්නේ නැත්තේ?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මට බාධා කරන්න එපා. [බාධා කිරීමක්] ඔබතුමා පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීමක්] මට බාධා කරන්න එපා. මා පිළිතුරු දෙන තුරු ඉන්න.[බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගරු මන්ත්‍රීතුමාගේ දැනුවත්වීම සඳහායි මා ඉන්දියානු තෙල් සමාගම පිළිබඳව කියන්නේ. The CIF price including the premium is US Dollars 123.8 per barrel of petrol and US Dollars 128.19 per barrel of diesel. මේ තමයි සාමාන්‍ය මිල. LIOC එකේ අය අත්සන් කර මිල ගණන් එවා තිබෙනවා. පෙට්‍රල් බැරල් එකක් ඩොලර් 123.8ක්, ඩීසල් බැරල් එකක් ඩොලර් 128.19ක් වෙනවා. Landed cost එකත් එක්ක බැලුවාම ඒ ගොල්ලන්ගේ ගණනය කිරීම අනුව පෙට්‍රල් ලීටරයක සම්පූර්ණ cost එක රුපියල් 123.97ක් වෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ ගොල්ලන්ගේ Excise Duty එක-

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු මන්ත්‍රීතුමනි, Excise Duty එක තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේත් තිබුණා. ඉතිහාසයේ හැම දාම Excise Duty එක තිබුණා. [බාධා කිරීමක්] ලෝකයේ ඕනෑම රටක පෙට්‍රල් සහ අනෙකුත් තෙල් සඳහා යම් බද්දක් අය කරනවා. නමුත් අපේ රටේ ඩීසල් සඳහා ගන්නේ රුපියල් 2යි. භූමිතෙල් සඳහා ශත පහක්වත් tax අය කරන්නේ නැහැ. භූමිතෙල්වලින් කිසිම tax එකක් අය කරන්නේ නැහැ. භූමිතෙල්වලට රජය කිසිම බද්දක් අය කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඩීසල් landed cost එක 103.76යි. මේ tax නැතුව. මා කිව්ව කාරණය සාධාරණීකරණය කරන්නයි ඕනෑ. මේ මිල වැඩි වීම සිදු වෙලා තිබෙන්නේ ලෝක වෙළෙඳ පොළේ මිල මෙහි landed cost එකට එකතු වන ගණනත් සමඟයි. එපමණක් නොවෙයි, පසු ගිය සතියේ ඉන්දියාවේ ඉන්දියන් රුපියල් 68ට තිබුණු ඩීසල් ලීටරය ඉන්දියන් රුපියල් 70 දක්වා වැඩි වුණා. ඉන්දියන් රුපියලකට ලංකාවේ රුපියල් 2.70ක් වනවා. ඉන්දියාවේ ඩීසල් ලීටරයක මිල අපේ රුපියල්වලින් ගණන් බැලුවොත් රුපියල් 190ක් වෙනවා. මොකද, ඉන්දියාවේ තෙල් නිෂ්පාදනය කරනවා; ගෑස් නිෂ්පාදනය කරනවා. සමාගම් ගණනාවක් තරගකාරී ලෙස තෙල් ආනයනය කරනවා. ඩීසල්වල මිල පමණක් මා උදාහරණයක් හැටියට ගත්තේ තමුන්නාන්සේලාට පැහැදිලි කරන්නයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අද නැඟෙනහිර යුරෝපය, යුරෝපීය රටවල, ග්‍රීසිය, ඒ පසුපසින් තිබෙන්නාවූ තවත් රටවල් ගණනාවක තත්ත්වයන් තුළ සමහර විට පුරෝකථනයක් කරනවා, economic recession එකක් එයි කියා, 2008 ඇති වුණා වාගේ. එවැනි තත්ත්වයක් ආවොත් ඉල්ලුම පහළ යන්න පුළුවන්. ඉල්ලුම පහළ යන විට මොකක්ද වන්නේ? මිල පහළ වැටෙන්න පුළුවන්. එතකොට අපට මිල අඩු කරන්න පුළුවන් ප්‍රවණතාවක් එන්න පුළුවන්. හැබැයි, අනෙක් අතට මැද පෙරදිග තත්ත්වය තවත් අවිනිශ්චිත වුණොත් මොකද වන්නේ?

ඉරානය වැනි රටවල් අද ලෝකයේ දෙවන තුන්වන ස්ථානයට තෙල් නිෂ්පාදනය කර සපයනවා, විශේෂයෙන් ඉන්දියාව, චීනය ඇතුළු සංවර්ධනය වෙමින් පවතින රටවල්වලට. යම්කිසි ප්‍රශ්නයක් එතැන මතු වුණොත් මේ තත්ත්වය ඊටත් වඩා වෙනස් වෙන්න පුළුවන්. ඒ සියලු තත්ත්වයන් එක්ක තමයි- [බාධා කිරීමක්] මා ඔබතුමාට උත්තර දෙනවා නේ. [බාධා කිරීමක්] මේ LIOC එකෙන් එවා තිබෙන list එක.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙම නම් ඔබතුමන්ලා කොළඹ වරායට පිරිසිදු කරන ලද පෙට්‍රල් ගෙනාවේ රුපියල් 87ට. ඒ රුපියල් 87ට බද්දක් එකතු කරලා තමයි විකුණන්න යන්නේ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
87ට වඩා වැඩි වෙනවා නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා කිව්වා, රුපියල් 88 කියා. සමහර විට Ceylon Petroleum Corporation එකේ formula එක අනුව අඩු කළොත් රුපියල් 61යි කොළඹ වරායට එන තෙල් මිල. රුපියල් 61 ඉඳලා ඒ ඉතුරු ප්‍රමාණය, ඒ සල්ලි ප්‍රමාණය කොහාටද ගිහින් තිබෙන්නේ? ලෝක වෙළෙඳ පොළේ මිල වැඩි වීමක් මේකට කිසි සේත්-

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඉතින් මට කියන්න දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තෙල් පිරිපහදුවෙන් දවසකට පෙට්‍රල් ටොන් 650ක් 700ක් විතර තමයි නිෂ්පාදනය වන්නේ. ඩීසල් නම් ටොන් 900ක් 1,000ක් පමණ නිෂ්පාදනය වෙනවා. නමුත් තෙල් ටොන් 5,000ක් අපට දවසකට යනවා. ඒ කියන්නේ සියයට 80ක් අපි ආනයනය කරන ඒවායි. මේ නිෂ්පාදන දෙකේම සියයට 80ක් පමණ ආනයනය කරන ඒවා. හැබැයි පෙට්‍රල් බැරලයක් ආනයනය කරන මිල තමයි ඩොලර් 123.8ක් වන්නේ; ඩීසල් බැරලයක ආනයන මිල තමයි ඩොලර් 128.19ක් වන්නේ. අන්න ඒකටයි මේ ගණනය කිරීම කරන්න ඕනෑ. එහෙම නැතිව ඔබතුමා කියන ඒ ගණනය කිරීමට නොවෙයි. ඒ නිසා මා හිතන්නේ මේ පැහැදිලි කිරීම අද අපේ ගරු වැඩ බලන විපක්ෂ නායකතුමා -

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඔබතුමා හරි. නමුත් තමුන්නාන්සේලා ජනතාව රැවැට්ටුවා නේ. "මැද පෙරදිග මිත්‍රයෝ ඉන්නවා. අපට අඩු මිලට පෙට්‍රල් ගෙනැල්ලා දෙනවා" කිව්වා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
නැහැ, අප එහෙම කිව්වේ නැහැ. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ මේකයි. ගරු වැඩ බලන විපක්ෂ නායකතුමා මගේ කථාව අවසාන වෙන කොට මම කියපු සියලු දේ හරිය කියන එක පිළි ගත්තාය කියන කාරණය ඉතාම පැහැදිලිව මම සඳහන් කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳව දැනුම් දීම. අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம்.ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පළමුවෙන්ම එක්සත් ජාතික පක්ෂයේ අලුත් වැඩ බලන නායකතුමා වන ජෝන් අමරතුංග මැතිතුමාට සුබ ප්‍රාර්ථනා කරනවා.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### I

### ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත් කෙටුම්පත
செயற்பாடு குறைவாகவுள்ள தொழில்முயற்சிகளுக்கும் மற்றும் குறைவாகப் பயன்படுத்தப்படுகின்ற சொத்துக்களுக்கும் புத்துயிரளித்தல் சட்டமூலம்
REVIVAL OF UNDERPERFORMING ENTERPRISES AND UNDERUTILIZED ASSETS BILL

"හඳුනාගත් ඌන ක්‍රියාකාරී ව්‍යවසාය හෝ ඌන උපයෝජිත වත්කම් ජාතික යහපත උදෙසා රජය සතු කිරීම සඳහා ද; එම ඌන ක්‍රියාකාරී එක් එක් ව්‍යවසාය හෝ ඌන උපයෝජිත වත්කම සම්බන්ධයෙන් හෝ ඒ ව්‍යවසාය හෝ වත්කම් කීපයක් සම්බන්ධයෙන් නිසි බලධරයකු පත් කිරීම සඳහා ද; විකල්ප උපයෝජනය තුළින් ඒවායේ ඵලදායී කළමනාකරණය, පරිපාලනය හෝ පුනරුදය සඳහා විධිවිධාන සැලැස්වීම සහ ඒවා සම්බන්ධයෙන් වන්දි ගෙවීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා විසිනි.***

***2011 නොවැම්බර් 09 වන බදාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமான மாண்புமிகு டி.எம்.ஜயரத்ன அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2011 நவம்பர் 09, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப் பட்டது.*

*Presented by the Hon. D.M. Jayaratne, Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs;*

*to be read a Second time upon Wednesday, 09th November, 2011 and to be printed.*

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. අපි හෙට මේ පනත් කෙටුම්පත විවාද කරන්නේ කොහොමද? තවම අපට එය හම්බ වෙලා නැහැ. ඒකේ මොනවා තිබෙනවාද කියන එකවත් අපි දන්නේ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

මේ මොහොත වෙන කොට ඒ පනත් කෙටුම්පත ඔබතුමාගේ මේසයට ගෙනත් දෙනු ලබනවා ඇති.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

අපට යම් කාල සීමාවක් දෙන්න, මේ පනත් කෙටුම්පත බලලා අවබෝධ කර ගන්න. මේ සඳහා සාධාරණය ඉටු කරන්න කියලා මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

What is the point of Order?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Deputy Speaker, you stated earlier that it was not appropriate for me to object on the new Bill that is being presented for debate tomorrow. But, now I guess it has been presented and at this particular moment, I would very honestly ask you - [*Interruption.*]

### II

### නගර සහ ග්‍රාම නිර්මාණ (සංශෝධන) පනත් කෙටුම්පත
நாடு, நகரத் திட்டமிடல் (திருத்தம்) சட்டமூலம்
TOWN AND COUNTRY PLANNING (AMENDMENT) BILL

"(269 වැනි අධිකාරය වූ) නගර සහ ග්‍රාම නිර්මාණ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා විසිනි.***

***2011 නොවැම්බර් 21 වන සඳුදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமான மாண்புமிகு டி.எம்.ஜயரத்ன அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2011 நவம்பர் 21, திங்கட்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப் பட்டது.*

*Presented by the Hon. the Hon. D.M. Jayaratne,Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs;*

*to be read a Second time upon Monday, 21st November, 2011 and to be printed.*

### III

### ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත
இலங்கை முதலீட்டுச் சபை ( திருத்தம்) சட்டமூலம்
BOARD OF INVESTMENT OF SRI LANKA (AMENDMENT) BILL

"ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසිනි.***

***2011 නොවැම්බර් 21 වන සඳුදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பொருளாதார அபிவிருத்தி அமைச்சர் சார்பாக மாண்புமிகு நிமல் சிறிபால த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2011 நவம்பர் 21, திங்கட்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப் பட்டது.*

*Presented by the Hon. Nimal Siripala de Silva on behalf of the Minister of Economic Development;*

*to be read a Second time upon Monday, 21st November, 2011 and to be printed.*

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2011 නොවැම්බර් මස 22 වැනි අඟහරුවාදා, 23 වැනි බදාදා, 24 වැනි බ්‍රහස්පතින්දා, 25 වැනි සිකුරාදා, 28 වැනි සඳුදා, 29 වැනි අඟහරුවාදා සහ 30 වැනි බදාදා යන දිනයන් `විසර්ජන පනත් කෙටුම්පත (2012)' සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

### I

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග 70(2) හි කුමක් සඳහන් ව තිබුණද, `විසර්ජන පනත් කෙටුම්පත (2012)' සලකා බැලීම සඳහා 2011 නොවැම්බර් මස 22 වැනි දින සිට නොවැම්බර් මස 29 වැනි දින දක්වා ඇති වෙන් කළ දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ.භා. 6.00ට ස්ථාවර නියෝග අංක 7හි (5) සහ (6) ඡේදයන් ක්‍රියාත්මක විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### II

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග 70(2) හි කුමක් සඳහන් ව තිබුණද, 'විසර්ජන පනත් කෙටුම්පත (2012)' සලකා බැලීම සඳහා 2011 නොවැම්බර් මස 30 වැනි බදාදා දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.00 සිට අ. භා. 5.00 දක්වා විය යුතු ය. අ. භා. 5.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### த இன்ஸ்ரிரியூட் ஒவ் சேர்டிபைட் பப்ளிக் எக்கவுன்டன்ஸ் ( கூட்டிணைத்தல்) சட்டமூலம்
### INSTITUTE OF CERTIFIED PUBLIC ACCOUNTANTS (INCORPORATION) BILL

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙත පවරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக் கட்டளை இல. 47 (5) இன்படி நிதி, திட்டமிடல் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப் பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Finance and Planning for report.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Hon. Ravi Karunanayake, what is your point of Order?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Deputy Speaker, you mentioned in the morning that it was not appropriate for me to have taken up a point of Order on a legal interpretation that was there. But, now

that it has been tabled in Parliament, the Hon. Prime Minister has deemed fit to change the name of the intended Bill as well. Now, there is a person who is affected - Mr. Nihal Sri Ameresekere has gone to the High Court and filed a case. The case number is: 52/2011/CO. He has been one of the persons who took Hilton Hotel to court. At this particular moment, Hon Deputy Speaker, I am tabling* that document, where a seven-judge bench gave a judgment in October, 2002 saying that there cannot be any changes on a certain legal provision that was there.

Hon. Deputy Speaker, now you have a three-judge bench that is giving a judgment on a matter that has already been referred to by a seven-judge bench. That judgement is being referred to this Parliament. One of the judges then was Mrs. Shirani Bandaranayake, who is now the Hon. Chief Justice, who has given the interpretation which you read out now.

The Hilton Hotel case is in court at the moment and that is *sub judice*. How is that it is coming in? This particular revived Bill that is coming in says that protracted litigation is one of the reasons for this underprivileged companies or underutilized companies, and that can be debated. So, are you bringing in laws with retrospective effect? Now, there is a case of the Hilton Hotel, Colombo, - Case No. 52/2011/CO - where Mr. Nihal Sri Ameresekere had gone to court. So, I earnestly request you, Hon. Deputy Speaker, to ensure that this will be set aside until such time that the court gives an interpretation on this. Earlier a seven-judge bench had given a ruling on this.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

Hon. Deputy Speaker, all these facts and circumstances have been duly taken into account when this Bill came up for argument in the Supreme Court. The Supreme Court has considered all relevant facts and circumstances and given its Determination. We are bound only by the Determination of the Supreme Court at the moment. Therefore, there is no legal validity or any argument which can be pursued on the basis of an impending case somewhere else. Even if there is a Stay Order or any other thing, as Parliament we are not bound by them because we are supreme in our legislative activities. The supremacy of the Parliament has been upheld in several decisions made in Parliament. Therefore, there is no basis for the argument of my Friend, the Hon. Ravi Karunanayake. So, it must be dismissed.

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Hon. Members, I have listened to both of you. This is only at the introductory stage today and the matter will be debated tomorrow. The Hon. Speaker will make a decision accordingly tomorrow when the matter is taken up for debate.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I appreciate that. - [*Interruption.*]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රධාන කටයුතු; අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I am still on that point of Order. - [*Interruption.*]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

I have given a ruling. So, you may take it up tomorrow when this matter is debated. - [*Interruption.*] That has no relevance right now.

දැන්, අද දිනට නියමිත කටයුතු.

## නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත
## நொத்தாரிசுகள் (திருத்தம்) சட்டமூலம்
## NOTARIES (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[අ. භා. 2.54]

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Public Administration and Home Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී මම අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, 2, 3, 4 සහ 5 ඉදිරිපත් කරනවා. මේ විෂයයන් 5න් අංක 1 හා 2 විෂයයන් සම්බන්ධව මම පැහැදිලි කිරීමක් කරන්න කැමැතියි. මේ අංක 1 විෂයයෙන් අදහස් කරන්නේ නොතාරිස් පනත් කෙටුම්පත සංශෝධනය කිරීමයි. අංක 2 විෂයයෙන් අදහස් කරන්නේ ලේඛන ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත සංශෝධනය කිරීමයි.

[ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සංශෝධන කිරීම අවශ්‍ය වෙලා තිබෙන්නේ මේ රටේ තිබෙන මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා කියන පළාත් පාලන ආයතන බල ප්‍රදේශ තුළ පිහිටි යම් කිසි ඉඩමක් යම් කෙනෙකු විසින් තවත් කෙනෙකුට පැවරුවොත් ඒ පැවරීම සඳහා ලියා පදිංචි කරන ලද ඔප්පුවට ගෙවන ලද මුද්දර ගාස්තු ඒ පළාත් පාලන ආයතනයට ආපසු ලබා දීමේ අවශ්‍යතාවක් ඇති වී තිබෙන නිසායි. එහෙම අවශ්‍යතාවක් ඇති වෙලා තිබෙන්නේ 1979 අංක 42 දරන මහ නගර සභා සහ නගර සභා සංශෝධන පනතෙනුත්, ඒ වාගේම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙනුත් ඒ පළාත් පාලන බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් සම්බන්ධව ගෙවන මුද්දර ගාස්තු එම පළාත් පාලන ආයතනවලට ගෙවිය යුතුයි කියලා නීතිය සංශෝධනය වෙලා තිබෙන නිසායි. ඒ සංශෝධනය කරන ලද නීතිය මෙතෙක් ක්‍රියාත්මක වුණත් එය ක්‍රියාත්මක කිරීමේදී යම් යම් අපහසුතාවන් පැන නැඟුණා. මොකද, සමහර වෙලාවට පළාත් පාලන ආයතන කවරේද කියලා හඳුනා ගැනීමේ අපහසුතාවන් එනවා. ඒ දේපළ පිහිටා ඇති පළාත් පාලන ආයතන හරියාකාරව හඳුනා ගන්නට නොහැකි වීම නිසා ගෙවීමට තිබෙන මුද්දර ගාස්තු නිවැරැදිව නොගෙවුණු අවස්ථාවන් තිබෙනවා. ඒ නිසා තමයි මේ සංශෝධන පනත් කෙටුම්පත් දෙක අද මේ ගරු සභාවට ඉදිරිපත් කරලා මේ ගරු සභාවේ අනුමැතිය ලබා ගන්න බලාපොරොත්තු වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේට මතක් කරන්නට ඕනෑ අපි දැනට සංශෝධනය කරන්න බලාපොරොත්තු වන්නේ මොන මොන වගන්තිද කියා. නොතාරිස් ආඥාපනතේ 31වන වගන්තියේ (16)වන උපවගන්තිය සහ (26)වන උපවගන්තිය අපි සංශෝධනය කරනවා. ඒ වාගේම ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 13වන වගන්තියේ (1)වන උපවගන්තිය සංශෝධනය කරනවා. දැනට නොතාරිස් ආඥාපනතේ 31 වගන්තියේ (16)වන උපවගන්තියේ සඳහන් වන්නේ ඉඩමේ මායිම් හා ප්‍රමාණය යන විස්තර දැක්වීම පමණයි. ඒ විස්තරවලට අමතරව අපි මේ සංශෝධනයෙන් බලාපොරොත්තු වනවා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, පළාත් පාලන ආයතන බල ප්‍රදේශය, ග්‍රාම නිලධාරි කොට්ඨාසය හා වරිපනම් අංකය කියන විස්තරත් ඇතුළත් කිරීමට.

ඒ වාගේම නොතාරිස් ආඥාපනතේ 31 වන වගන්තියේ (26) වන උපවගන්තියේ දැනට සඳහන් වන්නේ, ඔප්පු පිළිබඳ මාසපතා නාමාවලියක්, ඒ කියන්නේ "ඊ" ආකෘතියෙහි පිටපතක් ඉඩම් රෙජිස්ට්‍රාර්ට යැවිය යුතු බවයි. ඒ වාගේම ඔප්පු පිළිබඳ මාසපතා නාමාවලියේ, ඒ කියන්නේ "ඊ" ආකෘතියේ දැනට ඇතුළත් කළ යුතු කරුණු වශයෙන් තිබෙන්නේ අංකය, දිනය, නීත්‍යනුකූල ලේඛනයේ ස්වභාවය, පාර්ශ්වකරුවන්ගේ නම්, දීමනාකරු හා ලැබුම්කරු, ලියා පදිංචි කළ දිස්ත්‍රික්කය, ඔප්පුව බලපාන ඉඩමේ ඉඩම් එකකට වඩා ඇතොත් පළමුවන ඉඩමේ නම, ප්‍රතිෂ්ඨාව, අනු පිටපතේ මුද්දර යනාදියයි. මේ සංශෝධනයෙන් අපි බලාපොරොත්තු වනවා, ඔප්පු පිළිබඳ මාසපතා නාමාවලියේ පිටපතක් ඉඩම් රෙජිස්ට්‍රාර්ට සහ ඉඩම පිහිටි පළාත් පාලන බල ප්‍රදේශයේ පළාත් පාලන ආයතන කොමසාරිස්වරයා හෝ ලේකම්වරයාට යැවීමට. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතෙක් ඉඩම් රෙජිස්ට්‍රාර්ට පමණක් යවපු "ඊ" ආකෘතිය මින් පසු ඉඩම් රෙජිස්ට්‍රාර්ට වාගේම ඒ ඉඩම පිහිටි පළාත් පාලන බල ප්‍රදේශයේ පළාත් පාලන ආයතන කොමසාරිස්වරයාට හෝ ලේකම්වරයාටත් යැවිය යුතුයි. ඔප්පු පිළිබඳ මාසපතා නාමාවලියේ, ඒ කියන්නේ "ඊ" ආකෘතියේ දේපළ සඳහා බලපාන පළාත් පාලන ආයතනයේ නම ඇතුළත් කිරීමත් කළ යුතු වනවා. මෙතෙක් පළාත් පාලන ආයතනයේ නම ඇතුළත් කිරීමේ අවශ්‍යතාව තිබුණේ නැහැ. නමුත් මීට පසු ඒ නම ඇතුළත් කිරීමේ අවශ්‍යතාව තිබෙනවා.

මෙන්න මේ සඳහා තමයි මේ සංශෝධන දෙක නොතාරිස් ආඥාපනතටත්, ඒ වාගේම ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතටත් ඉදිරිපත් කරන්නට අද අප කටයුතු කර තිබෙන්නේ. මේ සඳහා මේ සභාවේ අනුමැතිය මම බලාපොරොත්තු වනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

[අ. භා. 3.00]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ඇමතිතුමා ගෙනා සංශෝධනවලට අපි විරුද්ධ නැහැ. ඒ සංශෝධන ඇතුළත් වීම ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. ඒ සංශෝධන අවශ්‍යයි. ඒවා අපි අනිවාර්යයෙන්ම පිළිගන්නවා. නමුත් අද මේ නොතාරිස් ක්ෂේත්‍රයේ, ඒ වාගේම ඔප්පු ලිවීමේ ක්ෂේත්‍රයේ, ඉඩම් ලියා පදිංචි කිරීමේ ක්ෂේත්‍රයේ ප්‍රශ්න ගණනාවක් පැන නැඟිලා තිබෙනවා. ඊට හේතුව, මේ ප්‍රශ්න මැඩ පැවැත්වීමට එහෙමත් නැත්නම් මේවා වැළැක්වීමට තිබෙන නීති අද දුර්වල තත්ත්වයකට වැටිලා තිබීමයි. උදාහරණයක් හැටියට ගත්තොත් අද අපට අහන්නට ලැබෙනවා - ඊයේ පෙරේදා ප්‍රවෘත්ති පත්තරවලත් පළ වෙලා තිබෙනවා මම දැක්කා- එකිනෙකාගේ ඉඩම්වලට වෙනත් අය ඔප්පු ලියා ගෙන කියලා. හොර ඔප්පු ලියනවා.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ඒක අද නොවෙයි, ඈත කාලයේ සිට කෙරුණු දෙයක්.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

අද ඒක උග්‍ර වෙලා තිබෙනවා. ඒක එහෙම තිබුණායි කියලා, ඉදිරියටත් එහෙම වෙන්න ඉඩ හරින්න පුළුවන්ද? මේකට මූලික හේතුව- [බාධා කිරීමක්] වෙන්න පුළුවන්. හැම දාම ඒක වාර්තා වෙනවා. අද වන විට වංචා විමර්ශන අංශයට පැමිණිලි එකසිය හතළිස් ගණනක් වාර්තා වෙලා තිබෙනවා. ඉතින් අපි මේක වළක්වන්න වැඩ පිළිවෙළක් යොදන්න ඕනෑ. මොකද, තමුන්නාන්සේලාට -රජයට- වග කීමක් තිබෙනවා, පෞද්ගලික දේපළ ආරක්ෂා කර දීමේ නිසි නීති රීති මේ රටට ගෙනැවිත් ඒවාට සුරක්ෂිතභාවයක් ලබා දෙන්න. මේ වංචාවන් පරණ

කාලයේ සිට කෙරුණායි කියලා දිගටම කෙරෙන්න දෙන්න බැහැ. මාස ගණන් අවුරුදු ගණන් මිනිසුන් නඩු කියනවා. අපි දන්නවා, කවුරු හරි කෙනෙක් මේ රටින් පිට වෙලා පිට රට ඉන්න වෙලාවේ ඔහුගේ ඉඩමට වෙනත් මිනිහෙක් ඇවිල්ලා, නොතාරිස් කෙනෙක් අල්ලා ගෙන, එයාගේ නම දාලා ඔප්පුවක් හදලා වෙනත් කෙනෙකුට විකුණන බව. අර මනුස්සයා රට ඉඳලා මෙහාට එන කොට ඉඩමත් නැහැ; ගෙයත් නැහැ; වෙනත් මිනිහෙක් ඒ ගෙයි පදිංචි වෙලා. අපට මේ වාගේ දේවල් අහන්නට ලැබිලා තිබෙනවා; ඒ වාගේ ප්‍රශ්නවලට මුහුණ දෙන්නට සිද්ධ වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, මම කියන්නේ මේ නීති පද්ධතිය වෙනස් වෙන්න ඕනෑ කියලායි. අපි ආපසු හැරිලා බැලුවොත් නොතාරිස් ආඥාපනත 1907 දී ගෙනා එකක් බව පෙනෙනවා. වංචා විමර්ශන නීති රීති පිළිබඳ අණපනත් 1840 වර්ෂයේ ගෙනා ඒවා. ලේඛන ලියා පදිංචි කිරීමේ පනතේ මූලාරම්භය ඇති වුණේ 1927 දීයි. ඇටෝර්නි බලපත්‍ර පනත ගෙනාවේ 1902 දීයි. ඒ නිසා අපි අලුත් නීති පද්ධතියක් ගෙනැල්ලා මෙයට සුදුසු පිළියමක් යොදන්න ඕනෑ. මේ වංචා, ඒ වාගේම විවිධාකාරයේ ප්‍රෝඩාවන් නවත්වන්නට කටයුතු කිරීම වෙනුවෙන් රජයක් හැටියට තමුන්නාන්සේලාට මේ වගකීම පැවරෙනවා. දැන් තිබෙන ප්‍රශ්නයක් තමයි වෙනත් අයගේ ඉඩකඩම් ලියා ගැනීම. ගෙවල් දොරවල් පවා ලියා ගන්නවා. ගිය සුමානයේ ඔප්පු ලිවීම හා නොතාරිස් කටයුතු පිළිබඳව seminar එකකුත් තිබුණා.

ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් බැලුවොත් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 42ක් තිබෙනවාය කියලා පෙනෙනවා. නොතාරිස්වරු 9,760 දෙනෙක් ඉන්නවා. අද තිබෙන තත්ත්වය හැටියට ආරංචි වෙනවා, licence නැති අයත් නොතාරිස් කියලා seal එක ගහලා ඔප්පුවක් ලියලා රෙජිස්ට්‍රාර් කන්තෝරුවට දෙනවා කියලා. රෙජිස්ට්‍රාර් දන්නේ නැහැ, ඒ තැනැත්තා නොතාරිස් කෙනෙක්ද නැද්ද කියලා. ඔහු ඒ ඔප්පුව ලේඛනගත කරනවා. ඉතින් මේවා නවත්වන්න ක්‍රමයක් අපි හොයන්න ඕනෑ. [බාධා කිරීමක්] ලියන්නේ නැහැ, නමුත් ඒක කෙරෙනවා. මොකද, රෙජිස්ට්‍රාර් දන්නේ නැහැ, ඒ පුද්ගලයා ලියා පදිංචි නොතාරිස් කෙනෙක්ද නැද්ද කියලා. ඔහුට කරන්න තිබෙන්නේ ඔප්පුවක් ආපුවාම ඒකට මුද්දර ගහලා තිබෙනවා නම් ඒක ලියා පදිංචි කරන එකයි. ඒක නිසා මේ ගැනුම්කරුගේයි, විකුණුම්කරුගේයි අනන්‍යතාව තහවුරු වන පිළිවෙළට ලේඛන සකස් විය යුතුයි කියන එක තමයි මූලිකව අපි සඳහන් කරන්නේ. එහි පළමුවන කාරණය වශයෙන් අදාළ අයගේ හැඳුනුම්පතේ ඡායාරූප පිටපත් මේ ඔප්පු සමඟ ඉදිරිපත් විය යුතුයි. ඕනෑම කෙනෙකුට ගිහින් බලලා ඉඩමේ අයිතිකරු අහවලාද නැද්ද කියන එක සොයා ගන්න පුළුවන් තත්ත්වයක් ඇති වෙන්න ඕනෑ. මේක විශාල ප්‍රශ්නයක්. ඒක නිසා විශේෂයෙන්ම මම ගරු ඇමතිතුමාගේ අවධානය මේ කෙරෙහි යොමු කරවනවා.

මේ පිළිබඳව සාකච්ඡාවල් කීපයක් මේ දවස්වල කෙරෙනවා. ගැනුම්කරු, විකුණුම්කරු හඳුනා ගැනීම අවශ්‍යයි. මේ දූෂණ වංචා සියල්ල නැති කරන්න ගැනුම්කරු වෙනුවෙනුත් නීතිඥ මහත්මයෙක් ඉදිරිපත් වෙලා එය සහතික කළ යුතුයි කියලා තවත් යෝජනාවක් තිබෙනවා. පිට රට කෙනෙකු ඉන්නවා නම් කේවියට් පත්‍රයක් ඉදිරිපත් කරලා රෙජිස්ටර් කරන්න ඕනෑ, ඔහුගේ ආරක්ෂාවට. මේ අවශ්‍යතාවන් අපි දන්නවා. නමුත් මේවාට ප්‍රතිකර්ම කරන්න නම් නීතිය රීතිය හරියට සකස් විය යුතුයි. මොකද, රෙජිස්ට්‍රාර්තුමා රජයේ සේවකයෙක්. එතුමාට ලියා පදිංචි කිරීමට යමක් ලැබුණාම ඔහු එය ලියා පදිංචි කරනවා. මේ අයිතිකාරයාද, එහෙම නැත්නම් නීත්‍යානුකූලයි කියන පුද්ගලයාද නැද්ද, නොතාරිස් නීත්‍යානුකූල කෙනෙක්ද නැද්ද කියන එක ඔහු බලන්නේ නැහැ. එම නිසා අද ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මා කිව්වේ ඒකයි. නඩු සිය ගණනක් අද උසාවියේ තිබෙනවා. ජනතාව හුඟ දෙනෙක් බොහොම අසීරු තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන් පදිංචිය නැතිව තිබෙන ඉඩකඩම්වලටයි මේ ප්‍රශ්නය ඇති වෙන්නේ. අපි දන්නවා, පසු ගිය කාලයේ කොළඹ බොහොම සුප්‍රසිද්ධ මිනිස්සු මේ කාර්යයේ යෙදුණු බව. දැනටත් යෙදෙනවාය කියායි ආරංචිය. මෙයින් ජනතාව අසරණ තත්ත්වයකට වැටෙනවා.

ඊ ළඟට ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, මේ සංශෝධන පනත් කෙටුම්පත තුළින් ඔප්පු ලිවීමේ මුද්දර ගාස්තු පළාත් පාලන ආයතනවලට ලැබෙන්නට සලස්වන්නට ඕනෑය කියා. මා ළඟ ඒ විස්තර තිබෙනවා. 2009 වර්ෂයේ මුද්දර ගාස්තු වශයෙන් ලැබී තිබෙන මුළු මුදල බිලියන 114යි. ඒ, මුළු රටේම මුද්දර ආදායම විතරක්. බස්නාහිර පළාතේ විතරක් මුද්දර ගාස්තු වශයෙන් ලැබී තිබෙන මුදල බිලියන 105යි. මෙතැන මා පෙන්නුම් කරන්නට හදන්නේ, විශාල ආදායමක් රටට ගෙන දෙන ව්‍යායාමයකට අදාළ කාර්යාලවල නීතිඥ මහත්වරුන්ට අද පහසුකමක් නැහැ කියන එකයි. ඒ ගැන අප කනගාටු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තමුන්නාන්සේ මේ ගැන දන්නවා. රෙජිස්ට්‍රාර් කන්තෝරුවකට ගියාම බලන්න, කිසිම සැලැස්මක් නැහැ. හේතුව මොකද, ඒ අයට අවශ්‍ය ගොඩනැඟිලි නැහැ; ඒ අයට අවශ්‍ය මේස පුටු නැහැ; වැසිකිළි පද්ධතියක් නැහැ; මුද්දර ගන්නට ගියොත් මුද්දරයක්වත් ගන්නට තැනක් නැහැ; නොතාරිස්වරු එතැනට ගියාම ඒ අයගේ වාහන ගාල් කරන්නටවත් තැනක් නැහැ. මේක විශාල ප්‍රශ්නයක් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මෙච්චර ආදායමක් ගෙන දෙන මේ ව්‍යායාමයට පහසුකම් සලසා දෙන්නට ඕනෑ. මට නොතාරිස් මහත්වරුන්ගෙන් පැමිණිලි කිහිපයක් ලැබී තිබෙනවා. විශේෂයෙන්ම ඒ අය කියන්නේ මේ ඔප්පු ලියා පදිංචි කිරීම තුළ පොත් පත්, පත් ඉරු පවා අද හරියට නඩත්තු වන්නේ නැත කියායි. ඔය හොරකමට, වංචාවට තුඩු දෙන එක කාරණාවක් තමයි, මේ පත් ඉරු මාරු කරන එක. They change the folios. අර පරණ එක ගලවා විසි කරලා අලුතෙන් කොළයක් අරගෙන ලියලා අමුණලා දානවා. මේ රෙජිස්ට්‍රාර් කන්තෝරුවලට තිබෙන පහසුකම් අඩු වීම නිසා තමයි මේ වංචාවන්ට විශේෂයෙන්ම මුහුණ දෙන්නට සිද්ධ වී තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තවත් කාරණයක් තමයි දවාලට ආහාර ගන්න වෙලාවට පැයකට මේ කන්තෝරු වහනවා. නීතිඥ මහත්වරුන් උසාවියේ ඉඳලා මේ වෙලාවට තමයි රෙජිස්ට්‍රාර් කන්තෝරුවලට යන්නේ, ඒ කන්තෝරුවල තිබෙන පත් ඉරු බලා ඔප්පු සහතික කරන ක්‍රියාදාමය කරන්න. එහෙම කන්තෝරු එකවර වසා දැමීමත් කරන්න එපාය කියා මා කියනවා. පැයකට එකවර කාර්යාල වසා දමන්න වුවමනාවක් නැහැ. විටින් විට ගිහින් ආහාර ගන්න පුළුවන්. අනෙක් එක ඒ කාර්යාලයේ ඉන්න නිලධාරියා ආහාර පාන ගන්න පාවිච්චි කරන්නේත් අර නීතිඥ මහත්වරුන් ගිහින් වාඩි වෙන මේසයයි. මේක හරිම කනගාටුදායක තත්ත්වයක්. රෙජිස්ට්‍රාර් කන්තෝරුවලට එහෙම නැත්නම් මේ ලේඛනාගාරවලට මීට වඩා පහසුකම් දිය යුතුමයි. මෙච්චර විශාල මුදලක් මුද්දර ගාස්තු වශයෙන් රටට ලබා ගන්න අවස්ථාවේදී පළාත් සභාවලින් හෝ මුදලක් වෙන් කර මේ කාර්යාලවල අවශ්‍යතාවන් සම්පූර්ණ කර දිය යුතුයි. මේ කාර්යාලවල එහෙම නැත්නම් මේ ලේඛනාගාරවල නිලධාරිනුත් එක්ක සාකච්ඡා කර තිබෙන අඩු පාඩු මොනවා ද කියා සොයා බලා ඒවා සම්පූර්ණ කරන්නට කටයුතු කිරීම අවශ්‍ය කාරණයක් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම නීතිඥ මහත්වරුන් අපට කරන පැමිණිල්ලක් තමයි, රෙජිස්ට්‍රාර් කන්තෝරුවේ ගිහින් වාඩි වෙන්න තමන්ට හරි හමන් පුටුවක් නැහැයි කියන එක. විදුලි පංකාවක් නැහැ කියනවා. මේක වැදගත් ආයතනයක්. ජනතාවගේ කෝටි ගණන් වටිනා ඉඩකඩම්වල අයිතිය ලේඛනගත කරන අවස්ථාවක්. තමුන්නාන්සේලා මේ ගැන වහාම සුදුසු පියවර ගන්නට ඕනෑ.

[ගරු ජෝන් අමරතුංග මහතා]

විශේෂයෙන්ම අවශ්‍ය නීතිරීති හරියට සම්පාදනය කරන්නට ඕනෑ. ගැනුම්කරුගේ හා විකුණුම්කරුගේ අනන්‍යතාව හරියට සහතික වන පිළිවෙළට ඒ අයගේ හැඳුනුම් පත් මඟින් හෝ මොනවා හෝ ක්‍රමයක් ඇති කර වගකීම හරියාකාර ඉෂ්ට වන හැටියට මේක සකස් කරන්නට ඕනෑ. සාක්කිකරයෝ ඇවිත් අත්සන් කරනවා. නොතාරිස් දන්නේ නැහැ, මේ සාක්කිකාරයෝ කවුද කියා. කොහේවත් යන මිනිස්සු ගේනවා. ඒ මිනිස්සුන්ට කීයක් හෝ දුන්නාම ඒකට අත්සන් කරනවා. එම නිසා මේක විශාල ප්‍රශ්නයක් බවට අද පත් වී තිබෙනවා. මේ ගැන කථා කරන්නට හේතු වී තිබෙන්නේ වංචනික ලෙස ඔප්පු ලියා ගැනීමයි; අනුන්ගේ ඉඩම් ලියා ගන්න එකයි. මා දන්නවා, කොළඹ ප්‍රදේශයේ අද හරිම භයානක තත්ත්වයක් තිබෙන බව. හුඟක් දෙනෙකුට අද මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා. ඒ ගැන උසාවියට ගියාම අවුරුදු ගණනක් යනවා.

ඊ ළඟට ඒක appeal කරනවා. නොයෙකුත් විධියට උසාවියෙන් උසාවියට යනවා. අන්තිමට නඩුවේ තීන්දුවක් ලැබී ඉඩම ආපහු ලැබෙන කොට අර අහිංසක මනුෂ්‍යයාගේ දේපළවල වටිනාකමත් ඉවරයි. අද මට කථා කිරීමට මේ අවස්ථාව ලැබුණු එක හුඟක් හොඳයි. තමුන්නාන්සේලා මේ පිළිබඳව වහාම ක්‍රියාත්මක වේවිය කියා අපි බලාපොරොත්තු වනවා. මෙහිදී කරුණු දෙකක් තිබෙනවා. එකක් ඔප්පු සහතික කිරීම පිළිබඳවයි. එක පැත්තකින් ගැණුම්කරු සහ විකුණුම්කරු සනාථ කරන නීත්‍යනුකූල තත්ත්වයක් ඇති කිරීම අවශ්‍ය වනවා. අනෙක් අතට මේ සා විශාල ආදායමක් ලබන මේ දෙපාර්තමේන්තුවේ කටයුතු කරන ස්ථාන මීට වඩා විධිමත් පිළිවෙළට සකස් කර නොතාරිස්වරුන්ට, නීතිඥ මහත්වරුන්ට හරියාකාරව ඒ කටයුතු කරන්න අවස්ථාව සලසා දීම අවශ්‍ය වෙනවා.

ඊ ළඟට අද දින විවාද කරන මුදල් පනත යටතේ නියෝගය ගැන මම කථා කරන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු නියෝජ්‍ය කථානායකතුමා ඔය ආසනයේ සිට සුප්‍රිම් උසාවියේ නියෝගයක් අද කියෙව්වා. ඒ කියෙව්වේ හෙට තිබෙන පනත් කෙටුම්පත පිළිබඳවයි. කාලවේලාව මදිය; ඒ නිසා අපට වැඩියෙන් කාලය ලබා දෙන්නය කියා අපි ඉල්ලුවා. නමුත් අපට ඒ සඳහා අවස්ථාව ලැබුණේ නැහැ. 2011 නොවැම්බර් 4වැනි දා 'ලංකාදීප' පුවත් පතේ මේ පිළිබඳව ප්‍රකාශයක් තිබුණා. මේ පනත් කෙටුම්පතේ තිබෙන විධිවිධාන ගැන, පවරා ගන්න යන ඉඩම් සහ කර්මාන්තශාලා පිළිබඳව එහි සඳහන් කර තිබුණා. ඒ ප්‍රකාශය කර තිබුණේ කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමායි. කැබිනට් රැස්වීම අවසන් වුණායින් පසුව, කැබිනට් රැස්වීමේදී ගත්තු තීන්දුවක් තමයි රජයේ මාධ්‍ය ප්‍රකාශක වශයෙන් එතුමා කියා තිබුණේ. එම පුවත් පතේ මේ විධියට සඳහන් වනවා:

"අසාර්ථක ව්‍යාපාර 37ට අමතරව ඉදිරියේදී තවත් එවැනි ඒවා පවරා ගන්න ඉඩ"

මේක කුතුහලයට ලක් වෙලා තිබෙන භයානක ප්‍රශ්නයක්. ව්‍යාපාර 37ක් පවරා ගන්න ගිහින් තමයි රට බොහොම කැළඹිලා තිබෙන්නේ. මට ලැයිස්තුවක් හම්බ වුණා. මම ඒක අද ඉදිරිපත් කරන්නේ නැහැ. මොකද, ඒ ලැයිස්තුව හරිද වැරදිද කියා ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගෙනුත් මම අහලා බලන්න ඕනෑ. මේක පවරා ගන්නා ව්‍යාපාරවල දෙවැනි ලැයිස්තුවය කියා තිබෙනවා. තවත් ව්‍යාපාර කිහිපයක් අත් පත් කර ගන්න සැලසුම් කරගෙන යනවාය කියා ඒවායේ නාම ලේඛනයකුත් එවා තිබුණා. මම හිතන හැටියට කවුරු හෝ අන්තර් ජාලයට මේ විස්තර ඇතුළත් කරලා ඇති. මේක හරි භයානක වැඩක්. මේ 37 හැර තවත් ව්‍යාපාර පවරා ගැනීමේ වැඩසටහනක් තිබෙනවාද කියන එක ගැන අපට ප්‍රකාශයක් ඕනෑ. ඒ පිළිබඳව අපට පැහැදිලි උත්තරයක් ලැබුණොත් හොඳයි. ඒ ගැන මේ ඇමතිතුමාගෙන් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු ඇමතිතුමාගෙන්- අහන්න බැහැ. මුදල් පනත යටතේ නියෝගයකුත් අද දින සාකච්ඡාවට ගන්නා නිසායි මම මේ කාරණය ඉදිරිපත් කරන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු මන්ත්‍රීතුමා, ඒ ලැයිස්තුවේ තිබෙන නම් ටික කියන්න බැරිද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
බැහැ. ඒක ඉදිරිපත් කරන්න මම කැමැති නැහැ, හරියට තහවුරු කරගන්නකම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මා ළඟ ඒ ලැයිස්තුව තිබෙනවා, මන්ත්‍රීතුමනි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
තමුන්නාන්සේ මට කිව්වා ඒ ලැයිස්තුව තිබෙනවාය කියා. ඒක හරිද කියා ආර්ථික සංවර්ධන අමාත්‍ය*තුමාගෙන්* අහලා තමයි ඒ ගැන කතා කරන්න ඕනෑ. නැත්නම් ඒක -අපි නොදන්නා දේවල් ගැන කතා කරන්න යන එක- අසාධාරණයි. මුදල් පනත යටතේ නියෝගයකුත් අද ඉදිරිපත් කරන නිසායි මම මේ ගැන සඳහන් කළේ. මේක බොහොම වැදගත් ප්‍රශ්නයක්. ව්‍යාපාරිකයන් අද බොහොම කණස්සල්ලෙන් ඉන්නවා, මගේ ව්‍යාපාර ගනීවිද, මගේ ව්‍යාපාර ගනීවිද, අහවලාගේ ව්‍යාපාර ගනීවිද කියා. ආර්ථික සංවර්ධන ඇමතිතුමා මේ අවස්ථාවේදී සභාවට පැමිණෙනවා. ඒ කාරණය පිළිබඳව මම එතුමාගෙන් දෙවනුව අහගන්නම්.

තුන්වන කාරණය තමයි, මෝටර් වාහන පනත යටතේ නියෝග දෙකක් සම්බන්ධයෙනුත් අද සාකච්ඡා වෙනවා කියන එක. මම මෙතැනදී ඉල්ලීමක් කරන්න කැමැතියි. දැන් තමුන්නාන්සේලා අධිවේගී මාර්ග හදා ගෙන යනවා. ඒක හොඳයි. අපි ඒක අගය කරනවා. ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත් ඒවා හදා ඉවර වන තෙක් හෝ මේ මාර්ගවල අද යන්න බැහැ. කොළඹ සිට රත්මලාන දක්වාත්, කොළඹ සිට මීගමුව දක්වාත් මාර්ගවල අද කොහොමවත් යන්න බැහැ. ඒ තරම් විශාල තදබදයක් තමයි තිබෙන්නේ. ඒක ඉතින් රටේ වාහන වැඩි වීම පිළිබඳ ප්‍රශ්නයක්. අඩුම තරමින් උදේ හයේ ඉඳලා රාත්‍රී අට වන තෙක් කන්ටේනර්, ට්‍රේලර් හා මහා පරිමාණයේ ලොරි ධාවනය නතර කිරීමට ක්‍රමයක් නැද්ද කියා අපි අහනවා. කාලයක් අපි ඒක කළා. අපේ ආණ්ඩුව තිබුණු කාලයේ අපි ඒ කාල සීමාව තුළ ඒ වාහන ධාවනය නැවැත්වුවා. එහෙම නවත්වන්න හේතු කිහිපයක් තිබුණා. අද බලන්න, පාසල් ශිෂ්‍යයන් කී දෙනෙක් යට කරගෙන ගිහින් තිබෙනවාද, මෝටර් රථ සට්ටන කොතරම් ප්‍රමාණයක් සිදු වී තිබෙනවාද කියලා. ගමනක් යන්න පැය ගණනක් ගත වෙනවා. ඉන්ධනවලට මොන තරම් විශාල මුදලක් වැය වෙනවාද බලන්න. ඒ විශාල වාහනවලට පුළුවන් බොහොම ලේසියෙන්ම රාත්‍රී කාලයේ ඒ රාජකාරිය කරන්න.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා (ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ - பொருளாதார அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Basil Rohana Rajapaksa - Minister of Economic Development)
එහෙම තමයි දැනුත් කරන්නේ. [බාධා කිරීමක්]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නගරයට එන්න පුළුවන් නේ රෑට. [බාධා කිරීමක්] නැහැ නේ. හැන්දෑවට ගිහිල්ලා බලන්නකෝ පාරේ යන්න පුළුවන්ද කියලා. [බාධා කිරීමක්]

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ඒවා සවස 6.00න් පසුව යන්නේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මම දන්නේ නැහැ, උදේ ඉඳන් මේ පාරවල් ඔක්කෝම block වෙලා. ස්ථිර වශයෙන්ම කිව්වොත් උදේ 6.00ට තමයි විද්‍යාලවලට යන ළමයින්ගේ වාහන, අරවා මේවා ඔක්කොම යන්න පටන් ගන්නේ. ඒ අයටත් වෙලාවට ළමයින්ව විද්‍යාලවලට ගෙන යන්නට බැහැ මේ තදබදය නිසා. හවසටත් එහෙමයි. [බාධා කිරීමක්] නැහැ, නැහැ, දැන් පැය 24ම ගමන් කරනවා. රෑට වඩා විශේෂයෙන්ම දහවල් කාලයේ තමයි යන්නේ. අනෙක් එක පොඩි වාහන නොවෙයි. ඒවා අඩි 40ක්, 50ක් දිගයි. අපිත් පාරේ යනකොට බොහොම අමාරුවෙන් බේරිලා යන්නේ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardana - Deputy Minister of Ports and Highways)
එක කන්ටේනරයක්වත් ඒ වෙලාවට යන්නේ නැහැ. අපි දන්නා හැටියට හැන්දෑවේ 6.00න් පසුව විතරයි කන්ටේනර් යන්නේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැහැ නේ. තමුන්නාන්සේ හැන්දෑවට මාත් එක්ක එන්න, පෙන්වන්න. ඔය කිව්වාට- [බාධා කිරීමක්] යන්න පුළුවන් සවස 6.00න් පසුව වුණාට උදේ ඉඳලාම ඒවා දුවනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
එහෙනම් ඒ මිනිසුන්ට මොළේ අමාරුවක් වෙන්න ඇති. ඒක අරගෙන වටේ දුවන්න.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
සමහරවිට තමුන්නාන්සේ කොළඹ ඉන්න නිසා ඒක තේරෙන්නේ නැතිව ඇති.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. John Amaratunga, please wind up now.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
කොළඹ-රත්මලාන දක්වා, කොළඹ-මීගමුව දක්වා උදේ 6.00 සිට රෑ 8.00 වන තුරු containers, trailers සහ ලොකු ලොරි යෑම, - [බාධා කිරීමක්] අධිවේගී මාර්ග හදලා ඉවර වුණාට පසුව ඒක කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. එතකොට ඕනෑ හැටියට මිනිසුන්ට යන්නට පුළුවන්. කිසි කරදරයක් නැහැ. අපි හැම දාම බලා ගෙන ඉන්නවා, කවදාද මේ අධිවේගී මාර්ග හදලා ඉවර කරන්නේ කියලා. ඒක අපට අත්‍යවශ්‍යයි. මේ රටේ කවුරු ආණ්ඩු කෙරුවත් ඒවා මේ රටට ඕනෑ. දැන් රටේ ආර්ථිකය වැඩි දියුණු වෙලා වාහන දුවනවා. ඉතින් ඒක හංගන්න දෙයක් නැහැ නේ. අපි ඒක නැහැ කියන්නේ නැහැ. ඒක වෙන්න පුළුවන්. නමුත් මිනිසුන්ට ඒ අතර ජීවත් වන්න බැරි නම් මොකක්ද ඒ ආර්ථික සංවර්ධනයෙන් ඇති වැඩේ කියන එක මතක් කරමින් මා නිහඬ වනවා. ඔබතුමාට ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Kumara Welgama. You have 12 minutes.

[අ. භා. 3.17]

**ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජෝන් අමරතුංග ගරු මන්ත්‍රීතුමා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වැඩ බලන විපක්ෂ නායකතුමා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
වැඩ බලන විපක්ෂ නායකතුමාද? මට සමාවන්න. වැඩ බලන විපක්ෂ නායකතුමා containers සම්බන්ධව ප්‍රශ්නයක් මතු කළා. මා හිතන විධියට එතුමා කිව්ව එක හරි. මොකද, දහවල් කාලයේ containers ධාවනය කරන්නට බැහැ කියලා එහෙම තහනමක් ගැසට් කරලා නැහැ. ඉතින් එතුමා කියපු දේ සැලකිල්ලට අරගෙන අපි යම් කිසි තීරණයක් ගත යුතුයි කියන එක මා මේ අවස්ථාවේ දී මතක් කරන්නට ඕනෑ.

ඊ ළඟට, විශේෂයෙන්ම අධිවේගී මාර්ග ගැන කථා කරනකොට මේ ගැනත් මා කියන්න ඕනෑ. දැන් අපි අධිවේගී මාර්ග සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් ගත යුතු ක්‍රියා මාර්ග කිහිපයක් ගැසට් කරලා තිබෙනවා. ඒවා මේ ගරු සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අනුව මා පළමුවෙන්ම කියන්න ඕනෑ, අධිවේගී මාර්ගයේ යන්න පුළුවන් වේග සීමාව පැයට කිලෝ මීටර් 100ක් කියලා ගැසට් කරලා තිබෙනවාය කියලා. ඒ වාගේම එහි ගමන් කරන්න පුළුවන් අවම වේග සීමාවක් සඳහන් කරලා නැහැ. යන්න පුළුවන් අවම වේගයක් එහි සඳහන් කරලා නැහැ. නමුත් පැයට කිලෝ මීටර් 100ක් දක්වා ධාවනය කරන්න පුළුවන්. අවම වේග සීමාවක් සඳහන් කරලා නැහැ. ඒකට හේතුවක් තිබෙනවා. අධිවේගී මාර්ගයේ මං තීරු දෙකක් තිබෙනවා, එක පැත්තකට යන්න. එක මං තීරුවක සාමාන්‍ය වේගයෙන් යනකොට අනෙක්

[ගරු කුමාර වෙල්ගම මහතා]

මං හිතුවේ පැයට කිලෝ මීටර් 100ක වේගයෙන් යන්න පුළුවන් විධියට තමයි මේ මාර්ගය හදලා තිබෙන්නේ.

විශේෂයෙන්ම මා කියන්න ඕනෑ, මේ අධිවේගී මාර්ගයේ motorcycles, motor tricycles, motor tricycle vans, කෘෂිකර්ම ඉඩම් වාහන, අත් ට්‍රැක්ටර්, ආබාධිතයන් සඳහා උපයෝගී කර ගන්නා රථ, ඒ වාගේම steam engines වැනි වාෂ්ප බලයෙන් ක්‍රියා කරන ඒවා ධාවනය කරන්න තහනම් කර තිබෙනවාය කියලා. අධිවේගී මාර්ගයේ අඩි 40ක trailer එකක් යන්න පුළුවන්. [බාධා කිරීමක්]Pushbikes යන්න බැහැ. Pushbikes තියා මිනිහෙකුට පයින්වත් යන්න බැහැ. නමුත් යම් කිසි breakdown එකක් වුණොත්, ඒක ඇද ගෙන යන්න වාහනයක් -towing vehicle එකක්- ගෙනෙන්න ඕනෑ. ඒකට කොමසාරිස්තුමාගේ විශේෂ අවසරයක් අර ගෙන tow කරන වාහනය අරගෙන යන්න පුළුවන්.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
කොමසාරිස්තුමා සොයන්න පැය ගණනක් යයි නේ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
නැහැ, කොමසාරිස්තුමා ඉන්නවා නේ RMV එකේ. එයා ඉන්නවා; Highway එකේ Director-Generalතුමා ඉන්නවා. එහෙම නැත්නම් පොලිස්පතිතුමා ඉන්නවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒකට වෙනම පොලීසියක් ඇති කරන්න ඕනෑ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
වෙනම පොලීසියකුත් තිබෙනවා. Highway එකට වෙනම පොලීසියක් තිබෙනවා. Highway Traffic Police එක තිබෙනවා. අධිවේගී මාර්ගයේ motorcycles යන්න බැරි වුණාට, පොලීසියේ motorcyclesවලට යන්න පුළුවන්. High-speed motorcyclesවලට යන්න පුළුවන්. විශේෂ අවසරයක් අරගෙන යන්න පුළුවන්. නඩත්තු කටයුතු කරන්න මිනිස්සු පයින් යනවා නම්, ඒකටත් විශේෂ අවසරයක් ගන්න ඕනෑ. අවසරයක් ගන්නේ නැතිව යන්න බැහැ. අධිවේගී මාර්ගය කියන්නේ ඉතා ඉක්මනින් යන්න පුළුවන් මාර්ගයක්. එවැනි මාර්ගයක් තමයි මේ හදලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වාහනයක් overload කරන්න බැහැ. සාමාන්‍යයෙන් වාහනයක ගෙන යන්න පුළුවන් දළ බරක් තිබෙනවා. ඒ බරට වඩා load කර ගෙන යැමත් තහනම්. ඒ වාගේම පළලින් වැඩි වාහන යැමත් තහනම්. පළලින් වැඩි වාහන නම් register කරන්නේ නැහැ. වාහන register කරන්න පළලේ යම් කිසි සීමාවක් තිබෙනවා. ඒ සීමාව තුළ තමයි register කරන්නේ. පළලින් වැඩි වුණොත් ඒ වාහනවලට යන්න ඉඩ දෙන්නත් බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මෙහි තවත් දෙයක් තිබෙනවා. වාහන නවත්වන්න විශේෂ තැන් තිබෙනවා. ඒ විශේෂ තැන්වල හැර තමන්ට ඕනෑ තැනක වාහනය නවත්වන්නත් බැහැ. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ඒකත් තහනම් කරලා තිබෙන්නේ. ඒ වාගේම හදිසියේවත් වාහනයක් breakdown වුණොත්, විශේෂයෙන්ම කියලා තිබෙනවා ත්‍රිකෝණයේ හැඩයට තිබෙන breakdown sign එක පෙන්වන්න ඕනෑ කියලා. ඒ වාගේම වාහනයේ lights දමලා තියන්න ඕනෑ. ඒවා පැහැදිලිවම ප්‍රකාශයට පත් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, learners -වාහන එළවන්න පුරුදු වන අයට- "L" board ගහ ගෙන අධිවේගී මාර්ගය ඇතුළට යන්න බැහැ. ඒකත් තහනම් කරලා තිබෙන්නේ. මේ කරුණු තමුන්නාන්සේලාට විශේෂයෙන්ම කියන්න ඕනෑ. බැකෝ වාගේ විශේෂ කාර්ය වාහනවලටත් ඒ පාරේ ගමන් කරන්න බැහැ. නමුත් නඩත්තු කටයුත්තකට යනවා නම් අවසරයක් අර ගෙන ඒ බැකෝ යන්ත්‍රවලට නැත්නම් excavators වලට යන්න පුළුවන්.

මම හිතන හැටියට මේ සම්බන්ධව තමුන්නාන්සේලාට මේ කිව්ව අදහස් ටික ඇති.

අපි දැනටමත් seat belt එක සම්බන්ධවත් තමුන්නාන්සේලා දැනුවත් කරලා තිබෙන්නේ. 2000 අවුරුද්දේ "GA" කියන අංක කාණ්ඩය පටන් ගත්ත දවසේ සිට අද දක්වා සහ මින් ඉදිරියට register කරන හැම වාහනයකම ඉස්සරහ යන driver සහ අනෙක් passenger යන දෙදෙනාම seat belts පැළඳිය යුතුය කියන එක මේ අවස්ථාවේ අවධාරණයෙන් කියනවා. ඒ වාගේමයි ලොරි සහ බස් රථවලටත්. 2011 ඔක්තෝබර් මස 01 වැනිදායින් පස්සේ register කරන ලොරි සහ motor coachesවල -ඒ කියන්නේ බස් රථවල- ගමන් කරන අය seat belts පැළඳිය යුතුයි. ඒකත් මේ අවස්ථාවේ කියනවා. ඊට කලින් register කරලා තිබෙනවා නම් ඒවාට seat belts පළඳින්නේ නැතිව යන්න පුළුවන්. Seat belts තිබෙනවා නම් තමන්ට ඒවා පැළඳ ගෙන යන්න පුළුවන්. නමුත් ඒවා නැත්නම් charge කරන්නේ නැහැ. තමුන්නාන්සේලා බඳ පටිය ගැන දන්නවා. බඳ පටියට pins තුනක් තිබෙනවා. Pins තුන හෝ ඊට වඩා තිබෙන බඳ පටි තමයි පාවිච්චි කරන්න පුළුවන්. අඩු ප්‍රමිතියෙන් තිබෙන ඒවා පාවිච්චි කරන්න බැහැ. ඒ වාගේම වාහනයක් reverse කරන කොට බඳ පටි බැඳ ගෙන reverse කරන්න අමාරුයි. එතකොට reverse කරන්න බැහැ. ඒකත් මේ වෙලාවේ කියන්න ඕනෑ. එතකොට ඕනෑ නම් බඳ පටිය ගළවලා reverse කරන්න පුළුවන්. මම හිතන හැටියට ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා ඒකට බොහොම කැමැතියි. මොකද, ඔබතුමා මේ දවස්වල reverse gear එකේ නේ යන්නේ. ඒ නිසා reverse එකේ යන කොට බඳ පටිය ගළවා ගෙන යන්න පුළුවන්. අප ඉස්සරහට යන නිසා බඳ පටිය දමා ගෙන යනවා.

අසනීප තත්ත්වයේ පසුවන අයත් ඉන්නවා. බඳ පටිය දමන්න බැරි යම් කිසි අසනීප -රෝගී- තත්ත්වයකින් ඉන්නවා නම් ඒ අයට පුළුවන් පිළිගත්ත වෛද්‍යවරයෙකුගෙන්, ඒ කියන්නේ Sri Lanka Medical Council එක- [බාධා කිරීමක්] ඒ කියන්නේ? ආබාධිත අය? ආබාධිත අය ගැන මම කථා කරන්නේ නැහැ. මොකද අපේ ජෝන් අමරතුංග මහත්මයා බොහොම කෙළින් ඉන්නවා. එතුමා බොහොම ලස්සන මහත්මයෙක්. මම මේ ළඟකදී පින්තූරයකුත් දැක්කා. මේකත් අමතක වෙනවා එතුමාව දැක්කාම. මේ ළඟකදී එතුමාගේ පින්තූරයක් පත්තරේ පළ වෙලා තිබෙනවා මම දැක්කා. බොහොම ලස්සන, හොඳ ගාම්භීර විධියට යන කෙනෙක් තමයි ජෝන් අමරතුංග මහත්මයා. අපි එක club එකේ නේ. [බාධා කිරීමක්] ඒක මේ පාර්ලිමේන්තුවේදී කියන්න බැහැ. නමුත් ඒ club එකේ සෑහෙන membersලා මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඉන්නවා. ඒවා පෞද්ගලිකයි, රහසිගතයි. ඒවායේ අදහස් කාටවත් දෙන්නේ නැහැ. ඒවා පිටට දෙන්නේ නැහැ. Swiss Bank එක වාගේ තමයි.

Sri Lanka Medical Council එකේ ලියා පදිංචි වෙච්ච, පිළිගත්ත වෛද්‍යවරයෙකුට පුළුවන්, මාස හයකට ඒ බඳ පටි දමන්නේ නැතිව යන්න සහතිකයක් දෙන්න. ඒ medical certificate එකත් අරගෙන RMV එකට එන්න ඕනෑ. මේ සඳහා RMV එකේ විශේෂ form එකක් පුරවන්න තිබෙනවා. ඒක පුරවලා seal එක ගහගෙන යන්න පුළුවන්. එතකොට ඒක වලංගුයි. ඒකට සතයක්වත් අය කරන්නේ නැහැ. නොමිලේ තමයි එය කරන්නේ. ඒකත් මම තමුන්නාන්සේලාට කියන්න ඕනෑ. නොමිලේ තමයි ඒ සේවාව ප්‍රවාහන අමාත්‍යාංශයෙන්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන්නේ. මාස හයකට වැඩිය කාලය යනවා නම් කරන්නේ මෙහෙමයි. ඒකේ committee එකක් තිබෙනවා. ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්තුමා committee එකක් පත් කරනවා. ජාතික ප්‍රවාහන වෛද්‍ය මධ්‍යස්ථානයේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන වෛද්‍ය නිලධාරින් දෙදෙනෙක්, සෞඛ්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය නිලධාරින් දෙදෙනෙක්, රියැදුරෙකුගේ කුසලතාව පරීක්ෂා කිරීම සඳහා ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නම් කරනු ලබන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙක් යන අය ඒ committee එකේ ඉන්නවා. ඉතින් ඒ ගොල්ලන්ට කරුණු ඉදිරිපත් කරලා, එතැන form එකක් තිබෙනවා, ඒ form එක පුරවලා දීලා මාස හයකට වැඩිය යන්න ඕනෑ නම් ඒ අවසර පත්‍රය ලබා ගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෝටර් සයිකල්වලට seat belts නැහැ. මෝටර් ත්‍රියිසිකල්වලට seat belts නැහැ. ත්‍රියිසිකල් වෑන් තිබෙනවා. ඒවාටත් seat belts නැහැ. ඉඩම් වාහනවලට seat belts නැහැ. අත් ට්‍රැක්ටර්වලට seat belts නැහැ. අපට හැම දාම උපකාරී වන hearse එකටත් බඳ පටිය දමන්න අවශ්‍යතාවක් නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
එතකොට පිටිපස්සේ යන කෙනාට?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
එයාට පටි දමනවා. බඳ පටි ගැන කථා කරන්න ගියොත් -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, please wind up now. Your time is over.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කථා කළා ඇතිද? ඇති නම් නවත්වන්නම්.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඔබතුමන්ලා අධිවේගී මාර්ගය හදන එකට සන්තෝෂයි. කවදාද අපට ඒකේ යන්න හම්බ වන්නේ?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ළඟදීම යන්න හම්බ වෙනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
අප බලා ගෙන ඉන්නවා, ඒක කවදාද විවෘත කරන්නේ කියලා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මේ ඉන්නේ අපේ මහාමාර්ග නියෝජ්‍ය ඇමතිවරයා. එතුමා ඒකට උත්තර දෙයි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
බස් එකක් දමනවාද? [බාධා කිරීමක්]

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
බස් එකක් දමන්නේ නැහැ. හොඳ luxury buses දෙකක් දමනවා. [බාධා කිරීමක්] නැහැ, පොඩ්ඩක් ඉන්න ඒකේ අර service area එක හදනකම්. මොකද තමුන්නාන්සේලා ගෙනිච්චාට වැඩක් නැහැ නේ, service area එකට ගෙනියන්න එපා යැ. ගිහිල්ලා සාත්තු සප්පායම් කරන්න එපා යැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Service එක හරියට තියෙන්න ඕනෑ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
Service එක දෙන්න එපා යැ. තමුන්නාන්සේලාට අඩු ගණනේ පොඩ්ඩක් සන්තෝෂ වෙන්න පුළුවන් මොනවා හරි කෑමක් බීමක් දෙන්න එපා යැ. ඒක හින්දා ඒ service areaඑක හැදුවාට පස්සේ අනිවාර්යයෙන්ම- [බාධා කිරීමක්] තවත් ඕනෑ නම් ඒවාත් දෙන්නම්. [බාධා කිරීමක්] ඔව්, ඒවා ඉතින් දෙන්න පුළුවන් මිනිහෙක් නේ මම. මම නිතරම පාරේ ඉන්න මිනිහා. ඒක හින්දා මට ඒ service එක ඕනෑ වෙලාවක දෙන්න පුළුවන්. ගරු ජෝන් අමරතුංග මහත්මයා මා ගැන හොඳටම දන්නවා.

මා මීට වඩා මේ සම්බන්ධයෙන් කථා කරන්නේ නැහැ. යෝජනා සම්මත කර ගැනීම සඳහා තමුන්නාන්සේලා සියලු දෙනාගේම පූර්ණ සහයෝගය ලබා දෙන්නය කියා ඉල්ලා සිටිමින් මාගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 3.30]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට මා බලාපොරොත්තු වනවා. ඇත්ත වශයෙන්ම මේ සංශෝධනය කාලෝචිතයි. මේ පාර්ලිමේන්තුවේත් නොතාරිස් මහත්වරු ගණනාවක් සිටිනවා. ඔප්පුවක් ලියන විට දැන් තිබෙන නීතියේ හැටියට දිස්ත්‍රික්කය, පත්තුව සහ කෝරළය ඇතුළත් කළ යුතුයි. මම කනගාටු වනවා, ගරු ඇමතිතුමා දොස් කීම ගැන. මේක වැදගත් ප්‍රශ්නයක්. ඉස්සර ලංකාවේ තිබෙන සෑම ගමක්ම පිහිටා

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

තිබෙන දිස්ත්‍රික්කය, පත්තුව සහ කෝරළය ආණ්ඩුව විසින් ලැයිස්තු ගත කර තිබුණා. The Government had a log book which stated the district, pattu and korale which every village belonged to. ඒ කියන්නේ සෑම ගමක්ම අයත් දිස්ත්‍රික්කය, පත්තුව සහ කෝරළය සඳහන් වුණ ලැයිස්තුවක් තිබුණා. නොතාරිස් මහත්වරු ඒක දන්නවා. නමුත් අද ඒ වාගේ ලැයිස්තු සකස් කරන්නේ නැහැ.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමනි, ඔබතුමා මේ සම්බන්ධව කථා කරනවාද කියා මා දන්නේ නැහැ. ඉස්සර "Village List" එකක් තිබුණා. සෑම ගමක්ම පිහිටා තිබෙන දිස්ත්‍රික්කය, පත්තුව සහ කෝරළය සඳහන් ලැයිස්තුවක් ආණ්ඩුව හැදුවා. ඒක සෑම ඉඩම් කන්තෝරුවකම තිබුණා. දැන් ඔබතුමන්ලා අලුත් නියෝගයක් ගේනවා, සෑම ඉඩමක්ම පිහිටා තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, පළාත් පාලන ආයතනය සහ ග්‍රාම නිලධාරි වසම ඇතුළත් කරන්නය කියලා. නමුත් ආණ්ඩුව එහෙම ලැයිස්තුවක් හදලා තිබෙනවාද, මේ ලංකාවේ තිබෙන සෑම ගමක්ම අයිති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, පළාත් පාලන ආයතනය සහ ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත් කරලා. එහෙම ලැයිස්තුවක් හදලා නැහැ. ගරු ඇමතිතුමනි, එහෙම දෙයක් හදලා නැහැ. ඒ වගකීම තිබෙන්නේ ආණ්ඩුවට. එහෙම ලැයිස්තුවක් ඉඩම් කන්තෝරුවේ නම් නැහැ. There must be a list in the Land Registry.

ඉස්සර "Village List" -ගම් ලැයිස්තුව- කියලා එකක් තිබුණා. ඒ ගම් ලැයිස්තුවේ දිස්ත්‍රික්කයයි, පත්තුවයි, කෝරළයයි සඳහන් වුණා. නමුත් මේ අලුත් අවශ්‍යතාවට අනුව සෑම ඉඩමක්ම පිහිටා තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයි, පළාත් පාලන ආයතනයයි, ග්‍රාම නිලධාරි වසමයි ඇතුළත් ලැයිස්තුවක් ආණ්ඩුවේ ඉඩම් කන්තෝරුවල නැහැ. මේ ගැන කියන්නය කියලා මට නොතාරිස්වරු කිව්වා. මේක ඒ අයට විශාල ප්‍රශ්නයක්. මොකද, යම් කිසි ඉඩමක් පිහිටා තිබෙන ග්‍රාම නිලධාරි කොට්ඨාසය, යම් කිසි ඉඩමක් පිහිටා තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ පළාත් පාලන ආයතනය සඳහන් කර ලැයිස්තුවක් සකස් කරලා නැහැ. අනාගතයේදී ඔප්පු ලියන විට ඒක විශාල ප්‍රශ්නයක් වෙනවා. ආණ්ඩුව විසින් එහෙම ලැයිස්තුවක් සකස් කරලා නැහැ. ඒක ආණ්ඩුවේ වග කීමක්. රජයේ වගකීම තමයි ඒක. ඉස්සර තිබුණා. බ්‍රිතාන්‍ය කාලයේ, සුද්දාගේ කාලයේ තිබුණා. දැනට අවුරුදු 10කට 15කට පෙරත් "Village List" එකක් සකස් කර තිබුණා. There was a "Village List" in the Land Registry. So, these details have to be given by the Government. ඒක තමයි පළමු වෙනි කාරණය.

අනෙක් කාරණය මේකයි, ගරු ඇමතිතුමනි. මේ ගැන අපේ ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාත් කිව්වා. Now, there is no index. ඉස්සර සෑම ඔප්පුවක්ම ලියන විට index එකේ සටහන් වෙනවා. පටුනක් තිබුණා. ඒ පටුන අරගෙන කෝරළයයි, පත්තුවයි බැලුවාම අදාළ ඉඩම සම්බන්ධයෙන් ඔප්පුවක් ලියලා තිබෙනවාද කියලා බලා ගන්න පුළුවන්. දැන් එහෙම index එකක් නැහැ. ඒ index එක නවත්වලා දැන් අවුරුදු 10ක් 15ක් වෙනවා. අපි උසාවි යන මුල් කාලයේ, 1970 ගණන්වල ඒ index එක තිබුණා. නමුත් දැන් එහෙම index එකක් නැහැ. මම හිතන්නේ දැන් අවුරුදු 15ක් තිස්සේ ඒ index එක නැහැ. උදාහරණයක් වශයෙන් පේරාදෙණිය ගනිමු. ඒ පටුන තිබුණා නම්, පේරාදෙණිය ප්‍රදේශයේ තිබෙන ඉඩම් සම්බන්ධයෙන් ලියූ ඔප්පු ඔක්කොම එක පිටුවක තිබෙනවා. එතකොට පත්ඉරු බලන්න අවශ්‍යතාවක් නැහැ, index එකෙන් බලා ගන්න පුළුවන්. දැන් ඒ index එක ඇත්ත වශයෙන්ම නැහැ. ඉතින් නොතාරිස් මහත්වරු ගණනාවක් මට කථා කරලා කිව්වා, මේ කරුණ රජයට ඉදිරිපත් කරන්නය කියලා. ඒ වාගේම නොතාරිස් විභාගය අවුරුදු ගණනාවකින් තියලා නැහැ. ඒ මොන හේතුවක් නිසාද මා දන්නේ නැහැ. සාමාන්‍යයෙන් අවුරුද්දකට වතාවක් නොතාරිස් විභාගය පැවැත්වෙනවා. දැන් අවුරුදු දෙකකින් තියලා නැහැ. මේ තුන්වැනි අවුරුද්ද යන්නේ. ඒ නිසා ඒ කරුණත් ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහනුවර ඉඩම් කාර්යාලයේ ඉඩකඩ පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි නිලධාරින්ට දොස් කියන්නේ නැහැ. මොකද, මුදල් සපයන්න ඕනෑ ආණ්ඩුවෙනුයි. ඇත්ත වශයෙන්ම නීතිඥ මහත්වරු, නොතාරිස් මහත්වරු පහළොස් දෙනකුටවත් වාඩි වෙන්න එහි ඉඩ නැහැ. මහනුවර කාර්යාලය ගත්තොත් නීතිඥ මහත්වරු, නොතාරිස් මහත්වරු හාරසියයක් විතර ඉන්නවා. මම කියන්නේ නැහැ, හාරසියයකට පහසුකම් සකස් කරන්නය කියලා. නමුත් අඩුම ගණනේ පණහකටවත් අවශ්‍ය පහසුකම් සකස් කරන්න ඕනෑ. මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මේ කරුණු ටික ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

[අ. භා. 3.36]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Environment)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත සහ නොතාරිස් ආඥාපනත සංශෝධනයට අදාළව ප්‍රධාන කාරණා දෙකකුයි අද අපි මේ සාකච්ඡාවට ගෙන තිබෙන්නේ. විශේෂයෙන් අපි දන්නවා, ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ විශාල පිරිසක් ඔප්පු ලිවීම තුළින් ජීවත් වන බව. නීතිඥවරුන් විතරක් නොවෙයි, නොතාරිස්වරුනුත් විශාල පිරිසක් ඒ තුළින් ජීවත් වනවා. අපිත් උසාවි යන කාලයේ ඔප්පු ලියලා තිබෙනවා දැන් ලියන්නේ නැති වුණාට.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ඔබතුමාට ලියන්න-

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

මට නීතියෙන් අවසර නැහැ දැන් ඒක කරන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමිය මට කියනවා ඔප්පු ලියන්නය කියලා. ඔප්පු ලියන්න මට දැන් නීතියෙන් අවසරයක් නැහැ. පළාත් සභාවේ ඇමතිවරයෙක් හැටියට පත් වුණු දවසේ ඉඳලා මා ඔප්පු ලියන්නේ නැහැ. ඒ කියන්නේ 1993 ඉඳලා අද වනකම් මම ඔප්පුවක් ලියලා නැහැ. ඒ දක්වා ලියලා තිබෙනවා. සම්ප්‍රදායයක් ඇතත්, නැතත් මා හිතනවා එය නොකළ යුත්තක් හැටියට. මා ඒ වෙලාවේ ඉඳලා ඒක කළේ නැහැ. කෙසේ වෙතත්, මේ හරහා තමයි අපේ රටේ ලන්දේසි යුගයේ ඉඳලා ඉඩම්වල අයිතිවාසිකම යම් කිසි ආකාරයකින් නිරවුල් කර ගත්තේ. ඒ නිසා ඔප්පු ලිවීමත් ඒ වාගේම ඒ හරහා තමන්ගේ ඉඩම් අයිතිය තහවුරු කර ගැනීමත් කියන කාරණාව අපේ රටේ ඉඩම් අයිතිය පිළිබඳ ඉතා වැදගත් දෙයක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි දන්නවා ලේඛන ලියා පදිංචි කිරීමේ ක්‍රමවේදයන් විවිධ කාලවල වෙනස් වුණු බව. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා මේ සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්න දෙකක් ගැන කිව්වා. විශේෂයෙන්ම දැනට ඉඩම් රෙජිස්ට්‍රාර්

කාර්යාලවල ග්‍රාම ලේඛනයක් පවත්වාගෙන යන්නේ නැහැ කියලා එතුමා කිව්වා. ඇත්ත වශයෙන්ම දැනට ග්‍රාම ලේඛනය තිබෙනවා. නමුත් මට දැන් දැනුම් දීලා තිබෙනවා, ඒ කාර්යාලවලින් දැනට ඒක යාවත්කාලීන කරමින් තියෙනවා කියලා. මොකද, ගම් පුළුල් වෙමින්, නව ගම්මාන එකතු වෙමින්, පත්තු කෝරළ වෙනස් වෙමින් තියෙන නිසා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පත්තු, කෝරළ-

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ග්‍රාම සටහන් ලේඛනය දැන් යාවත්කාලීන කෙරෙමින් පවතිනවා කියලායි කියන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පත්තු, කෝරළ ඒ කාලයේම තිබුණා. දැන් අලුතින් ඇතුළත් කරන්න තිබෙනවා හැම ඉඩමක්ම තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, ග්‍රාම නිලධාරි වසම, පළාත් පාලන ආයතනය. ඒක තමයි නැත්තේ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
මේවා අනුමත වුණාට පස්සේ ඒ කාර්යාලවලින් ඒවා යාවත්කාලීන කරලා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලට ඉදිරිපත් කරාවි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා හිතනවා මේක ඉතාම හොඳ සංශෝධනයක් කියලා. මොකද, අපි දන්නවා ඉඩම්වලට ව්‍යාජ ඔප්පු ලිවීම් විශාල වශයෙන් සිද්ධ වන බව. සමහර වෙලාවට රජයේ ඉඩම්වලට පවා ප්‍රකාශන ඔප්පු ලියලා තමා සන්තක කර ගන්න කටයුතු කරන කූට පිරිස් ඉන්නවා. සමහර අය අනුන්ගේ දේපොළවලට ඇතුළු වෙලා ප්‍රකාශන ඔප්පුවක් ලියලා ඒවායේ බුක්තිය ලබා ගන්න උත්සාහ කරනවා. [බාධා කිරීමක්] අම්පාරේ වැඩිපුර තිබෙනවාය කියලා අපේ ගරු පී. දයාරත්න ඇමතිතුමා කියනවා.

ඒ නිසා ඒ පළාත් පාලන ආයතනය යම් විධියකින් ඒ දැනුවත් කිරීම කරන එක ඉතාම හොඳයි. මොකද මේ ඔප්පු ලිවීමත්, පුද්ගලයන්ගේ ඉඩම් අයිතිය තහවුරු කිරීමත් කියන කාරණා දෙකම එක විට සිද්ධ වන්න ඕනෑ. ඒ නිසා මා හිතනවා, මෙය හොඳ දෙයක්ය කියා. තවත් දෙයක් තිබෙනවා. සමහර අවස්ථාවලදී මැරිච්ච නොතාරිස්වරුන්ගේ නමිනුත් තවමත් ඔප්පු ලියනවා. නොතාරිස්වරයා මැරිලා. නමුත් තවමත් ඔප්පුව ලියැවෙන අවස්ථා තිබෙනවා. මොකක්ද හේතුව? මම හිතන්නේ අපි යාවත්කාලීන විය යුතුයි කියායි. අපි සාකච්ඡා කරන කොට හැම වසරකම ඒ ලියා පදිංචි නොතාරිස්වරුන්ගේ නාම ලේඛනයක් සකස් කිරීම අත්‍යවශ්‍යයි කියලා අපි හිතනවා. මොකද නැත්නම් මහ ජනතාව මුළා වනවා.

ඔබතුමන්ලා දන්නවා, මැරිලා අවුරුදු 30, 40 ගිය පරණ මිනින්දෝරු මහත්වරුන්ගේ නමින් තවමත් මිනුම් කටයුතු සිදුවන බව. ඒ අයගේ නමින් තවම මනිනවා. මේක තමයි ඇත්ත කථාව. ඒවායින් ඔප්පු ලියවෙනවා. සමහර වෙලාවට ඒවා වැරදියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වංචාවලට ඉඩ දෙන ආකාරයේ ක්‍රමවේද ඉවත් කිරීම රජයේ යුතුකමක් හැටියට සලකලා තමයි මම හිතන විධියට මේ සංශෝධනය ගෙනැල්ලා තිබෙන්නේ. ඒ වාගේම අපි දන්නවා, "බිම් සවිය" වැඩ පිළිවෙළ යටතේ ඉතාමත්ම හොඳ වැඩ පිළිවෙළක් රජය පසු ගිය කාලයේ ඉදිරිපත් කරපු බව. ඒ කියන්නේ ඉඩම් හිමිකම් ලියා පදිංචි කිරීමේ ක්‍රමවේදයක් සකස් කර තිබෙනවා. මේක බ්‍රිතාන්‍ය යුගයේයි පටන් ගත්තේ. බ්‍රිතාන්‍යයන්ට title registration එකක් කොල්ලුපිටියේ විතරයි කර ගන්න පුළුවන් වුණේ. පාමංකඩ හරියේ විතරයි කර ගන්න පුළුවන් වුණේ. අනෙක් කිසිම තැනක කරන්න බැරි වුණා. මොකද ලංකාවේ ඉඩම් නීතිය ඒ තරම්ම සංකීර්ණයි. ඒ සංකීර්ණභාවය නිසාම හවුල් අයිතිකරුවන් ප්‍රමාණයත් ඉතාම වැඩියි. මේ නිසා ඇති වුණු ගැටලුව විසඳන්න ඉඩම් හිමිකම් ලියා පදිංචි කිරීමේ වැඩ පිළිවෙළක් ආණ්ඩුව ඉදිරිපත් කරලා, ලංකාව පුරා ඒක කර ගෙන යනවා. හැබැයි, ඒක ලෙහෙසි වැඩක් නොවෙයි. ඉඩම් හිමිකමක් ලියා පදිංචි වුණා නම් ඔප්පු ලිවීමේ කටයුතුවලදී මේක ඉතාමත්ම ලෙහෙසි, කිසිම කරදරයක් නැති කටයුත්තක් බවට පත් වනවා. මොකද අපි දන්නවා, නිශ්චිත භූමි ප්‍රමාණය මේකයි කියලා.

ඇත්තටම පෞද්ගලික ඉඩම් අයිතිය කියන එක සමාජයක තිබෙන වැදගත් අයිතියක්. ඒ අයිතිය අද ලෝකයේ පිළිගන්නවා. මම දැක්කා, දැන් කියුබාවත් පෞද්ගලික ඉඩම් අයිතිය පිළිගන්නවාය කියන එක. ලෝකය වෙනස් වන කොට, විශේෂයෙන්ම පරණ තිබුණු සමාජවාදී, ධනවාදී ආර්ථික ක්‍රමයන්වල තිබෙන වෙනස්කම් අඩු වෙන කොට පෞද්ගලික ඉඩම් අයිතිය පිළිබඳ අයිතිවාසිකම හුඟක් පුළුල් වෙමින් යනවා. ඒක නිසා මම විශ්වාස කරනවා, මේ වැඩ පිළිවෙළ හරහා ලොකු වෙනසක් කරන්න පුළුවන් වේවිය කියා.

අපි දන්නවා, සමහර වෙලාවට මුද්දර ඇලවීමේදී නියමිත වටිනාකම සඳහන් කරන්නේ නැහැය කියන එක. ඒක දැන් හුඟක් අඩු වුණත් තවමත් නියමිත වටිනාකමෙන් අඩකටත් වඩා අඩුවෙන් තමයි මුද්දර ඇලවීම කරන්නේ. ඉතින් මේවාත් යාවත්කාලීන වන්න ඕනෑ. මොකද ඉඩම් මිල ඉහළ ගියාට ඒ ඉහළ යන මිල ඔප්පුවක සටහන් වන්නේ නැහැ. ඒක හැම පැත්තෙන්ම පාඩුයි. ඉඩම ගන්න මනුස්සයටත් පාඩුයි. විකුණන මනුස්සයටත් පාඩුයි. ආණ්ඩුවටත් පාඩුයි. ඉතින් මේ වාගේ වැඩ පිළිවෙළවල් කරන්න අපි කටයුතු කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල පුළුල් කරලා ඒවායේ පහසුකම් පුළුල් කිරීමත් අපේ අමාත්‍යවරයා යටතේ කරගෙන යනවා. ඒ හරහා විශාල මුදලක් අපේ ආණ්ඩුවට හම්බ වනවා. ඒ නිසා ඉඩම් ලියා පදිංචි කිරීම නිසා අපේ ප්‍රාදේශීය සභාවල ක්‍රියාත්මකභාවය හුඟක් වැඩි වෙලා තිබෙනවා. ප්‍රාදේශීය සභාවලට හුඟක් මුදල් හම්බ වන්නේ ඉඩම් ලියා පදිංචි කිරීමෙන් සහ අනෙකුත් දඩ මුදල්වලින් ලැබෙන මුදල්වලිනුයි. ඒ නිසා ඒ ප්‍රදේශ තුළ සිට කටයුතු කිරීමෙන් පමණයි ඒ කටයුතු සිදු වන්නේ. මම හිතන්නේ මේක ඉතාම වැදගත් කාරණාවක්ය කියායි.

විශේෂයෙන් අපි මේ ගැනත් කල්පනා කරන්න ඕනෑ. අද නීතිඥවරු විශාල වශයෙන් දිවුරුම් දෙනවා. මම හිතන්නේ, අපි ගිය කාලයේ අවුරුද්දකට 225කට, 250කට වඩා වැඩි ප්‍රමාණයක් නීතිඥවරුන් හැටියට ශ්‍රේෂ්ඨාධිකරණයට ඇතුළු වුණේ නැහැය කියායි. නමුත් දැන් නීතිඥවරු හැටියට අවුරුද්දකට හත් අටසියයකටත් වඩා වැඩි ප්‍රමාණයක් ඇතුළු වනවා. ඒ අතර බහුතරයක් ඉන්නේ ගරු තලතා අතුකෝරල මන්ත්‍රීතුමිය වාගේ නීතිඥවරියන්. නීතිඥවරියන් විශාල පිරිසක් ඉන්නවා. ඒ උදවියටත් නොතාරිස් වෘත්තිය ඉතාම ලාභදායකයි. ඉතින් ඒ ගොල්ලන් වෙනුවෙනුත් අපි කථා කරන්න ඕනෑ. එහෙම නැත්නම් ස්ත්‍රී, පුරුෂ භේදයෙන් කථා කරනවාය කියා හිතනවා නේ. එහෙම නැතිව අපි කථා කළොත්, විශාල පිරිසක් නීතිඥ වෘත්තියට පත් වන නිසා සමහර විට මතයක් තිබෙන්න පුළුවන්, නොතාරිස්

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

විභාගය අවශ්‍යද කියලා. මොකද, නොතාරිස්වරුන් හැටියටත් එවැනි විශාල ප්‍රමාණයක් ඒ හා සමගම ඉදිරිපත් වනවා.

මා හිතනවා, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට විශාල වග කීමක් තිබෙනවාය කියලා. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය දශක ගණනාවක් තිස්සේ ඒ කටයුත්ත ඉතාම හොඳින් ඉටු කරනවා. සමහර තැන්වල අඩු පාඩු, ප්‍රශ්න තිබෙනවා. ඒ අය ඒවා නිරවුල් කර ගනිමින් ඉතාම හොඳ සේවාවක් කර ගෙන යනවා. මේ සංශෝධනය හරහා ඉඩම් අයිතිය පිළිබඳ යම් කිසි නිරවුල්භාවයක් ඇති වනවාය කියලා මා හිතනවා. දැන් පටුනක් අවශ්‍ය නැහැ. අවසන් වාර්තාව කෙළින්ම පළාත් පාලන ආයතනයට යැව්වාම, ඒ පළාත් පාලන ආයතනයේ ලියා පදිංචි වන ඉඩම් ප්‍රමාණය කොපමණද කියලා සාමාන්‍ය කෙනකුට ඉතාම ඉක්මනින් සොයා ගන්න පුළුවන්. අපි වෙන දා අවසන් ලේඛනය යැව්වේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට විතරයි. දැන් මේ සංශෝධනය නිසා අවසන් ලේඛනය පළාත් පාලන ආයතනයටත් යවන්න ඕනෑ. එම නිසා මොකක්ද වන්නේ කියා ඉක්මනින්ම සොයා ගන්න පුළුවන්. එතකොට ඉඩම් සම්බන්ධයෙන් පටුනක් ලියා පදිංචි වීමේ කාර්යය ඉබේම ක්‍රියාත්මක වනවා.

ඒ විතරක් නොවෙයි. මගේ තව යෝජනාවක් තිබෙනවා. විශේෂයෙන් මුද්දර ඇලවීම වෙනුවට රජයට මුදල් ගෙවා රිසිට් පතක් ලබා ගැනීම අනිවාර්ය කළොත්, මා හිතන හැටියට භාණ්ඩාගාරයට, එහෙම නැත්නම් රජයේ ආයතනවලට විශාල මුදලක් ඉතිරි වනවා. සමහර විට මුද්දර ගහලා යවන ඒවායේ මුද්දර අරගෙන් ගලවා ගෙන ඇවිත් මෙහේ අලවන අවස්ථාත් තිබෙනවා. මා දන්නවා, සමහර අය මුද්දර ගහන ඔප්පුව යවන්නේ නැහැ කියලා. ලියා පදිංචි කොපිය විතරක් යවලා ලියා පදිංචි වුණු ඔප්පුත් ලංකාවේ තිබෙනවා. අපි මේවා ගැන ඇත්ත කථා කරන්න ඕනෑ. මා දන්නවා, එහෙම වෙලා තිබෙන බව. ඒවා කරන්නේ විවිධ කණ්ඩායම්. මගේ යෝජනාව පරිදි මුද්දර ඇලවීම වෙනුවට රජයට මුදල් බැඳලා ලබා ගන්නා ලදු පත -රිසිට් පත- ඉදිරිපත් කිරීම පමණක් කරන්න ඕනෑය කියන සංශෝධනයක් ආවොත් ගරු ඇමතිතුමනි, එය මේ තිබෙන ක්‍රමයට වඩා ඉතාම හොඳ ක්‍රමයක්ය කියා මා විශ්වාස කරනවා. එතකොට ඔප්පුව ලියන අවස්ථාවේදී එම පුද්ගලයාටම පුළුවන්, රජයේ බදු මුදල බැඳලා රිසිට් එක ගෙනෙන්න. ඊට පස්සේ නොතාරිස්වරයාට තමන්ගේ ගාස්තුව කියන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, මුද්දර ඇලවීමේ යම් යම් දූෂණ, චෝදනා රැසක් තිබෙන බව අපට වාර්තා වන නිසා එහෙම කළා නම් ඉතා හොඳයි කියලා මා හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පවතින තත්ත්වය අනුව කාලීන වශයෙන් යම් යම් පනත්, රෙගුලාසි වෙනස් වන්න ඕනෑ. එසේ වෙනස් කිරීම සඳහා ක්‍රියා කිරීම ගැන අපේ ගරු ඇමතිතුමාට අපි ඉතාම ස්තුතිවන්ත වනවා. මෙය ඉතාම අත්‍යවශ්‍ය කාරණාවක් හැටියට දෙපාර්ශ්වයම පිළිගන්නා නිසා මේ හරහා ඇති වන සේවාව සාමාන්‍ය ජනතාවට තවදුරටත් හිතකර සේවාවක් බවට පත් වන බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 3.49]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වැදගත් පනත් කෙටුම්පත් කිහිපයක් ඉදිරිපත් වන අවස්ථාවේදී, ඒ පිළිබඳව කථා කරන්න මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට මා ස්තුතිවන්ත වනවා. ඒ වාගේම අපේ අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාගේ සහ රවි ජයවර්ධන මැතිතුමාගේ විශාල පිරිසක් -කළුතර සහ බණ්ඩාරගම ප්‍රදේශවල- මේ අවස්ථාවේදී අපිත් එක්ක සම්බන්ධ වනවා.

නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අපේ ඇමතිතුමා සඳහන් කළා. මේ පනත් කොයි ආකාරයෙන් ඉදිරිපත් කළත්, බොහෝ විට නීතිය මග හැරලා, නීතියෙන් රිංගා තමන්ගේ වාසියට කාර්ය භාරය ඉටු කර ගන්නා ආකාරය අද අපට දක්නට ලැබෙනවා. ඔප්පු ලිවීම පිළිබඳව ඇමතිතුමා විශේෂයෙන්ම සඳහන් කළා. ඔප්පු ලිවීමට මා සම්බන්ධ නොවුණත් නීති සම්පාදනය කරන විට නොතාරිස්වරුන්ට හොර ඔප්පු ලිවීමට නොහැකි වන ආකාරයේ නීති සකස් කරනවා වාගේම හොර ඔප්පු ලියන අයට දෙන දඬුවම තද කරන්නත් නීති සකස් කරන්න ඕනෑ. චෙක්පත් සම්බන්ධයෙන් දැන් හරියාකාරව නීති පනවා ගෙන එනවා. මූල්‍ය ආයතනයකට එවැනි චෙක්පතක් ලබා දුන්නොත් අනිවාර්යයෙන්ම අපරාධ නීතිය යටතේ දඬුවම් කළ හැකි වරදක් හැටියට නම් කරලා නීතිය පැත්තෙන් විශාල කාර්ය භාරයක් ඉටු කරන්න පුළුවන් කියලා තිබෙනවා මම දැක්කා. බටහිර සහ දියුණු රටවල මේ නීති හරියට ක්‍රියාත්මක වන නිසා ව්‍යාපාර ලෝකයට පිවිසෙන්න, ඒ වාගේම ඒ රටවල වෙළඳාම් කරන්න ලැබෙන අවස්ථාව හා විශ්වාසය ගොඩාක් වැඩියි.

අපි අද කොතරම් අධ්‍යයනය කරලා වුණත් ලංකාවේ ඉඩමක් ගන්න ගියාම ඔප්පු සම්බන්ධයෙන් විශාල ප්‍රශ්න මතු වනවා. Title Report එක සම්බන්ධයෙන් කොච්චර පරීක්ෂණ පැවැත්වුවත් සමහර වෙලාවට හොර ඔප්පු හඳුනා ගන්න බැරි අවස්ථා තිබෙනවා. හොර ඔප්පු ලියන නොතාරිස්වරුන්ට, ඊට අදාළ පුද්ගලයන්ට නීතියෙන් දඬුවම් ලැබෙන අවස්ථා ඉතාම දුර්ලභයි. අවුරුදු 20කට 25කට 30කට පසු ඊයේ පෙරේදා මා දැක්කා, වැරදි no-ball එකකට ක්‍රිකට් ක්‍රීඩකයෝ පිරිසකට මා හිතන්නේ match-fixing එකක් සම්බන්ධයෙන් -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාකිස්තානු ක්‍රීඩකයන්ට spot-fixing කියන ඉතාම සුළු වරදකට සිර දඬුවම් පනවා තිබෙනවා. හොර ඔප්පු ලියන උදවියත් ඒ දේවලට වග කිව යුතු ආකාරයට නීති ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරවන්න පුළුවන් නම් හොඳයි.

අවුරුදු 25ක 30ක 35ක වාගේ සිර දඬුවම් නියම කිරීමටත්, ඒ වාගේම ඔවුන්ගේ සහතිකය අවලංගු කිරීමටත් අපට නීති සම්පාදනය කරන්න පුළුවන් වුණොත් මා හිතන්නේ මේ ප්‍රශ්නය යම් තාක් දුරකට මඟ හරවා ගන්න පුළුවන් කියලායි. එතකොට මේ රටට වැඩියෙන් විදේශ ආයෝජන ගෙන්වා ගන්න පුළුවන් වනවා.

අධිවේගී මාර්ග සම්බන්ධයෙන් අපේ කුමාර වෙල්ගම ඇමතිතුමා අදහස් ප්‍රකාශ කළා. Three-wheelers සම්බන්ධව මට එතුමාගෙන් අහන්න බැරි වුණා. Three-wheelersවලට අධිවේගී මාර්ගවල ධාවනය කරන්න අවස්ථාව ලබා දීලා තිබෙනවාද නැද්ද කියා මේ නියෝගවල සඳහන් වෙලා නැහැ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
සඳහන් වී තිබෙනවා. "මෝටර් ට්‍රයිසිකල්" කියලා තිබෙන්නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
හොඳමයි. මා හිතන හැටියට අධිවේගී මාර්ග අපට අවශ්‍ය දෙයක්; අවුරුදු ගණනක් තිස්සේ බලාපොරොත්තු වුණු දෙයක්. අධිවේගී මාර්ග හොඳයි. මේ නිසා අපේ කාලය ඉතුරු කර ගෙන, ශ්‍රමය ඉතුරු කර ගෙන අයෝජනය කරන්න, ව්‍යාපාර ලෝකයේ තමන්ගේ කාර්ය භාරය ඉටු කර ගන්න පුළුවන් වනවා. එහිදී අවම වේගය ඇතුළත් නොවීම ප්‍රශ්නයක්. බොහෝ රටවල ධාවනය කළ යුතු අවම වේගය සඳහන් වනවා.

ඒත් එක්කම මේ කාරණයත් ඔබතුමාගේ අවධානයට යොමු කරවන්න ඕනෑ. අධික වේගයෙන් රිය පැදවීම සම්බන්ධයෙනුත් අද රටේ හරියාකාර නීතියක් නැහැ. ඔබතුමා මේ සම්බන්ධයෙන් දන්නවාද කියන්න මා දන්නේ නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවක් අනුව සාමාන්‍ය මාර්ගයේ අධික වේගයෙන් ධාවනය කරන වාහන අල්ලන්න පොලීසියටවත් නීතිමය අයිතිවාසිකමක් නැහැ. හරියාකාරව රිය නොපැදවීම -negligent driving- කියලා අපැහැදිලි ආකාරයට පදවන වාහන පොලීසිය විසින් නවත්වලා ඒවාට දඩ ගහන්න කටයුතු කර ගෙන යනවා. ඒ ගැන මා දන්නේ නැහැ. වැඩිම වේගය පැයට කිලෝ මීටර් 100යි කියා ඔබතුමා මෙහි සඳහන් කර තිබෙනවා. සාමාන්‍ය මාර්ගය සහ අධිවේගී මාර්ගය සම්බන්ධයෙන් මේ නීති දෙක කොයි ආකාරයට බලපායිද කියන කාරණය ගැන මීට වැඩි දැනුවත් කිරීමක් අවශ්‍යයි. මොකද, සාමාන්‍ය මාර්ගයේ අධික වේගයෙන් ධාවනය කිරීම සම්බන්ධව අද හරි නීතියක් නැහැ.

ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් තිබෙනවා. එක එක තැන්වල එක එක නීති තිබුණු නිසා, එක එක වේග සීමා තිබූ නිසා ඒ නීතිය යම් කිසි ආකාරයකින් ක්‍රියාත්මක නොවන ස්වභාවයක් මේ වෙන කොට බල පවත්වනවා. ඒ වාගේම අවම වේගය සඳහන් කළොත් ඉතා හොඳයි කියා මම හිතනවා. සාමාන්‍යයෙන් අධිවේගී මාර්ගවල ලක්ෂණය තමයි පැයට කිලෝමීටර් 80, 90, 100 වාගේ වේගයෙන් ධාවනය කරන වාහන විශාල ප්‍රමාණයක් ධාවනය කරවීම. අවම වේගය ඒ ස්ථානයේ සඳහන් කර නොතිබුණොත් ගමනාගමනයට බාධා වන තත්ත්වයක් ඇති වන්න පුළුවන්. මා හිතන විධියට අධිවේගී මාර්ගයේ වාහනය නවතා ගෙන ඉන්න බැරි නීතිමය තත්ත්වයක් තමයි පවතින්නේ. හැබැයි කිලෝමීටර් 2 හෝ 3 හෝ 5 හෝ වේගයෙන් -සාමාන්‍ය වේගයෙන්- ඉදිරියට ඇදෙන්න පුළුවන්. නීතිය මාර්ගයෙන් ක්‍රියාත්මක වෙන්න බැහැ, ඒ ආකාරයෙන් ගමනාගමනයේ යෙදුණොත්. ඒ නිසා මා හිතන්නේ අවම වේගයත් සඳහන් වුණොත් හොඳ බවයි. ගරු ඇමතිතුමා කිව්ව ආකාරයට අධිවේගී මාර්ගවලට ඇතුළත් වන්නේ සාමාන්‍ය වේගයක් පවත්වා ගෙන යන්න පුළුවන් වාහනයි. අනෙකුත් වාහන මෙයින් පරිබාහිර කරලා තිබෙනවා. අවම වේග සීමාව සම්බන්ධයෙනුත් ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාත් මේ අවස්ථාවේ මේ ගරු සභාවේ සිටින නිසා මා ඉතිරි අණපනත් ගැනත් කථා කරන්න කැමැතියි. ඉදිරිපත් කර තිබෙන, මුදල් පනත යටතේ නියෝගය සම්බන්ධයෙන් නම් මට එච්චර අවබෝධයක් නැහැ. හැබැයි මුදල් පනත යටතේ අද ඉදිරිපත් කර තිබෙන නියෝගයට අදාළව රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය සම්බන්ධයෙන් අදහස් කීපයක් ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම ව්‍යාපාර පවරා ගන්නා ආකාරයත්, පෞද්ගලීකරණය කරන ආකාරයත්, ඒ වාගේම රජය සතු කිරීමේ ක්‍රියා දාමයත් සම්බන්ධයෙන් අද වෙන කොට අපට විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඇත්තටම හිතා ගන්න බැහැ, ආණ්ඩුව ක්‍රියාත්මක වෙන්නේ කොයි ආකාරයෙන්ද කියලා.

මූල්‍යාකරණයේ තිබෙන අඩු පාඩුකම් නිසා විශාල වශයෙන් පාඩු ලබන ආයතන ගණනක් රටේ තිබෙනවා. ඒ අතර රජයේ ආයතන විශාල ප්‍රමාණයක් අද පාඩු ලබමින් ජනතාවට විශාල බරක් බවට පත් වෙලා තිබෙනවා. එවැනි තත්ත්වයක් තිබෙන අවස්ථාවේදී රජය යම් අවස්ථාවල සමහර දේපළ පවරා ගන්න, සමහර දේපළ පෞද්ගලීකරණය කරන්න කටයුතු කරන නිසාත්, රජයේ සමහර දේපළ යම්කිසි ආකාරයකින් පෞද්ගලීකරණය කිරීමෙන් පසු කිසිම ක්‍රමයක් නැතිව ආපසු පවරා ගැනීමේ නීතියකුත් නිසා ආණ්ඩුවෙන් හඳුනා ගෙන තිබෙන විදේශ ආයෝජක පිරිසක්, තමන්ට වාසිසහගත ආයෝජක පිරිසක් පමණක් මේ රට තුළට ගෙන ඒමේ කුමන්ත්‍රණයක් මේ අවස්ථාවේදී අපට දක්නට ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම රාජ්‍ය ව්‍යාපාරවලින් දත්ත කීපයක් ලබා ගත්තා. 2011 දී ලංකා විදුලිබල මණ්ඩලයේ පාඩුව රුපියල් මිලියන 4,680යි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පාඩුව රුපියල් මිලියන 4,409යි. ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පාඩුව රුපියල් මිලියන 53,687යි. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ පාඩුව රුපියල් මිලියන 3,979යි. ශ්‍රී ලංකා දුම්රිය සේවාවේ පාඩුව රුපියල් මිලියන 1,553යි. මිහින් ලංකා පුද්ගලික සමාගමේ පාඩුව 2008 දී රුපියල් මිලියන 2,400යි. 2009 දී රුපියල් මිලියන 728යි. මිහින් ලංකා පුද්ගලික සමාගම මිලියන 1,300ක සාමාන්‍ය පාඩුවක් වර්ෂයකට වාර්තා කරනවා. ඒ වාගේම ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ පාඩුව රුපියල් මිලියන 9,269යි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පාඩුව රුපියල් මිලියන 14,662යි. මේ ආකාරයෙන් කළමනාකාරිත්වය බංකොලොත් වෙලා තිබෙන අවස්ථාවක කළමනාකරණය හරියාකාරව කරන්න කියලා අණපනත් විශාල වශයෙන් හඳුන්වා දෙන්න මේ ආණ්ඩුව අද වෙන කොට බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ ආයෝජන සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය සැලකිලිමත් වෙන්න ඕනෑ. එල්ටීටීඊ සංවිධානය අවසන් වීමත් සමඟම අපි විශාල ආයෝජනයක් බලාපොරොත්තු වුණා. හැබැයි 2000 දී සියයට 25ක්ව තිබූ පෞද්ගලික ආයෝජන මට්ටම 2010 වෙන කොට සියයට 21.6ට බැහැලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇඹිලිපිටිය කඩදාසි කර්මාන්තායතනය සහ කන්තලේ සීනි කර්මාන්තායතනය, Sri Lanka Rubber Products and Exports Company, ඒ වාගේම Ceylon Ceramics Corporation කියන ආයතන පෞද්ගලීකරණය කිරීම සඳහා ආණ්ඩුව ඉදිරිපත් වෙලා තිබෙනවා කියන ප්‍රවෘත්තිය අද අපට ලැබිලා තිබෙනවා.

[ගරු සුජීව සේනසිංහ මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "Daily FT" කියන පත්‍රයේ, - මම හිතන්නේ මේක බැසිල් රාජපක්ෂ මැතිතුමාට බලපාන ලියවිල්ලක්- මේ විධියට සඳහන් වෙලා තිබෙනවා:

"The Government has made arrangements to hand over the Embilipitiya Paper Corporation to an Australian company for a period of 30 years as part of the restructuring of public enterprises under the State Resources and Investment Promotions Ministry."

තවද, මෙය රුපියල් මිලියන 600කට විකුණන්න යනවා කියන ප්‍රවෘත්තියකුත් මේ පත්‍රයේ සඳහන් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි, එම පත්‍රයේ තවදුරටත් මෙසේ සඳහන් වනවා:

"....State Resources and Investment Promotions Ministry said the government is in the process of restructuring 23 state enterprises and the first phase included four enterprises. The Embilipitiya Paper Corporation, Kantale Sugar Company, Sri Lanka Rubber Products and Exports Company and the Ceylon Ceramics Corporation...."

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
What is wrong in that?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
There is nothing wrong in that. But, you all are the very people who were criticizing so many times the privatization of public enterprises. - [*Interruption.*] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, I am not mistaken. I am giving you the correct facts. එහෙම නම්, ඔබතුමන්ලාට ඔබතුමන්ලා කියන දේ සම්බන්ධයෙන් පැහැදිලිතාවක් නැතුව ඇති. අපට තිබෙන ප්‍රශ්නය මේකයි. ඔබතුමන්ලා හෙට ඌන ක්‍රියාකාරි ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත් කෙටුම්පත කියන පනත් කෙටුම්පත සම්මත කර ගන්න යනවා. ඉදිරියට තව පනත් කෙටුම්පත් ගේන්න යනවා. හරියට ලාභ නොලබන, හරියට ක්‍රියාත්මක නොවන ආයතනත් මේ ආකාරයෙන් පවරා ගන්න පුළුවන් කියලා තමයි මම හිතන්නේ. මේවා මහා අපහාස. මෙහෙම ගියොත් ඔබතුමන්ලාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් පවරා ගන්න සිද්ධ වෙයි. මොකද, අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, ආණ්ඩුවත් පක්ෂයක් නැති තරමට එක්සත් ජාතික පක්ෂයේ අනාථාගාරය බවට පත් වෙලා. [බාධා කිරීම්] ඉතින්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අනිවාර්යයෙන් පවරා ගන්න අවශ්‍ය කටයුතු තමයි ඔය කරන්නේ. මොකද, තම පක්ෂයේ හරියට කළමනාකරණයක් නොමැති අවස්ථාවක, ඒ වාගේම හම්බන්තොට වරාය හරියට කර ගන්න බැරි අවස්ථාවක මේ ගොල්ලන් කළමනාකරණය ගැන කථා කරනවා. හැබැයි, බොහෝ සමසමාජ පක්ෂවලට අයත් නායකයෝ අද මේ සභාවේ ඉන්නවා. අද ඇමතිතුමා කථා කරද්දී ඇහුවා, "මොකක්ද ඇති වැරැද්ද?" කියලා. පෞද්ගලීකරණය සම්බන්ධයෙන් අපේ ප්‍රශ්නයක් නැහැ. හැබැයි, පෞද්ගලීකරණය හොඳ නැහැ කියලා ඔබතුමන්ලා එක වෙලාවක කියනවා. ඔබතුමන්ලාට තිබෙන්නේ සංවෘත ආර්ථිකයක් කියලා එක වෙලාවක කියනවා. රටේ ජනතාවට අද මේක තේරෙන්නේ නැහැ. [බාධා කිරීමක්] ඔබතුමා නැහැ, නැහැ කිව්වාට අපට තේරෙන්නේ නැහැ. තමන්ට ඕනෑ ආයතන ටික පෞද්ගලීකරණය කරනවා. රජයට අරගෙන ආපසු විකුණා ගන්න පුළුවන් ආයතන මොනවාද කියලා දැන් කුරුමානම් අල්ලනනවා. සියයට 20යි, සියයට 30යි ආදී වශයෙන් තමයි කොමිස් මුදල් ප්‍රමාණය. රුපියල් මිලියන ගණන්, කෝටි ගණන්වලට ඔබතුමන්ලා,-

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ඔබතුමාට තේරෙන්නේ නැහැ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
නැහැ, මට හොඳට තේරෙනවා, ඔබතුමාට අල්ලන්නේ නැහැ. මට තේරෙන එක ඔබතුමාට අල්ලන්නේ නැහැ. මට හොඳට තේරෙනවා. මට තේරෙන එක ඔබතුමාට අල්ලන්නේ නැහැ. ඒක ඇහට අමාරුයි. [බාධා කිරීමක්] මේ බලන්න ඇමතිතුමනි, මේවා අපට හොඳට තේරෙන දේවල්. මේවා ඔබතුමන්ලාට තේරෙන්නේ නැහැ. බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ අමාත්‍යාංශයේම විලී ගමගේ මහත්මයා කියනවා, රජයේ ආයතන අයින් කරලාද දන්නේත් නැහැ, පාඩු ලබන රජයේ ආයතන විශාල ප්‍රමාණයක් තිබෙනවා,-

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
දයාශ්‍රිත තිසේරා මැතිතුමාගේ අමාත්‍යාංශයේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
සමාවෙන්න, දයාශ්‍රිත තිසේරා මැතිතුමාගේ අමාත්‍යාංශයේ. ඇත්තටම අපට අමාත්‍යකම් හොයා ගන්නත් බැහැ. අමාත්‍යාංශ සොයා ගන්නත් බැරුවයි ඉන්නේ ඇමතිතුමනි. මොකද, මම හිතුවේ ඔක්කෝම ඔබතුමාට අයිතියි කියලායි. ඒකයි, මට වැරදුණා. එකක් දෙකක් හෝ කාට හරි ගිහිල්ලා තිබෙනවා. මම හිතුවේ ඒකත් ඔබතුමාට අයිතියි කියලායි. [බාධා කිරීමක්] ඒක තමයි, මම දන්නවා. දැන් ඉතින් ආණ්ඩුවේ ටිකත් private වෙනවා. [බාධා කිරීමක්] බැසිල් රාජපක්ෂ මහත්මයාගෙන් අහන්න කියනවා. ඒ හින්දායි අපට මේවා වරදින්නේ. කෙසේ වෙතත් විලී ගමගේ මැතිතුමා කියලා තිබෙනවා, බොහෝ ආයතන අනිවාර්යයෙන්ම පෞද්ගලීකරණය කරන්න ඕනෑ, නැත්නම් විශාල පාඩුවක් ලබනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මිහින් ලංකා ආයතනය සම්බන්ධයෙන් මෙවර COPE වාර්තාවේත් සඳහන් වෙනවා. ඒ ආයතනය විශාල පාඩුවක් ලබනවා. එයාර් ලංකා සහ මිහින් ලංකා කියන ආයතන Corporate Plan එකවත් ඉදිරිපත් කරලා නැහැ. ඔබතුමන්ලා පාඩු නොලබන ආයතන කියා නම් කර කර, හොඳින් ලාභ ලබන පෞද්ගලික ආයතන ජනතාව සතු නොකර රජය සතු කරලා රජයට පවරා ගෙන නැවත විකුණන ක්‍රියාදාමය රටේ ආර්ථිකයට සුදුසු දෙයක් නොවෙයි ඇමතිතුමනි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම විදේශ ආයෝජකයින් මේවා සම්බන්ධයෙන් අද විශාල භයක් දක්වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත ගෙන ඒමේ හේතුව හැටියට මෙතුමන්ලා පෙන්වන්නේ ඒ ආයතනවල කළමනාකරණය නොමැති බවයි. හැබැයි, මේ ආණ්ඩුවේ කළමනාකරණය සම්බන්ධයෙන් කථා කළොත්, අද තෙල් මිල පාලනය කර ගන්න බැරි ආණ්ඩුවක් තිබෙන්නේ. තෙල් ටික හරියාකාරව ගෙන්වා ගන්න බැරි තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා. ඒ වාගේම මොරගහකන්ද ජලාශ යෝජනා ක්‍රමයට මුල්ගල තියලා අවුරුදු ගණනාවක් වුණත් එහි වැඩ සියයට 30ක් වත් ඉවර කර ගන්න බැරිව අද හිර වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලි බිල ගැන කථා කරනවා. නොරොච්චෝලේ සහ කෙරවලපිටියේ විදුලි බලාගාර අද චීන සමාගම්වලට පවරා දෙන්න කථා කර ගෙන යනවා. විදුලි බිල හරියට පාලනය කර ගන්න බැරි ආණ්ඩුවක් මේ තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ ආයෝජනවලට විදුලිය, නවීන තාක්ෂණය ඕනෑ නම් මේ ආකාරයෙන් කටයුතු කරලා හරි යන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාසල් පොත් ටික, නිල ඇඳුම් ටික හරියට දී ගන්න බැහැ. රුපියල් 2,500 පඩි වැඩි වීම ලබා දීම කළමනාකරණය කර ගන්න බැරි ආණ්ඩුවක් පෞද්ගලික ආයතනවලට උගන්වන්න යනවා කළමනාකරණය කර ගන්නේ කොහොමද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආකාරයෙන් කළමනාකරණය අනා ගෙන ඉන්න ආණ්ඩුවක් අද රටේ ආර්ථික වර්ධනයක් තිබෙනවාය කියලා යම් කිසි ආකාරයකින් පෙන්වනවා. ඔබතුමන්ලා අය වැය විවාදයේදී පෙන්වයි සියයට 7ක, 8ක ආර්ථික වර්ධන වේගයක් තිබෙනවා කියලා. හැබැයි, ඒක නියම ආර්ථික වර්ධන වේගයක් නොවෙයි. ඒ වර්ධනයට හේතුව, සියයට 7.2ක, සියයට 7.5ක පොලියට ගත්තු විශාල මුදල් ප්‍රමාණයක් මේ වසරේදී රට තුළට ආපු එකයි. ඔබතුමන්ලාට පෙන්වන්න පුළුවන් මෙන්න මේ යෝජනා ක්‍රමයට ඒ මුදල් පාවිච්චි කළා කියලා. හැබැයි ඒ පොලියවත්, ඉදිරි අනාගතයේ මේ ආර්ථිකයට ඇති වන පරිහානියවත්, මේ සංවර්ධනය කියන ආර්ථික මාපකයේ පෙන්වන්නේ නැහැ.

ඔබතුමන්ලා මේ වැඩ පිළිවෙළ ඊයේ පෙරේදා පටන් ගත්තු දෙයක් නොවෙයි. ඔබතුමන්ලා ජනසතු කිරීම පටන් ගත්තේ 1956 දී. ඒ කාලයේ ලංකා විදුලිබල මණ්ඩලය, වරාය, ප්‍රවාහනය රජය සතු කළා. ඔබතුමන්ලා 1971 යුගයේදී රෙදි යාර දෙකක් දෙන්න පටන් ගත්තා. ඊට පස්සේ භූමිතෙල් ගඳ ගහන රෙදි දෙන්න පටන් ගත්තා. මේවා දිගටම කර ගෙන ඇවිල්ලා, ඊට පස්සේ එක්සත් ජාතික පක්ෂය කරපු සංවර්ධනය අවුරුදු ගණනක් තිස්සේ දැක්කා. ඒක දැකලා,- [බාධා කිරීමක්] මන්ත්‍රීතුමා කෑ ගහන්න එපා. උගුර හිර වෙයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා තමුන්නාන්සේට නියමිත වෙලාව අවසන්.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
එක්සත් ජාතික පක්ෂය ආරම්භ කරපු සංවර්ධන කටයුතු හරියාකාරව කර ගෙන යන්න බැරිව අද මේ ආණ්ඩුව මොන ආර්ථික ක්‍රමයක් මේ රටේ ඉදිරි අනාගතය වෙනුවෙන් හඳුන්වලා දෙන්න ඕනෑද කියලා දැන ගන්න විශාල පරිශ්‍රමයක යෙදෙනවා. ඒ අතරතුර ආයෝජන සම්බන්ධයෙන් විශාල පරිහානියක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම රජය සතු ආයතන විශාල ප්‍රමාණයක් විශාල ලෙස පාඩු ලබද්දී, යම් රැකියා ප්‍රමාණයක් රැක ගෙන අද ඉතා අමාරුවෙන් පවත්වා ගෙන යන පෞද්ගලික සමාගම්වලට මේ කරන බලපෑම නිසා ඉදිරි අනාගතයේදී -තව අවුරුදු 2කින්, 3 කින්- අපේ ආර්ථිකයට විශාල පහරක් වැදෙනවා. ඒ වාගේම ආර්ථිකය ඇද වැටෙන්නත් පුළුවන්. චීනය, ඉන්දියාව වැනි රටවල් විශාල වශයෙන් සංවර්ධනයක් ලබන අවස්ථාවක මේ රටේ පරිහානියට මේක හේතු වෙන්න පුළුවන් කියලා කරුණු ඉදිරිපත් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 4.09]

**ගරු පී. දයාරත්න මහතා (ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. தயாரத்ன - உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. P. Dayaratna - Minister of Food Security)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ප්‍රවාහන ඇමතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන නියෝග දෙක පිළිබඳවයි මම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ. ඒ තමයි, වාහනවල ගමන් කරන අය බඳ පටි පැළඳීම ගැන සහ අපි ළඟදීම විවෘත කරන්නට බලාපොරොත්තු වන අධිවේගී මාර්ගයේ ප්‍රවාහන කටයුතු පාලනය පිළිබඳව ගන්නා වැඩ පිළිවෙළ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම කියන්නට කැමැතියි, වර්ෂයක් පාසා මාර්ග අනතුරුවලින් මේ රටේ විශාල පිරිසක් මිය යන බව. පසු ගිය වසරේ 2,400 ගණනක් මිය ගිහිල්ලා තිබෙනවා. ඊට පෙර වර්ෂයේ 2,300 ගණනක් මිය ගිහිල්ලා තිබෙනවා. වාහන වැඩි වීමත් සමඟම ඒ විධියට පාරේ සිදු වන මරණ ගණන වැඩි වෙලා තිබෙනවා. මම හිතන හැටියට ඒ හේතුව නිසා වාහන බඳ පටි නියෝගය මීට සෑහෙන කාලයකට පෙරයි ඉදිරිපත් කරන්න තිබුණේ.

නමුත් මොනයම් හේතුවක් නිසා ප්‍රමාද වී හෝ මෙය ඉදිරිපත් කිරීම පිළිබඳව ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අපි යම් යම් රටවලින් ලබා ගත් සංඛ්‍යාලේඛන අනුව බැලුවොත්, වාහන පටි නොමැතිව ගමන් කිරීම නිසා සිදු වූ ජීවිත හානි සියයට තිහක් පමණ වෙනවා. එම නිසා වාහන පටි නීතිය ඇත්ත වශයෙන්ම ඉතාම වැදගත්. නමුත් එක්තරා වාහන කොටසකට පමණයි ඒ නීතිය අදාළ වන්නේ. ඉංග්‍රීසි අකුරු සහිත ලියා පදිංචි අංක තිබෙන වාහනවලට පමණයි මේ නීතිය තිබෙන්නේ. ඊට කලින් ආපු පැරණි වාහනවල මේ වාහන පටි නොමැති වන්න පුළුවන්. නැත්නම් ඒවා සවි කිරීම අපහසු වන්න පුළුවන්. ඒ වාගේම වාහන පටි,-[බාධා කිරීමක්]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
රජය ලාභ ලබන සෙවනගල සීනි කර්මාන්තශාලාව පවරා ගන්න යනවා කිසිම හේතුවක් නැතිව. විශේෂයෙන් මොනරාගල ජනතාවට,-[බාධා කිරීමක්]

**ගරු පී. දයාරත්න මහතා**
(மாண்புமிகு பீ. தயாரத்ன)
(The Hon. P. Dayaratna)
ඒක මේකට අදාළ නැහැ. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! ගරු ඇමතිතුමාට නියමිත කාල වේලාව සීමා සහිතයි.[බාධා කිරීම්]

**ගරු පී. දයාරත්න මහතා**
(மாண்புமிகு பீ. தயாரத்ன)
(The Hon. P. Dayaratna)
ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේට ඒ පිළිබඳව,- [බාධා කිරීම්] නැහැ. නැහැ. අවශ්‍ය නම් මා ඔබතුමාට ඒ පිළිබඳව ලොබියේදී කියන්නම්. [බාධා කිරීම්] ලොබියේදී කථා කරන්න පුළුවන් තමුන්නාන්සේත් එක්ක. ඒ පිළිබඳව හුඟක් තොරතුරු ඔබතුමාට දෙන්න මට පුළුවන්. [බාධා කිරීම්]

[ගරු පී. දයාරත්න මහතා]

ඒ ඉංග්‍රීසි අකුරු සහිතව ලියා පදිංචි වී නැති වාහන විශාල ප්‍රමාණයක් මේ රටේ තිබෙනවා. වාහන පට්ටලට අදාළව ඒවා පිළිබඳවත් යම් කිසි වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරන්නට පුළුවන් නම් හොඳයි. ඒ වාගේම මේ රටට වැසි ගෙන්වා, ඊට පසුව හදන lorry bodyවල මේ වාහන බඳ පටි සවි කිරීම හෝ පාවිච්චි කිරීම අපහසු වන්නටත් පුළුවන්. මේවා ගැන සොයා බලා කටයුතු කරනවා නම් හුඟක් හොඳයි කියා මා හිතනවා. ආසන පටි පැළඳීම පිළිබඳව ඒ කටයුතු සිදු වීමෙන් මේ රටේ සිදු වන මරණ විශාල සංඛ්‍යාවක් අඩු කරන්නට පුළුවන් කියලා මා හිතනවා.

අපේ අධිවේගී මාර්ගය ලබන 27 වන දා විවෘත කිරීමට නියමිතයි. 2011-2020 දශකය එක්සත් ජාතීන්ගේ මාර්ග අනතුරු අවම කිරීමේ දශකය හැටියට නම් කර තිබෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානයත්, ලෝක බැංකුවත් බොහොම උනන්දු වෙලා මේ කාලය තුළදී මාර්ග අනතුරු අවම කරන්නට යම් යම් විශාල වියදම් කරනවා. ශ්‍රී ලංකාවත් එයට සම්බන්ධ වෙනවා. අතිගරු ජනාධිපතිතුමා පසු ගිය මැයි 10 වන දා, මේ දශකයේ ආරම්භක දිනයේදී විශේෂ උත්සවයක් පවත්වලා මේ කටයුත්ත සඳහා අපිත් සම්බන්ධ වන බව ලෝකයට ප්‍රකාශ කළා.

මේ අධිවේගී මාර්ගය විවෘත කිරීමෙන් පසුව, ගමන් කළ හැකි වේගය පිළිබඳව මේ අවස්ථාවේදී අපි සාකච්ඡා කළා. උපරිම වේගය පැයට කිලෝ මීටර් 100යි කියා තිබුණත්, මාස කිහිපයක් යනතුරු උපරිම වේගය පැයට කිලෝ මීටර් 80ට පමණ සීමා කරනවා නම් හොඳයි කියන එක බොහෝ දෙනාගේ අදහසයි. ඒ වාගේම අවම වේග සීමාව අඩු ගණනේ පැයට කිලෝ මීටර් හැටක්වත් වන්නට ඕනෑ. එහෙම නොවුණොත් හෙමින් හෙමින් යන වාහන නිසා වේගයෙන් යන අයට විශාල අවහිරයක් වෙන එකයි වෙන්නේ. මේ අධිවේගී මාර්ගයේ මං තීරු හතරයි තිබෙන්නේ. එක පැත්තකට දෙකයි. අනෙක් පැත්තට දෙකයි.

විශේෂයෙන්ම හදිසි අවස්ථාවකදී වාහනයක් නවතාලීම සඳහා අවශ්‍ය වන corridor එක -තුන්වෙනි මං තීරුව- බොහොම පළලින් අඩුයි. ඒකේ පළල මීටර් 1.5ක් පමණයි; වාහනයක පළල නැහැ. මේ හේතුව නිසා වාහන නතර කළ හැකි තැන් දෙකක් අතරේදී හදිසියේ වාහනයක් යම් කිසි ආකාරයක ආබාධයකට ලක් වෙලා අයින් කළාම ප්‍රධාන මං තීරු දෙකෙන් ටිකක් ඒ වාහන සඳහා වෙන් වෙනවා. ඒක ටිකක් භයානක දෙයක්. මේ නිසා පොඩි වෙනසක් කරන්නට පුළුවන්. අඩු ගණනේ ඉදිරියේදී හෝ මීටර් 500න් 500ට parking lots හදන්නට ඕනෑ. එහෙම නැත්නම් භයානක තත්ත්වයක් ඇති වෙනවා. මොකද, දැන් තුන්වෙනි මං තීරුවක් නැහැ. බටහිර රටවල මං තීරු හතරයි. ඒ රටවල hard shoulder කියලා එකක් තිබෙනවා. ඒකේ ලේසියෙන්ම වාහනයක් නතර කරන්න පුළුවන්. එහෙම දෙයක් මේකේ නැහැ. තුන්වෙනි මං තීරුවක් නැහැ. ඒක තිබෙන්නේ සාමාන්‍යයෙන් වාහනවලට ගමන් කරන්න නොවෙයි, වාහනයක් හදිසි අවස්ථාවකදී නතර කර ගන්න. ඒ නිසා මම මේ යෝජනාව කරනවා. ඒ කාර්යය කරන්න අපහසු නැහැ. එය මහ විශාල වියදමක් යන දෙයක් නොවෙයි. මීටර් 500න් 500 හෝ parking lots හදා ගන්න පුළුවන්. මේ තිබෙන hard shoulder එක තව මීටර් කිහිපයක් පළල් කරන්න පමණයි තිබෙන්නේ. මේක ඉතාම වැදගත් දෙයක්.

අනෙක් කාරණය තමයි අද මේ අධිවේගී මාර්ගයේ වාහන පාලනය පිළිබඳව පොලීසිය පුහුණු වීම් කටයුතු කරනවා කියලා අපට දැන ගන්නට ලැබුණා. විශේෂයෙන්ම මේ මාර්ගය සඳහා විශේෂ වාහන වන motorcycles, ambulances, firefighting වාගේ වාහන මිලදී ගෙන පොලිසියේ පිරිසක් පුහුණු කර ගෙන යෑම පිළිබඳව අපි විශේෂයෙන්ම පොලීසියට ස්තුතිවන්ත වනවා.

උපලේඛනයේ සඳහන් ආකාරයට මේ මාර්ගයේ ගමන් කළ හැකි සහ නොහැකි වාහන පිළිබඳව පැහැදිලි කරලා තිබෙනවා. උපලේඛනයේ වාහන පස් වර්ගයක් සඳහන් කරලා තිබෙනවා, ඒවාට ගමන් කරන්න බැහැ කියලා තිබෙනවා. එනම් මෝටර් ට්‍රයිසිකල් වැනි රථ, කෘෂි කාර්මික ඉඩම් වාහන, අත් ට්‍රැක්ටර්, අබාධිතයන් සඳහා වූ රථ සහ වාෂ්ප බලයෙන් ධාවනය කෙරෙන මෝටර් වාහන. මේකේ මෝටර් සයිකල් කියලා නම් නැහැ. නමුත් වෙනත් තැනක එය සඳහන්ව තිබෙනවා. අද දින න්‍යාය පත්‍රයේ පස් වෙනි අයිතමයේ සඳහන් නියෝගයේ -2011 අගෝස්තු මස 09 දිනැති අංක 1,718/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.10.18 දින ඉදිරිපත් කරන ලද නියෝගයේ- මෝටර් සයිකල් කියලා සඳහන්ව තිබෙනවා. නමුත් උපලේඛනයේ එය ඇතුළත් වී නැහැ. මම දන්නේ නැහැ ඒ ඇයි කියලා. නමුත් එය උපලේඛනයට ඇතුළත් විය යුතුයි. සමහර විට වැරදීමක් වන්නට පුළුවන්.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
උපලේඛනයක් පස්සේ ගේන්න පුළුවන් නේ. අර පනතේත් එහෙම නේ.

**ගරු පී. දයාරත්න මහතා**
(மாண்புமிகு பீ. தயாரத்ன)
(The Hon. P. Dayaratna)
ඒ නිසා ඒක එකතු කරන එක හොඳයි. නැත්නම් කෙනෙක් මේක දිහා බලලා උපලේඛනයේ මෝටර් සයිකල් කියලා නැහැ කියලා මෝටර් සයිකල් එකක් පැද ගෙන යන්න ඉඩ තිබෙනවා. අපේ අධිවේගී මාර්ගයේ වාහන ගමන් කිරීමට අවසර දීමට පෙර, ඉතාමත්ම කාලීනව, මේ නියෝග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳව මේ අවස්ථාවේදී අපි ගරු ප්‍රවාහන අමාත්‍යතුමාට ස්තුතිවන්ත වනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක් සහ ඊට අමතරව තවත් විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ. භා. 4.19]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි. මේ අවස්ථාවේදී වැදගත් පනත් කෙටුම්පත් සහ රෙගුලාසි ගැන වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම මා බොහොම අගය කරනවා. ඇත්ත වශයෙන්ම ආණ්ඩුව මහ පාරෙන් අතුරු පාරවලට ගමන් කරන කාලයක මම හිතුවා, අද ඉදිරිපත් කළ පනත් කෙටුම්පත් සම්බන්ධයෙනුත් අද රටේ පවතින ආර්ථික තත්ත්වය ගැනත් වචන ස්වල්පයක් කථා කිරීමට මේ අවස්ථාව පාවිච්චි කරන්න. අද ආණ්ඩුව බොහොම සතුටෙන් අධිවේගී මාර්ගය ගැන කථා කරනවා. මතක තියා ගන්න අවශ්‍යයි, එක්සත් ජාතික පක්ෂය ඒක හදලා දීලා, සල්ලි ලබා දීලා ඔබතුමන්ලා ඒක ක්‍රියාත්මක කිරීම අපට සතුටුයි කියා. [බාධා කිරීම්] අපි කුහක දේශපාලනඥයෝ නොවෙයි. [බාධා කිරීම්] ඉන්න කෝ. මොකද, මේ පාරෙන් අතුරු පාරවලට ගමන් කරන්නේ? ගරු අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමා වාගේ කට්ටිය ඔහොම කථා කරනවාද? ඒ සම්බන්ධයෙන් අපට කියන්න අවශ්‍ය වන්නේ අපි බොහොම සතුටුයි කියලා. අර බිත්තියේ ලියලා තිබෙන එක්සත් ජාතික පක්ෂයේ ඉදිරි දැක්ම වටහා ගෙන ඒක සැබෑ මට්ටමට

ඉදිරියට ගෙන යන එක ගැන අඩු ගණනේ ඒ වාගේ අලුත් කට්ටියක් අපි බිහි කරලා තිබෙනවා කියන එක ගැන සතුටුයි. [බාධා කිරීම්]

අපට කුහකකමක් නැහැ නේ. අන්න ඒ නිසා තමයි එක්සත් ජාතික පක්ෂය එයාකාරයෙන්ම ඉදිරියට ගමන් කරන්නේ. ගරු ඇමතිතුමනි, මම මේ අවස්ථාවේදී අද පාර්ලිමේන්තුවේ [බාධා කිරීමක්] ඔව්, ඔක්කොම කන බොන මිනිස්සු. ඒ නිසා තමයි අද- [බාධා කිරීමක්] ඔව්, ඔක්කොම වැඩ කරනවා; වැඩ බලනවා; එහෙම තමයි අපි ඉන්නේ. [බාධා කිරීමක්] මේ කථා කරන අවස්ථාවේදී, අපේ අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාගේ හොරණ ඡන්ද දායකයෝ ගැලරියට ඇවිත් ඉන්නවා. මේ පාර්ලිමේන්තුව ක්‍රියා කරන ආකාරය ඒ අයට අපි පෙන්වන එක හොඳයි. දැන් පෙනෙනවා, ආණ්ඩුවේ වැඩ කරන ඇමතිවරු හැට හුටහමාරක් සිටියත් අද සභා ගර්භයේ ඇමතිවරුන් කී දෙනෙක් ඉන්නවාද කියලා. අඩු ගණනේ වැඩ කරන ඇමතිවරුන් තුන් හතර දෙනෙක්වත් සභා ගර්භයේ ඉන්න එක අපිට ලොකු දෙයක්. [බාධා කිරීමක්] ඔය ඉතින්! ආණ්ඩුව හැම වේලාවේම පීලි පනිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හෙට දින විවාදයට මෙම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන "ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත් කෙටුම්පත" සම්බන්ධ පෙත්සම අද උසාවියේ විභාගයට ගත්තා. ඒක හෙටට කල් දැම්මා. හැබැයි ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමනි, අද ස්වාමීන් වහන්සේලා නවසිය නමක්, දහස් නමක් විතර එතැනට එන අවස්ථාවේදී මැර කණ්ඩායමක්ද ශ්‍රේෂ්ඨාධිකරණය ළඟ සිටි එක ගැනත් අපි මතක් කරන්න කැමැතියි. මම දන්නවා, ඔබතුමන්ලා වාගේ කට්ටිය ඒක අනුමත කරන්නේ නැහැයි කියලා. වණ්ඩින් ඉන්න දේශපාලන සංස්කෘතියට තිතක් තැබුවායි කියලා අපි හිතුවා. නමුත් අපට පෙනෙනවා, ඒවා වර්ධනය වෙනවා කියලා. ඔබතුමන්ලා තුනෙන් දෙකක බලයක් තියා ගෙන මේ වාගේ කැත දේශපාලනයක තවමත් යෙදෙමින් මොන වාගේ නින්දා සහගත වැඩ කටයුතුද කරන්නේ? උසාවියට යන්නේ ජනතාවට වෙනින් තැනකට යන්න බැරි නිසා. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාමත් මෙතැන තිබෙන මැර බලය පෙන්වන්න හදලා තමයි ඔය වාගේ පනත් ගෙනෙන්නේ. උසාවියට යන කොටවත් අඩු ගණනේ ඒකෙන් සතුටක් සහ සාධාරණයක් ඉෂ්ට වෙන්න -[බාධා කිරීම්] කෑ ගහන්නේ නැතුව ඇහුවා නම් වැඩේ හරි. බොරුවට නිකම් කෑ ගහ ගහ ඉන්නවා. අපට හිතෙනවා, මේ ආණ්ඩුව සිංහල ව්‍යාපාර නැති කරන්න හදනවාද කියලා. බලන්න, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය - [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! Let us have an orderly House.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අද මෙතැන ජාතික හෙළ උරුමයේ ස්වාමීන් වහන්සේලා ඉන්නවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඉන්න හැම අවස්ථාවකදීම සිංහල ව්‍යාපාර නැති කරන ගමනක් තමයි ඇති කළේ. [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ආ!

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මොකද, ආ කියන්නේ? එදා 1958 දී අපේ සර් සිරිල් ද සොයිසලාගේ තිබුණු බස් ප්‍රවාහන සමාගම් රජය සන්තක කළා. ඒවා නැති කළේ දෙමළ අයද, මුස්ලිම් අයද? නැහැ, සිංහල අය. ඊට පස්සේ 1060-65දී මොකක්ද කළේ? සිලෝන් පෙට්‍රෝලියම් සංස්ථාව ඇති කළා. ඊට පස්සේ ඉස්කෝල ටිකත් ගන්න පටන් ගත්තා. මේවායේ බලය ඒ කාලයේ තිබුණේ සිංහල අයට නොවෙයිද? අපි මේ අවස්ථාවේදී සිංහල ජාතිවාදයක් ඇති කරන්න හදන්නේ නැහැ. නමුත් මේ ව්‍යාපාර නැති කරන්න හදන එක ගැන මතක් කිරීමක් තමයි කරන්නේ. ඒක තමයි අපට තිබෙන දුක. ඊට පස්සේ 1970-77 මොනවාද වුණේ? පෝලිම් යුගයකට ගෙනිච්චා විතරක් නොවෙයි, වතු ටිකත් ගත්තා. කවුද වතු ටික අයිති කර ගත්තේ? අන්තිමට වතු ටිකත් අත් පත් කර ගත්තා. කවුද ගෙවල් ටික අයිති කර ගෙන සිටියේ? ඒ ගෙවල් ටිකත් අයිති කර ගත්තා. ඊට පස්සේ රජය සන්තක කිරීම තුළින් "ලේක් හවුස්" එක අයිතිකර ගත්තා. දැන් කෑ ගහනවා. රනිල් වික්‍රමසිංහලාගේ පවුලට අයිති "ලේක් හවුස්" එකත් රජය සන්තක කර ගත්තා. ඊට පස්සේ පතල් සහ මේ සියල්ලක්ම. අන්තිමට සිංහල වෙළෙඳ ව්‍යාපාරිකයා නැති කරන ගමනක් තමයි ඒ කාලයේ ගියේ කියන එක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය අපට මතක් කරනවා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ඔබතුමාට මතක් කරන්න එකක් තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක මතක් කරන්න පස්සේ. මගේ වෙලාවේ මතක් කරන්න අවශ්‍යතාවක් නැහැ, ඇමතිතුමනි. මේ අවස්ථාවේදී මා මතක් කරන්න හදන්නේ ඔබතුමාට අමතක දේවල්. මගේ හිතවත් ඇමතිතුමනි, ඔබතුමාට කොන්දක් තිබෙනවා නම්, ඔබතුමා මට මේවා මතක් කරනවාට වැඩිය ඇමති මණ්ඩලය ඇතුළේ ඒක කිව්වා නම් මම හිතන්නේ ඊට වැඩියෙන් ජනතාව ඒකට ගරු කරනවා කියලායි. ඔබතුමාගේ වම් පැත්තෙත්, දකුණු පැත්තෙත් වාඩි වී සිටින ඇමතිවරුන් දෙදෙනාටම කොන්දක් තිබෙන බව මම දන්නවා. නමුත් ඔබතුමා ගරු කරන විධායක ජනාධිපති ඉදිරියේ ඒ කොන්ද පාවිච්චි කළා නම් මම හිතන්නේ ඊටත් වැඩිය ජනතාව ඒක අගය කරනවායි කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

දැන් ඔබතුමන්ලා මේ පනත් කෙටුම්පතේ නමත් වෙනස් කරලා. ඊයේ හැන්දෑවේ ලොකුවට Group Meeting එක තිබ්බා. පනත් කෙටුම්පතේ තිබුණු නම වෙනස් කළා. මේක ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත් කෙටුම්පත.

දැන් මේ පනත් කෙටුම්පත ගෙනල්ලා මොනවාද කරන්න හදන්නේ? මේ තුළින් අද ලාබ ලබන ආයතන- [බාධා කිරීමක්] සෙවනගල සීනි සමාගම දයා ගමගේ මැතිතුමාගේ එකක්. මේ, එක්සත් ජාතික පක්ෂයේ අය නොවෙයි. හැරී ජයවර්ධන ඔබතුමන්ලාගේ සභාපති කෙනෙක්. එතුමාගේ පැල්වත්ත සීනි සමාගම, හිල්ටන් ආයතනය වැනි ආයතන 38කින් 6ක්ම ලාබ ලබන ඒවා. මේ අත් පත් කර ගැනීම තුළින් ඔබතුමන්ලා මොනවාද මේ කරන්න හදන්නේ? ඔබතුමන්ලාට ඔය තරම් කැක්කුමක් තිබෙනවා නම් ඇයි මෙච්චර හදිසියෙන් මේ පනත් කෙටුම්පත ගෙනාවේ? මම මේ අවස්ථාවේදී එක කාරණයක් මතක් කරන්න කැමැතියි. ඒක බොහොම වැදගත් එකක්. අද මේ

[ගරු රවි කරුණානායක මහතා]

රටේ නීතිඥවරුන් යම් විධියකින් බය වෙලා ඉන්න මේ අවස්ථාවේදී ෂිබ්ලි අසීස් මැතිතුමා ඉතාමත් නිර්භීතව ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. මම ඒ ලිපිය **සභාගත*** කරනවා.

මේ අවස්ථාවේදී මම ඒ ලිපියේ කොටසක් කියවනවා. එහි මේ විධියට සඳහන්ව තිබෙනවා.

It states, I quote:

"In the normal course, under Article 78 (1) of the Constitution, every Bill is required to be published to the public in the Gazette…"

ඒ අවස්ථාවේදී තමයි ජනතාවට අයිතියක් තිබෙන්නේ. මෙවැනි පනතක් එනවාය ඒ නිසා උසාවියට යන්න පුළුවන්ය කියා ජනතාව දැනුවත් වෙන්නේ. උසාවියට යන්න පුළුවන් නම් උසාවියෙන් සෙතක් ලබා ගන්න පුළුවන් ක්‍රමයක් තමයි එයින් ආරම්භ වෙන්නේ. නමුත් මේ අවස්ථාවේදී, අපේ එස්.බී. දිසානායක මැතිතුමාත් ඉන්න මේ ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍රවාදය ටිකෙන් ටික නැති කර ගනිමින් යන මේ ගමන තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 ව්‍යවස්ථාව යටතේ රිංගාගෙන මේ පනත හදිසි පනතක්ය කියා ලෝකයට කියන්නේ නැතුව, ඇමති මණ්ඩලයම දැන ගෙන -මම හිතන්නේ සමහර විට ඇමති මණ්ඩලයවත් දන්නේ නැහැ, ඒකේ මොනවාද තිබෙන්නේ කියා.- දැන් අද ඒක හදිසි පනත් කෙටුම්පතක් විධියට ඉදිරිපත් කරන්න යනවා. අන්තිමට මොනවාද වෙන්නේ? ඒ අහිංසක ව්‍යාපාරිකයන්ට උසාවිය ඉදිරියට යන්නවත් අවස්ථාවක් නැහැ. උසාවිය ඉදිරියට ගියාම අනිවාර්යයෙන්ම ඒ වැරැද්ද නිවැරදි කරන්න හැකියාව තිබෙනවා. මම ඒ ගැන පසුව කතා කරන්නම්. නමුත් ඇයි මෙතරම් හදිසියෙන් කටයුතු කරන්නේ? අද ඒ ව්‍යාපාරිකයන් ඒ සම්බන්ධයෙන් උසාවි යනවා වාගේම වාණිජ මණ්ඩලවල හැම කෙනෙකුටම අද බයෙන් තමයි කටයුතු කරන්න වෙලා තිබෙන්නේ.

මම මේ අවස්ථාවේදී චන්ද්‍රා ජයරත්න මැතිතුමා ගැන මතක් කරන්න කැමැතියි. එතුමා ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ හිටපු සභාපතිතුමායි. එතුමා අද වාණිජ මණ්ඩලයේ හිටියේ නැති වුණත් අඩු ගණනේ එතුමාට මේ ගැන කතා කරන්න හැකියාව තිබුණු එක අපි අගය කරනවා. ඒ වාගේම මම මේ අවස්ථාවේදී තවත් කරුණක් මතක් කරනවා. "ඩේලි මිරර්" පුවත් පතේ සඳහන් වෙලා තිබුණා, "Gutless chambers" කියා. Not only, "Gutless chambers", I also add to it saying, "Spineless chambers"

මේ අවස්ථාවේදී එක්සත් ජාතික පක්ෂයට ඇඟිල්ල දික් කරලා අහනවා, "එක්සත් ජාතික පක්ෂය ඇයි මොනවත් කරන්නේ නැත්තේ?" කියලා. ඒ ව්‍යාපාරික ලෝකයේ එක්කෙනෙක්වත් ඇවිල්ලා මෙවැනි ප්‍රශ්නයක් තිබෙනවාය කියා එක්සත් ජාතික පක්ෂයට කිව්වාද කියා අපි අහනවා. පැල්වත්ත තිබෙන ප්‍රශ්න ගැන අපට කිව්වා. සෙවනගල තිබෙන ප්‍රශ්න, දයා ගමගේ මැතිතුමා ඇවිල්ලා අපට කිව්වා. ඒ සම්බන්ධයෙන් අපි කතා කරනවා. හිල්ටන් එක සම්බන්ධයෙන් ප්‍රශ්න තිබෙනවා. අපි ඒ ගැන කතා කරනවා. නමුත් සමහර අය අපට හොරෙන් ගිහින් ආණ්ඩුවත් එක්ක කතා කරලා ඇන ගත්තාට පසුව එක්සත් ජාතික පක්ෂයෙන් අහනවා "මොනවාද තමුන්නාන්සේලා කරන්නේ?" කියලා. ඒ ගැන මම මෙතැනදී මතක් කරන්න කැමැතියි. මොකද, එක්සත් ජාතික පක්ෂය මේ ගැන කතා කරන්න බය නැහැ. නමුත් අපි අද දුක් වෙන්නේ විවෘත ආර්ථිකය ගැන කතා කරන මේ ආණ්ඩුව අද ඒකේ විවෘත කියන කොටස එළියට දමලා මේක සංවෘත ආර්ථිකයක් කරගෙන, එක් කෙනෙකුට දෙදෙනෙකුට ඕනෑ කරන ආර්ථික ක්‍රමයක් ඇති කරගෙන යෑම ගැනයි.

සිම්බාබ්වේ මුගාබේ කළේත් මෙහෙමම තමයි. ඉස්සෙල්ලා කොම්පැනි ටික ගත්තා. ඊටපසුව ඉඩම් ටික ගත්තා. ඊට පසුව ලෝකයත් එක්ක - [බාධා කිරීමක්] කැගල්ල පැත්තට ආවේ නැහැ නේ. මම මේ කතා කරන්නේ මොනවාද මේ කරන්නේ කියන එක ගැනයි. - [බාධා කිරීමක්] මුදල් පනත, ඉඩම් පනත ගැන කතා කරන්නයි අද තිබෙන්නේ. මහ පාරේ තිබෙන ඒවා ගැනයි. මහ පාරෙන් අතුරු පාරට ඇවිල්ලා, ආණ්ඩුව ගැන, මුදල් සම්බන්ධයෙන්, ඉඩම් සම්බන්ධයෙන් තමයි මම කතා කරන්නේ. මම කතා කරන්න ඕනෑ විධිය ගැන ඔබතුමා මට කියන්න ඕනැයැ. හෙට තිබෙන එක ගැන අද දන්නා පක්ෂයක් වශයෙන් තමයි අපි කතා කරන්නේ. ඔබතුමන්ලා හෙට වැටෙන්න යන ගමනක් තමයි මේ යන්නේ. අන්න ඒ නිසා අපි හැමදාම කියන්නේ, ඔබතුමන්ලා හොරෙන් කරන දෙය අපි විවෘතව කරලා තිබෙනවාය කියන එකයි. සමහර විට අපි විපක්ෂයේ ඉඳලා තිබෙනවා. නමුත් ආඩම්බරයෙන් අපට දේශපාලනය කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ අන්න ඒ නිසාය කියන එකත් අපි මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

මේක සිංහල ව්‍යාපාරිකයන් නැති කරන්න යන ගමනක්ය කියා මම කිව්වා. මොකද, එක පැත්තකින් දෙමළ ව්‍යාපාරිකයන් නැති කරනවා. අනික් පැත්තෙන් මුස්ලිම් ව්‍යාපාරිකයන්ට ඒවා කරන්න ඉඩ දෙන්නේ නැහැ. එක්කෙනෙකුගේ, දෙදෙනෙකුගේ ග්‍රහණයට මේක ලබා ගන්නා ආර්ථික ක්‍රමයක්ද මේ ඇති කරන්න හදන්නේ කියා අපි බලනවා. නමුත් තමුන්නාන්සේලා මේක මතක තබා ගන්න ඕනෑ. අද අපි මෙතැන විපක්ෂයේ ඉඳගෙන කතා කළත් මම කතා කරන්නේත් මට පසුව කතා කරන අයත්, මට කලින් කතා කරපු අයත් කතා කරන්නේ, කළේ ඔබතුමන්ලාගේ වහලා තිබෙන කටත් අරින්නය කියන එකත් මම මතක් කරන්න කැමැතියි. ඇමති මණ්ඩලය ගියාට පසුව ඔතැන කතා කරන්න බැරි දේ අනේ, අපි වෙනුවෙන්වත් කතා කරන්නය කියා ඔබතුමන්ලා කියනවා නේද? අපි ඒ අය පාවා දෙන්නේ නැති නිසා තමයි ඒ විධියට විශ්වාසයෙන් කතා කරන්නේ. අපි ඒක කරන්නම්. නමුත් මතක තබා ගන්න, මේක කැරකෙන රෝදයක් වාගේ කැරකිලා නැවත ඔතැනට එන බව. මේ වාගේ අසාධාරණයට ලක් කරන කොම්පැනි, ඉඩම් නැවත ලබා දෙන අයත් ඉන්නවා. වැඩි කල් යන්නට මත්තෙන් ජනතාව තෝරා පත් කර ගන්නා අපේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තුළිනුත් මේ වාගේම ඉරණමක් ඒ අයටත් අත්වනවාය කියන එක මේ අවස්ථාවේ දී මා වගකීමෙන් යුතුව කියන්න කැමැතියි. එතකොට අපි those gutless, spineless chambersවලින් අහනවා. අපිත් එක්ක කථා කරපු නැති අයට, රිංගලා එන කට්ටියට තමයි එදාට සමාවක් නැත්තේ කියන එකත් මා මතක් කරන්නට කැමැතියි.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ඔබතුමා කාටද තර්ජනය කරන්නේ? අපටද? අපි හය නැහැ. තර්ජනය කරන්න එපා, අපි හය නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි තර්ජනය කරන්නේ නැහැ. කොන්දක් නැති ව්‍යාපාරිකයන්ට, ආණ්ඩුවට කත් අදින අයට මේ අවස්ථාවේ දී අපි මතක් කරන්න කැමැතියි, ශ්‍රම බලශක්තියෙන් වැඩ කරන ජනතාව වෙනුවෙන් තමයි අපි කථා කරන්නේ කියන එක. ඔබතුමන්ලා

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

පෙන්නුවේ අපි එක්සත් ජාතික පක්ෂයේ ව්‍යාපාරික ලෝකයේ ආදරවන්තයෝ කියලා යි. නැහැ, එහෙම නොවෙයි. අපි ඒ වැඩ කරන අයව ආරක්ෂා කරන්නට පනත් ගෙනල්ලා තිබෙනවා. එවැනි පනත් 18කින් 16ක් ගෙනල්ලා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයයි කියන එක මා මේ අවස්ථාවේ දී වගකීමකින් යුතුව කියන්න කැමැතියි.

මොකක්ද මේ කරන්න යන්නේ? විවෘත ආර්ථිකය කියන ලේබලය ගලවලා, සංවෘත ආර්ථිකය කියලා ගහන්නද හදන්නේ? නැත්නම් ඔබතුමන්ලා පෞද්ගලීකරණය කරන්නේ නැහැ කියලා කියමින්, ලොකුවට වෙනත් නම් ගෙනල්ලා පෞද්ගලීකරණය ඒ ආකාරයටද කරන්න බලන්නේ? දැන් බලන්න, කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමා 2011 නොවැම්බර් මාසයේ 04 වැනිද "ලංකාදීප" පත්‍රයේ මෙසේ කියනවා:

"අසාර්ථක ව්‍යාපාර 37 ට අමතරව ඉදිරියේදී තවත් එවැනි ඒවා පවරා ගන්න ඉඩ"

ඇමති කෙහෙළිය රඹුක්වැල්ල මේ කියන්නේ. එහෙම නම් මේක ප්‍රතික්ෂේප කරන්න කියලා කියන්න. එක පැත්තකින් ගිහිල්ලා "වෝටර්ස් එජ්" එක ගන්නවා. අනෙක් පැත්තෙන් ගිහිල්ලා තව තැනක ඉඩමක් තිබුණොත් ඒක ගන්නවා. මේ පාර හොඳ නැහැ යි කියලා ඒක අත්පත් කර ගන්නවා. ඔන්න ව්‍යාපාර 37ක් අසාර්ථකයි කියලා ඒවා ආණ්ඩුවට අත්පත් කර ගන්නට හදනවා. දැන් මම මේ කියන්නේ කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමා කර තිබෙන ප්‍රකාශය ගැනයි. එතැනින්ම තමයි මෙය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ඊ ළඟට මා කියන්න කැමැතියි, මුදල් අමාත්‍යාංශයේ වැඩ කරන කට්ටිය ඉතාමත් වංචා සහගත තත්ත්වයක් තුළින් ඉදිරිපත් කරලා තිබෙන website එකක් ගැන. ඇමති මණ්ඩලයේ සමහර අය මේක ගැන දන්නේ නැතිව ඇති. මාත් මේක ගැන කියන්නේ මට දැන ගන්නට ලැබිලා තිබෙන නිසා යි. එස්.බී. දිසානායක ඇමතිතුමාට දැන ගන්නට ලැබිලා තිබෙනවාද මා දන්නේ. මා හිතනවා එතුමා දැනගත්තොත් ඒ ගැන සටන් කරාවි කියලා. අද කියලා තිබෙනවා, තුන්වැනි list එකක් ගැන. A, B, C Lists හදලා තිබෙනවා, තවම දාලා නැහැ. මෙන්න මේ කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමා තමයි කියන්නේ, "අසාර්ථක ව්‍යාපාර 37ට අමතරව තවත් එවැනි ඒවා පවරා ගන්න ඉඩ" කියලා. දැන් මා මේ ඉඩ ගැන තමයි මතක් කරන්නේ. ඒක යටතේ තිබෙනවා, වැවිලි කර්මාන්ත 21ක්. ඒ 21ම එතැනට දාලා තිබෙනවා. සිනමන් ග්‍රෑන්ඩ්, සිනමන් ලේක්, ටාජ් හෝටලය, අඹේවෙල කර්මාන්ත ශාලාව, බ්‍රිතාන්‍යයේ තානාපති කාර්යාලයට තිබුණු ඉඩම්, Lanka Distilleries, ප්‍රීමා සමාගම, LIOC, කුල්හිරිය, Kabool Lanka, Hotels Corporation, Mini Hydro ව්‍යාපාර තිබෙන ඔක්කෝම. මේවාත් ඒ ලැයිස්තුවට දමලා තිබෙනවාය කියලා ඔන්න අපට ඉදිරිපත් කරලා තිබෙනවා. අපි විතරක් නොවෙයි කියන්නේ. මේ කෙහෙළිය ඇමතිතුමාත් කියලා තිබෙනවා, ඉදිරියේ දී පවරා ගන්නවා කියලා. ඒ දාලා නැති "සී" ලැයිස්තුව තමයි- [බාධා කිරීමක්] මම දන්නේ නැහැ. එහෙම නම් කෙහෙළිය රඹුක්වැල්ලට කියන්න, "නැහැ" යි කියලා කියන්න කියලා. කෙහෙළිය රඹුක්වැල්ල "ලංකාදීප" පත්‍රයට කර තිබුණු ප්‍රකාශය ගැනයි මම කිව්වේ.

**ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)

මෙතුමා බොරු මවනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔව්, ඉතින් මවන එක නේ අපි කරන්නේ. "Hedging" සුදුව සම්බන්ධයෙන් අපි උසාවි ගියාම අපි දේශද්‍රෝහියෝ. රුපියල් කෝටි 11,800ක් නැති කිරීම සම්බන්ධයෙන් අපි උසාවි ගියාම, අපි දේශද්‍රෝහියෝ. දැන් මොනවාද වෙලා තිබෙන්නේ? අද තෙල් මිල අඩු කරන්නට පුළුවන්කම තිබෙන අවස්ථාවේ දී ඒක නැති කරලා තිබෙන්නේ ඔබතුමන්ලා නේ. පාලිත ස්වාමීන් වහන්සේ නැවත උසාවි ගියේ අන්න ඒ සම්බන්ධයෙන්. දේශද්‍රෝහියෙක්ද අපේ පාලිත ස්වාමීන් වහන්සේ? [බාධා කිරීම්] ඔව්, ඔව්, බංකොළොත් කරන්නේ අපි නොවෙයි. [බාධා කිරීම්] ඔබතුමන්ලා බස් ටික නැති කළා වාගේ, ඔබතුමන්ලා ඉඩම් ටික නැති කළා වාගේ, ඔබතුමන්ලා ගෙවල් ටික නැති කළා වාගේ, මේ සිංහල ව්‍යාපාරය නැති කළා වාගේ තමයි ඕවාත් නැති කරන්නේ කියන එකත් මේ අවස්ථාවේ දී මතක් කරන්න කැමැතියි. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීවරුන් වාඩි වන්න. තමුන්නාන්සේලාගේ පැත්තේ කථිකයෙක් කථා කරන්නේ. කරුණාකර වාඩි වන්න. [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒ නිසා බොරුවට තර්ජනය කරනවා කියන්න ඕනෑ නැහැ. අපි අහිංසක වැඩ කරන ජනතාව නියෝජනය කරනවා කියන එක මේ අවස්ථාවේ දී මතක් කරන්නට කැමැතියි. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! තමුන්නාන්සේලාගේ කථිකයෙක් මේ කථා කරන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමන්ලා Sinotex ගැන කථා කරනවා. ඔබතුමන්ලා Jaqalanka ගැන කථා කරනවා. ඔබතුමන්ලා Plymouth ගැන කථා කරනවා. දන්නවාද? අවුරුදු 25ක් විතර අපි ඒවා ගැන කටයුතු කරලා සිටින පුද්ගලයන් වශයෙන් මේ කියන්නේ. මේවා කඩාගෙන වැටෙනකොට සත පහක් ආණ්ඩුවෙන් උදවු කළේ නැහැ. ඔබතුමන්ලාගේ ආණ්ඩුව තමයි මේ අහිංසක වැඩ කරන ලක්ෂ 78ක් වූ ජනතාවගේ අර්ථ සාධක අරමුදලේ සල්ලි ටික හොරකම් කරන්න හැදුවේ.

එතකොට ඒ වෙළෙඳ කලාපයේ ඉන්න නිර්භීත අය ඉදිරිපත් වෙලා තමයි ඒක නැවැත්වුවේ කියන එක මතක් කරන්න කැමැතියි. අන්න ඒකට විරුද්ධව තමයි අද ගිහිල්ලා ඒ ඉඩම් ගන්න හදන්නේ. එදා ගහපු අයට තවම සල්ලිවත් දීලා නැහැයි කියන එක අපි මතක් කරන්න කැමැතියි. දැන් බලන්න, මම කිව්වා වාගේ එක පැත්තකින් මේ පනත් කෙටුම්පත තුළ වාණිජ මණ්ඩලය- [බාධා කිරීම්] ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමනි, මම දන්නවා ඔබතුමා හැම වෙලාවේම අපට උදවු කරනවා කියලා. [බාධා කිරීම්]

**ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)
ආචාර්ය මොළේ අර්ශස්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔය බදුල්ල විතරක් නොවෙයි, මොණරාගලත්- [බාධා කිරීම්] හරි, හරි. ඔක්කොම හරි. ඉතින් දැන් ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමනි, මේ Chamber එක ගිහිල්ලා ඒ කථා කරපු ඇමති මණ්ඩලය කිව්වාම "ඇයි, ව්‍යාපාර ලෝකයට මෙතරම් ප්‍රශ්න ඇති කරන්නේ" කියලා, එතැන හිටපු මුදල් අමාත්‍යාංශයේ ලේකම් කියලා තිබුණේ, "නැහැ, නැහැ මේක ලෝක බැංකුවයි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලයි අනුමත කර තිබෙනවා" කියලායි. එයා දැන ගත්තේ නැහැ, එයා කියන කථාව එළියට යයි කියලා. ලෝක බැංකුවේ Vice-President බැරි වෙලා ලංකාව පැත්තට ආවා. ඒ වෙලාවේ කිව්වේ මොනවාද? "මේ වාගේ යෝජනා කිරීම රටට අහිතකරයි. මේවා අපි ප්‍රතික්ෂේප කරනවා. මේවා කරන්න ඉඩ දෙන්න එපා." කියලායි. මෙන්න මෙහෙම තමයි World Bank Vice-President for South Asia Isabel Guerrero කිව්වේ.

එක පැත්තකින් ආණ්ඩුවේ මුදල් අමාත්‍යාංශයේ ලේකම් මෙහෙම කියන කොට, ව්‍යාපාරික ලෝකය ඉදිරියේ එහෙම කියන කොට මේ රටට ව්‍යාපාර ලෝකය ගේන්නේ කොයි ආකාරයෙන්ද? එස්.බී. දිසානායක ඇමතිතුමනි, ඔබතුමාට විශ්වවිද්‍යාල ගෙනැල්ලා රජයේ ඉඩම් දීලා විශ්වවිද්‍යාල හදන්න පුළුවන්ද? මේක ජාත්‍යන්තර කුමන්ත්‍රණයක් නොවෙයි. මේක ඔබතුමාගේ කැබිනට් එක ඇතුළේ තිබෙන කුමන්ත්‍රණයක්. මේකෙන් පෙනෙන්නේ ඇමතිවරුන්ට වැඩ කරන්න ඉඩ දෙන්නේ නැති එකයි. ඔබතුමා මහන්සියෙන් වැඩ කරලා, විශ්වවිද්‍යාලයේ ළමයි එක්ක සටන් කරලා පිට රට විශ්වවිද්‍යාල මෙහාට ගේන්න හදන කොට, ඒ සඳහා රජයේ ඉඩම් දෙන කොට, මෙන්න ඒ ඉඩම් නැවත ගන්න පුළුවන් කියන හැකියාව, වාතාවරණය හැදුවාට පස්සේ මේ රටට එන්නේ කොයි විශ්වවිද්‍යාලයද ඇමතිතුමනි? ඉතින් මහන්සියෙන් වැඩ කිරීමේ හැකියාව ඔය ඇමති මණ්ඩලයෙන්ම නැති වෙන කොට ව්‍යාපාර -[බාධා කිරීම්] නැහැ, නැහැ. අපි මේවා කථා කරන්නේ හෙට සිදු වන දේ අද දන්න නිසයි. මොකද, සමහර විට හෙට කථා කරන්න බැරි වේවි. ආණ්ඩුව අද මේ ගැන කථා කරලා, හෙට විවාද කරන්නේ නැති වන්න ඉඩ තිබෙනවා. [බාධා කිරීම්] අන්න ඒ නිසා තමයි අපි මේවා කියන්නේ. [බාධා කිරීම්] නැහැ, නැහැ කිව්වාට මට දැන් ඒ පැත්තත් බලන්න තිබෙනවා, මේ පැත්තත් බලන්න තිබෙනවා. [බාධා කිරීම්] මෙතැන වැඩ කරන එක ඇමතිවරයෙක් ඉන්නවා. අන්න බැසිල් රාජපක්ෂ ඇමතිතුමා. මේ ව්‍යාපාර ලෝකය රුපියල් බිලියන දෙකක් තුනක් සොයා ගෙන යන කොට ඒ ආයෝජන මේ රටට ගෙන්වා ගන්න ඇමතිතුමාට පුළුවන්ද? මොන පිස්සුද? කට ඇරියොත් ඉන්න ආයෝජකයෝත් මේ රටින් යාවි. එතුමා වෙනුවෙන් මම කථා කරන්න තිබෙනවා නේ. මොකද, එතුමාට ඔය සම්බන්ධයෙන් කථා කරන්න බැහැ නේ. කථා කළොත් හෙට වෙනත් ප්‍රශ්නයක් ඇති වෙයි.

දැන් බලන්න, ආයෝජන මණ්ඩලයේ සභාපති පත් කිරීම ජනාධිපති අතට අර ගෙන තිබෙනවා. මේක තිබෙන්නේ බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේයි. ඒක නැහැයි කියන්න. කමක් නැහැ, අයියා, මල්ලි අතර ප්‍රශ්නයක්. ඒකට කමක් නැහැ. කොහොම වුණත් දැන් ඒ පත් කරන එක ජනාධිපති අතට අර ගෙන තිබෙනවා නේ. [බාධා කිරීමක්] අයියෝ, කමක් නැහැ. ඔබතුමා දක්ෂයි. ඒක ඇද ගෙන යනවා. අපිත් සහයෝගය දෙනවා. බය වෙන්න එපා. වැඩි කල් නැහැ නේ.

දැන් බලන්න, මේ ගොල්ලන් -Controversial law figures in World Bank discussions- කියනවා, මේවා කරන්න එපා කියලා. දැන් අපි කිව්වාම එක්සත් ජාතික පක්ෂයෙන් කිව්ව නිසා කරන්නේ නැතිව ඉන්න එපා. අඩු ගණනේ ඔබතුමන්ලා සමඟ ඉන්න ඇමති මණ්ඩලයෙන් හෙමින් කතා කරලා අහන්න, ඒ ගොල්ලන් කියන්නේ මොනවාද කියලා. දැන් මම විශ්වවිද්‍යාල ගැන කිව්වා. විශ්වවිද්‍යාල හදන්න ඉඩම් දුන්නොත් ඒවා හදන්න කවුද එන්නේ? මොකද, මේක දුන්නේ එස්.බී. දිසානායක කියලා වෙනත් පනතක් ගෙනැල්ලා ඒක ගන්න පටන් ගත්තොත් වැඩේ කොට උඩ නේද? ඒ නිසා එක්සත් ජාතික පක්ෂයේ අපි මේ වාගේ දේවල් සම්බන්ධයෙන් තමයි මේ අවස්ථාවේ කියන්නේ.

ව්‍යාපාර ලෝකයට මේවා ප්‍රශ්න කරන්න ගියාම, පාට කරන්න ගියාම ලොකු ප්‍රශ්නයක් ඇති වනවා. ඒ නිසා අපි මේ අවස්ථාවේ නැවත මතක් කරන්නේ රටේ ආර්ථිකය සම්බන්ධයෙන් හැප්පෙන්න එපා, ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න ඇති කරන්න එපා කියලායි. දැන් බලන්න, බැසිල් රාජපක්ෂ ඇමතිතුමනි, you are utilizing an absolute retrospective effect law in trying to bring this underperforming enterprises. Let me read from this Bill [බාධා කිරීම්] නැහැ, හෙට කථා කරන්න තිබෙන එක මම අද කථා කරනවා. මම මුදල් අමාත්‍යාංශය ගැන කථා කරනවා. ඔබතුමා මට කියන්න ඕනෑයැ මුදල් අමාත්‍යාංශය ගැන කථා කරන්න? ඉඩම්, මුදල් ඔය මහ පාරේ කථා කරන්නේ. මහ පාරේ නොවෙයි, ඔයගොල්ලේ අතුරු පාරවල්වල හෙට යන්න හදන්නේ. අපි ඒක නැවත මහපාරට ගේන්න හදන්නේ.

ඔබතුමන්ලා මුදල් අමාත්‍යාංශයෙන් මේ Regulations ගෙනැල්ලා තිබෙන්නේ ඇයි? මේ ගෙනැල්ලා තිබෙන්නේ සල්ලි එකතු කරන්නයි. ඒ සල්ලි එකතු කරන්නේ අහිංසක ජනතාවගෙන් බදු අය කරලායි. ඒ බදු ගෙවන අයගේ සල්ලි තමයි එකතු කරන්නේ. ඒ අයගේ සල්ලිවලින් නේද අද අපේ ව්‍යවස්ථාව ආරක්ෂා කරලා තිබෙන්නේ? [බාධා කිරීමක්] ඒක තමයි. හෙට කථා කළත්, අද කථා කළත් අප කථා කරන්නේ ඒ ජනතාවගේ බදු සල්ලි සම්බන්ධයෙනුයි. මේක පළාත් සභාවට, නගර සභාවට කථා කරන්න තිබෙන දෙයක් නොවෙයි. පාර්ලිමේන්තුවේ ඉන්න අපට විතරයි ඒ වරප්‍රසාදය තිබෙන්නේ. මේක උසාවියටත් නැහැ. ඉතින් මේ එකතු කරන සල්ලි ටිකෙනුත් පිස්සු කෙළින්න නේද හෙට හදන්නේ? මේ පාඩු ලබපු පැලවත්ත සීනි සමාගම, සෙවනගල සීනි සමාගම අලාභයට දුවලා දුවලා ඒවායේ ලාභය ඇති කළාට පස්සේ ඇයි ගන්නේ? ඇයි මේකේ හිඟුරාන සීනි සමාගම දමලා නැත්තේ? [බාධා කිරීමක්] ඔබතුමා ඊච්චර සද්ද කරනවා. නිවාඩ් කබ්රාල් ඒක කොම්පැනියකට දීලා තිබෙන නිසා ඒක නොගත්තාට කමක් නැහැ. ඒ අය ඔබතුමන්ලාගේ හෙන්චයියලා නිසා ඒක කමක් නැහැ. ඇයි හිඟුරාන දැම්මේ නැත්තේ? මේක අවුරුදු 16ක් වහලා තිබෙනවා. [බාධා කිරීමක්] මොකක්ද මේ කියන්නේ? [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please!

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සීනි නොවෙයි, අන්තිමට ගල් යුගයකට ගෙන යන්න හදන ගමන තමයි ඔය ආරම්භ කර තිබෙන්නේ. ඉතින් ඒක ඉක්මන් කරන්න තමයි ඔය මහා මාර්ග ඇති කරලා තිබෙන්නේ. එතකොට ඉක්මනට ගමන් කරන්න පුළුවන් ඒ ගල් යුගයට. ඒ සම්බන්ධයෙන් අප අහන්නේ.

Hon. Deputy Chairman of Committees, look at this obnoxious paragraph in Clause 9 of the Bill which I quote:

> " 'Underperforming Enterprise' means a company or other authority, institution or body established by or under any written law for the time being in force, which the Government owns shares and where the Government has paid contingent liabilities of such enterprise and Government is engaged in protracted litigation with regard to such Enterprise which is prejudicial to the national economy of public interest."

ඒ කියන්නේ අවුරුදු 15ක්, 16ක් උසාවියේ තිබෙන දේවලුත් අද underperforming asset එකක් හැටියට ගේන්න. මේකෙන් ඉලක්ක කරලා තිබෙන්නේ වෙන මොකුත් නොවෙයි නේ. හිල්ටන් ආයතනය නේ. ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමනි, ඔබතුමා අද උදේත් සාධාරණීකරණය කරලා කිව්වා මේ පාඩු ලබන ආයතන ගැන. ඔබතුමන්ලාට මේ පාඩු ලබන ආයතන ලාභ ලබන ඒවා බවට පත් කරන්න ඕනෑ නම් ඉස්සර වෙලාම පෞද්ගලීකරණයට හරි, මේ පනත යටතට හරි ගේන්න අවශ්‍ය වන්නේ ඛනිජ තෙල් සංස්ථාව නේද? ඒ වාගේම ලංකා විදුලිබල මණ්ඩලය නොවේද? ඊට පස්සේ මිහින් ආයතනය නොවෙයිද? මම අහනවා, Cricket Board එක නොවෙයිද ඉස්සර වෙලා ගන්න තිබෙන්නේ? මේවා නේ අද මේ රටේ සම්පත උරා ගන්න තිබෙන ආයතන ටික. මේවා තමයි පාඩු ලබන්නේ. ඒවා ඔක්කොම අමතක කර තිබෙනවා. මොකද ඒවා රජයේ ග්‍රහණය යටතේ තිබෙන නිසා ඒ ගැන සද්ද කරන්නේ නැහැ.

අප මේ අවස්ථාවේදී අහන්නේ මෙන්න මේ කාරණයයි. ඔබතුමන්ලා මේ පනත් ගේනවා. ඇයි බොලේ අර රජ ගෙදර ඉන්න කේපී ගේ නැව් ටික ගත්තේ නැත්තේ? නැව් 18ක් තිබෙනවාය කිව්වා. කෝ ඒ ටික? එතකොට මිලියන 18,000ක් තිබෙනවා කියලා කිව්වා. කෝ ඒ සල්ලි ටික? කා ළඟටද ගිහින් තිබෙන්නේ? රත්තරන් ටික කෝ? අප අහනවා කරුණා අම්මාන්ගෙන්, කොහේද ඒ රත්තරන් ටික තිබෙන්නේ කියලා. එයා දන්නවා ඇති නේ කොහෙන්ද ගත්තේ කියලා. දැනට ඒවා කොහේද තිබෙන්නේ කියලා අප අහනවා. ඇයි පනත් ගෙනැල්ලා ඒවා ටික ගන්නේ නැත්තේ?

අහිංසක දුප්පත් ජනතාව පාවිච්චි කරන කිරි පැකට් එකට, මාළු ටින් එකට, කරවල ටිකට රුපියල් දෙක, රුපියල් තුන ගණනේ සල්ලි එකතු කරනවා. සිගරට් එක රුපියල් දහයෙන්, රුපියල් දෙකෙන් වැඩි කරනවා. ඒවා කරන එකේ ඇයි මේවා ටික ගන්නේ නැත්තේ? ඒ නැව් 18 දැන් කොහේද තිබෙන්නේ? ඒ සල්ලි ටික කොහේද තිබෙන්නේ? ඇයි ඒ සම්බන්ධයෙන් නිශ්ශබ්දව සිටින්නේ? අවුරුදු එකහමාරකට ඉස්සර වෙලා ලොකුවට සද්ද කළා නේද? අන්න ඒ නිසා තමයි අප එක්සත් ජාතික පක්ෂයක් වශයෙන් කියන්නේ මේ රටේ ආර්ථිකයට වෙන හානිය ගැන. අප මේ අවස්ථාවේදී සම්පූර්ණයෙන්ම ඔබතුමන්ලා වෙනුවෙන් කථා කරනවා. අප කථා කරනවා වැඩ කරන එක ඇමතිවරයෙක් වන බැසිල් රාජපක්ෂ ඇමතිතුමා වෙනුවෙන්. එතුමාට කථා කරන්න බැරි නිසා අප කථා කරනවා මේ අවස්ථාවේදී. එතුමා අමාරුවේ දමන්න නොවෙයි අප කථා කරන්නේ. නමුත් මේ කාරණය මතක තියා ගන්න. මම දන්නවා එතුමා මහන්සියෙන් වැඩ කරනවා කියලා ඒ ආයෝජනය සම්බන්ධයෙන්. මොකද අපත් ඒ සම්බන්ධයෙන් කථා කරනවා. විපක්ෂයේ හිටියාට මෙතැන පාට භේදයක් නොවෙයි තිබෙන්නේ.

අපට අවශ්‍ය වන්නේ මේ රටේ ආර්ථිකය ගොඩ නඟන්නයි. හැම අවුරුද්දකම රැකී රක්ෂා 1,48,000ක් ශුද්ධ වශයෙන් ඇති කරන්න අවශ්‍යයි. ඒකට සියයට අටක වර්ධන වේගයක් මදි ඇමතිතුමනි. ඒකට අඩු ගණනේ මේ රටේ ඉතිරි කිරීම් සියයට 45ක් අවශ්‍යයි. මේ රටේ සියයට 26ක් තියා ගෙන ඉන්න කොට, මේ රටේ වර්ධන වේගය මහ බැංකුවේ විතරක් වර්ධන වේගය සියයට 8ක් තියෙද්දී එළියේ සියයට 2ක් තියෙන කොට මේ බොරුව තව ඉදිරියටත් කරන්න බැහැ. අප දන්නවා මේ සම්බන්ධයෙන් කටයුතු කරන එකම අය රටේ ආයෝජකයෝ බව. ඊට වැඩිය රටේ ඉන්න ව්‍යාපාරිකයෝ. ගරු කුමාර වෙල්ගම වාගේ ඇමතිතුමන්ලා ව්‍යාපාරික ලෝකයේ බොහොම දක්ෂයෝ. කොහොමද බස් ටික දුවන්නේ, කොහොමද ලොරි ටික දුවන්නේ කියලා අප ඔබතුමන්ලාට කියන්න ඕනෑද? නැවත මේ පනත් තුළින් අත් පත් කරගෙන ඕවා කරන්න ඔබතුමන්ලාට දෙන්න ඕනෑද? ඔබතුමන්ලා දන්නවා. නමුත් කරුණා-

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒක දැනුයි දන්නේ. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මොනවා ගත්තත් එතුමාගේ අර ජෝන් එක්ක කරන විනෝදාංශය කවදාකවත් ගන්න ඉඩ දෙන්නේ නැහැයි කියන එක අපි මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. ඒකට අපි 100 per cent guarantee එකක් දෙනවා. යූඑන්පී එක ආවත් ඔබතුමාට ඒ සම්බන්ධයෙන් සියයට සියයක් duty-free facility එක දෙනවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
එතකොට අපි දෙදෙනාම-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්. මේ පැත්තේ ඉඳගෙන ඔබතුමා ඒ පැත්ත ආරක්ෂා කරයි. ඒ පැත්තේ ඉඳගෙන මේ පැත්ත ආරක්ෂා කරනවා. කමක් නැහැ. අන්න එහෙම සහෝදරත්වයෙන් වැඩ කරන්න අවශ්‍යයි. දැන් ගුටි කන කාලය අවසන් කරන්න අවශ්‍යයි. නිල් පාට, කොළ පාට භේදයක් නොවෙයි, අපට අවශ්‍ය වන්නේ. ජාතික ආර්ථිකයක් හදන්නයි අපට අවශ්‍ය වන්නේ. අන්න ඒ නිසායි අපට අද ඇඬෙන්නේ. අද මේ ව්‍යාපාරික ලෝකයට ආණ්ඩුවෙන් කුහක විධියට සලකන ආකාරය තමයි අපි මේ අවස්ථාවේදී හෙළිදරව් කරන්න අවශ්‍ය වන්නේ. හෙට එන එක ගැන අද අපි කථා කරන්නේ, අනිද්දා වන්නේ මොකක්ද කියන එක අපි දන්නා නිසායි. Schedule A එක අද තිබෙනවා. Schedule B එක හෙට ගෙනෙනවා. Schedule C එක අනිද්දා ගෙනෙනවාය කියලා කෙහෙළිය ඇමතිතුමාත් කියනවා. ඒ Schedule C එකේ තිබෙන ඒවා දන්නා නිසා තමයි අපි මේ කරුණු හෙළිදරව් කළේ.

දැන් බලන්න, ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමනි, ඔබතුමා රට පුරා ගිහිල්ලා රටේ අධ්‍යාපනය හදන්න බැලුවා. බැරි වෙලාවත් මේ අහිංසක පෞද්ගලික කොම්පැනියක් ඔබතුමාගේ අමාත්‍යාංශයට අයත් ඉඩමකින් අක්කර දෙකක් තුනක් අරගෙන, පාසලක් හදලා අවුරුදු දෙකකින් ඒක වහන්න පටන් ගත්තොත් ඒක අත්පත් කර ගැනීමේ හැකියාව නේද මේ තුළින් ඇති වන්නේ? එතකොට කවුද එතැනට සල්ලි ටිකක් දමන්නේ? මෙන්න මේවා ගැන තමයි මා කිව්වේ. මේක ජාත්‍යන්තර කුමන්ත්‍රණයක් නොවෙයි. මේක කැබිනට් එක ඇතුළේ තිබෙන පොඩි කුමන්ත්‍රණයක්. මෙතැන විශ්වවිද්‍යාල, ඔතැන අධ්‍යාපනය, අතැන ආයෝජකයෝ ටික -මේ ඔක්කෝම- නැති කළාම ඔන්න එතකොට මේක එක්සත් ජාතික පක්ෂයේ කුමන්ත්‍රණයක්ය කියලා සමහර අය කියන්න පටන් ගනීවි. ගරු ඇමතිතුමනි, කරුණාකර මේ විහිළු කිරීම නවත්වන්න.

[ගරු රවි කරුණානායක මහතා]

ඔබතුමන්ලාට විවෘත ආර්ථිකයෙන් සංවෘත ආර්ථිකයකට යන්න ඕනෑ නම් භය නැතිව කියන්න ඒකට යනවාය කියලා. ඔබතුමන්ලාට "පෞද්ගලිකරණය කරනවා" කියන වචනය පාවිච්චි කරන්න ලජ්ජා නම් මේ පනත් ගෙනෙන්නේ නැතිව කරුණාකර, ඒක කියන්න. එක්සත් ජාතික පක්ෂයේ අපි කියන්නම් ඒක රටට හොඳයි කියලා. ලෝක බැංකුව එළවා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එළවා ආයෙත් පාවඩ දාලා ගෙනාවේ කවුද? අපිද? ඔබතුමන්ලායි. දැන් මොනවාද කියන්නේ? දැන් සල්ලි දෙන්නේ නැහැයි කියනවා. ඇයි? ඔබතුමන්ලාගේ විනිමය අනුපාතය ගෙන යන ආකාරය හරි නැහැයිලු. මේ රටේ මහ බැංකුව කියන දේ ඒ ගොල්ලන්ට විශ්වාස නැහැයිලු. කොටස් වෙළෙඳ පොළ අද කඩා වැටෙනවා. මේක ලෝකයේ තිබෙන හොඳම කොටස් වෙළෙඳ පොළක් ලෙසට මාස හය හතකට ඉස්සෙල්ලා පම්පෝරි ගහපු ආණ්ඩුවට අද මොකද වෙලා තිබෙන්නේ? මලික් කාදර් ද කොහෙද කොටස් වෙළෙඳ පොළෙන් මුදල් අමාත්‍යාංශයට එළෙව්වා. කොටස් වෙළෙඳ පොළ කඩා වැටීම නැවැත්තුවාද? ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමනි, ඔබතුමා මහ බැංකුවේ අධිපතිගේ කළු සහ අළු පාට පොත කියවලා එතුමාගේ පොතෙන්ම එතුමාට පාඩමක් උගන්වා දෙන එක තමයි මම ඔබතුමාට -ඔය ටියුෂන් මහත්තයාට- මතක් කරන්නේ.

එදා ඔබතුමායි, මමයි එකතුවෙලා Select Committee එකක් පත් කළා, මේ මහ බැංකුවේ අධිපතිට කවදාකවත් ආර්ථිකය හදන්න බැහැයි කියලා. ඔබතුමාගේ අත්සන එහි තිබෙනවා. නමුත් ඔබතුමා ආණ්ඩු පක්ෂයට ගියා. අත්සන නැති වුණාට තවම අදහස තිබෙනවා නේද ගරු ඇමතිතුමනි. ඕක තමයි තිබෙන වෙනස. ඔබතුමා හිතා වුණාට මම ඒ ගැන දන්නවා. ඔබතුමාට කියන්න බැරි දේ තමයි අපි කියන්නේ. අපි භය නැහැ කියන්න. අපේ මේ පැත්තේ නොමමර වශයෙන් එච්චර හිටියේ නැති වුණාට ගුණාත්මක භාවය පැත්තෙන් රජ බඩු තමයි මේ පැත්තේ ඉන්නේ කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. ඒ නිසා කරුණාකර, මේ රටේ ආර්ථිකයත් එක්ක සෙල්ලම් කරන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔන්න බලන්න දැන් මොනවාද වෙලා තිබෙන්නේ කියලා. ඔබතුමන්ලා හෙට ගෙනෙන්න තිබෙන පනත් කෙටුම්පත තුළින් මා කාරණයක් මතක් කරන්න කැමැතියි. හිල්ටන් එක ගැන මම තව වුට්ටකින් කථා කරන්නම්. මේකේ දෙවැනි එක යටතේ "Properties situated at Badulla - Colombo Commercial Company" යනුවෙන් තිබෙනවා. මෙන්න ගරු හරීන් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාට මේ දැන් ලියුමක් ආවා. කොහෙන්ද මේ ලියුම ඇවිල්ලා තිබෙන්නේ? මුතියංගන රජ මහා විහාරයෙන්. රජ මහා විහාරයට දීලා තිබෙන ඉඩම් ඔබතුමන්ලා හෙට ඒ පනත් කෙටුම්පත තුළින් නැවත අත් පත් කර ගන්නවාලු. නැහැයි කියනවා නම් කරුණාකර, මේ කියන රජ මහා විහාරයේ නායක ස්වාමීන් වහන්සේට ඉදිරිපත් වෙලා "එහෙම ඉඩමක් ගන්නේ නැහැ" කියලා කියන්න. මේ ව්‍යාපාරික ලෝකයේ ඉන්න අයගෙන් ඉඩම් ගන්නවාද, නැත්නම් මුතියංගන රජ මහා විහාරයේ ඒ ස්වාමීන් වහන්සේගේ ඉඩම් ටික අත් පත් කර ගන්නවාද, නැද්ද කියන එක කියන්න. මේක තමයි මෙතැන ගැසට් කරලා තිබෙන්නේ. නැහැයි කියනවාද? මෙන්න කොළඹ කොමර්ෂල් කොම්පැනියේ ඒ ගහපු ගිවිසුම. මෙන්න ඊට පස්සේ 2005 ඔක්තෝබර් මාසයේ දුන්නු ඒ ඉඩම නැවත අත් පත් කර ගන්නය කියලා මෙන්න මේ Schedule එකේ තිබෙනවාය කියන එක මම මේ ඇමති මණ්ඩලයේ ඉන්න ඇමතිවරුන්ට කියනවා. ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත් කෙටුම්පත තුළින්ද මේ කටයුතු කරන්නේ? මේ පනත් කෙටුම්පත තුළින් ඉස්සෙල්ලාම ගන්න තිබෙන ආයතනය තමයි ඔය කැබිනට් මණ්ඩලය තිබෙන ආණ්ඩුව. මොකද, ආණ්ඩුව තමයි underperforming.

දැන් බලන්න, මේක මුතියංගන රජ මහා විහාරයේ ඉඩමක්. ඊට පස්සේ දෙවැනි එක තමයි හෙල්ත් ෆුඩ් ප්‍රොඩක්ට්ස් ප්‍රයිවෙට් ලිමිටඩ්. මේක ඉන්දියාවේ කොම්පැනියක්.

ඉන්දියාවේ කොම්පැනියක් මෙහේ ඇවිල්ලා වැඩ කටයුතු කරන කොට "වනස්පති මෙහේ නීතිගත කරන්න බැහැ" කියනවා. ඒ වාගේ කොම්පැනි හතර-පහක් අර ගෙන තිබෙනවා. ඒක හොඳයි. රජයට හොර කරලා ඉඩම් අර ගෙන තිබෙනවා නම් ඒවා ගන්න එකේ කිසි ප්‍රශ්නයක් නැහැ. අපට ඒ සම්බන්ධයෙන් කිසිම කැක්කුමක් නැහැ. මේවා BOI කොම්පැනි. මේ BOI කොම්පැනි arbitration සඳහා යොමුව තිබෙනවා. මේවා පිට රටවලට - සිංගප්පූරුවට හරි ලන්ඩන්වලට හරි- ගියා නම් අර හෙජින් සුදුව වගේ අනිවාර්යයෙන්ම ආණ්ඩුවට ප්‍රශ්නයක් ඇති වෙනවා නේද? මේවා ගැන සිතා බලා කථා කරන්නේ නැද්ද? International Chamber of Commerceවලට ගියා නම් මේවා අනිවාර්යයෙන්ම arbitration සඳහා යොමු වනවා. එතකොට අර Citibank එක, Deutsch Bank එක, Standard Chartered Bank එක, ඒ arbitration පාවිච්චි කරලා ගිහිල්ලා ඒකෙන් ලැබුණු දේ තමයි කෝටි 11,800ක් ඒ සුද්දන්ගේ බැංකුවට ගෙවන්න ආණ්ඩුවට සිදු වීම. මේක ගෙවන්නේ කැබිනට් මණ්ඩලය නම් අපි බොහොම සතුටුයි. නමුත් අද රට පුරා ජීවත් වන අහිංසක මිනිසුන් තමයි, කිරි පැකට්ටුවට රුපියල් දෙකතුන ගෙවන, සිගරැට්ටුව වෙනුවෙන් ශත පනහ, රුපියල ගෙවන අය තමයි -අන්න ඒ බදු ගෙවන්නන් තමයි- මේ කෝටි 11,800 ගෙවන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, තවත් විනාඩි දෙකකින් කථාව අවසන් කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, does that mean that I have utilized the 20 plus 18 minutes?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Yes.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Today, you are smiling. So, I can get you to show me a little generosity and I am sure I can get five minutes off your pocket today.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
I always smile.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I do not want to antagonize you because I will lose even the little time I have.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

I always have a smiling face.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Yes. So, keep going with your smiling face so that I can speak a little longer. Even from that Chair, you are reflecting -

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා (පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர - புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. Chandrasiri Gajadeera - Minister of Rehabilitation and Prison Reforms)

Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Chandrasiri Gajadeera, what is your point of Order?

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා වැරැදි පනතක් ගැන වාගෙයි කථා කරන්නේ. අද ඉදිරිපත් කරපු ඒවා ගැන නොවෙයි කථා කරන්නේ. [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

තමුන්නාන්සේ- [බාධා කිරීම්]

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

එතුමා අද රෑ රට යනවා. ඒකයි. [බාධා කිරීම්]

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

පටපිටලවාගෙන.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

එතුමා හෙට රට යනවා ලු.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

දෙදෙනා අතර හොඳ understanding එකක් තිබෙනවා වාගෙයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමන්ලාගේ නායකයෝ-

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

අද ඉදිරිපත් කරපු පනත් කෙටුම්පත් ගැන ඔබතුමාගේ හොඳ අදහස් බලාපොරොත්තුවෙනුයි අප ඉන්නේ. නමුත් දැන් වෙන එකක් ගැනයි ඔබතුමා කථා කරන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමාගේ නායකයන්ට බ්‍රිතාන්‍යයේ අගමැතිතුමා ආරාධනා කළේ නැති වුණාට අපට ආරාධනා කරලා තිබෙනවා කියා ඩිලාන් පෙරේරා ඇමතිතුමා කියන එක ගැන මට සතුටුයි. මට තිබෙන එකම ප්‍රශ්නය, මා මොනවාද කරන්නේ කියන එක ගැන එතුමා දන්නේ කොහොමද කියන එකයි.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

මම දන්නවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

යන එක විතරක් දැන ගත්තොත් ඇති. ඊට වඩා දැන ගන්න ඕනෑ නැහැ. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමා, මේ අවස්ථාවේදී මා කියනවා ඔය දැන ගැනිල්ල තිබුණා නම්, කැබිනට් මණ්ඩලයට ඕක කිව්වා නම් අද කොතරම් සතුටුදායක වේවිද කියා. එහෙම නම් අද මට මේ වාගේ කථා කරන්න අවශ්‍යතාවක් නැහැ. විපක්ෂය වශයෙන් අද ඔබතුමන්ලා වෙනුවෙන් කථා කරන්න අපට අවශ්‍යතාවක් නැහැ. අප කථා කරන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ ආණ්ඩුව ගැන නොවෙයි. අප කථා කරන්නේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව ගැන නොවෙයි. අප කථා කරන්නේ මේ රටේ තිබෙන සමස්ත ව්‍යාපාර ක්ෂේත්‍රය ආරක්ෂා කරන්නේ කොහොමද කියන එක ගැනයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ අවස්ථාවේදී තවත් කාරණයක් මතක් කරනවා. ඔන්න බලන්න, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමා 2011 නොවැම්බර් 3වන දින "ඩේලි මිරර්" පත්තරයට කියන්නේ මොකක්ද කියලා. අපි අගය කරනවා එතුමා පත්තරයට මේ වාගේ දෙයක් කියා තිබෙන එක ගැන. එතුමා මෙසේ කියනවා:

"Losses at 249 Govt. Ventures exceed Rs. 19 billion : COPE"

මේ සංඛ්‍යාව වැරැදියි. Rs. 19 billion නොවෙයි. මේක Rs. 79 billion. ඒ කියන්නේ කෝටි 7,900යි. මෙන්න මේ වාගේ ආයතන තමයි ඉස්සර වෙලාම පෞද්ගලීකරණයට යොමු කරන්න අවශ්‍ය වන්නේ. මම කිව්වා, "මම හිල්ටන් ආයතනය සම්බන්ධයෙන් කථා කරනවා" කියලා. 2002 මාර්තු මාසයේ හිල්ටන් හෝටලය සම්බන්ධයෙන් නිහාල් අමරසේකර - He is one of the most articulate persons on public litigation. He,on behalf of the people of Sri Lanka, went to court and wanted a wind-up order given on the Hilton saga. But, the seven-judge bench ordered that there should be no involvement because the Constitution protects certain rights that are -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, your time is over.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Please give me just two more minutes.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Then, one of your Members will lose two minutes.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Just give me only two minutes, Sir. So, the order that was given stymied him, prevented him from proceeding further. But, once an order was given by a three-judge bench saying that this can be taken over, that it can be expropriated back again, then what happened was, he went to court today - Application No. 52/2011/CO - hoping that the High Court utilizes its jurisdiction and gives approval for him to go forward to protect this. Now, the reason why Hilton is being taken back is owing to the fact that there is mismanagement. The Government has had control over its management for 17 years, from 2nd October, 1994. Now if there is mismanagement, then it is the Government that has been in power that has been mismanaging.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

You must be generous towards me also.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Mr. Presiding Member, I am also keeping a tab on the time. I am just on the verge of 36 minutes.You gave me 38 minutes and therefore I am just two minutes away from your mark.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, I am monitoring the time.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I know you are using a different tool to control me.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

No, not at all.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Anyway, I will ensure that I sit down in two minutes. Now, out of Rs.10 billion repayments, 56 per cent was paid by the HDL Company. There are foreign shareholders - there is a Swiss national; there is a Singaporean. You have an investment guarantee, you have a BOI guarantee and furthermore you have an arbitration. So, imagine if they invoke the arbitration clause, automatically Hilton will be subject to international scrutiny. Then how is the Government going to protect itself? While we are talking very positively, you want to take over Sevanagala, you want to take over Pelwatta, you want to take over Hilton. We oppose the entire Bill in principle and we want to ensure that the economy of the country keeps going without any problem. So, all what we want is a healthy economy where unemployment is reduced virtually to zero level and we want investments pouring into the country because when the Government messes up the economy, it is we in the Opposition, who have got to take on the economy. So, we want to work together. Finally, please ensure that you have a safer, sounder and more proactive economy that is left for tomorrow rather than screw it up today.

I thank you, Sir.

[අ. භා. 4.57]

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Petroleum Industries)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ප්‍රථමයෙන්ම සඳහන් කරන්න ඕනෑ, අපේ ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා අද බොහොම වේගවත් කථාවක් කළ බව. ඇත්ත වශයෙන්ම අද මේ වෙලාවේ විවාදයට ගෙන තිබුණේ Registration of Documents (Amendment) Bill එක සහ Notaries (Amendment) Bill එකයි. එකම අවස්ථාවක මේ සංශෝධන පනත්,-[බාධා කිරීමක්] ඔව්. ඒ නියෝගත් තිබෙනවා. මේ පනත් කෙටුම්පත් දෙක සහ තවත් නියෝග කීපයක් අද දින විවාදයට ගෙන තිබෙනවා. කෙසේ වෙතත්, විපක්ෂ නායකතුමා ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාට වැඩ බලන විපක්ෂ නායක ධුරය පවරා ගිහින් තිබෙනවා වාගේ ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාට හෙට කරන්න තිබෙන කථාව වෙන කාට හෝ පවරයිද දන්නේ නැහැ. එතුමා හෙට විවාදයට නියමිත කථාව අද කළා. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා හෙට රට යනවාද? [බාධා කිරීමක්] මට ඒ ගැන සැකයක් තිබෙනවා. ඔබතුමා එක්සත් ජාතික පක්ෂයේ සංවිධායක ධුරය කාටද පවරන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ, මීට ඉහත දී රජයෙන් පවරා දුන් යම් යම් ව්‍යාපාර, ඌන සංවර්ධිත හෝ අසාර්ථක නම් ඒවා නැවත පවරා ගෙන සංවර්ධනය කරනවා විනා, පෞද්ගලික ව්‍යාපාරිකයකුගේ කිසිම දේපොළක්, ව්‍යාපාරයක් පවරා ගැනීමක් මේ පනත් කෙටුම්පතේ සඳහන් වන්නේ නැහැ කියලා. ඒ වාගේම මෙහිදී සඳහන් කරන්න ඕනෑ, රජය එවැනි අසාර්ථක ව්‍යාපාර පවරා ගන්නවා මිසක්, අසාර්ථක දේශපාලන ව්‍යාපාරවලට අත තබන්න යන්නේත් නැහැ කියලා.

දැන් බලන්න. එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායකවරු දෙදෙනෙක් ඉන්නවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කරු

ජයසූරිය මැතිතුමායි, සජිත් ප්‍රේමදාස මැතිතුමායි. හැබැයි ඒ දෙදෙනාටම වැඩ බලන විපක්ෂ නායක ධුරය දුන්නේ නැහැ. ඒ දෙදෙනාටම දෙන්නේ නැතිව විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ජෝන් අමරතුංග මැතිතුමාට තමයි වැඩ බලන විපක්ෂ නායක ධුරය දුන්නේ. සමහර විට රවි කරුණානායක මැතිතුමාගේ අද දින කථාව අනුව, ඊ ළඟ වටයේදී එතුමාට වැඩ බලන විපක්ෂ නායක ධුරය ලැබෙන්නත් පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපට ඕනෑ නැහැ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
එහෙම ලැබෙන්නත් පුළුවන්. ඉතින්, අපි ඒ ගැන කථා කරන්නේ නැහැ.

මා මෙහිදී සඳහන් කරන්න ඕනෑ, එදා එක්සත් ජාතික පක්ෂ පාලන කාලය යටතේ වී අළෙවි මණ්ඩලයට අයත් වෙලා තිබුණු වී ගබඩා විශාල ප්‍රමාණයක් මිලදී අරගෙන, ඒ ගබඩා සියල්ල ඇඟලුම් කර්මාන්තශාලා ආරම්භ කරන්න පෞද්ගලික අංශයට දුන්නු බව. මේ වන කොට ඒවා කීයක් කර්මාන්තශාලා හැටියට පාවිච්චි කරනවාද? කීයක් පාවිච්චි වෙනවාද? ඒ සියල්ල අද දිරාපත් වෙලා; අසාර්ථක වෙලා.

ඊ ළඟට සිංහල ව්‍යාපාරිකයන් ගැන රවි කරුණානායක මැතිතුමා කථා කළා. එදා 1960 දශකයේ, 1970 දශකයේ දේශීය කර්මාන්තශාලා ආරම්භ කළා. දේශීය ව්‍යාපාරයක් වශයෙන් ආරම්භ කරපු දාස සමූහ ව්‍යාපාරයට මොකද කළේ එක්සත් ජාතික පක්ෂ පාලන කාලය යටතේ? පුළුවන් තරම් අඩන්තේට්ටම් කළා. ඒ දේශීය කර්මාන්ත ව්‍යාපාරිකයන් සිංහල ව්‍යාපාරිකයින් නොවෙයිද? ඔවුන් සම්පූර්ණයෙන් වට්ටලා දැම්මා.

දැන් කථා කරනවා විහාරවල, දේවාලවල ඉඩම් ගැන. ගැටඹේ විහාරස්ථානයට කටු කම්බි ගැහුවේ කවුද? එදා එක්සත් ජාතික පක්ෂ පාලනය යටතේයි ඒක කළේ. එතකොට සතොස රැටත් විවෘත කරලා තිබුණා. මොකද වුණේ? දැන් අර ගංගාරාමය ආසන්නයේ කොමර්ෂල් කොම්පැනිය තිබුණු තැන සතොස ශාඛාව රැට විවෘත කරලා තැබුවා. රැට ඒවායේ මැස්සෙක්වත් හිටියේ නැහැ. ඒවා අසාර්ථක වුණා.

අද මේ සියලු දෙයක් ගැනම මේ අය කථා කරනවා. අනාගත එක්සත් ජාතික පක්ෂ පාලනයක් ගැන කථා කරනවා. නමුත් වැඩ බලන විපක්ෂ නායක ධුරය නියෝජ්‍ය නායකවරුන්ට නැහැ. [බාධා කිරීමක්] තමුන්නාන්සේට හොඳයි. තමුන්නාන්සේට හොඳයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඉතින් මොකක්ද අමාරුව?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
අපට අමාරුවක් නැහැ. අපට කිසිම අමාරුවක් නැහැ. ඉස්සෙල්ලා තමන්ගේ කඳවුර හරියට හදා ගන්න. ඒක හදා ගෙන අනික් ඒවා ගැන කථා කරන්න. එතැනයි මේ ප්‍රශ්නය වෙලා තිබෙන්නේ.

අනික් එක, දැන් මේ හැම දෙයක් ගැනම තමුන්නාන්සේලාට කථා කළ හැකියි 2009 මැයි මාසයේ 19 වන දා වන කොට එල්ටීටීඊ ත්‍රස්තවාදය මෙරටින් අවසන් කරපු නිසා. ව්‍යාපාරිකයන්ට ව්‍යාපාර කරන්න, ආයෝජනය කරන්න, සංචාරකයන්ට මෙරටට එන්න, මෙහේ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ආයෝජනය කරන්න, මුදල් යොදවන්න, කොටස් වෙළෙඳ පොළ ඉහළට එන්න අවස්ථාව ඊට පෙර මේ රටේ තිබුණේ නැහැ. අපි මේ සියල්ලම කළා. එදා මොකක්ද කිව්වේ? මා ඒවා නැවත කියන් යන්නේ නැහැ. අලිමංකඩ යනවා කියලා පාමංකඩ යනවාය කිව්වා. එහෙම නේ එදා කිව්වේ? තොප්පිගල කියන්නේ මහා වනයක් කිව්වා. අද තත්ත්වය මොකක්ද? අද ඒවා සරු කෙත් වතු බවට පත් වෙලා තිබෙනවා.

අද උතුරු ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු සඳහා රජය අතහිත දීලා තිබෙනවා. ඒ ගොවීන් වගා කරලා ඒ අස්වැන්න වෙළෙඳ පොළට එන නිසා අද එළවලු මිල අඩු වෙලා තිබෙනවා. භාණ්ඩ මිල අඩු කිරීම සඳහා විශාල වැඩ පිළිවෙළක් දිවි නැඟුම වැඩසටහන යටතේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා අද ක්‍රියාත්මක කරලා තිබෙනවා. පොල් මිල ඉහළ ගියා. පොල් බෑ දෙක අරගෙන කථා කළා. පොල් ගෙඩිය රුපියල් 50යි කිව්වා. නමුත් අද මොකද කියන්නේ? එදා බිත්තර ගැන කථා කළා. තමුන්නාන්සේලා කාලීනව මතු වන ප්‍රශ්නයක් අරගෙන ඒ ප්‍රශ්නය මත දේශපාලනයේ ජීවත් වනවා. හැබැයි ස්ථිර සාර වූ වැඩ පිළිවෙළක් නැහැ. අපි එහෙම නොවෙයි. අතිගරු ජනාධිපතිතුමාගේ රජය යම් කිසි දර්ශනයක්, වැඩ පිළිවෙළක් ඇතුවයි ඒ කටයුතු කරන්නේ.

ව්‍යාපාරිකයන්ට අවශ්‍ය වන්නා වූ යටිතල පහසුකම් සියල්ල අද ක්‍රියාත්මක කරගෙන යනවා. අධිවේගී මාර්ග ක්‍රියාත්මක වනවා. මෙතුමා සඳහන් කළා, අධිවේගී මාර්ග ඒ කාලයේ ආරම්භ කළා කියලා. කෝ, ඉවර කරන්න පුළුවන් වුණාද? පාලම් තුනක් කඩා ගෙන වැටුණා. එදා ගාල්ල ප්‍රදේශයේ හදපු පාලම් තුනක් කඩා ගෙන වැටුණා. ඒවා පරීක්ෂා කරලා නැවත අපට හදන්න වුණා. ඒ යටිතල පහසුකම් අද ඇති කරලා තිබෙනවා. මාර්ග පද්ධතිය සංවර්ධනය කරලා තිබෙනවා. පාලම් හදලා තිබෙනවා. අද ග්‍රාමීය මාර්ග carpet වනවා. ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් වෙලා තිබෙනවා.

මට මතකයි, 2008 වර්ෂයේ යුද්ධය අවසාන අදියරට යන අවස්ථාව වන කොට ලෝක ආර්ථික අවපාතයත් එක්ක තේ මිල පහත වැටිලා තේ කිලෝවක් රුපියල් 22ට, රුපියල් 23ට ගියාම එක්සත් ජතික පක්ෂයේ දේශපාලනඥයන් ගාල්ල ප්‍රදේශයේ, ඇල්පිටිය පැත්තේ ගිහිල්ලා තේ දළු පාරේ හලපු හැටි. අද මොකක්ද කියන්නේ? අද තේ කිලෝවක් රුපියල් 55යි. රබර් ගැන මොකක්ද කියන්නේ? අද රබර් කිලෝවක් රුපියල් 480යි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
දැන් factories කීයක් වැහිලා තිබෙනවාද?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
කොහේවත් වැහිලා නැහැ. අද ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් වෙලා තිබෙනවා. මොනවාද මේ ව්‍යාපාර ගැන කථා කරන්නේ? ව්‍යාපාර කරන්න අවස්ථාව හදලා දීලා තිබෙනවා. යටිතල පහසුකම් නැංවූයේ ඒකටයි. ඒ නිසා දීර්ඝ කාලීන සැලසුමක් ඇතුවයි, වැඩ පිළිවෙළක් ඇතුවයි රජය කටයුතු කරලා තිබෙන්නේ.

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

තෙල් සංස්ථාව ගැන කථා කළා. තෙල් සංස්ථාව තුනට කැඩුවා. තුනට කඩන වෙලාව වන විට -2001 අවුරුද්දේ- තෙල් සංස්ථාවේ ලාභය දස ලක්ෂ හත්දාහක්. දස ලක්ෂ හත්දාහක් ලාභ ලබපු තෙල් සංස්ථාව තමයි අසාර්ථකයි කියලා තුනකට කඩලා තුනෙන් එකක් ඉන්දියානු තෙල් සමාගමට විකුණලා ඉතුරු තුනෙන් එක විකුණන්න දැම්මේ. අපේ ආණ්ඩුව යටතේ තමයි ඒ දෙකත්-

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
දැන් මොකද වෙලා තිබෙන්නේ?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
තෙල් සංස්ථාව අලාභ ලබන්නේ ඇයි? සහනාධාරයට තෙල් දෙන හින්දා. රුපියල් 84ට ඩීසල් මිල තිබ්බත් ලීටරයකට රුපියල් 18ක් පාඩුයි. ගහන හැම ඩීසල් ලීටරයකින්ම රජයට රුපියල් 18ක් පාඩුයි. හැම භූමිතෙල් ලීටරයකින්ම රුපියල් 31ක් පාඩුයි. හැම දැව්තෙල් ලීටරයකින්ම රුපියල් 40ක් පාඩුයි. මේ සහනාධාර ජනතාවට ගිහිල්ලායි තිබෙන්නේ. විදුලිබල මණ්ඩලය නියම විධියට ගණනය කළොත් ඒකක පිරිවැය මීට වඩා වැඩි වෙන්න ඕනෑ. ඒ සහනයත් ජනතාවට දීලායි තිබෙන්නේ. ඒ නිසා විදුලිබල මණ්ඩලයේ හෝ තෙල් සංස්ථාවේ පාඩුව හෙජින් ගිවිසුම නිසා ඇති වූවක් නොවෙයි. හෙජින් ගිවිසුම නිසා සත පහක්වත් ගෙවා නැහැ. ඒ සම්බන්ධ නඩු දෙකක් අපි ජයග්‍රහණය කරලා තිබෙනවා. ඉතුරු දෙක අභියාචනාධිකරණයට ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා වෙනත් ප්‍රශ්න මේකට ඈඳා ගන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රධාන වශයෙන්ම අද මේ විවාදය පැවැත්වෙන්නේ, නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත සහ ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධව සාකච්ඡා කරන්නයි. ඒ සඳහා අපේ සම්පූර්ණ සහයෝගය පළ කරන බව සඳහන් කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක් වෙන් කරලා තිබෙනවා.

[අ. භා. 5.06]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේදී එක අතකින් නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කථා කළා. තව අතකින් මුදල් රෙගුලාසි ගැන කථා කළා. ඒ වාගේම අනෙක් අතට මාර්ග නීති හා සම්බන්ධ රෙගුලාසි ගැන කථා කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව කථා කරන කොට මා මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. ඊයේ කනිෂ්ඨ නීතිඥ මහත්මියක් නීතිමය කාරණයක් ගැන මගෙන් යම් ප්‍රශ්නයක් ඇහුවා. Millennium City නිවාස යෝජනා ක්‍රමයේ තිබෙන නිවසක් පිළිබඳව හිමිකම් වාර්තාවක් - title report එකක්- ලබා දෙන කොට ඒ පිළිබඳව කරන්න පුළුවන් රෙකමදාරුවෙහි දැන් ප්‍රශ්නයක් තිබෙනවා නේද කියලා එතුමිය මගෙන් ඇහුවා. මම ඇහුවා, "මොකක්ද ප්‍රශ්නය?" කියා. මේ අලුත් පනත් කෙටුම්පත හරහා ආණ්ඩුව අරගෙන යන ප්‍රතිපත්තිය හරහා -මේ පනත් කෙටුම්පතේ නැහැ, Millennium City එක අත් පත් කර ගන්නවාය කියා.- රජයෙන් ලබා ගත්ත ඉඩම් මත ව්‍යාපාර කරන, රජයෙන් ලබා ගත්ත ඉඩම්වල වගා කරන, රජයෙන් ලබා ගත්ත ඉඩම්වල නිවාස හදලා තිබෙන සියලු දෙනාම අනතුරුදායක තත්ත්වයකට පත් වෙලා තිබෙනවා නේද කියා මගෙන් ඇහුවා. මා බොහොම විමසිල්ලෙන් ඇගෙන් ඇහුවා, "ඇයි මේ විධියේ ප්‍රශ්නයක් අහන්නේ?" කියලා. තවම මේ පනත් කෙටුම්පත සම්මත වෙලාත් නැහැ.

ආණ්ඩුවට මේ විධියට රජයේ ඉඩම්, රජයෙන් ලබා ගත් ඉඩම් කියා රජයට කැමැති වෙලාවක රජයට ආශා හිතෙන වෙලාවක රජය තීරණය කරන වෙලාවක අත් පත් කර ගන්න පුළුවන් නම් Millennium City එකේ තිබෙන නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබා ගත්ත වසා දමා තිබෙන නිවාස සහිත ඉඩම් ඌන උපයෝජිත කියන පදනම මත අත් පත් කර ගන්න පුළුවන් නේද කියා ඇය මගෙන් ඇහුවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. ALHAJ A.H.M. AZWER left the Chair, and MR. DEPUTY SPEAKER took the Chair.*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "කලින් රජයෙන් ලබා ගත්ත අයිතියට නැත්නම් Crown titles වලට දෙන්න පුළුවන් රෙකමදාරුව නීතිඥවරයකුට කරන්න බැරිකමක් තිබෙනවා නේද?" කියා ඇය මගෙන් ඇහුවා. මේ ප්‍රශ්න කිරීම හරහා සමාජගත වෙලා තිබෙන කාරණය මේකයි. ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත් කෙටුම්පත හරහා රජය මේ රටේ සිවිල් සමාජයට දීලා තිබෙන පණිවුඩය තමයි රජයට ආශා නම් ඕනෑ දෙයක් ඕනෑ වෙලාවක අත් පත් කර ගන්නවාය කියන එක. "මේ ආණ්ඩුව අපේ. මේ ආණ්ඩුව මගේ. මේ ආණ්ඩුව රාජපක්ෂලාගේ. මේ ආණ්ඩුව රාජපක්ෂලාගේ යහළුවන්ගේ. මේ ආණ්ඩුවට කැමැති දෙයක් කැමැති වෙලාවට කරනවා." කියලා අර මුගාබේගේ ජාතියේ ප්‍රතිපත්ති තමයි මේ ආණ්ඩුවට තිබෙන්නේ කියා මේ රටේ සිවිල් සමාජයටත් ජාත්‍යන්තර සමාජයටත් අද පණිවුඩයක් ගිහින් තිබෙනවා. මේ පණිවුඩය ඉතාම නරක පණිවුඩයක්. ඊයේ වන විට මේ රට තුළ ආයෝජනය කරන විදේශීය ආයෝජකයෝ තමන්ගේ නීති උපදේශකයන්ගෙන්, තමන්ගේ ආර්ථික උපදේශකයන්ගෙන් විමසමින් ඉන්නවා මේ කාරණය ගැන. මේ රට කලින් කියපු පණිවුඩය එනම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වන ව්‍යවස්ථාව අනුව විදේශීය ආයෝජනයන් සුරක්ෂිත කර තිබෙනවා කියන ආයෝජන මණ්ඩලයේ වෙබ් අඩවියේ ඉහළින්ම දමා තිබෙන පණිවුඩයට පරස්පරව නීති හදන විට, හිතුවක්කාර ලෙස නීති හදන්න යන විට අද විදේශීය ආයෝජකයෝ කල්පනා කරනවා, මෙවැනි අනතුරුදායක ආයෝජන පරිසරයක් තිබෙන රටක අපි මොකටද ආයෝජනය කරන්නේ කියා; මීට වඩා පහසු, මීට වඩා විශ්වාසදායක ආයෝජන පරිසරයක් තිබෙන රටවලට අපේ ආයෝජන අරගෙන යා යුතුයි කියා. මේ අනතුර ආණ්ඩුව දකින්නේ නැහැ.

දැන් පහසුවට කියන කථාවක් තමයි, "පාඩු ලබන ව්‍යාපාර" කියන එක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෙවණගල සීනි කර්මාන්තශාලාව පාඩු ලබන ව්‍යාපාරයක් නොවෙයි. සෙවණගල සීනි කර්මාන්තශාලාව රජය සහ විදේශීය සමාගමක් ඒකාබද්ධව ආරම්භ කරලා ඒ විදේශීය සමාගමට කර ගෙන යන්න බැරුව අත් හැර දමා තිබියදී වෙළෙඳ පොළේ තරගකාරී මිලට දයා ගමගේ මහත්මයාත් ඒ ආයෝජකයෝත් මිලදී අරගෙන වසර කිහිපයක් තුළ එකදිගට ලාභ ලබන ආදර්ශවත් සමාගමක් බවට පත් කර තිබෙනවා. පැල්වත්ත සීනි සමාගම ඒ මුල් විදේශීය ආයෝජකයෝ අත් හැර දමා ආණ්ඩුවේ පාලනයෙන් අත්මිදුණාට පසු දේශීය ආයෝජකයෝ මිලදී අරගෙන කොටස් වෙළෙඳ පොළේ ලැයිස්තුගත කර තිබෙන වැදගත් පිළිගත් ලාභ ලබන සමාගමක් බවට පත් වෙලා තිබෙනවා.

මේ පනත හරහා වෙන්නේ පාඩු ලබන,කළමනාකරණය නුසුදුසු, ඌන උපයෝජිත සමාගම් පවරා ගැනීම නොවෙයි, රටේ තිබෙන වටිනා කියන සම්පත්, ව්‍යාපාර ආණ්ඩුවේ ඉන්න සුළු පිරිසකගේ, හෙංචයියන්ගේ පාලනයට යටත් වීමයි. මේ පනත යටතේ අත් පත් කර ගන්නා දේපළ නිසි බලධාරියෙක් මඟින් පාලනය කරන්නත්, ඒ හරහා අලුත් කළමනාකරණයක් ඇති කරන්නත් රජයට සම්පූර්ණ බලය ලැබෙනවා. තව අතකින් ආයෝජන වෙනුවෙන් දුක් මහන්සි වෙච්ච ව්‍යාපාරිකයන්ට පාඩු වෙනවා වාගේම, වඩා හොඳ ව්‍යාපාරික පරිසරයක් තුළ, වඩා හොඳ පහසුකම් ලබන සේවකයෝ දහස් ගණනකට, ගොවීන් දස දහස් ගණනකට අනාගතයේ පාඩු විඳින්න සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂි කර්මාන්තය පිළිබඳව අණ්ඩුව මැදිහත් වෙලා තිබෙන එකම ව්‍යාපාරයක්වත් ලාභ ලබන්නේ නැහැ. ආණ්ඩුවට සමහර ව්‍යාපාර සමහර ක්ෂේත්‍රවල පාලනයක් තිබෙන්න ඕනෑය කියන කාරණය අපි පිළිගන්නවා. ඒත් ආණ්ඩුව අත් පත් කර ගත්තු, ආණ්ඩුව ජනසතු කරපු කිසිම ව්‍යාපාරයක් ලාභ ලබන තත්ත්වයට පත් වෙලා නැහැ. අවසානයේදී ඒකේ පාඩුව ජනතාවට දරන්න සිද්ධ වන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මේ පිළිබඳව හොඳම උදාහරණය තමයි ඩිව් ගුණසේකර මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුක්ත COPE කමිටුව කියන දේ. "රජය විසින් කරන ව්‍යාපාර 259ක් පාඩු ලබනවා. 2007 ඉඳලා 2009 කියන අවුරුදු 2කට විතරක් පාඩුව රුපියල් බිලියන 19ක්" කියලා එම කමිටුව කියනවා. ආණ්ඩුවට ව්‍යාපාර කරන්න බැහැයි කියන කාරණය ඒකෙන් හොඳටම තේරෙනවා. ප්‍රවාහනය වැනි ක්ෂේත්‍ර ගැන යම් ආකාරයක පාලනයක් ආණ්ඩුවට තිබෙන්න ඕනෑ කියලා අපි විශ්වාස කළත්, විදුලිය පිළිබඳව යම් පාලනයක් ආණ්ඩුවට තිබෙන්න ඕනෑය කියලා අපි විශ්වාස කළත්, සීනි නිෂ්පාදනය ගැන, ඇල්කොහොල් නිෂ්පාදනය ගැන පාලනය ආණ්ඩුවට අතට ගන්න තිබෙන වුවමනාව මොකක්ද කියන කාරණය ගැන අපි ගැඹුරු ලෙස හිතන්න අවශ්‍යයි. මේවා බොහොම ලාභ ලබන ව්‍යාපාර. මේවා හරියට කළමනාකරණය කළොත් ඒ කළමනාකරණයේ දක්ෂතාව මත උපයන්න පුළුවන්. රජයට ඒ දක්ෂතාව නැහැ. මේ ව්‍යාපාර ගැන ආස හිතිලා, මේවා ගැන ලෝභ හිතිලා, මේවායේ තිබෙන ප්‍රයෝජනය බලයේ ඉන්න අපට ගන්න බැරි නම් කාටද ගන්න පුළුවන් කියන පටු, දූෂ්ට, කුහක පරමාර්ථය මතයි මේ ව්‍යාපාර අත් පත් කර ගන්න කටයුතු කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ප්‍රඥප්තියේ 17.1 අනුව සෑම කෙනෙකුටම තනිව හෝ හවුලේ දේපළ අත් පත් කර ගැනීමේ අයිතිය තහවුරු කරලා තිබෙනවා. 17.2 අනුව කිසිවකුගේ දේපළ හිතුවක්කාර විධියට අහිමි නොකළ යුතුයි කියලා කියනවා. දැන් ආණ්ඩුව ඌන උපයෝජිත සමාගමක් කියලා කියන කොට දයා ගමගේට අවස්ථාවක් දුන්නාද,"මගේ ව්‍යාපාරය හරියාකාරව කෙරෙනවා"ය කියලා පෙන්වන්න? BOI සමාගමක් හැටියට ආයෝජන මණ්ඩලය සමඟ ඇති කර ගෙන තිබෙන ගිවිසුම එක අකුරක්වත්, වචනයක්වත් කඩ කරලා නැහැයි කියලා පෙන්නුම් කරන්න දයා ගමගේට අවස්ථාව දුන්නාද? නැහැ. ආරියසීල වික්‍රමනායකට හෝ හැරී ජයවර්ධනට හෝ අවස්ථාවක් දුන්නාද පැල්වත්ත සීනි සමාගම ලාභ ලබනවා, කාර්යක්ෂමව වැඩ කරනවා, උපරිම ඵලදාව ලබනවා, අපි ඒ ගිවිසුම්වලට අනුකූලව කටයුතු කරලා තිබෙනවාය කියලා පෙන්නුම් කරන්න? නැහැ. ලංකා ට්‍රැක්ටර්ස් සමාගමේ රවි වෙත්තසිංහට අවස්ථාව දුන්නාද තමන්ගේ ව්‍යාපාර හරියට කෙරෙනවා, ඒ දේපළ හරියාකාරව පාලනය කරනවා කියලා පෙන්නුම් කරන්න? නැහැ. ඒ වෙනුවට ආණ්ඩුව ලැයිස්තුවක් හදලා තීරණය කරනවා මේවා තමයි ඌන උපයෝජිත සමාගම් කියලා. මේවා හරිද? මේක සාධාරණද? මේක යුක්තිගරුකද? ස්වභාව යුක්ති මූල ධර්මවලට අනුකූලද? නැහැ. ආණ්ඩුව තීරණය කළා. විධායකය තීරණය කළා. මේ ක්‍රමය තුළ හදිසි පනත් කෙටුම්පතක් විධියට මේක අරගෙන එනවා. දැන් සති දෙකකට කලින් සඳුදා හවස්වරුවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ කිසිවෙක් නැති වෙලාවේ රහසිගතව ජොෂ්ඨ අධි නීතිඥ ජනක ද සිල්වා මහත්මයා තනිවම ගිහිල්ලා තහවුරු කරනවා මේ ගැන. ශ්‍රේෂ්ඨාධිකරණයට අනෙක් පැත්තට කරුණු කියන්න, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අනෙක් පැත්තට කරුණු අහන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වන ව්‍යවස්ථාව අදාළ වන කාරණය ගැන කියන්න, විදේශීය ආයෝජකයන්ගේ ආයෝජන අහිමි වීම ගැන කියන්න අවස්ථාවක් තිබුණාද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වන ව්‍යවස්ථාව අනුව විදේශීය ආයෝජන තිබෙනවා නම් විශේෂ රැකවරණයක් ලැබෙනවා.

හිල්ටන් සමාගමේ ජපන් ආයෝජකයෝ සිටිනවා. ඒ වාගේම සෙවනගල සමාගමේ බ්‍රිතාන්‍ය ආයෝජකයෝ සිටිනවා. මේ ආයෝජකයන්ගේ ආයෝජන ආරක්ෂාව ගැන කරුණු ඉදිරිපත් කරන්න, ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවේ 157 වන ව්‍යවස්ථාවෙන් ලැබෙන රැකවරණය කියන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. ඇයි මේ හොර රහස්? මොකක් ද මේ හදිසිය? [බාධා කිරීමක්]

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මේ කිව්ව ආයතනවල සීනි හදනවා ද ?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔව්.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
දන්නේ නැති හින්දායි අහන්නේ?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු ඇමතිතුමනි, දන්න හින්දා මම කියන්නේ. සීනි කර්මාන්තය-[බාධා කිරීම්]

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
අපේ ගමේ - මේ මතුගම කෝරළයේ - මිනිස්සු කියනවා, ඒවායේ හදන්නේ මේ spirit එකලු. [බාධා කිරීමක්] ඒගොල්ලන් කියනවා, මේ ආයතනයේ සීනි හදන්නේ නැහැ, spirit එක හදන්නේ කියා. [බාධා කිරීම්] එහෙමයි කියන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම ගරු ඇමතිතුමාට උත්තරයක් දෙන්නම් කෝ. සීනි කර්මාන්තය තුළ එක අතකින් සීනි නිෂ්පාදනය වනවා වාගේම molasses නිෂ්පාදනයත් ඒකේ අතුරු ඵලයක්.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒක වැඩියි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒක වැඩියි කියා කියන එකට සාධකයක් කියන්න. කරුණාකර කියන්න, යම් මෙට්‍රික් ටොන් ප්‍රමාණයක් උක් ගස් ඇඹරුවාම විද්‍යානුකූලව යම් සීනි ප්‍රමාණයක් නිෂ්පාදනය වන්නට ඕනෑ; molasses ප්‍රමාණයක් නිෂ්පාදනය වන්නට ඕනෑ. ඒකේ අනුපාතය වෙනස් වෙලා තිබෙනවා ද? නිෂ්පාදනය වෙනස් වෙලා තිබෙනවා ද? ඒ ගැන කථාවක් නැහැ. මොනවා ද තිබෙන දත්ත? [බාධා කිරීමක්]

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඔබතුමාට විරුද්ධව කථා කරනවා නොවෙයි. මම ඒ කෝරළයේ ඕවිටිගල, හඳට පොලු ගහපු ගමේ ඉපදිච්ච මිනිහෙක්. මම මේ අහන්නේ දන්නේ නැති නිසා. [බාධා කිරීමක්]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමා උස හින්දා හඳට පොලු ගහන්න ලේසියි. [බාධා කිරීමක්]

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඔබතුමා මට වඩා උගත්. මම මේ අහන්නේ, මට ආරංචි විධියට. මේකේ molasses ප්‍රමාණය වැඩි වෙලා සීනි හදන එක අඩු වෙලා තිබෙනවාලු. [බාධා කිරීමක්] මා දන්නේ නැහැ, ඇත්ත ද බොරු ද කියා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒක බොරුවක්. ගරු ඇමතිතුමා, ඔය අමාත්‍ය මණ්ඩලයේ ඉන්න තමුන්නාන්සේලා වාගේ අයට දීලා තිබෙන ලණුවක්. තමුන්නාන්සේ ව්‍යාපාරිකයෙක්. තමුන්නාන්සේලාට දකින්නට ලැබේවි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සිංහල ව්‍යාපාරිකයන්ගේ ව්‍යාපාර ජනසතු කර, ඒවායේ පරිපාලනය අඩාළ කරලා, අවසානයේ මේ ආණ්ඩුවේ හෙංචයියන් කිහිප දෙනෙකුට මේ ව්‍යාපාර ඉස්සරහට පවරා දී ඒවායේ ලාභ ප්‍රයෝජන -තමුන්නාන්සේලාට නොවෙයි.- රාජපක්ෂලාගේ කට්ටියට, වටේ ඉන්න මිනිස්සුන්ට, හෙංචයියන්ට, කුස්සියේ ඉන්න කට්ටියට හම්බ වෙනවා කියන කාරණය මා කියන්න කැමතියි.

[பி. ப. 5.20]

**ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)**
(மாண்புமிகு முருகேசு சந்திரகுமார் - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. Murugesu Chandrakumar - Deputy Chairman of Committees)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நொத்தாரிசுகள் (திருத்தம்) சட்டமூலம் மற்றும் ஆவணங்கள் பதிவு (திருத்தம்) சட்டமூலம் என்பவற்றின் இரண்டாம் மதிப்பீட்டின் மீதான விவாதத்திலே கலந்துகொண்டு பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கிய உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இச்சந்தர்ப்பத்திலே வட மாகாணத்தின் காணி உரிமங்கள் மற்றும் பதிவுகள் தொடர்பான விடயத்தை நான் இச்சபையின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன். கடந்த 30 வருடங்களாக வடக்கு, கிழக்கில் காணப்பட்ட யுத்த சூழ்நிலைகளின் விளைவாக, தற்பொழுது அங்குள்ள மக்கள் தமது காணி உரிமங்களைப் பெறுவதில் பல்வேறு சட்டச் சிக்கல்களை எதிர்நோக்கவேண்டிய நிலைமை உருவாகி இருக்கின்றது. குறிப்பாக, யுத்தம் நடைபெற்ற காலகட்டங்களில் அப்பிரதேசங்களைத் தமது அதிகாரத்தின்கீழ் வைத்திருந்தவர்கள் தாங்கள் அங்கு உருவாக்கிய சட்டங்களின்மூலம் அங்குள்ள மக்களின் காணிகள் மற்றும் உடைமைகளைத் தமது இஷ்டப்படி மாற்றியிருக்கின்றார்கள். அதற்கு அன்றிருந்த நிருவாகங்களும் ஒத்துழைத்திருக்கின்றன. இன்று அப்பிரதேசத்தில் ஓர் இயல்புநிலை தோற்றுவிக்கப்பட்டதற்குப் பின்பு, யுத்தம் காரணமாக வெளிநாடுகளுக்குப் புலம்பெயர்ந்த தமிழ் மக்கள் மீண்டும் தங்களது சொந்தப் பிரதேசங்களிலுள்ள தமது காணிகளைப் பார்க்க வரும்போது, அவர்களுக்கு அதிர்ச்சியளிக்கும் செய்திகள்தான் கிடைக்கப்போகின்றன. ஒன்றில், அவர்களுடைய நிலங்கள் சூறையாடப்பட்டிருக்கும் அல்லது அவர்களது காணி உரிமம் மாற்றப்பட்டு, வேறொருவர் அதற்கு உரிமையாளராக இருக்கின்ற நிலைமையைக் காணக்கூடியதாக இருக்கும். இவ்வாறான நிலைமைதான் இன்று அங்கு காணப்படுகின்றது. எனவே, இந்தச் சூழ்நிலையில் இன்று அரசினால் கொண்டுவரப்பட்டிருக்கின்ற திருத்தச் சட்டங்கள் இவ்விடயங்களுக்கு நல்லதொரு தீர்வாக அமையும் என்று நான் நம்புகின்றேன்.

அண்மையில் அரசினால் செயற்படுத்தப்பட்ட "பிம் சவிய" - "மண்ணின் மகிமை" எனும் காணி உரித்துப் பதிவுச் சான்றிதழ் வழங்கும் திட்டத்தினை, குறிப்பாக, வடக்கு, கிழக்கில் வாழுகின்ற தமிழ் மக்களுக்கு ஒரு வரப்பிரசாதமான விடயமாகவே நாங்கள் பார்க்கின்றோம். ஆனால், துரதிஷ்டவசமாக இத்திட்டம் தொடர்பாகத் தமிழ்த் தேசியக் கூட்டமைப்பினரும் சில ஊடகங்களும் தமிழ் மக்கள் மத்தியில் தவறான கருத்துக்களைப் பரப்பிக்கொண்டிருக்கின்றார்கள். அண்மையில் நான் பிரித்தானியாவுக்குச் சென்றிருந்தேன். அங்குள்ள புலம்பெயர் தமிழ் மக்களைச் சந்தித்துப் பேசியபோது, இக்காணிப்பதிவு தொடர்பாக அவர்கள் மத்தியில் தவறானதும் பொய்யானதுமான பரப்புரைகள் செய்யப்பட்டிருப்பதை அவதானித்தேன். உரிமை கோரப்படாத காணிகளில் சிங்கள மக்களைக் குடியேற்றும் நோக்கில்தான் இத்திட்டம் கொண்டுவரப்பட்டிருக்கின்றது என்ற தவறான ஒரு கருத்தை அங்கு விதைத்திருக்கின்றார்கள். "உண்மை அதுவல்ல; யுத்தம் முடிவடைந்ததற்குப் பிறகு இடம்பெயர்ந்த மக்கள் மீள்குடியேற்றப்பட்ட காலகட்டங்களில் தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் பத்திரிகைகளிலும் பாராளுமன்றத்திலும் தமிழ்ப் பிரதேசங்களில் சிங்கள

மக்களைக் குடியேற்றுவதற்கு அரசாங்கம் திட்டமிட்டுச் செயற்படுகின்றது என்ற போலியான பிரசாரத்தை முன்வைத்தார்கள்; ஆனால், அவர்களுடைய பிரசாரங்களைப் பொய்ப்பிக்கும் வகையில் தமிழ்ப் பிரதேசங்களில் தமிழ் மக்களுடைய இன விகிதாசாரத்தைச் சிதைக்கும் வகையில் சிங்கள மக்களைக் குடியேற்றும் எந்தவொரு நடவடிக்கையும் இதுவரை அரசினால் மேற்கொள்ளப்படவில்லை" என்று நான் அவர்களிடம் கூறினேன். இக்காணிப்பதிவு நடைமுறையானது தமிழ் மக்களுக்கு விமோசனத்தைக் கொடுக்கும் ஒரு விடயமாக இருந்தாலும்கூட, தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் தமது அரசியல் வங்குரோத்துக் காரணமாகவும் சுயலாப அரசியலுக்காகவும் அது தொடர்பாகத் தவறான கருத்துக்களைத் தமிழ் மக்கள் மத்தியில் விதைத்துக்கொண்டிருக்கின்றார்கள். வெளிநாடுகளிலுள்ள மற்றைய நாடுகளில் உள்ள புலம்பெயர்ந்த தமிழ் மக்கள் மத்தியிலும் இது போன்ற கருத்துக்களை அவர்கள் விதைத்திருக்கின்றார்கள்.

உண்மையிலேயே இந்தக் காணிப்பதிவு எந்தவகையில் தமிழ் மக்களுக்கு விமோசனமாக அமைகின்றது என்பது தொடர்பாக அவர்களுக்குத் தெரியப்படுத்த வேண்டிய பொறுப்பு எங்களுக்கு இருக்கின்றது. குறிப்பாக யுத்த சூழலினால் புலம்பெயர்ந்து வெளிநாடுகளில் வாழ்கின்ற தமிழ் மக்களது காணிகளை மற்றும் பெறுமதியான உடைமைகளை அவர்கள் மீண்டும் தங்களுக்கு உரியதாக மாற்றிக்கொள்வதற்கு இந்தச் சட்டம் அவர்களுக்கு எந்த அளவுக்குப் பிரயோசனப்படுகின்றது என்பது போன்ற விடயங்களைத் தெரியப்படுத்த வேண்டிய கட்டாயம் எங்களுக்கு இருக்கின்றது. துரதிஷ்டவசமாக, புலம்பெயர்ந்த தமிழர்கள் வாழும் நாடுகளில் ஆதிக்கம் செலுத்தும் தமிழ் ஊடகங்கள் இந்த உண்மையான கருத்துக்கள் அவர்களைச் சென்றடைவதைத் தடுத்துக்கொண்டிருக்கின்றன. புலம்பெயர்ந்த தமிழர்கள் வாழும் நாடுகளில் மாற்றுக் கருத்தாளர்கள் தங்களது கருத்துக்களைச் சொல்வதற்கு இடமளிக்கப்படாமல் அச்சுறுத்தப்படுகிறார்கள். யுத்த காலத்திலும் சரி, இன்றும் சரி, அந்த நிலைமை தொடர்ந்துகொண்டிருக்கின்றது. அந்தந்த நாடுகளில் இருக்கின்ற இலங்கைத் தூதரகங்கள் மிகவும் கஷ்டத்தின் மத்தியில் இந்த விடயங்களை அந்த மக்களுக்குத் தெளிவுபடுத்தினாலும், அவர்களுக்கு அந்த விடயங்கள் உரியமுறையில் கிடைக்கும் வாய்ப்பை அந்த மிரட்டல்கள் தட்டிப் பறிப்பதாகவே அமைகின்றன. "தமிழ் மக்கள் தங்களது நிலங்களைப் பெற முடியாது" என்ற ஒரு பிரசாரம் புலம்பெயர்ந்த தமிழர்கள் வாழும் நாடுகளில் முன்வைக்கப்படுகின்றது. உண்மை அப்படியல்ல. அதாவது புலம்பெயர்ந்து வெளிநாடுகளில் வாழும் தமிழர்கள் இந்தத் திட்டத்தினூடாக, இந்த நாட்டிலே ஒரு பிரதிநிதியை நியமித்து - அவர் உறவினராக இருக்கலாம் அல்லது நண்பராக இருக்கலாம் - அவருக்கு power of attorney என்று சொல்லப்படுகின்ற ஓர் அதிகாரத்தை வழங்கித் தங்களது நிலங்களை மீளப் பதிவுசெய்து தங்களது காணி உரிமையை நிலைநாட்டிக் கொள்ள முடியும்.

இன்று குறிப்பாக யாழ்ப்பாணம் போன்ற பிரதேசங்களில் உள்ள நீதிமன்றங்களில் பல்வேறுபட்ட காணிப் பிரச்சினைகள் சம்பந்தப்பட்ட வழக்குகள் கிட்டத்தட்ட 25 வருட காலமாகத் தீர்க்கப்படாத நிலையில் தூங்கிக்கொண்டிருக்கின்றன. இந் நிலையில் உண்மையான காணி உரிமையாளர்கள் தங்களது காணிகளைப் பெறுவதற்குரிய ஒரு சூழலை இந்தப் பதிவுக்கூடாகப் பெறுகின்றார்கள். இந்தக் காணி உரிமங்களைப் பதிவுசெய்யும் சட்டம் அவர்களுக்கு மிகவும் பிரயோசனமானதாக மாறியிருக்கின்றது. நிலப் பிரச்சினையைத் தீர்ப்பதற்கு நீண்டகாலம் நீதிமன்றத்தில் காத்திருக்க வேண்டிய தேவையை இது இல்லாமல் செய்கின்றது. இது தமிழ் மக்களுக்கு மிகவும் பிரயோசனமான விடயம் என்று தெரிந்திருந்தும், தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் அரசியல் நோக்கங்களுக்காகத் தவறான கருத்துக்களை மக்கள் மத்தியில் விதைத்துக்கொண்டிருப்பதை மிகவும் கவலையான விடய மாகவே நாங்கள் கருதுகின்றோம். உண்மையிலே, வன்னிப் பிரதேசங்களைப் பொறுத்தவரையில் அங்கு மீளக்குடியேறி வாழ்கின்றவர்களில் 40 சதவீதத்துக்கு மேற்பட்டவர்கள் நில உரிமம் இல்லாத ஒரு நிலைமையில்தான் இருக்கின்றார்கள். இதனால் அவர்கள் பல்வேறு துன்பங்களை அனுபவித்துக் கொண்டிருக்கின்றார்கள். குறிப்பாக, அவர்களது நிலங்களுக்கான உறுதிப்பத்திரம் கைகளில் இல்லாதபடியால் மீள் குடியேற்றத்தின்போது அரசினால் வழங்கப்படுகின்ற பல்வேறு நன்மைகளை அவர்கள் பெற முடியாத ஒரு நிலைமை இருக்கின்றது. அதுமட்டுமல்ல, நீண்டகால யுத்தம் காரணமாக ஏராளமான மக்கள் தங்கள் காணி உரிமப்பத்திரத்தைத் தொலைத்துவிட்டார்கள். யுத்த சூழலில் அவர்கள் தங்களது மிகவும் பெறுமதியான உறுதிப் பத்திரங்களை இழக்க வேண்டிய நிலை ஏற்பட்டது. ஆகவே, இந்தக் காணி உரிமப் பதிவுச் சட்டமானது அவர்கள் முறையான ஓர் உறுதிப் பத்திரத்தைப் பெறக்கூடிய வாய்ப்பை ஏற்படுத்திக் கொடுத்திருக்கின்றது. காணி அமைச்சினாலும் வட மாகாண காணி அமைச்சினாலும் இந்தத் திட்டம் தொடர்பாக மூன்று ஆவணங்கள் வெளியிடப்பட்டிருக்கின்றன. தமிழ்த் தேசியக் கூட்டமைப்புப் பாராளுமன்ற உறுப்பினர்கள் அவற்றை முறையாக வாசித்திருந்தால் அது தமிழ் மக்களுக்கு எந்தளவு பிரயோசனமானது என்பதைப் புரிந்துகொண்டிருப்பார்கள் என்று நான் நினைக்கின்றேன். துரதிஷ்டவசமாக அவர்கள் அதை வாசிக்கவில்லையோ எனக்குத் தெரியவில்லை.

குறிப்பாக, பெரும்பாலான வடக்கு - கிழக்கு தமிழர்களிடமிருக்கும் காணி உரித்து ஆவணம் சட்டரீதியாகப் பெறுமதியான ஆவணமல்ல. ஏராளமானவர்கள் தங்களிடம் உறுதி இருப்பதாகச் சொல்லிக்கொண்டிருக்கிறார்களே தவிர, அது முறையாகப் பெறப்பட்டதா என்பது தொடர்பான அறிவு அவர்களிடம் இல்லை. அந்த நிலைமைகளை மாற்றும் வகையில் இந்த ஆவணங்கள் பதிவு (திருத்தம்) சட்டமூலம் அவர்களுக்குக் கைகொடுக்கும். சில காணிகளுக்கு உறுதியை வைத்திருந்தாலும் அதற்கான Survey plan - நில அளவை வரைபடம் அவர்களிடம் இல்லை. அவர்களது காணியில் எல்லைகள் குறிப்பிடப்பட்டிருக்கும்; ஆனால், அந்த எல்லைகளின் பிரகாரம் காணி இருக்காது. ஆகவே, இந்தச் சந்தர்ப்பத்தைத் தமிழ் மக்கள் பயன்படுத்திக்கொள்வதனூடாக அங்கீகரிக்கப்பட்ட ஓர் ஆவணத்தை அவர்களால் பெறக்கூடிய வாய்ப்பு இருக்கிறது. இந்தச் சட்டமூலத்தின் பிரகாரம், ஒவ்வொரு காணி உறுதியும் நுண்ணாய்வு செய்யப்பட்டு, அந்தக் காணி முறையாக அளக்கப்படும்; அதன் உரிமமும் பதிவு செய்யப்படும். இதனால் அவர்கள் பெறப்போகும் அந்த உறுதிச் சான்றிதழ் மிகவும் பெறுமதியுள்ளதாக இருக்கும். காணி விடயங்களில் இப்படியான நிலைமைகள் இருக்கும் பொழுது, அதைப்பற்றி ஏன் இவர்கள் தவறான முறையில் பிரசாரம் செய்கின்றார்களென்பது எனக்குப் புரியாமல் இருக்கிறது.

யுத்த சூழலில் தங்களது காணியைப் பார்த்துக் கொள்ளும்படி உறவினர்களிடமும் நண்பர்களிடமும் கூறி விட்டுப் புலம்பெயர்ந்து சென்றவர்கள், இன்று திரும்பிவந்து பார்க்கும்போது அவர்களது காணியைத் திருட்டுத்தனமாக வேறொருவர் தனது பெயரில் உறுதி முடித்து வைத்திருக்கின்ற நிலைமை காணப்படுகின்றது. யாழ்ப்பாண காணிப் பதிவுத்

[ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා]

திணைக் களத்துக்கு சென்று பார்த்தால், ஒவ்வொரு காணிக்கும் இரண்டு பேர் உரிமை கோரும் நிலைமை இருக்கின்றது. யுத்தம் அப்படிப்பட்ட சூழலை உருவாக்கியிருக்கிறது. ஆகவே, இந்தப் பதிவுக்கூடாகத் தமிழ் மக்கள் நன்மையடை யப்போகிறார்கள்; பரம்பரை பரம்பரையாக இருந்துவந்த அவர்களுடைய காணிகளை மாற்றிக்கொடுப்பதற்கும் இது வழிவகுக்கும். அந்த வகையில், புலம்பெயர்ந்த நாடுகளில் 25 - 30 வருடங்களாக வாழ்பவர்கள் தங்களது அடுத்த பரம்பரம்பரையினருக்குத் தங்களுடைய காணிகளை மாற்றிக்கொடுப்பதற்கு இந்தச் சந்தர்ப்பத்தைப் பயன் படுத்திக்கொள்ள முடியுமென்று நான் கருதுகின்றேன். அதுமட்டுமல்ல, கிட்டத்தட்ட சர்வதேச தரத்துக்கு நிகரான ஒரு பதிவு முறையைத்தான் இந்த அரசாங்கம் அறிமுகப்படுத்தியிருக்கிறது.

உலகத்திலே காணி பதிவுசெய்யும் பிரதான முறைமைகள் இரண்டு உள்ளன. அவையாவன, உறுதி மற்றும் உரிமப் பதிவு முறைகளாகும். உலகத்திலே அபிவிருத்தியடைந்த பெரும்பாலான நாடுகளில் காணி உரிமைப் பத்திரம் பதிவு செய்யும் நடைமுறை அமுலில் உள்ளது. அதே நடைமுறையைத் தான் இந்த அரசாங்கமும் கொண்டுவந்திருக்கின்றது. தங்களது காணித்துண்டுக்கான பெறுமதியூடாக அவர்கள் ஓர் இலக்கை அடையக்கூடிய வாய்ப்பை இது ஏற்படுத்திக் கொடுத் திருக்கின்றது. ஆகவே, தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் தங்களது தவறான பிரசாரங்களுக்கூடாகத் தமிழ் மக்களி டையே தேவையற்ற பதற்ற நிலைமையை உருவாக்க முயலக்கூடாதென்று நான் இந்தச் சபையினூடாக அவர்களிடம் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். இன்று தமிழ்த் தேசியக் கூட்டமைப்பின் மூத்த உறுப்பினர்கள், புலம்பெயர்ந்துள்ள தமிழ் மக்கள் வாழும் நாடுகளுக்குச் சென்றிருக்கின்றார்கள். அங்கு புலம்பெயர்ந்த தமிழர்கள் பணம் கொடுத்து அவர்களைச் சந்திக்கின்ற அளவுக்கு, தமிழ்ப் பிரதிநிதித்துவத்தை விற்கின்ற ஒரு நிலைமையில் அவர்கள் காணப்படு கிறார்கள். அதாவது, கௌரவ சம்பந்தன் அவர்களுடன் கனடாவில் விருந்து சாப்பிட்டு, கலந்துரை யாடுவதற்கு 100 Canadian Dollarsஉம், பிரித்தானியாவில் 50 Sterling Poundsஉம் அறவிடப் பட்டிருக்கிறது. அதாவது, பணம் சம்பாதிக்கும் ஒரு களமாகத்தான் அவர்கள் அதைப் பயன்படுத்துகிறார்கள். ஆனால், உண்மை நிலைமை களையே அவர்கள் புலம்பெயர்ந்த நாடுகளில் தெரிவிக்க வேண்டும். கடந்த 30 வருட காலமாகத் தமிழ் பகுதிகளில் எந்தவித காணிப் பகிர்வும் நடைபெறவில்லை. இந்த காணிப்பதிவு தனிப்பட்டரீதியில் ஒருசிலருக்குப் பாதிப்புக்களை ஏற்படுத்தலாம். பெருநில உடைமை யாளர்களது - அவர்கள் தமிழ்த் தேசியக் கூட்டமைப்பின் தற்போதைய பாராளுமன்ற உறுப்பினர்க ளாகவோ அல்லது முன்னாள் பாராளுமன்ற உறுப்பினர் களாகவோ இருக்கலாம் - நிலங்களெல்லாம் தமிழ் மக்களுக்குப் பகிர்ந்தளிக்கப்பட வேண்டும்.

ஏனெனில் அந்தக் காணிகள் எவராலும் உரிமை கோரப்படாத நிலையில் காடுகளாக இருக்கின்றன. தமிழ்த் தேசியம் பற்றித் தீவிரமாகப் பேசுகின்ற இவர்கள் அந்தக் காணிகளைத் தமிழ் மக்களுக்கு வழங்குவதைத் தடுத்துக் கொண்டிருக்கிறார்கள். அந்தக் காணிகள் தமிழ் மக்களுக்கு நியாயமான முறையில் கிடைக்கவேண்டிய சந்தர்ப்பங்களைத் தடுத்து, அவர்களைத் திசைதிருப்பும் நோக்கில் தவறாக வழிநடத்துவது வேதனைக்குரியது என்பதைத் தெரிவித்துக் கொள்கின்றேன்.

திருகோணமலையில் உள்ள லிங்கநகரிலே தமிழ்த் தேசியக் கூட்டமைப்பு உறுப்பினர் ஒருவருடைய காணிகளில் குடியிருந்த 56 தமிழர்களை அக்காணிகளிலிருந்து வெளியேறும்படியும் இல்லாவிட்டால், ஒவ்வொரு பேர்ச் காணிக்கும் 25,000 - 30,000 ரூபாய் வீதம் தரும்படியும் நிர்ப்பந்திக்கின்ற நிலைமை காணப்படுகிறது. அந்த மக்கள் பல வருட காலமாக அந்தக் காணிகளிலே வசித்தவர்கள். அவர்களை அந்தக் காணிகளிலிருந்தும் அப்புறப்படுத்து வதற்குத்தான் இவர்கள் முற்படுகிறார்களே தவிர, யுத்தத் தினால் பாதிப்புற்றிருக்கும் அந்த மக்களுக்கு மனமுவந்து அந்தக் காணிகளைக் கொடுப்பதற்கு அவர்கள் தயாராக இல்லை. இவர்களுடைய இந்த நடவடிக்கை வருந்தத்தக்கது.

ஆகவே, இவர்கள் எமது மக்களுக்கு நன்மை செய்யவேண்டுமென நினைத்தால் தயவுசெய்து இந்தக் காணிப்பதிவு தமிழ் மக்களுக்கு மிகவும் விமோசனம் அளிக்கும் விடயம் என்பதை மனதார ஒத்துக்கொண்டு, அவர்களைக் காணிப்பதிவு நடவடிக்கையை மேற்கொள்ளுவதற்கு ஊக்கு விக்க வேண்டும்; புலம்பெயர் தமிழ் மக்கள் மத்தியில் உண்மையான கருத்துக்களைச் சொல்லி அவர்களையும் இந்தக் காணிப்பதிவில் பங்குகொள்ள வைக்கவேண்டும் எனக் கேட்டுக்கொண்டு, விடைபெறுகின்றேன். நன்றி, வணக்கம்.

[අ. භා. 5.37 ]

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

නමෝ බුද්ධාය! ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අද ඉදිරිපත් කරන ලද මෝටර් වාහන පනත යටතේ නියෝග අංක 1 සහ 2 පිළිබඳව විශේෂ අවධානයක් යොමු විය යුතුයි කියන අවස්ථාවේ මෙම විවාදයට එක්වීමට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වනවා.

මේ අවස්ථාවේදී ඉදිරිපත් කර තිබෙන ගැසට් නිවේදනයෙන් ජනතාවට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව ගරු කුමාර වෙල්ගම මැතිතුමා විසින් පැහැදිලි කිරීමක් කළා. අපි පසු ගිය වසර තුන දිහා හැරී බැලුවොත්, මේ රටේ වාහන පද්ධතිය වාගේම අපගේ සම්පූර්ණ ප්‍රවාහන පද්ධතිය දිහා බැලුවොත් රථ වාහන ගෙන්වීම හැම අංශයකින්ම විශාල වශයෙන් වැඩි වෙලා තිබෙන බව පෙනෙනවා. ඊට සමගාමීව අපේ පාරවල්, යටිතල පහසුකම් සඳහා විශේෂ අවධානයක් යොමු කරලා, මේ රට පුරාම මහා මාර්ග, පළාත් සහා පාරවල් සඳහා විශාල ආයෝජනයක් කරන වේලාවකුයි මේ. මේ සියල්ලේම ප්‍රතිඵලයක් හැටියට මේ රටේ ප්‍රජාව හා පාරිභෝගිකයන් ඒ වාගේම වාහනවල යන අය සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වීම ගැන අපි අතිශයින් සන්තෝෂ වනවා.

අද ඉදිරිපත් කර තිබෙන ගැසට් පත්‍රවල සඳහන් නියෝගවල අංශ කීපයක් දිහා බැලුවාම වාහනවල යන අයගේ ආරක්ෂාව සම්බන්ධයෙන් වන ආසන පටි -seat belts- ගැන අවධානය යොමු වෙලා තිබෙන බව පෙනෙනවා. දැනට තිබෙන වාර්තාවල දත්තයන් දිහා බැලුවොත් අපට පෙනෙනවා, අපේ රථවාහන අනතුරුවලින් මිය යන දහස් ගණනකගෙන් බහුතරයක් ඒ මරණවලින් බේරා ගන්න එහෙම නැත්නම් ඒ සිදු වන හානි, ආපදා අඩු කර ගන්න අපට විශාල වශයෙන් රුකුලක් කර ගන්න තිබුණාය කියලා, මේ ආසන පටි -seat belts- පැළැඳීම අනිවාර්ය වෙලා තිබුණා නම්.

ගරු ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු විය යුතු තවත් කරුණක් මම දකිනවා. විශේෂයෙන්ම කුඩා දරුවන් අපේ වාහනවල යනවා. ඒ ගැන දෙමව්පියන්ගේ සැලකිල්ල අඩුයි. දරුවන් අතින් අල්ලා ගෙන යනවා. එහෙමත් නැත්නම් seats දෙක

මැද හිට ගෙන, ඉඳගෙන නොයෙකුත් ආකාරයට දරුවන් යනවා. ළදරුවන් අතේ තියා ගෙන යනවා. හැබැයි ඒ අයගේ ආරක්ෂාව සඳහා මේ නීතිය වෙනස් කරන්න කියලා ඉල්ලීමක් කරන්න මම කැමැතියි. මොකද, සාමාන්‍යයෙන් කිලෝමීටර් 50ක වේගයෙන් ගිහිල්ලා වාහනයක් හැප්පුණත්, දරුවන්ගේ තිබෙන බර අඩුකම නිසා ඔවුන්ව වීසි වෙලා ගිහිල්ලා ඔවුන්ගේ හිසට නැත්නම් ඔවුන්ගේ ශරීරයට විශාල හානියක් වෙන්න පුළුවන්. නමුත් ලෝකයේ අනෙක් රටවල් දිහා බැලුවාම දරුවන් සඳහා පොඩි seat එකක්, baby seat එකක් එහෙම නැත්නම් ළදරු seat එකක් - විශේෂයෙන්ම අවුරුදු හතට වඩා අඩු පොඩි දරුවන් වෙනුවෙන් සුරක්ෂිතයක්- අනිවාර්යයෙන්ම තිබිය යුතුයි. ආරම්භයක් හැටියට මේ ගෙනෙන පනත් කෙටුම්පතේ ඒ ගැන කථා කිරීම ගැන අප සන්තෝෂ වනවා. ඒ වාගේම මේ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමක් කරන්න ඕනෑ. මෙය කරන්නේ මේ රජයටවත් එහෙම නැත්නම් ඒ වාහන ගෙන්වන අයටවත් වාසියක් ලබා ගන්න එහෙමත් නැත්නම් වෙන කිසිම දෙයක් නිසා නොවෙයි. මෙහි අරමුණ වන්නේ, වාහනයේ යන දරුවන්ගේ ඒ වාගේම ඒ වාහනයේ යන මගියාගේ ඒ වාගේම වාහනය එළවාගෙන යන අයගේ ආරක්ෂාව සලසා දීමයි.

අලුත් වාහන සියල්ලේම -නවීන වාහනවල- airbags තිබෙනවා. මේ airbag එක seat belt එකට සම්බන්ධ කරලායි තිබෙන්නේ. යම් කිසි විධියකින් accident එකක් වුණොත් - වාහනයක් හැප්පුණොත්- seat belts දාලා හිටියේ නැත්නම් මේ airbag එක විවෘත වන්නේ නැහැ. එය, ලක්ෂ ගණනක් දීලා අලුතෙන් ගන්න වාහනවල අනිවාර්යයෙන් සම්බන්ධ වුණු පද්ධතියක්. ඒකට හේතු රාශියක් තිබෙනවා. ලෝකයේ airbag එක හදන කොට ඒ අයව උදෙ‍ෝගිමත් කරන්න, මේ seat belts පැළැඳීම අනිවාර්ය කරන්න ඒක එකතු කළා. අපි කොච්චර හොඳ වාහනයක ගියත් seat belt එක දාගෙන සිටියේ නැත්නම් airbag එක විවෘත වන්නේ නැහැ. සමහර විට ලක්ෂ ගණනක් මිලියන ගණනක් වටිනා වාහනවලත් වාහනය වටේම ඒ තත්ත්වය තිබෙනවා, හදිසි අවස්ථාවක ආරක්ෂාව සඳහා. නමුත් seat belt එක දාගෙන නොසිටීම airbag එක විවෘත නොවන්න එක හේතුවක්.

අපි දැන් අධිවේගී මාර්ග ආරම්භ කරනවා. ඒ වෙනුවෙන් අමාත්‍යාංශය වෙනම කැපවීමක්, මහන්සියක් දරන වෙලාවේ අලුතෙන් අපට ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වීම අවශ්‍යයි; නීති රීති අවශ්‍යයි. ඒ වෙනුවෙන් රියැදුරන් පෙළ ගැස්වීම අවශ්‍යයි. ඒ වාගේම මේ මාර්ගවල යන්න යම් කිසි අලුත් පුහුණුවක් අවශ්‍යයි. කිලෝමීටර් 60-100 අතර අධි වේගයකින් තමයි මේ මාර්ගයේ වාහන යන්නේ. ඒ යන වාහන එක පැත්තකටයි ගමන් කරන්නේ. අපට ඕනෑ විධියට දකුණු පැත්තට හරවන්න බැහැ. අධික වේගයෙන් යන ගමන් වාහනය මාර්ගයෙන් එළියට ගන්න පුළුවන් වම් පැත්තෙන් පමණයි. ඒ මාර්ගයේ යන විට කොහොමද තමන් යන lane එක මාරු කරන්නේ, කොහොමද signal දාන්නේ කියලා පුරුද්දක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම ඉදිරියෙන් විශාල වාහනයක් යනවා නම් ඒ වාහනයේ tail lights, ඒ අයගේ සංඥා, පාරේ තිබෙන සංඥා පිළිබඳව අවබෝධයක් ඇති කර ගන්න ඕනෑ. මම අත් දැකීමෙන් මේ කරුණු දන්නවා. රටවල් ගණනාවකදී වාහන එළවන්න අවස්ථා රාශියක් මට ලැබිලා තිබෙනවා. එහිදී, සාමාන්‍යයෙන් කොළඹ නගරයේ හෝ නගර ආශ්‍රිතව කිලෝමීටර් 30 - 50 අතර අඩු වේගයෙන් යන අවස්ථාවලට වඩා හරි ඉක්මනට, ක්ෂණිකව රියැදුරාට තීන්දු ගන්න අවශ්‍ය වෙනවා. ඒ නිසා ඒ පුහුණුව අවශ්‍යයි. ඒ නිසා මම බොහොම කැමැති වෙනවා, බොහොම සන්තෝෂයි අපේ ගරු ඇමතිතුමා ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරලා මේ අවස්ථාවේදී මේ නියෝග ඉදිරිපත් කිරීම ගැන. මේ සඳහා කාරණා කිහිපයක් අවශ්‍ය වනවා. එකක් තමයි ජනතාව දැනුවත් කිරීම. අනෙක් එක, ජනතාව පෙළ ගැස්වීම සහ ජනතාවට අවබෝධයක් ඇති කර දීම. අපි බලාපොරොත්තු වන සංවර්ධනයේදී, අධිවේගී මාර්ග මඟින් උතුර, දකුණ, නැඟෙනහිර සහ බස්නාහිර සම්බන්ධ වෙනවා.

ගුවන් තොටුපොළේ සිට විනාඩි 17ත් 20ත් ඇතුළත පෑලියගොඩට එන්න පුළුවන්. පෑලියගොඩින් අපේ දක්ෂිණ අධිවේගී මාර්ගයට සම්බන්ධ වෙලා කොට්ටාවට යන්න පුළුවන්. තව අවුරුදු දෙක හමාරක් තුළ ඒ සම්බන්ධතාව ඇති වෙනවා. කොට්ටාවට එන්න විනාඩි 15ක්වත් යන්නේ නැහැ. එතැන් සිට පැයක් වාගේ කාලයකින් මාතරට යන්න පුළුවන්. අද කටුනායක ගුවන් තොටුපොළට එන කෙනෙකුට මාතරට යන්න පැය හතර හමාරක් යනවා නම්, තව අවුරුදු දෙකක් ගත වන විට පැයක් වාගේ කාලයකින් මාතරට යෑමේ හැකියාව ලැබෙනවා.

අපි පොඩි කාලයේ අපේ පාසල්වලට -මම නාලන්දා විද්‍යාලයේ- ගාල්ල, කලුතර සහ අවිස්සාවේල්ල වාගේ ප්‍රදේශවල සිට ළමයි ආවා. ඒ අය උදේ පාන්දර හතරට නැඟිටලා, බස් එකේ බොහොම අමාරුවෙන් කොළඹට ඇවිල්ලා පාසලට ආවා. එක හමාරට ඉස්කෝලේ ඇරුණාම හැන්දෑවේ හතර, පහ වෙනකම් කාලය පාරට ගත වුණා. පැය කීයක්ද? අද ගාල්ලේ දරුවෙකුට විනාඩි 45කින් කොට්ටාවට එන්න පුළුවන්. කොට්ටාවේ සිට කොළඹ නගරයට එන්න යන්නේ තවත් විනාඩි 20ක විතර කාලයක්. එහෙම බැලුවාම ජනතාවට පහසුකම් සපයා ගැනීමේ හැකියාව දිනෙන් දින වැඩි වෙලා, පුළුල් වෙලා තිබෙනවා. මේ යටිතල පහසුකම් සංවර්ධනයත් එක්ක, සම්බන්ධීකරණයත් එක්ක නීති රීති පද්ධතියත් පෙළ ගැසුණේ නැත්නම්, ජනතාව මේ සඳහා හරියට පෙළ ගැසුණේ නැත්නම්, මුල් වකවානුවේදීම හරියට නීති රීති පිළිපැද්දේ නැත්නම් ඒකෙන් වෙන්න පුළුවන් හානිය වැඩියි. වගකීමක් ඇති රජයක් හැටියට අමාත්‍යාංශවල උපදෙස් අරගෙන, වෙනම අධිකාරියක් හදලා, තාක්ෂණය ගැන අවබෝධයක් ඇති අයගෙන් අවශ්‍ය තොරතුරු ලබා ගෙන සාර්ථකව කටයුතු කිරීමේ අරමුණෙන් තමයි මේවා කරන්නේ.

අද අපි මේ නියෝගයෙන් ඉදිරිපත් කරලා තිබෙනවා අධිවේගී මාර්ගයක යන්න මෙපමණ වාගේ අවම මුදලක් අය කරනවා කියලා. මේ යටිතල පහසුකම් හදන විට ඒවායේ වාසිය සෘජුව සහ වක්‍රව පාරිභෝගිකයන්ට ලැබෙනවා. ඒ නිසා මේවා නඩත්තු කර ගෙන යන්න, මේවා පවත්වා ගෙන යන්න ඒ අයගෙන්ද යම් කිසි දායකත්වයක් ලැබිය යුතුයි. මේ නියෝග ක්‍රියාත්මක වීම තුළින් ඒ පහසුකමත් ඇති වෙනවා කියා අපි විශ්වාස කරනවා.

අධිවේගී මාර්ග සහ ආසන පටි කියන කාරණා දෙකට අමතරවත් මේ අමාත්‍යාංශය යම් කිසි කටයුත්තක් කරලා තිබෙනවා. ආබාධිත තත්ත්වයක කෙනකු වාහනයක යද්දී seat belt එකක් දාන්න බැරි නම් ඒකට වෙනම ප්‍රතිපාදන හදලා තිබෙනවා. වෛද්‍ය සහතිකයක් සමඟ මෝටර් රථ ලියාපදිංචි කිරීමේ අංශයට ඒ පිළිබඳව ඉල්ලීමක් කිරීමෙන් අවශ්‍ය පහසුකම සලස්වා ගන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒ නිසා මම නැවත වරක්-

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමා ඒකට පිළිතුරක් දෙයි කියා මා හිතනවා. Left-hand drive vehicles තවම ලංකාවේ භාවිත වනවා. ඒ පිළිබඳව ඔබතුමාගේ අදහස මොකක්ද? ඒවා ගෙන්විය යුතුද, ඒවා පාවිච්චි කිරීමට ඉඩ දිය යුතුද මෙතරම් වාහන තදබදයක් ඇති කාලයක?

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

ලෝකයේ කිසිම රටක, තමන්ගේ රටේ තිබෙන්නේ left-hand drive vehicles නම් අනෙක් එක පාවිච්චි කරන්න අවස්ථාවක් දෙන්නේ නැහැ. ඉස්සර left-hand drive vehicles වල දකුණු පැත්තේ විශේෂ කණ්ණාඩියක් - mirror එකක් - දාලා තිබුණා.

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

මේක පදවන්නේ වමෙන් කියලා පිටුපසින් එන අය දැනුවත් කරන්න ඒ වාහනය පිටුපස board එකක් දාලා තිබුණා. ඒ සියලු ප්‍රතිපාදන තිබුණා. දැනට අවුරුදු 14කට විතර කලින් තීන්දුවක් අරගෙන තිබුණා, අලුතින් එන එවැනි වාහනවලට ඒවා අනිවාර්ය විය යුතුය කියලා. නැත්නම් ලංකාවට ඒ වාහන ගෙනාවාට පස්සේ convert කරන්න ඕනෑ කියලා. මේවා නිසා ප්‍රශ්න රාශියක් එනවා. Accidents හුඟක් වැඩි වන්න පුළුවන්. ඒක සුදුසුම නැහැ. විශේෂයෙන් බස් වාගේ ලොකු වාහන පිටුපස මේ වාහන යන විට ලෙහෙසියෙන් overtake කරන්න බැහැ. එම නිසා එකෙන් ප්‍රශ්න ඇති වෙනවා. ගරු මන්ත්‍රීතුමා ඇසුවේ හොඳ වැදගත් ප්‍රශ්නයක්. අපේ ගරු ඇමතිතුමා ඒ ගැන අවධානය යොමු කරයි. ඒ වාහන අපට සුදුසු නැහැ කියන එකයි මගේ අදහස. අපේ රටේ තිබෙන්නේ දකුණු පැත්තේ සිට රිය පදවන ක්‍රමයක්. ඒකට අපේ වාහන පමණක් නොවෙයි, අපේ මාර්ග පද්ධතිය, පොලිසියේ traffic rules සම්පූර්ණයෙන්ම සම්බන්ධ වෙලා තිබෙනවා. ඒ නිසා ඒ වාහන සම්බන්ධ ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු බහුතරයක් කථා කළේ හෙට දවසේ විවාදය ගැන. ඒ ගැන ඒ මන්ත්‍රීතුමන්ලාගේ අදහස් දැක්වීම කෙසේ වෙතත් අපි මේ කාරණය පැහැදිලිව කියන්න ඕනෑ. අද මේ රට අලුත් යුගයක ගමන් කරන්නේ. යම් යම් වැරදි තීන්දු ඉතිහාසයේ අරගෙන තිබුණා නම්, ඒ තුළින් අපේ සංවර්ධනයට හානියක් වෙනවා නම්, අපේ ගමන් මාර්ගයට යම් කිසි බාධාවක් ඇති වෙනවා නම් අපි ඒවා නිවැරදි කර ගන්නට ඕනෑ. ඒ පරම අදහසින් තමයි හෙට ඒ පනත් කෙටුම්පත විවාදයට ගන්නේ. එම නිසා ඒ ගැන ද්වේශ සහගතව බලන්න නරකයි. ඒ දෙස විපක්ෂය බලන්නේ ද්වේෂ සහගතවය කියා සඳහන් කරමින්, අද මේ අත්‍යවශ්‍ය නියෝග ඉදිරිපත් කර තිබීම ගැන ගරු කුමාර වෙල්ගම අමාත්‍යතුමා ඇතුළු සියලුම නිලධාරි මණ්ඩලයට නැවත වරක් ස්තුති කරමින් මම නිහඬ වෙනවා.

[අ. භා. 5.49]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දීර්ඝ කථාවක් කරන්නේ නැහැ. මා ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරන්න බලාපොරොත්තු වන්නේ මුළු රටේම විහිදුණු ඉතාම බරපතළ ප්‍රශ්නයක් ගැනයි. විවිධ කාල පරිච්ඡේදවල රජයේ ඉඩම්, කුඩා කුඩා ඉඩම් අපේ මිනිසුන්ට-ජනතාවට- දීලා තිබෙනවා. පරම්පරා ගණනක් ගිහින් වුණත්, අද එය මුළු රටේම තිබෙන ප්‍රශ්නයක් විධියට අපට පෙනෙනවා. සමහර ඉඩම් ඒ අයට බෙදා ගන්න පුළුවන්. සමහර ඉඩම් බෙදා ගන්න බැහැ. නමුත් ඒවායේ ගෙවල් හැදිලා තිබෙනවා. මේ ඉඩම් දීලා තිබෙන ක්‍රමවේදය තුළ, මේ ගොල්ලන්ට බැංකුවකට ගිහින් ණයක් ගන්නවත්, වෙන ක්‍රමයකින් ණයක් ගන්නවත් පුළුවන්කමක් නැහැ.

සමහර ඒවා තිබෙනවා ජනාධිපති බලපත්‍ර යටතේ. ඒ වාගේම සමහර ඒවා වෙනත් ඉඩම් බෙදා දීමේ ක්‍රම අනුව දීලා තිබෙනවා. දැන් මේවා තවත් කෙනෙකුට, ඒ කියන්නේ දරුවෙකුටවත් බෙදා දෙන්න බැරි තත්ත්වයේ ප්‍රශ්න උද්ගත වෙලා තිබෙනවා. ඒ නිසා ඉඩම් කොමසාරිස්තුමාට, ප්‍රාදේශීය ලේකම්තුමාට හෝ කිසිම නිලධාරියෙකුට මේ ඉඩම් නීත්‍යානුකූලව බෙදා දෙන්න පුළුවන්කමක් නැහැ. ඒකට සම්පූර්ණ තහංචියක් තමයි තිබෙන්නේ. අපි දන්නවා නාගරික ප්‍රදේශවල ජලය තිබෙනවා නම් පර්චස් තුනේ කැබලි වශයෙන් පවා ඉඩම් බෙදා දෙන බව. ඒ, ජලය තිබෙනවා නම්. ඒ සෞඛ්‍ය පහසුකම් දිහා බලලා තමයි එහෙම දෙන්නේ. එහෙම වුණත් ජනතාවට ඒ ඉඩම්වල හොඳ ගෙයක් හදා ගන්නට අවස්ථාවක් නැහැ. ඒක තමයි අද රටේ තිබෙන නීතිය. ඒ නිසා මා ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්නේ, නීතියක් අනුව අපට ඉදිරියට යන්න පුළුවන් වෙන්නේ මේ පිළිබඳව හරි දැක්මක් ඇතිව කටයුතු කළොත් විතරයි කියන එකයි. දැන් ඒ පිළිබඳ නීතියක් නැති නිසා අවනීතිය, නීතිය බවට පත් වෙලා තිබෙනවා. තමන්ගේ පවුලේ අය, දරුවන් ඉඩම් බෙදා ගන්නවා. එහිදී සමහර වෙලාවට මරා ගන්නවා. ඇත්ත වශයෙන්ම ඒක තමයි ඇති වෙලා තිබෙන තත්ත්වය. ඒ නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරන්නේ, රජයෙන් බෙදා දීලා තිබෙන ඉඩම් නැවත වරක් ඒ පවුලේ උදවිය අතර බෙදා දෙන්න පුළුවන් නම්, ඒ අයට ඒ සඳහා ඔප්පුවක් දෙන්න පුළුවන් නම් ඒක ඉතා වැදගත් බවයි.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මගේ වෙලාව කොහොමද දන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා මගේ වෙලාවෙන් විනාඩියක් ඉල්ලනවා. මගෙන් අඩු කරන්නේ නැතිව එතුමාගෙන් අඩු වෙන්න දුන්නාට කමක් නැද්ද?

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
"බිම් සවිය" වැඩ සටහනින් බොහෝ දුරට ඔබතුමා කියන ඔය ප්‍රශ්නවලට විසඳුම් දෙනවා. බිම් සවිය වැඩසටහනෙන් කරන්නේ, ඉඩම මැනලා, ඉඩමේ අයිතිය හඳුනා ගෙන ඒ ඉඩමේ අයිතිකරුට ඔප්පුවක් ලබා දෙන එකයි. එහෙම නැත්නම් ඒකට title report එකක් ලබා දෙන එකයි. මේ "බිම් සවිය" වැඩසටහන ලංකාව පුරාම ක්‍රියාත්මක කරන්න දැනට විධිවිධාන සලස්වාගෙන යනවා. ඒකෙන් හුඟක් දුරට මේ ප්‍රශ්න විසඳෙනවාය කියලා මා හිතනවා. ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ එදා අක්කර භාගයක්, අක්කරයක් වශයෙන් දුන්නු ඉඩමේ අද තුන් හතර දෙනෙක් ගෙවල් හදා ගැනීම නිසා අද ඒවා කුඩා බිම් කට්ටි බවට පත් වෙලා තිබෙනවා. අද ඒ ඉඩම් හඳුනා ගෙන, ඒ වෙන් වෙලා තිබෙන බිම් කට්ටිවල අයිතිය ප්‍රකාශ වෙන පත්‍රිකාවක් රජය මඟින් ඔප්පුවක වටිනාකමක් ඇතිව ලබා දෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මම කිව්වේ දැනුත් ඒක කරන්න පුළුවන් කියන එකයි.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ඒක මගේ අමාත්‍යාංශයට අයිති කාරණයක් නොවෙයි. ඒක ඉඩම් අමාත්‍යාංශයට අයිති කාරණයක්.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒක තමයි. ඔබතුමන්ලාට ඒක කැබිනට් එකේදී කතා කරන්න පුළුවන්. මම කිව්වේ මෙතැන නීතිමය ප්‍රශ්නයක් තිබෙනවා කියන එකයි. මොන දේ කළත් නීතිය වෙනස් නොකර, ඉඩම් ප්‍රදාන පනත වෙනස් කරන්නේ නැතිව ඔය කියන දේ කරන්න බැහැ. ඒ නිසා මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්නේ, රජයේ ඉඩම් බෙදා දීම, රජයේ ඉඩම් ප්‍රදානය කිරීම යන කටයුතු නීත්‍යානුකූලව

කරලා ඔප්පුවක් මඟින් ඉඩම් දෙන්න කියන එකයි. ඒ අයට ඕනෑ නම් ඉඩම් තියා ගනීවි. එහෙම නැත්නම් ඒවා විකුණලා ඊට වඩා හොඳ ඉඩමක් ගනියි. ඒක සමාජමය ප්‍රශ්නයක්. ඒ අයගේ හැකියාව අනුවයි ඒක වෙන්නේ. ගරු ඇමතිතුමනි, අපි ඉඩම දෙනකොට එයා දුප්පත් කෙනෙක් වෙන්න පුළුවන්. නමුත් ටිකක් කල් යනකොට එයා හිතන්න පුළුවන් මට ඉන්න තරම් මේ පරිසරය හොඳ නැහැ, දැන් මට සල්ලි තිබෙනවා, ඒ නිසා මම වෙන තැනකින් ඉඩමක් ගන්නවා කියලා. නමුත් ඔප්පුවක් නැතිකම නිසා ඒ අයට ඒක කර ගන්න විධියක් නැහැ. ඉතින් එහෙම නම් ඇයි අපි බල කරන්නේ එයාට එතැනම ඉන්න කියලා? මේ නිසා අද නොතාරිස් මහත්වරු, සමහර නීතිඥ මහත්වරු -ඔක්කෝම අය නොවෙයි- අත යට ඔප්පු ලියනවා; අත යට ගිවිසුම් ගහනවා. මේක සාමාන්‍යයෙන් සිද්ධ වෙන දෙයක්. ඒ බලය උඩ තමයි ඒ අය ඉන්නේ. ඒ බලය මත ඒ අයගේ ඉඩම්වලට වතුර දෙනවා. ලයිට් දෙනවා. ඒ නිසා ඒවා දැන් මුඩුක්කු බවට පත් වීගෙන යන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා කරුණාකරලා මේ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න.

හෙට විවාදයට ගන්න පනත් කෙටුම්පත ගැන මම වැඩිය කතා කරන්නේ නැහැ. මොකද, ඒක හෙට නේ ඉදිරිපත් කරන්නේ. ඒක ගැන හෙට කතා කරනවා. නමුත් ඒ ගැන ගරු ඇමතිතුමන්ලාට එක ඉඟියක් දෙනවා. කවුරු හරි මිනීමැරුම් නඩුවකට අහු වෙලා, වරදකරු වෙලා එල්ලා මරන්න ඕනෑ කියලා උසාවියෙන් තීන්දු කළොත්, ඊට ඉස්සර වෙලා අහනවා නිදහසට යමක් කියන්න උඹට තිබෙනවාද කියලා. හෙට ඉදිරිපත් කරන්න යන පනත් කෙටුම්පතේ ඒ ටිකවත් නැහැ. ඒ ටික තමයි මම කෙටියෙන් කිව්වේ. මම හෙට ඊට වඩා දෙයක් කතා කරන්නම්. [බාධා කිරීමක්] අස්වර් මන්ත්‍රීතුමනි, කරුණාකර තමුන්නාන්සේ වාඩි වන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට වෙලාව තිබෙන්නේ විනාඩි 10යි. මෙහෙම බාධා කරනකොට -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මා මේ කිව්වේ මේ රටේ තිබෙන මූලික අයිතියක් ගැනයි; මිනිහෙකුට නිදහසට කරුණු ඉදිරිපත් කරන්නට තිබෙන අයිතිය ගැනයි. ඒ කිසි දෙයක් නැතිව- [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා ( ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation )
පසු ගිය අය වැය කථාවේ දී අතිගරු ජනාධිපතිතුමා මෙය පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අය වැය කථාවේ දී ප්‍රකාශ කර තිබුණාට, අහවල් කෙනා ඒ ව්‍යාපාරය හරියට කරගෙන යන්නේ නැහැ කියලා කිසිම ලියවිල්ලකින් කිසිම කෙනෙකුට දැනුම් දීමක් කරලා නැහැ. ඒ අය වැය කථාවේ දී කළ ප්‍රකාශයක්. මම මේ කියන්නේ ඒක නොවෙයි. හෙට ඉදිරිපත් කරන මේ පනත් කෙටුම්පත අනුව එම ව්‍යාපාර පවරා ගන්නකොට, ඒ පුද්ගලයාට නිදහසට කරුණු කියන්න අවස්ථාවක් තිබෙන්නට ඕනෑ, "නැහැ, ඔය තීරණය වැරැදියි. මගේ ඇත්ත තත්ත්වය මේකයි" කියලා. මා ඒකයි කියන්නේ, ඒ අවස්ථාව -

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
අතිගරු ජනාධිපතිතුමා ඊට වැඩියේ හොඳ දෙයක් කළා; කරුණාකර මේ අවුරුද්ද තුළ ඒ ව්‍යාපාර සංවර්ධනය කර ගන්න කියලා කිව්වා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒ තමුන්නාන්සේලා කියන දෙය නේ. ඒ තොරතුරු දැන් මා අතේ නැහැ, මම හෙට ගෙනෙන්නම්. එහෙම අවස්ථාව දීලා, ඒගොල්ලන් එහෙම නොකළාද කියන එක ගැන- [බාධා කිරීමක්] මට බොහොම සුළු වේලාවයි නේ තිබෙන්නේ. කරුණාකර බාධා කරන්න එපා. අපි පෙන්වන්නම්. එහෙම කිසිම නිවේදනයක් නොකර තමුන්නාන්සේලා මනඃකල්පිත විධියට හිතලා; ඒ විධියට හිතන්න ඉඩ දීලා, චෝදනාවක් නැතිව එකපාරටම ඉඩම පවරා ගන්නවා. ඉඩම පවරා ගන්න කොට නිදහසට කරුණු කියන්න අවස්ථාවක් නැහැ. "මම හරියට ව්‍යාපාරය කළා. මම අත්සන් කළ ගිවිසුම අනුව හරියට කටයුතු කරලා තිබෙනවා. මම ලාභ උපදවා තිබෙනවා" කියලා කියන්න අවස්ථාවක් දීලා නැහැ. මේක බරපතළ වරදක්. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මනුෂ්‍යයකුට දී තිබෙන මූලික අයිතියවත් මේ පනත් කෙටුම්පත තුළින් දී නැහැ. ඒ අවස්ථාව අහෝසි කරලා අද ඉතාම භයානක තත්ත්වයකට මේ රට පත් කරලා තිබෙනවා. මම හෙටයි මේ ගැන කථා කරන්නේ. මම මේ ඉඟියක් කළේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා, මේ ඉඩම් ප්‍රශ්නය ගැන. මේ ප්‍රශ්නය මුළු රටේම තිබෙනවා.

විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයේත් මේ ප්‍රශ්නය තිබෙනවා. ජා-ඇල මැතිවරණ කොට්ඨාසයේ, වත්තල මැතිවරණ කොට්ඨාසයේ මේ ප්‍රශ්නය තිබෙනවා. මේ පිළිබඳව ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න. විශේෂයෙන්ම අපේ ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා නියෝජනය කරන- [බාධා කිරීමක්] මෙතුමා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වාගේ කෑ ගහනවා නේ. මොකද මේ වෙලා තිබෙන්නේ? එතුමාගේ ඔළුව හොඳ නැහැ. එක්කෝ එතුමාව වාඩිකර වන්න. එතකොට වැඩේ ඉවරයි.

පුබුදුගම පවුල් 2,000ක් විතර සිටිනවා, ගරු ඇමතිතුමනි. ඇත්ත වශයෙන්ම ඒ අය බලහත්කාරයෙන් තමයි පදිංචි වෙලා සිටින්නේ. නමුත් රජයෙනුත් ඉඩම් දුන්නා. ඉඩම් දීලා, දැන් පාරවල් හදලා, විදුලිය දීලා තිබෙනවා. ඒවාට ඔප්පු නැහැ. ඒ, පුබුදුගම. මෙන්න මේ විධියේ තත්ත්වයන් තිබෙනවා. කරුණාකර මේවා ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියා ඉල්ලීමක් කරනවා. [බාධා කිරීමක්]

කරුණාකර මේ අස්වර් මන්ත්‍රීතුමාට කියන්න, මන්ත්‍රීවරයකු කථා කරනකොට අඩු ගණනේ විනාඩි 10ක් ඇහුම්කන් දීමේ ශක්තියක් ඇති කර ගන්නය කියලා. [බාධා කිරීමක්]

[අ. භා. 5.59]

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම වැදගත් සංශෝධන පනත් කෙටුම්පත් කිහිපයක් සහ අපේ රටේ ජන ජීවිතයට අදාළ නියෝගයන් කිහිපයක් ගැන මේ ගෞරවනීය සභාවේ සාකච්ඡා කරන අවස්ථාවේ දී ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාවක් ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ඒ වාගේම අද දින මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත්වල තිබෙන වැදගත්කම ගැන හෝ එහෙම නැත්නම් අද දින ඉදිරිපත් කර තිබෙන මේ නියෝගයන්වල තිබෙන වැදගත්කම ගැන විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කථා කළේ නැහැ. එතුමන්ලා හෙට දිනයේ ඉදිරිපත් කිරීමට තිබෙන පනත් කෙටුම්පතක් ගැන තමයි කථා කළේ.

ගරු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාට අපේ ගෞරවය සහ ස්තුතිය පුද කරන්නට ඕනෑ, එතුමා ඉතාම කාලෝචිත සංශෝධන කිහිපයක් නොතාරිස් ආඥාපනතටත්, ඒ වාගේම ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතටත් ඉදිරිපත් කිරීම පිළිබඳව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීමේ මූලික අරමුණ වෙලා තිබෙන්නේ විශේෂයෙන්ම පළාත් පාලන ආයතනවලට ලැබිය යුතු මුද්දර ගාස්තු ඉතාම කඩිනමින් එම ආයතනවලට ලබා දීම සඳහා කියලා මා විශ්වාස කරනවා. මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා පනත්වල පැහැදිලිව දක්වා තිබෙනවා, ඒ අදාළ බල ප්‍රදේශයේ ඉඩම් ගනුදෙනු විමේදී මුද්දර ගාස්තු ඒ අදාළ පළාත් පාලන ආයතනවලට ලැබිය යුතුයි කියලා.

අපට තිබෙන අත් දැකීම තමයි ඒ මුද්දර ගාස්තු පළාත් පාලන ආයතනවලට ලැබෙන්නේ අවුරුද්දක් දෙකක් විතර ගියාට පස්සෙයි කියන එක. අපි දන්නවා, ඒ සඳහා සමහර පළාත් පාලන ආයතනවල සභාපතිතුමන්ලාට තමන්ගේ කාර්ය මණ්ඩලයේ අය දවස් දෙකක් තුනක් කොළඹට එවන්න සිදු වනවාය කියලා. එතකොට ඒ අයගේ කාර්යක්ෂමතාව පිරිහෙනවා. නමුත් මේ වැඩ පිළිවෙළ අනුව ඒ ඔප්පුවේ අදාළ පළාත් පාලන ආයතනයේ නම සඳහන් වනවා. ඒ වාගේම අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම සඳහන් වනවා. ඒ වාගේම මම හිතන්නේ අනෙක් සංශෝධනය අනුව මාසික ලැයිස්තුවේ පිටපතක් ලැබෙනවා කියලායි. සාමාන්‍යයෙන් නොතාරිස්වරු මාසික ලැයිස්තුවේ පිටපතක් පළාත් පාලන ආයතනයට යවන්නේ නැහැ. ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයට විතරයි යවන්නේ. මේ ආඥාපනතේ සංශෝධනය අනුව මාසික ලැයිස්තුවේ පිටපතක් හැම පළාත් පාලන ආයතනයකටම යනවා. එතකොට පළාත් පාලන ආයතනයේ ප්‍රධානියා දන්නවා, තමන්ගේ බල ප්‍රදේශයේ ඉඩමක් හුවමාරු වුණා කියලා. ඒක මාසයක් ඇතුළත අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රධානියාට දැන ගන්න ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අපි දන්නවා, ඔබතුමාත් නියෝජනය කරන හබරාදූව, උණවටුන, හික්කඩුව වැනි ප්‍රදේශවල අද වන විට විදේශිකයෝ, එහෙම නැත්නම් වෙනත් ලොකු සමාගම් ඇවිල්ලා විශාල ඉඩම් හුවමාරුවක් වන බව. නමුත් අපේ ප්‍රදේශවල පළාත් පාලන ආයතන ඒ සම්බන්ධයෙන් දැනුවත් වෙලා නැහැ. උදාහරණයක් හැටියට මම කියන්නම්, පසු ගිය මාසයේ හික්කඩුව නගර සභාවේ සභාපතිතුමාට නිලධාරින් කොළඹට එවන්න සිද්ධ වුණ කාරණය. එහෙම ඇවිල්ලා පසු ගිය අවුරුදු දෙකට රුපියල් ලක්ෂ 60ක මුදලක් එකතු කර ගන්න වුණේ මේ අවුරුද්දේයි. අපි දන්නවා, අද පළාත් පාලන ආයතන තමන්ට ලැබෙන මුදලින් අතිවිශාල වැඩ කොටසක් කරන බව. ගමේ ජනතාව වෙනුවෙන් වීදි ලාම්පු දමන එක, එහෙම නැත්නම් බෝක්කුවක් හදන එක, පාර සකස් කරන එක අයිති වෙලා තිබෙන්නේ පළාත් පාලන ආයතනයටයි. මේ සංශෝධනය හරහා පළාත් පාලන ආයතනවලට මුදල් ලැබීම තුළින් ඉතා කාර්යක්ෂම ආකාරයට ජනතා සේවයක් කරන්න පුළුවන් කියන කාරණයයි අපි කියන්නේ. ඒ නිසා අපේ ගරු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාටත්, අපේ රජයටත් මේ සම්බන්ධයෙන් නැවත වතාවක් ස්තුතිවන්ත වන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට අමතරව මම කියන්න කැමැතියි, 2010 අවුරුද්ද ඇතුළත ඔප්පු 9,93,420ක් ලියා පදිංචි කර තිබෙන බව. ඒවායේ දෙවැනි පිටපත් 7, 18,927ක් භාර දීලා තිබෙනවා. එයින් අපට හිතා ගන්න පුළුවන් කොපමණ මුදල් ප්‍රමාණයක් අපට ලැබෙනවාද කියන එක. 2009 අවුරුද්දේ මෙවැනි ඉඩම් ගනුදෙනුවලින් රුපියල් මිලියන 1,143ක් රජයට ලැබිලා තිබෙනවා. ඒ වාගේම 2010 අවුරුද්දේ රුපියල් මිලියන 642ක මුදලක් ලැබිලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2009 අවුරුද්දේ බස්නාහිර පළාතේ විතරක් - ගම්පහ, කොළඹ සහ කළුතර දිස්ත්‍රික්කවල- රුපියල් මිලියන 105ක මුදලක් හුවමාරු වෙලා තිබෙනවා. 2010 අවුරුද්දේ රුපියල් මිලියන 195ක මුදලක් ලැබිලා තිබෙනවා. මේ මුදල් සියල්ලම යන්නේ පළාත් පාලන ආයතනවලටයි. ඒ නිසා මේ මුදල් ඉතාම කඩිනමින් පළාත් පාලන ආයතනවලට ලබා ගැනීමෙන් පළාත් පාලන ආයතනවලින් අපේ ජනතාව ඉටු කර ගන්නට අපේක්ෂා කරන අරමුණු බොහොම ඉක්මනට ඉටු කර ගන්නට පුළුවන් කියන කාරණය අපි කියන්න ඕනෑ. අපේ අතිගරු ජනාධිපතිතුමා 2010 අවුරුද්දේ හොඳ ශක්තිමත් ආර්ථිකයක් තිබෙන ගමක් ඇති කරන බව එතුමාගේ මහින්ද චින්තන ඉදිරි දැක්ම වැඩ පිළිවෙළේ දක්වා තිබෙනවා. ඒ නිසා මෙහි අවසාන ප්‍රතිඵලය අනුව එතුමාගේ ඒ වැඩ පිළිවෙළට මේක හොඳ ශක්තිමත් අත් වැලක් වනවාය කියන කාරණය අපි මෙහිදී කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තවත් කාරණයක් කියන්නට ඕනෑ. ගරු කුමාර වෙල්ගම ඇමතිතුමා මෝටර් වාහන පනත යටතේ නියෝග දෙකක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ නියෝග අනුව ආසන පටි පැළඳීමෙන් රිය අනතුරු බොහොමයක් වළක්වා ගන්න පුළුවන්. මේ වන විට ලෝකයේ රිය අනතුරුවලින් වර්ෂයකට මිලියන 1.02ක් පමණ මිය යන බව අපි දන්නවා. නමුත් මේ රිය අනතුරුවලින් බොහොමයක් වළක්වා ගත හැකි රිය අනතුරුයි. ඒ නිසා ආසන පටි පැළඳීමෙන් රිය අනතුරු බොහොමයක් වළක්වා ගන්න පුළුවන්. ඒ වාගේම රිය අනතුරු වැළැක්වීම නිසාත් රටේ ආර්ථිකයට ලොකු පිටිවහලක් ලැබෙනවා. මොකද එතකොට රෝහල්ගත වන ප්‍රමාණය අඩු වෙනවා. ඒ නිසා මේ සියලු කරුණු සංකලනය කරලා බැලීමේදී අද ඉදිරිපත් කරපු සංශෝධන පනත් කෙටුම්පත් සහ ගැසට් රෙගුලාසි මේ රටේ ජනතාවගේ සුබසිද්ධිය සඳහා ඉදිරිපත් කරන ලද ඒවායි කියන කාරණය ප්‍රකාශයට පත් කරමින්, අපේ ගරු ඇමතිතුමන්ලා දෙදෙනාටම අපේ ගෞරවය සහ ස්තුතිය පුද කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

මීළඟට ගරු සරණ ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[අ. භා. 6.06 ]

**ගරු සරණ ගුණවර්ධන මහතා (ඛනිජ තෙල් කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சரண குணவர்தன - பெற்றோலியக் கைத்தொழில்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sarana Gunawardena - Deputy Minister of Petroleum Industries)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ගරු සභාවට වැදගත් පනත් කෙටුම්පත් කීපයක් ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ එක් පනත් කෙටුම්පතක් ගැන කථා කිරීමට මා අදහස් කරනවා. ඒ හා සම්බන්ධව ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න ඇමතිතුමාට ප්‍රථමයෙන්ම අපේ ගෞරවය පුද කරනවා. නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත සහ ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව තමයි අප මේ සාකච්ඡා කරන්නේ.

නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධව කිව්වොත්, එය මීටත් වැඩිය පුළුල් ලෙස සාකච්ඡා කළ යුතු පනත් කෙටුම්පතක්. ඒ මන්ද කියනවා නම්, මේ නොතාරිස්වරුන්ගේ කාර්ය භාරය, ඒ හා සම්බන්ධ අනිකුත් සිද්ධීන් වාගේම ඒ හා සම්බන්ධ අනිකුත් කටයුතුවලදී මෙය අපට ඉතාම වැදගත් වෙනවා. විශේෂයෙන්ම අපේ ගම්පහ දිස්ත්‍රික්කයට ලොකු අඩු පාඩුවක්ව තිබුණු දෙයක් තමයි අද මේ සම්පූර්ණ කරන්න යන්නේ. මෙය මුළු රටටම ප්‍රයෝජනවත් වෙනවා වාගේම අප දිස්ත්‍රික්කයටත් ඉතාමත් වැදගත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමන්ගේ ඔප්පුවක් අදාළ නොතාරිස්වරයා විසින් සහතික කිරීමේදී ඒ නොතාරිස්වරයා පසු ගිය කාලයේදී, නැත්නම් මේ වෙන කොට සඳහන් කරපු ආකාරයත්, මේ පනත සංශෝධන වීමත් එක්ක සඳහන් කරන ආකාරයත් අතර ලොකු පැහැදිලි කිරීමක් තිබෙනවා. අප දන්නවා ඉස්සර ඔප්පුවක් ලියාපදිංචි කළාම -register කළාම- ඒකේ සඳහන් වුණේ පත්තුව, කෝරළය, තුලාන ආදී වශයෙන් බව. අද මේ පනත සංශෝධනය කිරීමත් එක්ක එය පැහැදිලිව පළාත් පාලන ආයතන -මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා- වශයෙන් පැහැදිලිව සඳහන් වෙනවා. එපමණක් නොවෙයි, මේ පනත් සංශෝධනය තුළින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, ග්‍රාම නිලධාරි කොට්ඨාසය කියන මේ සෑම ප්‍රදේශයක්ම නියෝජනය වීම තුළින් ඒ ප්‍රදේශයට, එහෙම නැත්නම් ඒ පළාත් පාලන ආයතනයට විශාල ශක්තියක් එනවා.

අප දන්නවා, පළාත් පාලන ආයතනයක් හුඟක් වෙලාවට ශක්තිමත් වෙන්නේ පළාත් සභාවේ ආධාර අරගෙන, නැත්නම් මධ්‍යම රජයෙන් ආධාර අරගෙන බව. ඒ ගනු ලබන ආධාරවලින් සෑහීමකට පත් වෙලා වැඩ කළත් ඔවුන්ට ලැබෙන අනිකුත් අපේක්ෂිත ආදායම් දිහා බලන කොට අපට පේනවා, කලට වේලාවට මේ ආදායම් ලැබෙන්නේ නැති බව. බදු මුදලක් එකතු කරපු පලියට, එහෙම නැත්නම් පොළකින්, කඩ සාප්පුවකින් යම් මුදලක් එකතු කළාට ජනතාව මත බර පටවන්නේ නැතිව කටයුතු කරන කොට ඒ ආදායම්වලින් සෑහීමකට පත් වෙන්න බැහැ.

ගරු ඇමතිතුමනි, අපේ ප්‍රදේශයේ තිබෙන විශාලම ප්‍රශ්නයක් ගැන තමයි මම දැන් ඔබතුමාට කියන්න යන්නේ. අපේ ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාත් මේ ගරු සභාවේ දැන් ඉන්නවා. ගම්පහ දිස්ත්‍රික්කයේ තිබෙන ඉඩම්වල මිල දිහා බැලුවාම අතිවිශාල මුදලක් පර්චස් එකකට අය කරනවා. එහෙම නැත්නම් තක්සේරු කරනවා. හැබැයි මෙකේ නියමිත මුදල, නැත්නම් නියමිත වටිනාකම ඔප්පුවෙන් ලැබෙන්නේ නැහැ. ඒක ලොකු අඩු පාඩුවක්. ඒකට මූලික හේතුව තමයි මේ පළාත් පාලන ආයතනය නොතාරිස්වරයාත් එක්ක සම්බන්ධ වීමක් නැතිකම. ඒ සම්බන්ධ නොවීම තුළ ඒ නොතාරිස්වරයා විසින් කරන කාර්ය භාරය ප්‍රාදේශීය සභාව දන්නේ නැහැ. මා උදාහරණයක් කියන්නම්. වෙන්දේසි කරන ඉඩමක් තමන්ගේ පිඹුරු පත අනුමත කර ගන්නට සැලැස්ම ඉදිරිපත් කරන කොට, ඔවුන් ඔවුන්ගේ ඉඩමේ තිබෙන පර්චස් ප්‍රමාණය, නැත්නම් ඒකේ තිබෙන කැලි ප්‍රමාණය සහ තක්සේරු මුදල ලේඛනගත කරනවා. හැබැයි ඔප්පුවක් ලියන්න ගියාම ඒ මුදල පළාත් පාලන ආයතනයට ඉදිරිපත් කළත් නොතාරිස්වරයා ළඟ ඒ කටයුත්ත සිද්ධ වන්නේ නැහැ. ඒ නිසා මෙතැනදී කතන්දර දෙකක් තමයි සිදු වන්නේ.

ඒ අනුව බලන කොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, පළාත් පාලන ආයතනය එහෙම නැත්නම් ග්‍රාම නිලධාරි කොට්ඨාසයත් සම්බන්ධ වෙලා ඒ නොතාරිස්වරයා විසින් ඉදිරිපත් කරන එහෙම නැත්නම් ලියාපදිංචි කිරීම සඳහා සහතික කරන ඔප්පු ටිකේ මාසික ලැයිස්තුවක් ලබා ගන්න කටයුතු කරන්න ඕනෑ. අපි හිතමු මා නියෝජනය කරන අපේ අත්තනගල්ල ප්‍රාදේශීය සභාවට එවැනි ලැයිස්තුවක් යවනවාය කියලා. එතැනදී අපේ සභාපතිතුමාට පුළුවන්, කාර්ය මණ්ඩලයක් යොදවලා කොච්චර ඉඩම් ප්‍රමාණයක් මාසිකව හුවමාරු වනවාද, ඒ ඉඩම්වල කොච්චර තක්සේරුවක් කරලා තිබෙනවාද, ඒ තක්සේරුවෙන් කොච්චර මුදලක් පළාත් පාලන ආයතනයට ලැබෙනවාද කියන එක පැහැදිලිවම බලන්න. උදාහරණයක් විධියට, එක් ග්‍රාම නිලධාරි කොට්ඨාසයකින් පර්චස් 15ක ඉඩමක් නිශ්චිත විධියට ලියාපදිංචි කරලා යම් කිසි මුදලක් ආවා නම්, තව මාස දෙකකින් එම ග්‍රාම නිලධාරි වසමේම එවැනිම ඉඩම් ප්‍රමාණයක් ලියාපදිංචි කරලා ඊට වඩා අඩු මුදලක් එන්න පුළුවන්. ඒ කියන්නේ, සමහර විට එම ඔප්පුව එම මුදලටම අවුරුදු දෙකක්, තුනක් ගියත් ලියන මට්ටමක් තිබෙනවා. ඒ නිසා මේ පනත් කෙටුම්පත ඉතාම වැදගත් පනත් කෙටුම්පතක්.

මෙම පනත් කෙටුම්පතින් ජනතා අපේක්ෂා ඉටු කරන්නට පළාත් පාලන ආයතනයට ඍජුව හෝ වක්‍රානුසාරයෙන් ශක්තිය ලැබීම ඉතාම වැදගත් කොට සලකනවා. මොකද, පළාත් පාලන ආයතනවලට අයත් මුද්දර ගාස්තු මෙතෙක් කල් එකතු කළේ පළාත් සභාවෙන්. සමහර වෙලාවට පළාත් සභාවට ගිහිල්ලා ඒ මුද්දර ගාස්තු ඉල්ලන කොට කියනවා, "මේක අදාළ පළාත් පාලන ආයතනයට සම්බන්ධයිද කියලා හොයලා බලන්න ඕනෑ"ය කියලා. අපි දන්නවා සමහර අතුරු මාර්ගවල මාර්ගය අයිති එක ආයතනයකට; ඉඩම අයිති තව තැනකට. ඒ ආදී වශයෙන් විශාල ගැටලු සහගත තත්ත්වයන් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මතක් කරන්න ඕනෑ තව කාරණයක් තිබෙනවා. මේ ඔප්පු ලිවීමේදී මුද්දර අලවනවා. ඉස්සර නම් මුද්දර අලවන දිනය පළමු වැනිදා නම් ඒ මාසයේ 31 වැනිදාට අමතරව තව දින පහළොවක් ඇතුළත ඔප්පුව ලියාපදිංචි කරන්න පුළුවන්. දැන් අද බැංකු ක්‍රමයට ඒ කියන්නේ, බැංකුවට ගිහිල්ලා සල්ලි බැඳලා receipt එක අලවන්න පුළුවන්. යම් වෙච්ච සිද්ධියක් නිසායි මා මෙය ගරු සභාවේ මතක් කරන්නේ. උදාහරණයක් වශයෙන් ගත්තොත්, ඔප්පුවේ වටිනාකම රුපියල් එක්ලක්ෂ අනූනවදහසයි නම් සිංහල භාෂාවෙන් එක් ලක්ෂය කියන එක අයින් කරලා අනූනවදහසක් ලියලා, බැංකුවෙන් සහතික කරලා receipt එක ආවාට පස්සේ පරිගණකයෙන් ඉලක්කම්වලින් සඳහන් කරලා තිබුණත් අතින්

[ගරු සරණ ගුණවර්ධන මහතා]

එක්ලක්ෂය කියන එක ලියලා අදාළ ඉඩම් කන්තෝරුවේ නිලධාරින් සමඟ සම්බන්ධ වෙලා කටයුතු කළොත් රජයට ඉතා විශාල ආදායමක් අහිමි වෙනවා. ඔප්පුව ලියාපදිංචි වෙනවා. ඒවා සොයා බලන්න වැඩිපුර නිලධාරින් ප්‍රමාණයක් මේවාට යෙදවීම පමණක් නොවෙයි, ඒ හා අවශ්‍ය කරන ඉඩ කඩ, වටපිටාව සකස් කිරීමත් ඉතාම වැදගත් කියා මා හිතනවා. මොකද, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මහත්වරුනුත් ඉන්න නිසායි මා මෙය මතක් කරන්නේ. මම ඊයේ පෙරේදා දිනක ඔප්පුවක් ලිව්වා. ඒකේ මුදල සඳහන් වෙලා තිබුණේ අනූනවදහසයි. අපි මේක හෙව්වා බැංකු ණයක් ගන්න ගියාම. එහිදී අදාළ නීතිඥවරයා මොකක්ද කියන්නේ? "සමා වෙන්න, මහත්තයෝ. ඒක මම නොවෙයි කළේ. මගේ නිලධාරියෙක් යැව්වා. දැන් ඒක නිවැරදි කරන්නම්" කියලා කිව්වා. එතැනම රුපියල් ලක්ෂයකින් ලැබෙන ආදායම රජයට අහිමි වන විධියට වංචා වන ආකාරයෙන් එහෙම නැත්නම් වැරදි ආකාරයෙන් කටයුතු සිදු වෙලා තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එපමණක් නොවෙයි. නීතිඥ මහත්මයෙක් මිය ගියාමත් ඒ අයගේ නමින් සමහර වෙලාවට ඔප්පු ලියනවා. සමහර වෙලාවට නීතිඥ මහත්මයා ඉන්නවා, වයස්ගතයි. එයාගේ නමින් වෙනත් අය ඔප්පු ලියනවා. අපි දන්නවා, අපේ ගම්පහ ප්‍රදේශයේ පාසල්වලට දරුවන් ඇතුළත් කරන්න යන අවස්ථාවලදී මේ ඔප්පු හුවමාරු, එහෙම නැත්නම් බදු ඔප්පු හුවමාරු සම්බන්ධයෙන් විශාල ප්‍රමාණයේ වැඩ කටයුත්තක් කෙරෙන බව. ඒ නිසා මේ ගැනත් විශේෂ අවධානයක් යොමු කිරීම වැදගත්. මේ පනත් කෙටුම්පත ශක්තිමත් පනත් කෙටුම්පතක්. ඒ වාගේම මේ තුළින් රටට විශාල වැඩ කොටසක් කරන්න පුළුවන්. මොකද, ප්‍රාදේශීය සභාවට මුදල් ලැබෙනවා කියන්නේ ගමට වැඩ කරනවා කියන එකයි. ගමේ බෝක්කුව හදන එක, වීදි ලාම්පු සවි කරන එක, ට්‍රැක්ටර් පැන්නුමක් හදන එක, මේ කටයුතු කෙරෙන්නේ ප්‍රාදේශීය සභාවෙනුයි. මේ ආකාරයෙන් විශාල වැඩ කොටසක් කරනවා. ඒ නිසා මේ පනත් කෙටුම්පත ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් නිසා මේ ගැනත් විශේෂයෙන් අවධානය යොමු කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඉස්සෙල්ලාත් ප්‍රකාශ කළා, නීතිඥ මහත්වරුන්ගේ නමින් මේ කටයුත්ත කිරීමේදී විශාල වශයෙන් අතරමැදි පුද්ගලයන් මාර්ගයෙන් මේ කටයුත්ත සිද්ධ වනවාය කියා. ඒ ගැනත් සොයා බලන්නය කියලා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම මේ දවස්වල සාකච්ඡා වනවා, රජයට සතු දේපොළ සම්බන්ධයෙන්. අපි දන්නවා සමහර ඔප්පු තිබෙනවා රුපියල් 2.50ටත් ලියාපු. ඒ වාගේම මේ දිනවල සාකච්ඡා වනවා, රාජ්‍ය දේපොළ තව කෙනෙකුට පවරා ඒවා අසාර්ථක වුණාම ඒවා පවරා ගන්න එක සම්බන්ධයෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගැනත් සොයා බලන්න වෙනවා. ඒ දීපු අක්කර සිය ගණනක, දහස් ගණනක, හෙක්ටෙයාර භාරපන්සියයේ, තුන්භාර දහසේ ඉඩම් ප්‍රමාණය සම්බන්ධයෙන් අපි සොයා බලන්න ඕනෑ. ඒවා බදු මත දුන්නාද; එහෙම නැත්නම් සෘජුව විකුණුවාද, ඒවාට දමලා තිබෙන මුළු මුදල කොපමණද, ඒ හා සම්බන්ධ වෙලා කොච්චර මුදලක් ආණ්ඩුවට ගෙවලා තිබෙනවාද කියා සොයා බලන්න ඕනෑ. ඒ විධියට ගත්තාම මේ කාරණය සමස්ත ලංකාවටම බලපානවා. ඒ නිසා එවැනි ආකාරයේ ඔප්පු ලිවීම සම්බන්ධයෙනුත් සොයා බැලීම සුදුසුයි.

අපි දන්නවා රුපියල් 100ට 200ට අක්කර 100, 200 ලියා තිබෙන බව. ඒ වෙනුවෙන් ආණ්ඩුවට ගෙවන ගණන කොපමණද? එහෙම නැත්නම් ගෙවන මුදලින් අදාළ පළාත් පාලන ආයතනයට ලැබෙන ගණන කොපමණද? නමුත් අදාළ පළාත් පාලන ආයතනය ගිහිල්ලා ඒ කර්මාන්තශාලාව ආශ්‍රිතව; එහෙම නැත්නම් ඒ ඉඩම ආශ්‍රිතව යටිතල පහසුකම් සැපයීම ආදිය කරනවා. ගන්නා මුදලටත් වඩා විශාල වශයෙන් වැය කරලා වර්ෂයක් වර්ෂයක් පාසා ඒවා නඩත්තු කරනවා.

මෙවැනි යෝජනාවක් මේ සභාවට ගෙන ඒම රජය අපේක්ෂා කරන වැඩ පිළිවෙළට, එහෙම නැත්නම් රජය බලාපොරොත්තු වන වැඩ පිළිවෙළට ඉතාම ශක්තියක් වන බව මතක් කරනවා. ගරු ඇමතිතුමාටත්, එම නිලධාරි මණ්ඩලයටත් අපේ ගෞරවය සහ ස්තුතිය පුද කරමින් මේ සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවගේ සහයෝගයත් ලබා දෙන බව ප්‍රකාශ කරමින් මා නවතිනවා. ස්තුතියි.

[අ. භා. 6.17]

**ගරු වයි.ජී. පද්මසිරි මහතා**
(மாண்புமிகு வை.ஜீ. பத்மசிரி)
(The Hon. Y.G. Padmasiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ඉතාම වැදගත් ආඥාපනත් දෙකක් පිළිබඳ සංශෝධන ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ පිළිබඳව දීර්ඝ සාකච්ඡාවක් සිදු වෙලා තිබෙන අවස්ථාවේදී නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත සහ ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව මාත් අදහස් බිඳක් සභාව හමුවේ තබන්න බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම වංචා ප්‍රයෝග පිළිබඳව අද අපේ ගරු මැති-ඇමතිතුමන්ලාගේ කථාවල සඳහන් වුණා. වංචා ප්‍රයෝගවලට බොහෝ දීර්ඝ ඉතිහාසයක් තිබෙනවා. කොයි කාලයේදී ඒවා කරන්න පුරුදු වුණාද කියන එක නිශ්චිතව කියන්න පුළුවන්කමක් අපට නැහැ. නමුත් අපි දන්නවා අපේ රටේ පළමුවෙන්ම, 1840 අංක 07 දරන ආඥාපනතින් වංචා ප්‍රයෝග වැළැක්වීම පිළිබඳව යම් පියවරක් නීතිමය වශයෙන් අර ගෙන තිබුණු බව. යම් දේපළක් -නිශ්චල හෝ චංචල දේපළක්- කෙනකුට දෙනවා නම් සාක්ෂි දෙකක් ඉදිරිපිට තමයි දීමනාකරුගෙන් අත්සන් ගන්නේ. ඒක තමයි ක්‍රමය. එය ආරම්භ වෙලා තිබෙන්නේ 1840 අංක 07 දරන වංචා ප්‍රයෝග වැළැක්වීමේ ආඥාපනත යටතේයි. නොතාරිස් ආඥාපනතටත්, ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතටත් මූලික පදනමක් වුණේ මේ ආඥාපනතයි කියා කිව්වොත් ඒක ඉතාම නිවැරැදියි.

අද ඉදිරිපත් කර තිබෙන සංශෝධනය විශේෂයෙන්ම බලපාන්නේ පළාත් පාලන ආයතනවලටයි. දේපළ පැවරීමේදී ලැබෙන ආදායම, මුද්දර ගාස්තු පළාත් පාලන ආයතනවලටයි ලැබිය යුතුව තිබුණේ. නමුත් 1988 සිට ක්‍රියාත්මක වන පළාත් සභා ක්‍රමයත් එක්ක ඒවා එකතු කිරීමේ බලය පළාත් සභාවලට දුන්නා. ගරු මොහාන් මන්ත්‍රීතුමාගේ කථාවේදී ප්‍රකාශ කළා වාගේ එතැන් සිට ගත වූ වසර 20ක 22ක පමණ වූ කාලය තුළම පළාත් පාලන ආයතන ලොකු ප්‍රශ්නයකට මුහුණ දුන්නා. තමන්ට ලැබිය යුතු ආදායම පළාත් සභාවෙන් ලබා ගැනීමට විශාල වෙහෙසක් දරන්න සිදු වුණා. ඒ වෙනුවෙන් රෙජිස්ට්‍රාර් කාර්යාලයට යන්න ඕනෑ. ලිපිකරුවකු දෙදෙනකු යොදවන්න ඕනෑ. ඒ ඒ මාසවල තමන්ගේ ප්‍රදේශයට අයිති ඉඩම් සම්බන්ධයෙන් ලියපු ඔප්පුවල තොරතුරු ඒකරාශි කරන්නම සෑහෙන කාලයක් තිස්සේ මහන්සියක් දරන්න සිද්ධ වුණා. බොහොම ප්‍රමාද වෙලා -අවුරුදු 20ක් විතර ගත වෙලා- හෝ අදින් පස්සේ පළාත් පාලන ආයතනවලට පුළුවන් වෙලා තිබෙනවා තමන්ගේ ආදායම පළාත් සභාවලින් ඉතාම පහසුවෙන් ගන්න. මේ නව සංශෝධනය යටතේ ඒ කටයුත්ත කරන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ සඳහා පියවර ගැනීම පිළිබඳව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු භාර ගරු අමාත්‍යතුමාට අපේ ස්තුතිය පිරිනමනවා. පළාත් සභා ක්‍රමයටත්, පළාත් පාලන ආයතනවලටත් ලබා දුන්නු ශක්තියක් හැටියටයි අප මෙය දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආඥාපනත් දෙකම බොහොම කලාතුරකින් සංශෝධනය වන ආඥාපනත් දෙකක්. අවුරුදු 10කින්, 15කින්, 20කින් විතර තමයි පුංචි සංශෝධනයක් හෝ එකතු වන්නේ. මේවා, ඒ තරම්ම ප්‍රබලව ක්‍රියාත්මක වන ආඥාපනත් දෙකක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නොතාරිස් තනතුර කියන්නේ විශ්වාසය සහ අවංකභාවය මත පදනම් වුණු තනතුරක්. ඒ විශ්වාසය රැකෙන ආකාරයට, අවංකභාවය ආරක්ෂා වන විධියට අවශ්‍ය නීතිරීති ඒ ආඥාපනතේ තිබෙනවා. අපි දන්නවා පැරැණි නොතාරිස්වරුන් ඒ ගෞරවාන්විත තත්ත්වය ආරක්ෂා කරන්න වැඩ කර තිබෙන බව. අතරින් පතර සමහර අය වැරැදි කරන්න පුළුවන්. නමුත් මේ වෘත්තියේ යෙදෙන වැඩි දෙනා බොහොම අවංකභාවයකින් කටයුතු කරනවා.

මේ ආඥාපනතේ යම් යම් අඩු පාඩු තිබෙනවා; සංශෝධනය විය යුතු තැන් තිබෙනවා. උදාහරණයක් වශයෙන් එහි තුන්වන උපලේඛනයේ තිබෙන ගාස්තු චක්‍රය ගෙන බැලුවොත්, එය කවදාවත් ක්‍රියාත්මක නොවන එකක් බව පෙනෙනවා. මට මතක හැටියට, යම් බදුකරයක් ලිව්වාම අය කරන්න පුළුවන් ගාස්තුවක් හැටියට ශත හැත්තෑපහ, රුපියල වාගේ මුදලක් තමයි නියම කර තිබෙන්නේ. ඉතින් කොහේද මේවා ක්‍රියාත්මක වන්නේ? මුළු ගාස්තු චක්‍රයම, ඒ උපලේඛනයම ඉවත් කරන්න සිද්ධ වෙලා තිබෙනවා.

ඒ වෙනුවට ආදායම් බදු දෙපාර්තමේන්තුවත්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයත්, පළාත් සභා එක්ක සාකච්ඡා කරලා ආදායම් බදු ලබා ගැනීමේ ක්‍රමයක් හැටියට යම් කිසි වැඩ පිළිවෙළක් යෙදුවොත්, ඔප්පු ලියන නොතාරිස්වරුන්ගෙන් හා නීතිඥවරුන්ගෙන් ඒ ලියන ඔප්පුවලට ඒ මාසයේම වුණත් උපයන විට බදු ගෙවීමේ ක්‍රමයක් හදන්න පුළුවන්. අපේ භාණ්ඩාගාරයට, රජයට වැඩි ආදායමක් ලබා ගන්න ක්‍රමයක් හැටියට ඒ පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න මා කැමැතියි.

ඉඩම් පිළිබඳව ගරු සරණ ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාවේදී කියවුණා. මේ දේපොළ වටිනාකම් අඩු කරනවා. ඒක මහදී ගනුදෙනු කර ගෙන එනවා. නොයෙකුත් දේවල් වනවා. ඉතින් ඒ සඳහා සුදුසු එක් පියවරක් හැටියට මට මේ යෝජනාව ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ ඒ ප්‍රාදේශීය සභා හෝ පළාත් පාලන ආයතනවල නාගරික සහ ග්‍රාමීය වශයෙන් තිබෙන යම් කිසි ඉඩම් පිළිබඳව තක්සේරු දෙපාර්තමේන්තුව ලවා යම් වටිනාකමක් තක්සේරු කරන්න. ඒක වරිපනම් බදු වාගේ අවුරුදු කිහිපයකට වරක් අසවල් ප්‍රමාණය වැඩි කරනවාය කියලා යම් ප්‍රමාණයකින් වැඩි කරලා, ස්ථාවර වටිනාකමක් පෙන්වුවොත් අපට මීට වඩා ආදායමක් ලබා ගන්න පුළුවන්ය කියන එක පෙනෙන්න තිබෙනවා. එම නිසා මෙවැනි හිඩැස් වහලා, වංචා, ප්‍රයෝගවලට තිබෙන ඉඩ අඩු කරලා, වැඩි ආදායමක් ලබා ගන්නා අතරම නොතාරිස් වෘත්තිය තුළින් සාධාරණ සේවාවක් කර ගැනීමටත් අවශ්‍ය විධිවිධාන අනාගතයේදී යොදන්නය කියා ගරු අමාත්‍යතුමාගෙන් මා විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ඒ ලියා පදිංචි කිරීමේ කාර්යාල මීට වඩා ආදායම් උපයන මධ්‍යස්ථාන බවට පත් කර ගන්න පුළුවන්. බලන්න, ලේඛන ලියා පදිංචි කිරීම යටතේ ලේඛන කීයකින්ද ලියා පදිංචි කිරීමේ ගාස්තු අය වන්නේ කියලා? බොහොම කිහිපයකින් තමයි අය වන්නේ. එම නිසා ලියා පදිංචි කරන සෑම ලියවිල්ලකින්ම ලියා පදිංචි කිරීමට යම් කිසි ගාස්තුවක් අය කිරීමක් කළොත් හොඳයි. උදාහරණයක් වශයෙන් බලන්න, කේවියට් තහනමක් ලියා පදිංචි කරන්න අය කරන ගාස්තුව රුපියල් 12.50යි. ඒ යටතේ යම් වෙන්දේසි සමාගමක් ඒ ඉඩම් කැබැල්ලටත්, ඒ ඉඩම් කැබැල්ල සහිත පාරවල් කිහිපයකටත් කේවියට් තහනමක් ලියාපදිංචි කළොත්, ඒ කේවියට් තහනමට අදාළ ඉඩම් අයිතිකරුට ඒ පිළිබඳව නැවත දැනුම් දෙන්න සිද්ධ වුණොත්, ලියා පදිංචි තැපෑලෙන් දැනුම් දෙන්න විශාල මුදලක් වැය වනවා. ඒ සියල්ල රජයේ ගාස්තුවලින් දරන්න වන්නේ. එම නිසා මේ සිදුරු වහලා, වැඩි ආදායමක් සොයන්න පුළුවන් විධියටත්, ඒ ආඥාපනතේ පදනම රැක ගෙන වංචාකරුවන් නීතියේ රැහැනට අසු වන්නත්, සාධාරණව ආදායමක්, බද්දක් රජයට ලබා ගන්නත් පුළුවන් වන විධියට ඉදිරි කාලයේදී යම් වෙනස්කම් ඇති කරන්න අපේ ඇමතිතුමාට හැකි වේවා!යි කියා මා ප්‍රාර්ථනා කරමින්, මේ සංශෝධන ඉතාම අගය කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." --[ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]***
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. W.D.J. Senewiratne]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[මූලාසනාරූඪ මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[MR. PRESIDING MEMBER in the Chair.]*

***1 සිට 5 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 5ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 5 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendments.*

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
I move,

"That the Bill be now read the Third time."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත
## ஆவணங்கள் பதிவு (திருத்தம்) சட்டமூலம்
## REGISTRATION OF DOCUMENTS (AMENDMENT) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பீற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
I move,

"That the Bill be now read a Second time."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය."--[ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]***
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. W.D.J. Senewiratne]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[මූලාසනාරූඪ මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[MR. PRESIDING MEMBER in the Chair.]*

***1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 3ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 3 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendments.*

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
I move,

"That the Bill be now read the Third time."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## මුදල් පනත : නියෝගය
## நிதிச்சட்டம் : கட்டளை
## FINANCE ACT: ORDER

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2)වැනි ව්‍යවස්ථාව සහ 2004 අංක 11 දරන මුදල් පනතේ 22වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 26වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2011අගෝස්තු 04 දිනැති අංක 1717/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.10.18 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## මෝටර් වාහන පනත : නියෝග
## மோட்டார் வாகனச் சட்டம் : ஒழுங்குவிதிகள்
## MOTOR TRAFFIC ACT : REGULATIONS

### I

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
Sir, on behalf of the Hon. Minister of Transport, I move,

"That the Regulations made by the Minister of Transport under the Sections 141, 143, 144, 168 and 190 read with Section 237 of the Motor Traffic Act (Chapter 203), and published in the Gazette Extraordinary No. 1717/14 of August 03rd, 2011, which were presented on 18.10.2011, be approved."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### II

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
Sir, on behalf of the Hon. Minister of Transport, I move,

"That the Regulations made by the Minister of Transport under the Sections 19 and 157 A read with Section 237 of the Motor Traffic Act (Chapter 203) and published in the Gazette Extraordinary No. 1718/12 of August 09th, 2011, which were presented on 18.10.2011, be approved."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## 2012 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන් තෝරාගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂයන් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වන විශේෂ කාරක සභාව

## 2012 ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்ட மதிப்பீடுகளிலிருந்து தெரிவு செய்யப்பட்ட அமைச்சுக்களின் செலவுத் தலைப்புக்கள் பற்றிக் கலந்துரை யாடுவதற்கான தெரிகுழு

## SELECT COMMITTEE TO DISCUSS THE HEADS OF EXPENDITURE OF MINISTRIES SELECTED FROM THE BUDGET ESTIMATES OF THE YEAR 2012

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
Sir, on behalf of the Leader of the House, I move,

"Whereas the period of time allocated to the Committee stage program for the Budget Estimates of the year 2012 is 17 days;

And whereas a period of time of approximately 2 hours have been allocated for each Head of Expenditure since Heads of Expenditure of several Ministries have to be discussed on a single day as approximately 7 1/2 hours have been allocated per day for the Committee stage program of the budget thereby limiting the period of time for the preparation of the Heads of Expenditure within each Ministry;

That this Parliament resolves that a Select Committee be appointed to enable the Members to meet and discuss during the period from the commencement of the second reading of the Appropriation Bill, i.e. from 22.11.2011 to 29.11.2011, the Heads of Expenditure of the 21 Ministries in the Annexure which were decided at the Committee on Parliamentary Business with the concurrence of the Chief Whip of the Government and the Chief Whip of the Opposition.

2. (a) The Committee and its Chairman shall be nominated by Mr. Speaker.

   (b) Notwithstanding the provisions of Standing Order 95, the Committee shall consist of not more than twenty one (21) Members selected from both the Government and the Opposition.

3. The Committee shall have power to,-

   (a) fix its quorum; and

   (b) send for persons, papers and records, order any person to attend before Parliament or before such Committee.

4. The Committee shall present its report to the Parliament on or before the day on which the Committee stage debate on the votes of the said selected Ministries commences.

Annexure:

1. Ministry of Good Governance and Infrastructure
2. Ministry of Urban Affairs
3. Ministry of Consumer Welfare
4. Ministry of International Monetary Co-operation
5. Ministry of Rural Affairs
6. Ministry of National Resources
7. Ministry of Human Resources
8. Ministry of Social Welfare
9. Ministry of Scientific Affairs
10. Ministry of Food Security
11. Ministry of Parliamentary Affairs
12. Ministry of Public Management Reforms
13. Ministry of Productivity Promotion
14. Ministry of Postal Services
15. Ministry of Public Relations and Public Affairs
16. Ministry of Disaster Management
17. Ministry of State Resources and Enterprise Development
18. Ministry of Social Services
19. Ministry of Private Transport Services
20. Ministry of Civil Aviation
21. Ministry of Technology and Research"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

## பலன புத்தர் சிலை அமைப்புச் சபை (கூட்டிணைத்தல்) சட்டமூலம்

## ORGANIZATION FOR THE CREATION OF BALANA BUDDHA STATUE (INCORPORATION) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදින්, 48(3) වන ස්ථාවර නියෝගය යටතේ, මූලාසනාරූඪ මන්ත්‍රීතුමා විසින් එය "ඒ" ස්ථාවර කාරක සභාවට පවරන ලදී.***

*சட்டமூலம் இதன்படி, இரண்டாம் முறை மதிப்பிடப்பட்டு நிலைக் கட்டளை 48(3) இன்படி நிலைக்குழு "ஏ" க்கு தலைமைதாங்கும் உறுப்பினர் அவர்களால் சாட்டப்பட்டது.*

*Bill accordingly read a Second time, and allocated by MR. PRESIDING MEMBER to Standing Committee"A" under Standing Order 48(3).*

## ශ්‍රී ධම්මාලංකාර සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
## ஸ்ரீ தம்மாலங்கார சமூக சேவைகள் மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
## SRI DHAMMALANKARA SOCIAL SERVICES FOUNDATION (INCORPORATION) BILL

***පනත් කෙටුම්පත (ස්ථාවර කාරක සභාවෙහි දී) සංශෝධනය කළ ආකාරයෙන් සලකා බැලීමේ නියෝගය කියවන ලදී.***

*[நிலைக் குழுவில்] திருத்தப்பட்டவாறு, சட்டமூலத்தைப் பரிசீலித்தற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for consideration of Bill, as amended (in the Standing Committee), read.*

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,"ශ්‍රී ධම්මාලංකාර සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත පිළිබඳ ස්ථාවර කාරක සභාවේ වාර්තාව පිළිගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

"පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියැවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill, as amended, accordingly read the Third time, and passed.*

## රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
## இராமகிருஷ்ண சாரதா மிஷன் (இலங்கைக் கிளை) (கூட்டிணைத்தல்) சட்டமூலம்
## RAMAKRISHNA SARADA MISSION (LANKA BRANCH) (INCORPORATION) BILL

***පනත් කෙටුම්පත (ස්ථාවර කාරක සභාවෙහි දී) සංශෝධනය කළ*** *ආකාරයෙන් සලකා බැලීමේ නියෝගය කියවන ලදී.*

*[நிலைக் குழுவில்] திருத்தப்பட்டவாறு, சட்டமூலத்தைப் பரிசீலித்தற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for consideration of Bill, as amended (in the Standing Committee), read.*

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත පිළිබඳ ස්ථාවර කාරක සභාවේ වාර්තාව පිළිගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

"පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියැවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill, as amended, accordingly read the Third time, and passed.*

## දෙහිවල, නැදිමාලේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)පනත් කෙටුම්පත
## தெஹிவளை - நெதிமாலை பௌத்த கலாசார நிலையம் (கூட்டிணைத்தல்) (திருத்தம்) சட்டமூலம்
## BUDDHIST CULTURAL CENTRE OF NEDIMALA, DEHIWALA (INCORPORATION) (AMENDMENT) BILL

***පනත් කෙටුම්පත (ස්ථාවර කාරක සභාවෙහි දී) සංශෝධනය කළ ආකාරයෙන් සලකා බැලීමේ නියෝගය කියවන ලදී.***

*[நிலைக் குழுவில்] திருத்தப்பட்டவாறு, சட்டமூலத்தைப் பரிசீலித்தற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for consideration of Bill, as amended (in the Standing Committee), read.*

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "දෙහිවල, නැදිමාලේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ ස්ථාවර කාරක සභාවේ වාර්තාව පිළිගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

"පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියැවිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*

*පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.*

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill, as amended, accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The Adjournment Motion to be moved by the Hon. Dayasiri Jayasekara.

## පීපල්ස් ලීසිං සමාගමේ කොටස් නිකුතුව
## பீபல்ஸ் லீசிங் நிறுவனத்தின் பங்கு விற்பனை
## ISSUANCE OF SHARES OF PEOPLE'S LEASING COMPANY

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා:

> "1995දී ආරම්භ කරන ලද මහජන බැංකුවට අනුබද්ධ පරිපාලිත සමාගමක් වන පීපල්ස් ලීසිං සමාගමට අයත් කොටස්, කොටස් වෙළෙඳ පොළට ආයෝජනය කිරීම සඳහා කටයුතු කිරීම මඟින් අපේ රටේ ප්‍රධාන රාජ්‍ය බැංකුවක් බවට කීර්තිය ලබා ඇති මහජන බැංකුව පෞද්ගලීකරණය කිරීමේ ක්‍රියාදාමය සඳහා ක්‍රියා කරන්නේද යන්න පිළිබඳව කුකුසක් බැංකු සේවයේ නිලධාරින් තුළ ඇති වී තිබේ. මහජන බැංකුවේ තැන්පත්කරුවන්ගේ සහයෝගයෙන් ක්‍රියාත්මක වන පීපල්ස් ලීසිං සමාගමට අනාගතයේ අත් වන ඉරණම පිළිබඳව මෙම පාර්ලිමේන්තුවට කරුණු දක්වන මෙන් ඉල්ලමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම කියන්න කැමැතියි "ජන හද හඳුනන මහජන බැංකුව" අවුරුදු 50ක් සම්පූර්ණ කළ කාල වකවානුව පසු ගිය දිනවලට යෙදී තිබුණා. රටේ ඉතාම කීර්තිමත් බැංකුවක් විධියට නම් දරාපු එම බැංකුව, පූර්ණ වශයෙන් මහ බැංකුවට වග කියන අතර, මූලික වශයෙන් සමන්විත වුණේ ගම්වල සිටින අහිංසක මිනිස්සුන්ගේ තැන්පතුවලින් බව අපි දන්නවා. රාජ්‍ය බැංකු දෙක අතුරින් මහජන බැංකුව විශාල වශයෙන් ග්‍රාමීය මට්ටමේ බැංකු ශාඛා ගණනාවක් අත් පත් කරගෙන තිබුණා. ඒ විතරක් නොවෙයි, විශාල පිරිසකට ශක්තිය දුන්, විශාල ව්‍යාපාරිකයන් පිරිසක් බිහි කරපු බැංකුවක් බවට මෙම බැංකුව පත් වෙලා තිබුණා. 1995 අගෝස්තු 22වැනි දින මේ බැංකුවට යම් කිසි හදිසි කාර්ය භාරයක් කරන්න සිද්ධ වුණා. මොකද, ඒ කාලයේ තිබුණු ආණ්ඩුව විධියට ගත්තොත්, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ කාලයේ එතුමිය හදිසියේ බස් රථ ගෙනැල්ලා ඒ බස් රථවලට ලීසිං පහසුකම් දෙන්න කටයුතු කළා. මොකද, ඒක ඉතාම ඉක්මන් කාර්ය භාරයක් බවට පත් වෙලා තිබුණා. ඒ කාලයේ හිටපු ආචාර්ය ගාමිණී ප්‍රනාන්දු මැතිතුමා, එම බස් රථ ටික ගෙනැල්ලා කොහොමද ඒවාට ලීසිං පහහසුකම් දෙන්නේ කියන එක ගැන කථා කළා. ඒ කාලයේ මුදල් අමාත්‍යාංශයේ හිටපු නිලධාරින් විධියට අපිත් එතුමාව බොහොම ළඟින් ආශ්‍රය කළා. ඒ වෙලාවේ එතුමා කිව්වා, මේ කාර්යභාරය බැංකුවට කරන්න බැහැ කියලා. බැංකුව ඇතුළේ ඒ වන කොට ලීසිං පහසුකම් දෙන ක්‍රමයක් තිබුණා. මූල්‍යමය කල්බදු පහසුකම්, කුලී පිට ගැනුම්, මෙහෙයුම් කල්බදු වාරික ණය, ණය සාධන පත්‍ර නිකුත් කිරීම වැනි කාර්යයන් කරපු ආයතනයක් බැංකුව ඇතුළේම තිබුණා. වාහනයක් ගන්න, ඉඩමක් ගන්න, ගෙයක් දොරක් මිලදී ගන්න මහජන බැංකුවෙන් යම් කිසි ණයක් දෙනවා නම් ඒ සඳහා වන ලීසිං පහසුකම් ටික මහජන බැංකුව ඇතුළෙන්ම දුන්නා. නමුත් හදිසියේ ඇති වුණු ඒ අවශ්‍යතාව නිසා මහජන බැංකුවේ සභාපතිතුමා කිව්වා, මේක වෙනම කාර්යභාරයක් විධියට බැංකුවට පිටස්තරව කරන්න කියලා. එහෙම පිටස්තරව පටන් ගත්තු ආයතනය තමයි "පීපල්ස් ලීසිං" කියලා පරිපාලිත සමාගමක් විධියට නැත්නම් subsidiary එකක් විධියට මේ පසු ගිය කාලවකවානුව තුළ ක්‍රියාත්මක වුණේ. බැංකු වාර්තා අනුව බලනකොට පසු ගිය අවුරුද්දේ බිලියන 10ක් මහජන බැංකුව ලාභ ලබන කොට, ඒ බිලියන 10න් බිලියන 3ක ලාභය තිබුණේ මේ පීපල්ස් ලීසිං ආයතනයේයි. පීපල්ස් ලීසිං ආයතනය සියයට සියයක් මහජන බැංකුවේ කොටස්වලින් සමන්විතයි. ඒ සමාගම සියයට සියයක් අයිති මහජන බැංකුවට. 2011.10.05 වැනි දා සිට පුවත් පත්වල සඳහන් වුණා, මහජන බැංකුවට සියයට සියයක් අයිති මෙම සමාගමේ කොටස් විකිණීමට අවශ්‍ය කරන කටයුතු කරනවා කියලා. සියයට සියයක් පූර්ණ අයිතිය මහජන බැංකුව සතු වෙලා තිබිච්ච මේ සමාගමෙන් සියයට 25ක කොටස් වෙළෙඳ පොළට නිකුත් කරන්නත්, ඒ කොටස්වල වෙළෙඳ පොළ මිල රුපියල් 18ක තියන්නත්, රුපියල් ලක්ෂ 9,828ක වටිනාකමක් තිබෙන සියයට 5ක කොටස් සංඛ්‍යාවක් පීපල්ස් ලීසිං සමාගමේ නව දෙනෙකුට බෙදලා දෙන්නත් 2011.06.30 රැස් වූ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කෙරුවා. ආණ්ඩුවේ මේ ක්‍රියාදාමය ගැන මා තර්ක කරන්නේ වෙන හේතුවක් හින්දා නොවෙයි, මේ ආණ්ඩුව පෞද්ගලීකරණයට එරෙහිව කටයුතු කරපු ආණ්ඩුවක් නිසා. මම දන්නේ නැහැ, මට තේරෙන්නේ නැහැ මේ ආණ්ඩුව කොහේ යනවාද කියලා. එක වෙලාවකට සමහර ආයතන පෞද්ගලීකරණය කරනවා. තව වෙලාවකට පෞද්ගලීකරණය කරපු ආයතන ආපහු පවරා ගන්නවා. හෙට, පෞද්ගලීකරණය කරපු ආයතන ආපහු පවරා ගන්න කටයුතු කරනවා. ඒ එක්කම සියයට සියයක් ආණ්ඩුවේ පරිපාලිත මේ සමාගම පෞද්ගලීකරණය කරනවා. [බාධා කිරීමක්] ඔව්, change of ownership. ඒක තමයි මේ කර ගෙන යන්නේ.

මම මේ කාරණයත් කියන්න කැමැතියි. අපි දන්නවා, මේ ආණ්ඩුවට තිබෙන ප්‍රශ්නය. සරත් අමුණුගම මැතිතුමා -එතුමා මුදල් ඇමති නොවෙයි ජ්‍යෙෂ්ඨ අමාත්‍යතුමා- මුදල් ඇමති වුණා නම් මීට වඩා වැඩ කොටසක් කරයි කියලා අපි විශ්වාස කරනවා. එතුමාටත් දීලා තිබෙන්නේ වැඩ බැලීමේ ජ්‍යෙෂ්ඨ ඇමතිකමක්. එතුමාගේ තර්කය, එතුමාගේ ආර්ථිකය හැසිරවීමේ ක්‍රියාවලිය අපි හොඳට දන්නවා. ඒ නිසා එතුමාගේ මතයත් එක්ක මට පරස්පරතාවක් නැහැ. එතුමා හොඳ මතයක ඉන්නේ. හැබැයි, මේ ආණ්ඩුව කරන ක්‍රියාදාමය ආරක්ෂා කරන්න ගිහිල්ලා, අද මොකක්ද මේ තමන් කථා කරන theory එක කියලා හොයා ගන්න බැරි තත්ත්වයකට එතුමා පත් වෙලා තිබෙනවා. එතුමා හොඳට theory එක දන්න ඇමති කෙනෙක්. හොඳ theoryයක් තිබෙන, හොඳ දැනුමක් තිබෙන කෙනෙක්.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

දැන් ආණ්ඩුව මේ සියයට සියයක් රජය සතු පරිපාලිත සමාගමේ සියයට 25ක කොටස්, කොටස් වෙළෙඳපොළට නිකුත් කරනවා. සියයට පහක් තමන්ගේ ගෝලයන් ටිකක් අතට දෙනවා. මම විශේෂයෙන්ම මේ ටික කියන්න කැමැතියි. දොන් පත්මසිරි කුමාරගේ මහත්මයා ගන්නවා කොටස් 42,68,850ක්. ඒ වාගේම පයාගල වඩුගේ ලයනල් ප්‍රනාන්දු මහත්මයා ගන්නවා කොටස් 13,24,875ක්. මලවිතාන තිලකංකානම්ලාගේ දමිත් ජානක මහත්මයාට කොටස් 11,79,315ක් හම්බ වෙනවා. ජිනදාස ගමගේ 11,76,210යි. ඇන්ඩ්‍රිස් රත්නායක කොටස් 10,93,905ක් ගන්නවා. රොහාන් මරිනෝ ඒඩ්‍රියන් තෙන්නකෝන්ට කොටස් 10,50,030යි. මොහොමඩ් ජාබීර්ට 9,3,270යි. ඉස්මයිල් ලෙබ්බේ අබ්දුල් ගෆාර්ට 8,92,155යි. යක්පිටියගේප්‍රේමරත්නට 8,6,850යි. මේ ඔක්කොම එකට එකතු කළාම රුපියල් 18ක් වටිනා කොටස් විශාල ප්‍රමාණයක් දෙන්න තීන්දු වෙනවා. මේ අය මේ සඳහා ආයෝජනය කරපු ප්‍රමාණය කරුණාකර අපට කියන්න. අපට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය ඒක. මේ සමාගමේ වැඩ කරන අය තමයි ඒ කොටස් ටික බෙදා ගෙන තිබෙන්නේ. ඒ වෙනුවෙන් මේ ගොල්ලෝ මේ ආයතනයට දීපු ශත පහක මුදලක්, ගෙවපු මුදලක් තිබෙනවා නම් කරුණාකර අපට කියන්න. මේ ගොල්ලෝ එන විට නිකම් අත පය හොල්ල හොල්ලා ආපු උදවිය. නමුත් ඒ ගොල්ලෝ රුපියල් කෝටි ගණනක කොටස් හිමිකරුවන් බවට පත් වෙලා තමයි පීපල්ස් ලීසිං සමාගමෙන් එළියට යන්නේ. මේක තමයි අපට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය. මොකක්ද මේ ගොල්ලෝ කරපු ආයෝජනය මේ කොටස් මිලදී ගැනීම සඳහා? හතළිස් දෙලක්ෂ හැටඅටදහස් අටසිය පනහක කොටස් මිලදී ගන්න පද්මසිරි කුමාරගේ මහත්මයා කරපු ආයෝජනය මොකක්ද? කරුණාකර අපට ඒක කියන්න. මේ විධියට දහ දෙනෙක් අතරේ මේ කොටස් ටික බෙදලා දීලා, තව සියයට 25ක කොටස්, කොටස් වෙළෙඳ පොළට දමනවා.

අපි දන්නවා, අද වන විට හැම මහජන බැංකුවක්ම ඇතුළේ පීපල්ස් ලීසිං ආයතනයට අදාළ කවුළුවක් තිබෙන බව. ඒ ඇයි? ඒක මහජන බැංකුවේම ප්‍රධාන පරිපාලිත සමාගමක් නිසා. අපේ පඬුවස්නුවර මහජන බැංකුවේ බැංකුව ඇතුළතම පීපල්ස් ලීසිං සමාගමේ ලීසිං කටයුතු සඳහා වෙනම කවුළුවක් තිබෙනවා. මහජන බැංකුවෙන් ණයක් ගන්නා පුද්ගලයා අද කෙළින්ම යන්නේ වෙන තැනකට නොවෙයි. බල බලා ඉන්නේ නැහැ, හැරි හැරී ඉන්නේ නැහැ. මහජන බැංකුවේ තිබෙන ලීසිං ආයතනය වෙත කෙළින්ම යනවා. එහෙම ගිහින් මහජන බැංකුවේ ලීසිං එක දමා ගන්නවා. එතකොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සියයට 25ක කොටස්, කොටස් වෙළෙඳ පොළට දැම්මාට පස්සේ, සිරිපාලයි රන්මැණිකයි ඔක්කොම උදවිය එකතු වෙලා ගන්නවා. අද කොටස් වෙළෙඳ පොළේ සිද්ධ වෙමින් තිබෙන තත්ත්වය හොඳට අපි දන්නවා. මහජන බැංකුවට සියයට සියයක අයිතිය තිබුණු කොටස් ටිකෙන් සියයට 30ක් මේ විධියට පිටට යනවා. මේ ඇමතිවරු තර්ක කරයි, ප්‍රශ්නයක් නැහැ, සියයට 30යි දීලා තිබෙන්නේ, ඉතුරු 70ම අපට තිබෙනවා, ඒ නිසා මොකුත් ප්‍රශ්නයක් නැහැ කියලා. අපට තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි. බිලියන 7ක් හොයා ගන්න ආණ්ඩුවට ක්‍රමයක් නැති වුණාම, බිලියන 3ක් ලාභ ලබන ආයතනයක කොටස් වෙළෙඳපොළට යොමු කරලා එතැනින් ඒ මුදල් ටික ගන්නවා. ඒකෙන් මනදොල සපුරන්නේ කොටස් වෙළෙඳ පොළට අලුතෙන් ඇතුළු වන පුද්ගලයන් වන පද්මසිරි කුමාරගේ මැතිතුමා සහ අනෙක් උදවියගේ විතරයි. ලංකාවේ ජනහද හඳුනන මහජන බැංකුව, අහිංසක දුප්පත් මිනිසුන්ගේ තැන්පත් ටිකෙන්, නැත්නම් ඒ මිනිසුන්ට දෙන ණය ටිකෙන්, ගන්නා ලීසිං එකෙන් හම්බ කරන්නේ, පීපල්ස් ලීසිං සමාගමේ කොටස්වලින් සියයට 25ක් ලබා ගෙන මේ රටේ කොටස් වෙළෙඳ පොළට අලුතෙන් ඇතුළු වන අයගේ පරිභෝජනය සඳහායි. ඇයි මෙහෙම කරන්නේ? මොකක්ද මේකට හේතුව? ඒ කොටස් වෙළෙඳ පොළට කොටස් නිකුත් කරලා මොකක්ද මේ කරන්න හදන්නේ?

2000 වන විට මහජන බැංකුව පාඩු පිට පවත්වාගෙන ගියේ. 2001 දී රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආණ්ඩුව එන විට මහජන බැංකුව පාඩු පිට පවත්වාගෙන ගියේ. එහෙම පාඩු වෙලා තිබෙද්දී තමයි, සමහර බැංකු එකතු කරන්න, සමහර ඒවා පෞද්ගලීකරණය කරන්න, සමහර ඒවා පාඩු ලබන ආයතන තත්ත්වයෙන් මුදා ගන්න කියන යම් යම් යෝජනා ආවේ. ඒ වාගේ යෝජනා ආවේ 1994 ඉඳලා 2000 වන තුරු ගෙන ගිය කොල්ලකාරී ආර්ථික ක්‍රියාවලිය නිසායි. 1994 වන විට ලාභ ලබමින් තිබුණු ආයතනය 2000 වන විට පාඩු ලබන ආයතනයක් බවට පත් කරලා තමයි අපට භාර දුන්නේ. ඒවායේ බර තමයි අවුරුදු දෙකක් තිස්සේ රනිල් වික්‍රමසිංහ මහත්මයාට අදින්න සිද්ධ වුණේ. මිනිසුන්ට රැකීරක්ෂාවක්වත් දෙන්නේ නැතුව නතර කරන්න සිද්ධ වුණේ ඒකයි. 1994 ඉඳලා 2000 වන තුරු බලයේ හිටපු ආණ්ඩුව මේ රටේ මිනිස්සු කෝටි 15,000ක ණයකාරයෝ බවට පත් කෙරුවා.

2001 වන කොට ඔක්කෝම සියයට 105ක් වූ ඒ ණය ගෙවන්න අපි ලෝකයට ණයකාරයෝ බවට පත් වුණා. ඇයි? ගෙවන්න තිබුණු වාරික ටික ඔක්කෝම 2001වන කොට එකතු කළා. ඒකේ ප්‍රතිඵලය තමයි මේ සිද්ධ වුණේ. දැන් අද සිද්ධ වෙමින් තිබෙන්නේත් ඒකයි. අද මොකක්ද මේ කරන්නේ? මේක පෞද්ගලීකරණය කරලා, ඊ ළඟට ලබ්බට තියපු අත පුහුලට තියන්නේ නැහැ කියලා අපිට කියන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක ගැන බොහොම පැහැදිලිව සාකච්ඡා කරන්න කථා කරපුවාම මහජන බැංකුවේ අධිපතිතුමා ඇතුළු කට්ටිය කියලා තිබුණේ, "මේක මහ බැංකුවේ යෝජනාවක්; මේකට අපිට මොකවත් කරන්න බැහැ; මහ බැංකුව නියම කරලා තිබෙනවා මේක නිකුත් කරන්න කියලා; ඒ නිසා තමයි අපිට මේක කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ; නැතුව අපට කිසි ප්‍රශ්නයක් නැහැ; පීපල්ස් ලීසිං එක පාඩු ලබන ආයතනයක් නොවෙයි; රුපියල් බිලියන 3ක ලාභයක් රටට අරගෙන දෙන පීපල්ස් ලීසිං සමාගමේ කොටස් මේ විධියට නිකුත් කරන ලෙස කියා තිබෙන්නේ මහ බැංකුව; ඒ නිසා මහ බැංකුව කියපු වැඩේ අපි කරන්න ඕනෑ" කියලා. එතකොට දැන් මොකක්ද මහ බැංකුව කරමින් ඉන්නේ? මහ බැංකුව අද කරමින් ඉන්නේ මේ රටේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කටයුතු එකින් එක, එකින් එක ඉෂ්ට කරන වැඩ පිළිවෙළයි. ඒක තමයි මේ සිද්ධ කරන්නේ. ඒක තමයි තමුන්නාන්සේලා මේ පනත් කෙටුම්පත් ගෙනෙන්නේ. ඒකයි මේ කාරණාත් එක්ක ඒක ගැළපෙන්නේ කොහේද කියලා අපට හිතා ගන්න බැරි.

පසු ගිය කාලයේ මේ ක්‍රියාවලිය එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් ක්‍රියාත්මක කරන්න හදන කොට මේ ගොල්ලෝ කෑ ගැහුවා. ෂාහ් කියලා මහත්මයෙක් හිටියා. එතුමා තමයි මේකට විරුද්ධව කෑ ගැහුවේ. දැන් එයා ලොක්කෙක්. දැන් එයා ලොකු මහත්තයෙක්. දැන් එයා Merchant Bank එකේ සභාපති. දැන් එතුමාට ප්‍රශ්නයක් නැහැ. ඇයි? දැන් එතුමාට තමන්ට හදා ගත්තු බැංකුවක් තිබෙනවා. කිසි ප්‍රශ්නයක් නැහැ. දැන් අර වෘත්තීය සමිති පැත්තකට දාලා, බැංකු සේවකයෝ පාවා දෙන වැඩ පිළිවෙළ තමයි එතැනින් කරන්නේ. මම අහනවා, දැන් කෝ ඒ කට්ටිය කියලා? එදා පාරට බැහැලා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව එළවන්න කෑ ගහපු ඒ ෂාහ් මහත්තයලාගේ ලංකා බැංකු සේවක සංගමයට දැන් මොකද වෙලා තිබෙන්නේ? දැන් කෝ ඒ බැංකු සේවකයෝ? වෙනදා පාරට බැස්ස අයට දැන් මොකද සිද්ධ වෙලා තිබෙන්නේ? අද මම කියනවා, අර 2000 වසරට පෙර බැංකුව තිබුණු තත්ත්වයට මේක අනිවාර්යයෙන්ම ඉදිරියේදී පත් වෙනවා කියලා. ඒ විතරක් නොවෙයි. මහජන බැංකුවේ ලාභ ඉපැයීමේ ක්‍රියාවලිය රුපියල් බිලියන 3කින් අඩු වුණාම, නැවත ඒ ගොල්ලන්ට මේක එන්නේ නැති වුණාම, මහජන බැංකුව නැවත ලාභ නොලබන තැනකට පත් කිරීමේ කටයුත්තේ අවසාන ප්‍රතිඵලය තමයි තව අවුරුද්දක්, දෙකක් ඇතුළත අනිවාර්යයෙන්ම -ඊ ළඟ අය වැයට පෙර- මහජන බැංකුවත් ඇවරයි, දැවරයි, තුන්

ඇවරයි කියන එක. ජන හද හඳුනන මහජන බැංකුව විකුණන තැනට තමයි මේ ගෙනෙන්න හදන්නේ. ඒ නිසා මම ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඇමතිතුමා වෙන කථාවක් කියලා නිකම් සිටියි. මම දන්නවා. හැම දාම අදාළ කාරණය නොවෙයි වෙන එකක් කියන්නේ. එතුමා තර්කය දාලා හෙමින් නැඟිටලා යයි.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம )
(The Hon. (Dr.) Sarath Amunugama )
ඔබතුමා කියපු කිසිම කෙනෙකුට, එකම share එකක්වත් දීලා නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ තිබෙන්නේ දීලා. [බාධා කිරීමක්] ඔබතුමන්ලාගේ- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න මම කියන්නම්.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
එහෙම කළොත් ඔබතුමා ඉල්ලා අස් කර ගන්නවාද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්, ඉතින් මේ දාලා තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
සාක්ෂි ඇතිව ඔප්පු කළොත් ඔය කියපු ලැයිස්තුවේ කිසිම කෙනෙකුට එක කොටසක්වත් වැරදි විධියට- [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමන්ලා- [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔබතුමා ඉල්ලා අස් කර ගන්නවාද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම මේ prospectus ඔබතුමාට දෙන්නම්. ඒකේ shareholding විස්තර තිබෙනවා. මගේ ළඟ ඒක තිබෙනවා. නැතුවා නොවෙයි. ඔබතුමන්ලා දැන් මේකට ප්‍රශ්න එන කොට සද්ද නැතුව නිකම් ඉන්නවා ඇති. අපි දන්නේ නැහැ. [බාධා කිරීමක්] තවම වැඩේ කරලා නැතුව, ඒකද දන්නේ නැහැ හෙමිහිට මේක යට ගහලා තිබෙන්නේ. මේකේ prospectus මගේ ළඟ තිබෙනවා. ඔක්කෝම බඩු ටික මගේ ළඟ තිබෙනවා. තමුන්නාන්සේලා දීපු කොටස්වල විස්තර ටික ඔක්කෝම තිබෙනවා. දැන් මේ ප්‍රශ්නය මතු වුණාට පස්සේ, පාර්ලිමේන්තුවේදී කථාවට ලක් වුණාම අඩුම තරමේ බැංකුවට අත තිබ්බ වැඩේ තමුන්නාන්සේලා දැන් නතර කරලා ඇති. එහෙම කරන්න පුළුවන් නම් දෙවියන්ගේ පිහිටයි. [බාධා කිරීමක්] සල්ලි අරගෙන ඉවරයි.

අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් මේ සම්බන්ධව කථා කරන්න කැමැත්තෙන් සිටිනවා. එතුමාටත් තවත් කාරණා කිහිපයක් කියන්න තිබෙනවා. මොකද, නැත්නම් ගරු ඇමතිතුමා වෙන වෙන කථා කියලා බේරිලා පැනලා යනවා. ඒ නිසා මම කියන්න කැමැතියි, මේ පෞද්ගලීකරණය කිරීම අද පීපල්ස් ලීසිං මූල්‍ය ආයතනයෙන් පටන් අරගෙන ඊ ළඟට අනෙක් ඒවාටත් අත තියෙන තැනට තමයි මේ තල්ලු වෙලා තිබෙන්නේ කියලා. ඒ නිසා අපි තමුන්නාන්සේලාගෙන් ගෞරවයෙන් ඉල්ලන්නේ මේ රටේ බැංකු ක්ෂේත්‍රය කඩා වට්ටන වැඩ පිළිවෙළට නැවතත් දැන හෝ නොදැන කරුණාකරලා අත ගහන්න එපා කියලායි. තමුන්නාන්සේලා දෙවන වර කියැවීම සඳහා හෙට ගේන්න බලාපොරොත්තු වන පනත් කෙටුම්පතත් ඒවාගේම තමයි. අපට තේරෙන්නේ නැහැ, මොකක් ද කරන්නේ කියා. දැන් එන investors ලාත් -ආයෝජකයෝත්- ඔක්කොම යන්න යනවා. “We do not have any trust in investing in Sri Lanka.” කියා තමයි අද ඒ ගොල්ලෝ කියා තිබෙන්නේ. ඇමෙරිකානු කොම්පැනි කිහිපයක් පුවත් පත් නිවේදන නිකුත් කර තිබුණා. අද සවස ඔවුන් වෙනම සාකච්ඡාවක් තියලා ප්‍රකාශ කර තිබුණා. මේවා ක්‍රියාත්මක කර ගෙන ගිහින් තමුන්නාන්සේලා මොකක්ද රටට සිද්ධ කරමින් යන්නේ? එම නිසා මා කියනවා, කැරුණාකර මේ ක්‍රියාදාමය වහාම අත් හරින්න; මේ ක්‍රියාදාමය වහාම නතර කරන්න කියලා. මේ ක්‍රියාදාමය අත් හැරලා ලංකා බැංකුවට, ඒ වාගේම ලාභ ලබන People’s Leasing Company එකට ඔවුන්ගේ පැවැත්ම අනුව ක්‍රියාත්මක කරන්න ඉඩ දෙන්නය කියමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. යෝජනාව ස්ථිර කරන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල්තැබීමේ යෝජනාව මම ස්ථිර කරනවා.

ඇත්ත වශයෙන්ම මා මේ සම්බන්ධයෙන් කථා කරන්නට නොවෙයි සිටියේ. නමුත් වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. මගේ තර්කය මීට වඩා චුට්ටක් වෙනස් වෙනවා. එක්සත් ජාතික පක්ෂය හැටියට අපි කොයි වෙලාවකවත් පුද්ගලික ආයෝජන එපා කියන තැන නැහැ. අප කොයි වෙලාවේත් කියන්නේ පුද්ගලික ආයෝජන අවශ්‍යයි කියන එකයි. 1977 වර්ෂයේ නිදහස් ආර්ථිකය නැවත ශ්‍රී ලංකාවට හඳුන්වා දෙනකොට එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිය වුණේ ඒකයි. කවුරු මොනවා කිව්වත්, එදා සිට අද වන තුරු -මහින්ද චින්තනය 1, මහින්ද චිනතනය 2- දිගටම කර ගෙන ගියේ ඒ අප නැවත හඳුන්වා දුන් ආර්ථික ප්‍රතිපත්තියයි. නමුත් ඒ ක්‍රියාවලිය තුළ යම්කිසි විනිවිදභාවයක්, ක්‍රමවේදයක් අවශ්‍ය වෙනවා. අද අපට තිබෙන ලොකුම ගැටලුව මේකයි. එක පැත්තකතින් ආණ්ඩුව කලින් පෞද්ගලීකරණය කළ ලාභ ලබන ආයතන ජනසතු කරනවා. අනෙක් පැත්තෙන් ලාභ ලබන ආයතන පෞද්ගලීකරණය කරනවා. මහජන බැංකුව පෞද්ගලීකරණයේ පළමුවන අදියර තමයි මේ පටන් ගෙන තිබෙන්නේ. මොකද? මේ People’s Leasing Company කියන්නේ මහජන බැංකුවට සියයට සියයක් අයිති ආයතනයක්. මහජන බැංකුවට සියයට සියයක් අයිති ආයතනයක් පෞද්ගලීකරණය කරනවාය කියන්නේ, මහජන බැංකුවේ කොටසක් පෞද්ගලීකරණය කිරීම තමයි. එක පැත්තකින් කියනවා, නැහැ, අප පෞද්ගලීකරණයට විරුද්ධයි කියා. අනෙක් පැත්තෙන් කියනවා, අප පෞද්ගලීකරණය කරනවාය කියා. තව පැත්තකින් කියනවා, අපි පෞද්ගලීකරණය කරපුවා ජනසතු කරනවාය කියා. මේ ආණ්ඩුව යන්නේ කොහේද කියා ආණ්ඩුවවත් දන්නේ නැහැ. එම නිසා මෙතැන කිසිම පැහැදිලි ප්‍රතිපත්තියක් මේ ආණ්ඩුවට නැහැ.

[ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොටස් වෙළඳ පොළ ගැනත් යම් කිසි දෙයක් කථා කරන්නට ඕනෑ. සමහර වෙලාවට මිනිස්සු කියනවා, කොටස් වෙළෙඳ පොළ කියන්නේ රටේ ආර්ථිකයේ මිනුම් දණ්ඩක් නොවෙයි; කොටස් වෙළෙඳ පොළේ කී දෙනා ද ඉන්නේ කියලා.

ඇත්ත වශයෙන්ම එහෙම නොවෙයි. ගොඩක් දියුණු රටවල කොටස් වෙළඳ පොළ කියන්නේ මුළු දළ දේශීය නිෂ්පාදනයටත් වඩා ලොකු වටිනාකමක් තිබෙන දෙයක්. මේ කොටස් වෙළෙඳ පොළේ ප්‍රාථමික වෙළඳ පොළකුයි, ද්විතීයික වෙළඳ පොළකුයි දෙකක් තිබෙනවා. මෙතැන වැදගත් දෙයක් කථා කරන්න තිබෙනවා. මහජන බැංකුවේ පෞද්ගලීකරණයේ පළමුවන අදියරෙන් කරන්නේ මොකක්ද? රුපියල් මිලියන 7,000ක් අලුත් ආයෝජන වශයෙන් ලබා ගන්නවා. ඇයි, ඒ ලබා ගන්නේ? එහෙම ලබා ගෙන එයින් බස් අරගෙන දෙන්න පුළුවන්. ට්‍රැක්ටර් අරගෙන දෙන්න පුළුවන්. Motorcycles අර ගෙන දෙන්න පුළුවන්. මිනිසුන්ට තමන්ගේ ව්‍යාපාරය දියුණු කර ගැනීමට අවශ්‍ය උපකරණ මෙවලම් ලබා ගන්නට පුළුවන්. ඇයි, මිනිස්සු මේ ප්‍රාථමික කොටස් වෙළඳ පොළේ ආයෝජනය කරන්නේ? සමහරු දීර්ඝ කාලීනව මේ ආයෝජනය තියා ගන්න ඕනෑය කියලා හිතනවා. සමහර කට්ටිය හිතනවා, අද IPO දැම්මා නම් හෙට මේකෙන් අයින් වෙන්න. එතකොට අපට මේක රුපියල් 18ට හම්බු වුණොත්තින් රුපියල් 25ට විකුණලා එතැනින් අයින් වෙන්න පුළුවන්. ඒක කරන්නේ ප්‍රාථමික වෙළඳ පොළේ නොවෙයි. ඒක කරන්නේ ද්විතීයික වෙළඳ පොළේ; secondary market එකේ. එතකොට ද්විතීයික වෙළඳ පොළේ යම් කිසි නියාමනයක් අත්‍යවශ්‍යයි. ද්විතීයික වෙළඳ පොළ හරි විධියට වැඩ කරන්නේ නැත්නම් ප්‍රාථමික වෙළඳ පොළ වැඩ කරන්නේ නැහැ.

ප්‍රාථමික වෙළෙඳ පොළ වැඩ කරන්නේ නැත්නම් මූල්‍ය ආයෝජන, අවශ්‍ය ප්‍රාග්ධනය ආයතනවලට ලබා ගන්න බැහැ. අද වන විට ද්විතීයික වෙළෙඳ පොළ සම්පූර්ණයෙන්ම කඩා වැටිලා තිබෙනවා. අපට කිව්වා යුද්ධයෙන් පසුව සියයට එකසිය ගණනකින් මෙය වර්ධනය වුණාය, ඊට පසුව අවුරුද්දේ තවත් සියයට ගණනකින් වර්ධනය වුණාය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන විට ද්විතීයික වෙළෙඳ පොළේ සෘණ වර්ධනයක් තිබෙන්නේ. ඔබතුමා දන්නවාද දන්නේ නැහැ. මේ වසරේ ජනවාරි 01 වන දින සිට අද වන විට ද්විතීයික වෙළෙඳ පොළ, කොටස් වෙළෙඳ පොළ කඩා ගෙන වැටිලා සෘණ වෙලා. ඒකට හේතුව මොකක්ද? අපි මේ සම්බන්ධයෙන් කටයුතු කරනවා. COPE එකේදී මේක අහන්න වෙනවා. පත්තරයේ තිබුණා ආයෝජකයෝ පිරිසක් ජනාධිපතිතුමාට ලියුමක් ලියලා ලු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ අවශ්‍යතාවන් මත තමයි මලික් කාදර් කියන Securities and Exchange Commission of Sri Lanka එකේ අධ්‍යක්ෂ ජනරාල්තුමා වැඩ කරන්නේ කියලා. එතකොට විපක්ෂයේ මේවා ගැන කථා කරන්නේ කවුද? මම කථා කරනවා. දයාසිරි ජයසේකර මහත්මයා කථා කරනවා. සමහර විට ඉරාන් වික්‍රමරත්න මහත්මයා කථා කරනවා. ඒ කියන්නේ අපි තුන්දෙනාද මලික් කාදර් මහත්මයාට මේක කරපන්, අරක කරපන් කියලා අණ දෙන්නේ? එහෙම ලියුමක් ලියලා කියලා පත්තරේ තිබුණා. ඒ අනුව ඒ මහත්මයාව ගෙදර ඇරලා. සමහර වෙලාවට මේ කට්ටිය හිතනවා ඇති, භය කරලා මලික් කාදර් මහත්මයාව මෙතැනින් පැන්නුවාට පසුව ඒකේ ඉන්න කට්ටියට ඕනෑ ඕනෑ විධියට ද්විතීයික වෙළෙඳ පොළ හසුරවන්න පුළුවන් කියලා.

දැන් අද මොකද වෙලා තිබෙන්නේ? මලික් කාදර් මහත්මයාව පැන්නුවාට පසුව ද්විතීයික වෙළෙඳ පොළ කඩා වැටීම දිගටම සිදු වනවා. අදත් සියයට ගණනකින් කොටස් වෙළෙඳ පොළ කඩා ගෙන වැටිලා. මිනිසුන්ට මේ ද්විතීයික වෙළෙඳ පොළ, කොටස් වෙළෙඳ පොළ ගැන තිබෙන විශ්වාසය එන්න එන්නම බිඳ වැටෙනවා. මේ බිඳ වැටීමත් සමඟ මොකද වෙන්නේ? ප්‍රාථමික වෙළෙඳ පොළ බිඳ වැටෙනවා. ප්‍රාථමික වෙළෙඳ පොළ බිඳ වැටෙන විට මොකද වෙන්නේ? අවශ්‍ය ආයෝජන ලබා ගන්න බැරි වෙනවා. දැන් IPO දාන්න හිටිය කී දෙනෙක් IPO දාන්නේ නැද්ද? IPO කීයක් පස්සට අර ගෙන තිබෙනවාද? දැන් දන්නවා IPO දාන්න බැහැ කියා. දැම්මොත් ඒක subscribe වෙන්නේ නැහැ කියලා. ඒ කියන්නේ අවශ්‍ය ප්‍රමාණයට මිනිසුන් මේකට ආයෝජනය කරන්නේ නැහැ. ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම IPO දාන්න ලැයිස්තුවේ තිබුණා. මම කලින් කිව්වා වාගේ share ownership එක transfer වෙන එක විතරයි වෙන්නේ. මට පෙනෙන විධියට මේ ආණ්ඩුව ගෙන යන්නේ two-step process එකක්. ඒ කියන්නේ අදියර දෙකේ වැඩ සටහනක්. පළමුවෙනි අදියර තමයි පෞද්ගලික අංශයේ තිබෙන ආයතන තමන් ලබා ගැනීම. ඉන් පසුව ඒ ආයතන තමන්ට ඕනෑ කට්ටියට දෙනවා.

දැන් ෂෙල් ගෑස් ලංකා සමාගමට මොකද වුණේ? ෂෙල් ගෑස් සමාගම ආණ්ඩුව ලබා ගත්තා; ජනසතු කළා. ඒ අය තීරණයක් අරගෙන තිබුණා, සමහර රටවල ෂෙල් ගෑස් සමාගම අනෙක් කොටස්කාරයන්ට විකුණනවා කියලා. කොහොම හරි ආණ්ඩුව ෂෙල් ගෑස් ලංකා සමාගම ගත්තා. අර ගෙන මහ ලොකුවට පම්පෝරි ගැහුවා, පත්තරවල කිව්වා, ඇමතිවරු TVවල කිව්වා, "බලන්න මේ ෂෙල් ගෑස් ලංකා සමාගම දැන් රජයට අයත් ආයතනයක්. ලිට්රෝ ගෑස් ලංකා සමාගම කියන්නේ රජයේ ආයතනයක්. අපි මේකෙන් සහන දෙනවා. අපි ජනතාවට අඩු මිලට ගෑස් දෙනවා" කියලා. දුන්නාද? දුන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි මම ඉතාමත්ම වග කීමෙන් කියනවා, මෙන්න මේ කාරණය. මම ඉතාමත්ම ගරු කරන ඇමතිවරු දෙදෙනෙක් දැන් ගරු සභාවේ අසුන් ගෙන සිටිනවා. එතුමන්ලා දෙදෙනා දන්නවා. ලිට්රෝ ගෑස් ලංකා සමාගම නැවත පෞද්ගලීකරණය කිරීම සඳහා කොළඹ ප්‍රාථමික වෙළෙඳ පොළේ ලැයිස්තුවේ තිබෙනවා. ඒක තමයි සත්‍යය. ඒක තමයි යථාර්ථය.

අපේ ගරු අනෝමා ගමගේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමියගේ ආයතනය හෙට ගත්තාට පසුව, තව මාස කිහිපයකට පසුව කියයි, "අපි මේ ආයතනය වෙනත් කෙනෙකුට පෞද්ගලීකරණය කරනවා." කියලා. එහෙම වෙන්න පුළුවන්, අපට පෙනෙන විධියට. අපි මෝඩයෝ නොවෙයි නේ. අපට තේරෙනවා නේ මොනවාද වෙන්නේ කියලා. එවැනි ක්‍රියා මාර්ගයක් තමයි ගන්නේ. කෙසේ වෙතත් මේ සියල්ල මෙසේ තිබියදී People's Leasing Company එක ගැන යම් කිසි හොඳ දේකුත් කියන්න ඕනෑ. People's Leasing Company එක බොහොම පොඩියට පටන් අරන්, කළමනාකරණය තුළින් ලාභ ලබන ආයතනයක් බවට පත් වෙලා තිබෙනවා. නමුත් ආණ්ඩුවේ වැඩිපුර ආයතන ලාභ ලබන ආයතන නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාඩු ලබන ආයතනයි. කෙසේ වෙතත්, මේ ප්‍රාථමික වෙළෙඳ පොළෙන් ප්‍රාග්ධනය ලබා ගන්න අවශ්‍ය නම් ද්විතීයික වෙළෙඳ පොළ යම් කිසි නියාමනයක් අනුව පාලනය කරන්න ඕනෑ. එහෙම වුණේ නැත්නම් පෞද්ගලික අංශයට අවශ්‍ය ආයෝජන ලබා ගන්න හැකි වන්නේ නැහැ. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
පිළිතුරු කථාව, ගරු ආචාර්ය සරත් අමුණුගම ඇමතිතුමා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා ( ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation )
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීම

සහ ස්ථිර කිරීම ගැන හිතවත් මන්ත්‍රීතුමන්ලා දෙපොළටම මම ස්තුතිවන්ත වනවා. මොකද, අපට අවස්ථාවක් ලැබිලා තිබෙනවා, ඒ තුළින් යථා තත්ත්වය රටට පැහැදිලි කරන්න.

මම කෙළින්ම ඒ මූලික ප්‍රශ්නයට එන්නම්. මම ගිය වතාවේදී ඉදිරිපත් කළා, මේ වෙළෙඳ පොළට යෑමේදී ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමූහයකට සුවිශේෂ වරප්‍රසාදයක් ලැබෙනවායි කියලා. අපට ඒ වෙලාවේ දැන ගන්නට ලැබුණේ, සාමාන්‍ය පෞද්ගලික අංශයට යම් කිසි උදව්වක් හැටියට, යම් කිසි පිළිගැනීමක් හැටියට මෙය කෙරෙන බවයි. මොකද, අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්ව විධියට, ඉතා පොඩියට පටන් ගත්ත ආයතනයක් ඉතාම හොඳ සාර්ථක මට්ටමකට ඒ නිලධාරින්ට ගෙන යන්න පුළුවන් වුණා. නමුත් පාර්ලිමේන්තුව තුළ අපි කරපු විවාදය තුළදී ඔබතුමන්ලාත් අදාළ කරුණු ඉදිරිපත් කළා; ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුනුත් කරුණු ඉදිරිපත් කළා. අපි දෙපොළත් ඒකට මැදිහත් වුණා. මම මේ අවස්ථාවේදී ගරු සභාවට වාර්තා කරන්න කැමැතියි, ඒ ප්‍රශ්නය අපි ඔබතුමන්ලාට සෑහීමකට පත් වන්න පුළුවන් විධියට නිරාකරණය වෙලා තිබෙන බව.

මම දැන් කියවනවා, මේ වර්ෂයේ නොවැම්බර් 04වන දා මහජන බැංකුවේ Board එකේ

වාර්තාව. එහි මෙසේ සඳහන් වනවා:

"The Chairman informed the Board that having obtained knowledge of the unrests and issues that have arisen amongst the trade union members of People's Bank due to the allocation of free shares to the employees of the Company, the employees of the Company have expressed their willingness to voluntarily transfer these shares back to People's Bank subject to obtaining the relevant regulatory approvals including the Securities and Exchange Commission of Sri Lanka if, such a transfer would help upkeep the industrial peace at the Bank and the continuance of the IPO process..."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වර්තමාන තත්ත්වය නම්, ඒ කියපු අයට ස්වේච්ඡාවෙන් ආපහු එය ලැබිලා තිබෙනවා. ඔබතුමන්ලා දෙදෙනාම ඉතාම බුද්ධිමත් මන්ත්‍රීවරුන්. මට ප්‍රශ්නයක් නැහැ, ඒ ලිපියේ පිටපතක් පවා ඔබතුමාට මම දෙන්නම්. ඒකයි මම කිව්වේ, ඇත්ත වශයෙන්ම නම් සියල්ලක්ම කියන්න ඕනෑ නැහැයි කියලා. මොකද, නැත්නම් මටත් ඒ නම් සියල්ලම කියවන්න වෙනවා. ඩී. පී. කුමාරගේ, සංජීව බණ්ඩාරනායක, ලයනල් ප්‍රනාන්දු, රොහාන් තෙන්නකෝන්, ලක්සඳ ගුණවර්ධන වැනි අය තමුන්නාන්සේලා කියපු ලැයිස්තුවේ අයයි.

මේ තමයි ඒ ගොල්ලන් සභාපතිතුමාට යැව්ව ලිපිය. එහි මෙසේ සඳහන් වනවා:

"In all these circumstances, in valuing the goodwill and reputation of our company and People's Bank than any personal benefits we would have derived from the aforesaid shares allocated to us, we, on behalf of all the employees of our company who became eligible to receive the said shares hereby inform you of our willingness to voluntarily transfer the said shares back to the People's Bank subject to obtaining clearance from the Securities and Exchange Commission of Sri Lanka and all other relevant authorities".

එතකොට ඒ ප්‍රශ්නය නිරාකරණය වනවා. දැන් Securities and Exchange Commission එක lock-in කරලා තිබෙනවා, අවුරුද්දකට ඒ කොටස් මුදල් ආපසු ගෙවන්න බැරි වෙන්න. නමුත් එතුමන්ලාගේ අත්සන පිට ලිපියක් තමුන්නාන්සේලාට ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ ප්‍රශ්නය දැන් නිරාකරණය වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ පාර්ලිමේන්තුවට තමයි ස්තුතිවන්ත වන්න ඕනෑ. අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා නිතරම කියන දෙයක් තමයි මේ වාගේ රටට වැදගත් අවස්ථාවලදී, අපි ආණ්ඩු පක්ෂය, විපක්ෂය හැටියට බෙදා ගන්න ඕනෑ නැහැ, අපි ඒ පිළිබඳව සාකච්ඡා කරලා ඒ විසඳුම්වලට යන්න පුළුවන් කියන එක. ඒ පාර්ලිමේන්තු විවාදයට පස්සේ අපිට ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න පුළුවන් වුණා. ඒ අනුව තමයි අපි කාටත් පිළිගන්න පුළුවන් අවස්ථාවකට අපි පැමිණ තිබෙන්නේ.

ඒ ප්‍රධාන ප්‍රශ්නය නිරාකරණය වුණා. නමුත් තව වචන ස්වල්පයක් කථා කරන්න මම කැමැතියි. විශේෂයෙන්ම මහජන බැංකුව ගැන අපේ රජය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආඩම්බර වනවා. ඔබතුමා හොඳටම දන්නවා, මෙය අපේ රටේ ඉතිහාසයේ ඉතාම ආඩම්බර අවස්ථාවක් හැටියට අපට කියන්නට පුළුවන් බව.

විශේෂයෙන් ගරු ගීතාංජන ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාත් සභා ගර්භයේ ඉන්න වෙලාවේ මේක කියන්න ඕනෑ. එතුමාගේ පියතුමාත් මේ සම්බන්ධයෙන් මූලික කටයුතු කළා. ඒ වාගේම මේ සභාවේ හුඟාක් දෙනෙක් නොදන්නා අය, අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ ඥාතිවරයෙක් වූ ජී.වී.එස්.ද සිල්වා මැතිතුමා මුලින්ම කෘෂිකර්ම බැංකුව හැටියට මේ ගැන කෙටුම්පත් සකස් කළා. අවසානයේදී ඒ අදහසුත්, වෙනත් අදහසුත් එක්කාසු කරලා තමයි මහජන බැංකුව කියා මේ බැංකුව ඇති කළේ. ඒ නිසා මෙතුමන්ලා දෙදෙනාටම හොඳ ගෞරවයක් හිමි වෙනවා. අපේ දයාසිරි ජයසේකර මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිටියා. හර්ෂ ද සිල්වා මැතිතුමාගේ ඥාතියා හිටියා. ඉතින් අපි සියලු දෙනාම සතුටු වෙනවා, මහජන බැංකුවේ වර්ධනය ගැන.

අපි මෙතැනදී මතක තබා ගත යුතු වැදගත්ම දෙයක් තිබෙනවා. ප්‍රතිපත්තිමය ප්‍රශ්නයක් හැටියට ඉදිරිපත් කළ නිසා නිතරම මතක් කළ යුතු දෙයක් තිබෙනවා. මෙතැන කොටස් බෙදීමේදී කිසිම විධියකින් පරිපාලන අයිතිය අඩු වන්නේ නැහැ. People's Leasing සමාගමේ කොටස් බෙදුණේ මේ විධියටයි. සියයට 71.5ක් මහජන බැංකුව සතුව පවතිනවා. ඒ වාගේම සියයට 25ක් මහ ජනතාවට නිකුත් කළා, IPO එකෙන්. සියයට 3.5ක් තමයි සේවකයන්ට ලබා දුන්නේ. දැන් ඒක වෙනස් වෙලා. සාමාන්‍යයෙන් සියයට 75යි, සියයට 25යි කියන තත්ත්වයට පරිවර්තනය වෙලා තිබෙනවා. කිසිදු විධියකින් මෙතැනදී පාලනමය වෙනසක් සිදු වන්නේ නැහැ. ඔබතුමා කිව්වා වාගේ ඉස්සර People's Leasing එක වෙනුවෙන් මහජන බැංකුවේ කවුළුවක් තිබුණා නම් ඒ කවුළුව ඒ විධියටම යනවා. ඒ පරිපාලනය ඒ විධියටම යනවා. ඒ නිලධාරි මණ්ඩලය ඒ විධියටම යනවා. මොකද, ඔබතුමන්ලා හොඳටම දන්නවා, සියයට 25ක කොටස් මුදලක් ගියාය කියා ඒකේ controlling interest එක වෙනස් වෙන්නේ නැති බව. ලොකු පරතරයක් තිබෙනවා, සියයට 75 සහ සියයට 25 වශයෙන්. ඇයි අපි මේ තත්ත්වයට ආවේ කියන එකත් මතක් කරන්න ඕනෑ.

ඇත්ත වශයෙන්ම ඔබතුමා සඳහන් කළා, මහ බැංකුවෙන් ඒ නියෝගය ලැබුණාය කියා. ඒක සම්පූර්ණ සත්‍යයක්. තමුන්නාන්සේලා දන්නවා, අද මුළු ලෝකයේම බැංකු කෙරෙහි spotlight එක බලනවා කියලා. ඔක්කොමලා බැංකුවල ක්‍රියාකාරිත්වය ගැන සොයන වෙලාවක්, මේ. විශේෂයෙන් ආර්ථික වශයෙන් දියුණු රටවල්වල බැංකු ක්ෂේත්‍රය දැන් හුඟාක් දුරට අර්බුදකාරී තත්ත්වයකට මුහුණ දී තිබෙනවා. අද අපි මේ සාකච්ඡා කරන වෙලාවේත් Euro Zone එකේ බැංකු අර්බුදවලට මුහුණ දෙනවා. ඇමෙරිකාවේ බැංකු අර්බුදවලට මුහුණ දෙනවා. අද අලුත්ම ප්‍රවෘත්තිය තමයි ඉතාලියෙත් එහෙමයි කියන එක. හුඟාක් ඉතාලි බැංකු ග්‍රීසියෙන් ණය අරගෙන තිබෙනවා. ස්පාඤ්ඤ බැංකු අරගෙන තිබෙනවා, බ්‍රිතාන්‍ය බැංකු අරගෙන තිබෙනවා, ප්‍රංශ බැංකු අරගෙන තිබෙනවා, ජර්මන් බැංකු අරගෙන තිබෙනවා. දැන් එතකොට මේ ණය knock-on effect එකක් ඒ බැංකු ක්ෂේත්‍ර කෙරෙහිත් තිබෙනවා. ළඟම ඉන්න ඥාති රට වාගේ නිසා

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

ඉතාලියට මේක කෙළින්ම බලපානවා. ඔබතුමන්ලා දන්නවා ඇති, මුළු ලෝකයේම මහ බැංකු ටික Baselවලදී රැස් වෙලා Basel Agreement එක ඇති කර ගත්තා කියලා මේ බැංකු ටික සුරක්ෂිත කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය ගැන. ඒ ප්‍රශ්නයේදී එළඹුණු එක නිගමනයක් තමයි සුරක්ෂිත -reserve- මුදල් ප්‍රමාණය, මොකක් හරි ආපදාවකදී ප්‍රයෝජනයට ගන්න තිබෙන මුදල් ප්‍රමාණය වැඩි කර ගත යුතුයි කියන එක. ලංකාවේ වුණත් කඩා වැටිච්ච මූල්‍ය ආයතන දිහා බැලුවාම අපට පෙනෙනවා ප්‍රශ්නය වුණේ හදිසියක් ආවාම ඒ ගොල්ලන්ට ගෙවන්න මුදලක් නැති එක බව. Bailout එකක් කරන්න ඕනෑ. ඇමෙරිකාව ගත්තොත් මුලදී ඒ ගොල්ලන් කිව්වා, "අපි ඇඟිලි ගහන්නේ නැහැ" කියා. Lehman Brothersලා ආවාම කිව්වා, "අපි ඇඟිලි ගහන්නේ නැහැ, ඔය ගොල්ලන්ට මේක කර ගන්න බැරි නම් වැටෙන්න" කියා. වැටුණා.

ඊ ළඟට J B Morgan එක වැටෙන්න හැදුවා. ඊට පසුව Morgan Stanley එක වැටෙන්න හැදුවා. එතකොට තමයි ඒ ආණ්ඩුවට තමන්ගේ මූලික ප්‍රතිපත්තිය වුණු ඇඟිලි ගහන්නේ නැති ප්‍රතිපත්තිය වෙනස් කරලා එක පාරට bailout එකකට යන්න වුණේ. තමුන්නාන්සේලා කියනවා ආණ්ඩුවේ ප්‍රතිපත්ති වෙනස් කළාය කියා. තමුන්නාන්සේලා පොඩ්ඩක් "Too Big to Fail" කියන පොත කියවන්න. Lehman Brothers එකට මොකද වුණේ, Morgan Stanley එකට මොකක්ද වෙන්න ගියේ, සියයට සියයක් අනික් පැත්තට හැරිලා කවදාවත් ධනපති ක්‍රමය යටතේ මේවාට ඇඟිලි ගහන්නේ නැහැ කියපු ඇමෙරිකාවේ ඔබාමා රජය සම්පූර්ණයෙන් Fed එක හරහා කොහොමද මේකට මැදිහත් වුණේ කියා බලන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු ඇමතිතුමනි, ඒක තාවකාලික වැඩසටහනක් නේ. ඔබතුමා දන්නවා ඇති, ඒ shares නැවතත් ඇමෙරිකාවේ ආණ්ඩුවෙන් ඒ ආයතනවලට දීලා තිබෙනවා කියලා. ඒක temporary වැඩසටහනක් විතරයි.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඒක හරි. ඔබතුමාගේ දැනුමට මා ගරු කරනවා. ඒ විධියට ඒ වෙලාවේ ක්‍රියා කරන්නට සිදු වුණා. නමුත් ඒ හැම ක්‍රියාවක්ම මත ඉඳලා විමර්ශනය කරන කොට ඒ ගොල්ලන් තීරණය කළා ඒ ගොල්ලන් ළඟ තිබුණු මේ සුරක්ෂිත මුදල් ප්‍රමාණය - reserve currency - මදියි කියන එක. මේ බැංකුව සම්බන්ධයෙන් විතරක් නොවෙයි, සෑම බැංකුවක් සම්බන්ධයෙන්ම මහ බැංකුවේ තිබෙන ලොකුම කාර්ය තමයි surveillance කිරීම. මේවා ඔක්කොම බලලා, මේවා හරියට ඉදිරියට යනවාද කියලා පරිපාලනය කරන්න ඕනෑ. ඒ නිසා ඔක්කොම බැංකුවලට කිව්වා, තමන්ගේ සුරක්ෂිත මුදල රැක ගන්නේ කොහොමද කියලා කරුණු ඉදිරිපත් කරන්න කියලා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඔබතුමන්ලා පවරලා, ඔබතුමන්ලා ආපසු අත් පත් කර ගන්නවා. ඒකද ප්‍රතිපත්තිය?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

නැහැ, අපේ රහසක් නැහැ. ඕනෑ නම් ඔබතුමාට මම කියන්නම්. කනගාටුයි, හෙට මට පිට රට යන්න තිබෙනවා. නැත්නම් මම මේ සම්බන්ධව හෙට පැවැත්වෙන විවාදයට සහභාගි වන්නයි සූදානම් වෙලා සිටියේ. නමුත් දැන් මා කියන්නම්. පවරා ගත්තාට පසුව මේවා රජයේ ආයතන විධියට පවත්වා ගෙන යන්නට අපේ කිසිම අදහසක් නැහැ. ඒ ගොල්ලෝ වැඩ කරපු නැති නිසා අවුරුද්දක් ඇතුළත වැඩ කරන්න කියලා ඒ අයට දැනුම් දුන්නා. ඒ වැඩ කරපු අයටම නැවත වරක් ඇවිල්ලා කියන්න පුළුවන්, "අපිට වැරදුණා -*Mea Culpa*- අපි මේ විධියට මේක ඉදිරියට ගෙන යනවා" කියලා. එහෙම කියන්න ඒ අයට අයිතිය තිබෙනවා. හෙට පැවැත්වෙන විවාදයේ දී ඒක පැහැදිලි කරයි.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු ඇමතිතුමනි, ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද? ඔබතුමා කිව්වා, එම ආයතනවලට අවුරුද්දකට කලින් දැනුම් දුන්නා කියලා. එම ආයතනවලට ලිඛිතව දැනුම් දුන්නාද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

නැහැ. ගිය වර අය වැයේදී පැහැදිලිවම කියා තිබෙනවා, අවුරුද්දක් කල් දීලා තිබෙනවාය කියලා. [බාධා කිරීමක්] නැහැ, නැහැ, ඔක්කොම ආයතනවලට. ඒ කියන්නේ නම් වශයෙන් කියලා නැහැ. කරුණාකරලා අපේ පසු ගිය අය වැය කථාව කියවන්න. එහි පැහැදිලිව කියා තිබෙනවා, BOI අනුමැතිය ලබා ගත් ආයතනවලට අපි අවුරුද්දක් කල් දෙනවා, නැවත වරක් සකස් වෙන්න -reform වෙන්න - කියලා. ඒක ගැන හෙට අපි සාකච්ඡා කරමු කෝ. දැන් මේක-

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

You are both the judge and the jury.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

You are saying that no notice was given but we are saying that notice has been given. We can look into it tomorrow. I do not want to debate on that today. දැන් මට කියන්නට ඕනෑ මේකයි. මේක අනෙක් බැංකුවලටත් අදාළයි නේ. තමුන්නාන්සේලාත් අපිත් එක්ක එකඟ වෙයි. ඒ සංචිතයේ මුදල් ප්‍රමාණය වැඩි කර ගන්නට ඕනෑ. ඊට අමතරව අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියපු විධියට ඒ ගොල්ලන්ගේ වැඩ කටයුතු තව පළල් කරන්නට ඕනෑ. ණය දෙන්න, ණය පරිමාණය වැඩි කර ගන්න මුදල් ඕනෑ. මට හරි පුදුමයි, මේ වාගේ විවාදයක් ගැන එක්සත් ජාතික පක්ෂයෙන් යෝජනාවක් ඉදිරිපත් කළ එක ගැන. මොකද, තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය තමයි, මේ ප්‍රමාණය නොවෙයි, සියයට 25ක් නොවෙයි, සියයට 100ක් දුන්නත් කමක් නැහැයි කියන එක.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඔබතුමන්ලා දීලා, ආපසු ගන්න එකයි අපට තිබෙන ප්‍රශ්නය. ආයෙත් දෙනවා, ආයෙත් ගන්නවා. කාටද දෙන්නේ?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

දැන් මට හිතා ගන්න බැහැ, රජයේ ආයතනයක යම් කිසි කොටස් මුදලක්; සියයට 25ක සුළු මුදලක් මහජනතාවගේ සහභාගිත්වයෙන් සාමාන්‍යයෙන් කාටත් පිළිගන්නට පුළුවන් කොටස් වෙළෙඳ පොළ හරහා දෙන එකට විරුද්ධ වන්නේ කොහොමද කියලා. ඒ සම්බන්ධයෙන් තමුන්නාන්සේලා ස්තුතිවන්ත වෙලා යෝජනාවක් ගෙනෙන්නට ඕනෑ. සමහර විට ඔබතුමන්ලාගේ විසඳුම වන්නේ මේවා සියයට 100ක් දෙන එකයි. ඒ නිසා මට තේරුම් ගන්නට බැහැ, මෙතුමා මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කළේ ඇයි කියන එක. නමුත් බොහොම සන්තෝෂයි, මේක පැහැදිලි කර ගන්නට අපට අවස්ථාව ලැබුණු එක ගැන. මේ බැංකුව විතරක් නොවෙයි, හැම තැනම ඒ ගොල්ලන්ගේ මුදල් ප්‍රමාණය වැඩි කර ගන්නට ඕනෑ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු ඇමතිතුමනි, ඒක ඇත්ත නොවෙයි නේද? පැහැදිලි කර ගැනීමට ඔබතුමාට අවස්ථාවක් ලැබීම පිළිබඳව ඔබතුමා සන්තෝෂ වනවාය කියනවා. නමුත් prospectus එකේ තිබෙනවා, මේ කට්ටියට මේවා දෙනවාය කියලා. මට ප්‍රශ්නයක් නැහැ, එහෙම දෙන එක නොවෙයි ගැටලුව. ඒක දෙන්න තමයි හිටියේ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඒක තමයි ගරු මන්ත්‍රීතුමනි. මා මේක පංගුපේරු කරන්න හැදුවේ නැහැ. මේ prospectus එක තිබුණා. සල්ලි එකතු කළා. මා මේ හැන්සාඩ් වාර්තාවත් දැන් කියව කියවා සිටියේ. මා හිතන්නේ සති දෙකකට වැඩි කාලයක් නැහැ, මේක අපි මේ ගරු සභාවේ දී සාකච්ඡා කළා නේ. මා එදා කථාවක් කළා. එහිදී මා ඒක හඳුන්වා දුන්නා. ඒ අවස්ථාවේ දී මේ කරුණුම තමුන්නාන්සේලා ඉදිරිපත් කළා. තමුන්නාන්සේලා අපට ඩිංගක් ඒ ගැන ලකුණු දෙන්නට ඕනෑ. ඊට පසුව අපි ඔක්කොම නැවතත් මේවා ගැන සාකච්ඡා කළා. දැන් ඔබතුමන්ලාත් කැගහනවා, අපිත් කැගහනවා. අපිත් ඒක සොයා බලන්න ඕනෑ. ඒක පාර්ලිමේන්තුවේ යුතුකම. තමුන්නාන්සේලා සතුටු වෙයි, ඒ විධියේ සාර්ථක නිමාවකට අපිට යන්න පුළුවන් වෙච්ච එක ගැන. අපි උත්සාහ කරන්නේ අපේ බැංකු ක්‍රමය ඉතාම ස්ථාවර තත්ත්වයකට ගෙනෙන්නයි. මොකද, මේ සුළි සුළං හමා ගෙන යන වෙලාවේ අපි මහ බැංකුවටත් ස්තුතිවන්ත වන්නට ඕනෑ, මහජන බැංකුවටත් ස්තුතිවන්ත වන්නට ඕනෑ, ඒ තිබෙන ප්‍රශ්නවලට, අර්බුදවලට මුහුණ දීලා විශේෂයෙන්ම පුංචි මිනිහාගේ මුදල් රැක ගන්න විධියට, ඒවා ආරක්ෂා කරන විධියට යම් යම් වෘත්තීයමය තීන්දු ගැනීම ගැන. මේවා එක එක්කෙනාට හිතෙන හිතෙන විධියට ගන්නා තීන්දු නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේවා Baselවල සාකච්ඡා කරලා, නිරන්තරයෙන් බැංකුවල ප්‍රධානීන් සාකච්ඡා කරලා මුළු ලෝකයටම -globally- බලපාන විධියට කරන වෙනස්වීම්. ඒ reform එක මුළු ලෝකයටම යනවා. ඒකේ කොටසක් හැටියට තමයි, අපි ලංකාවට මේ වෙනස කරන්නේ. ඒ සම්බන්ධයෙන් අපි මහ බැංකුවේ නිලධාරීන්ටත්, මහජන බැංකුවේ නිලධාරීන්ටත් ස්තුතිවන්ත වන්නට ඕනෑ. ඒ වාගේම තමුන්නාන්සේලා හුඟාක් දුරට අපහාසයෙන් කථා කරපු ඒ නිලධාරීන් දැන් කොයි තරම් හොඳට ආදර්ශවත් විධියට ක්‍රියා කරලා තිබෙනවාද බලන්න. අපි ඒ පැත්තත් පිළිගන්න ඕනෑ නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

නොකර බැරි නිසා කරනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

නැහැ, කොහොම වුණත් අපි පිළිගන්න ඕනෑ. We have to be magnanimous if people can make a request like that.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ඇත්ත වශයෙන්ම මේ වාගේ දේවල් මම අහලා -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට ආසනයක් තිබෙනවා නේ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමා, තමුන්නාන්සේ පටන් ගත්තා විතරයි. තව ගොඩක් දේවල් අහන්න ලැබෙයි. බය වෙන්න එපා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ඒ ආසනයට ගිහිල්ලා කථා කළා නම් හොඳයි. මම පූර්වාදර්ශයක් දෙන්නට කැමැති නැහැ. ඒ නිසා තවදුරටත් කථා කරනවා නම් ආසනයට ගිහිල්ලා ඉඳගන්න.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

මුළු ලෝකයම හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා වටා කැරකෙන්නේ නැහැ නේ. ඔබතුමා මේක දැන ගෙන හිටියේ නැහැයි කියලා -

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

The magnanimity of these people has to be appreciated if they are willing to give back Rs. 80 million.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

That is what I am saying. That is precisely what I am telling you.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

You cannot take credit for that.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

No, no. I am only saying that we should jointly give credit to those people. Why should we take credit for that?

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
I take my hat off.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Thank you. That is all I want.

මම තමුන්නාන්සේලාට නැවත වරක් කියනවා යම්කිසි වරදක් සිද්ධ වුණා නම්, වැරදි perception එකක් තිබුණා නම් අපි හැම දෙනාම එකතු වෙලා අපට ඒක සකස් කර ගන්න පුළුවන් වෙලා තිබෙන බව. ඒක හැංගිලා අපට ටිකක් පහරක් වදින්න ඉඩ තිබුණා. වාසනාවකට තමුන්නාන්සේලා මේ ප්‍රශ්නය දැකපු නිසා අපට ලෝකයා ඉදිරියේම පිළිතුරක් දීලා හොඳට ලකුණු ගන්න පුළුවන් වුණා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.13ට, 2011 නොවැම්බර් මස 09 වන බදාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***
*அதன்படி, பி. ப. 7.13 மணிக்கு பாராளுமன்றம், 2011 நவம்பர் 09, புதன்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Adjourned accordingly at 7.13 p.m. until 1.00 p.m. on Wednesday, 09th November, 2011.*

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

1 වන ප්‍රශ්නය - 0944/'10

2 වන ප්‍රශ්නය - 0945/'10

3 වන ප්‍රශ්නය - 0946/'10

4 වන ප්‍රශ්නය - 0947/'10

5 වන ප්‍රශ්නය - 0948/'10

6 වන ප්‍රශ්නය - 0949/'10

7 වන ප්‍රශ්නය - 0950/'10

8 වන ප්‍රශ්නය - 0951/'10

9 වන ප්‍රශ්නය - 0952/'10

10 වන ප්‍රශ්නය - 0953/'10

11 වන ප්‍රශ්නය - 0954/'10

12 වන ප්‍රශ්නය - 0955/'10

ලිඛිත පිළිතුරු අපේක්ෂාවෙන් ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා විසින් අසා ඇති අද දින න්‍යාය පත්‍රයේ සඳහන් ඉහත අංක දරන ප්‍රශ්නවලට පිළිතුරු දීමට අධ්‍යාපන අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන මහතා සති දෙකක් කල් ඉල්ලා ඇත.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.